322 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 322 - இல. 2
Volume 322 - No. 2

2025 නොවැම්බර් 08වන සෙනසුරාදා
2025 நவம்பர் 08, சனிக்கிழமை
Saturday, 08th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 233]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 237-259]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ප්‍රතිලාභ සහ "එට්කා" ගිවිසුම පිළිබඳ සාකච්ඡා [තීරුව 259]

**වරප්‍රසාද:**

ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් 2025.10.23 දින මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය [තීරුව 262]

**වරප්‍රසාද යෝජනා:**

කෝපා කමිටුවේදී ලබා දුන් සාක්ෂිවලට එරෙහිව පෞද්ගලික සමාගමක් විසින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග [තීරුව 264]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [පළමුවන වෙන් කළ දිනය]:**

දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 267-408]

**කල්තැබීමේ යෝජනාව:**

මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ සංවර්ධන ව්‍යාපෘති අත්හිටුවීම [තීරු 408-421]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 421-424]


# பிரதான உள்ளடக்கம்


**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 233]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 237-259]

**தனி அறிவித்தல் மூல வினா:**

இந்திய-இலங்கை சுதந்திர வர்த்தக ஒப்பந்தத்தின் நன்மைகள் மற்றும் ETCA தொடர்பான பேச்சுவார்த்தைகள் [ப: 259]

**சிறப்புரிமை:**

2025.10.23ஆம் திகதி கௌரவ சாமர சம்பத் தசநாயக்க அவர்களால் எழுப்பப்பட்ட சிறப்புரிமை வினா [ப: 262]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவில் அளிக்கப்பட்ட சாட்சியத்திற்கு எதிராக தனியார் நிறுவனமொன்றால் எடுக்கப்பட்ட சட்ட நடவடிக்கை [ப: 264]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட முதலாம் நாள்]:**

இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 267-408]

**ஒத்திவைப்புப் பிரேரணை:**

மாவனல்லை பிரதேச சபையால் அங்கீகரிக்கப்பட்ட அபிவிருத்தித் திட்டங்கள் இடைநிறுத்தம் [ப: 408-421]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 421-424]


# PRINCIPAL CONTENTS


AUDITOR-GENERAL'S REPORT [Col. 233]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 237-259]

QUESTION BY PRIVATE NOTICE:

Benefits of Indo-Sri Lanka Free Trade Agreement and Negotiations on ETCA [Col. 259]

PRIVILEGE:

Question of Privilege Raised by Hon. Chamara Sampath Dasanayake on 23.10. 2025 [Col. 262]

PRIVILEGE MOTIONS:

Legal Action by Private Company against Evidence Given at COPA [Col. 264]

APPROPRIATION BILL, 2026 - [First Allotted Day]:

Second Reading - Debate Adjourned [Cols.267-408]

ADJOURNMENT MOTION:

Suspension of Development Projects Approved by Mawanella Pradeshiya Sabha [Col. 408-421]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 421-424]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2025 නොවැම්බර් 08වන සෙනසුරාදා*
*2025 நவம்பர் 08, சனிக்கிழமை*
*Saturday, 08th November, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVIII, XX, XXI, XXII හා XXIII කොටස්, තෙවැනි කාණ්ඩයේ XV, XVI හා XVII කොටස් සහ නවවැනි කාණ්ඩයේ X, XI හා XII කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 සහ 2023 වර්ෂ සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2024 වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් රීති සහ නියෝගය ඉදිරිපත් කරමි.

(i) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2025 ඔක්තෝබර් 04 දින පනවන ලද රීති; සහ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) 2004 අංක 11 දරන මුදල් පනතේ 26 වගන්තිය සමඟ කියවිය යුතු 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය.

මෙම රීති සහ නියෝගය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

- 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 22 වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දැක්වීම සම්බන්ධයෙන් එවකට අධ්‍යාපන, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2024 නොවැම්බර් 29 දිනැති අංක 2412/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ
- 2025 අංක 3 දරන විසර්ජන පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව 2025.09.01 සිට 2025.09.30 දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වැය ශීර්ෂ අංක 240 යටතේ සංවර්ධන කටයුතු වැඩසටහනෙන් වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන.- [අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජාතික ඖෂධ නියාමන අධිකාරිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම 2024 වර්ෂය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ දකුණු පළාත් සභාව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2020 සහ 2021 වර්ෂ සඳහා බුද්ධශාසන අරමුදලේ වාර්ෂික වාර්තා;

(ii) 2024 වර්ෂය සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2024 වර්ෂය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, අනුරාධපුර, විජයපුර, අනුලාදේවි මාවත, අංක 932 යන ලිපිනයෙහි පදිංචි ඩී.ජී. සෝමරත්න මහතා සහ වෙනත් දහසය දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, කෝවිල්මෝට්ටෙයි ගොවි සංවිධානය වෙනුවෙන් මන්නාරම, මඩු, කෝවිල්මෝට්ටෙයි පෙරියපණ්ඩිවිරිච්චාන් බටහිර යන ලිපිනයෙහි පදිංචි ගුණරත්නම් ජූඩ් විමලරාජ් මහතා සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ඔෂානි උමංගා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)

ගරු කථානායකතුමනි, බුලත්සිංහල, පන්සල අසල, බෝතලේගම යන ලිපිනයේ පදිංචි ඩබ්ලිව්.ඒ. සමන් ප්‍රියංකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

ගරු කථානායකතුමනි, ඉංගිරිය, හෙට්ටියවත්ත, අංක 161/9/ ඒ1 යන ලිපිනයේ පදිංචි ගුරුගේ උපුල් චන්ද්‍රසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ආසියානු සංවර්ධන බැංකුවෙන් කොළඹ මහ නගර සභාව වෙත ලැබුණු ප්‍රදානය: විස්තර
### ஆசிய அபிவிருத்தி வங்கியால் கொழும்பு மாநகர சபைக்கு வழங்கப்பட்ட நிதி: விபரம்
### GRANT BY ASIAN DEVELOPMENT BANK TO COLOMBO MUNICIPAL COUNCIL: DETAILS

739/2025

**1. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කොළඹ නගරයේ මලාපවාහන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා කොළඹ මහ නගර සභාව වෙත ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද මුදල සහ එම මුදලෙන් මේ වනවිට භාවිත කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දෙන ලද මුදල්වලින් කොටසක් භාවිතයට නොගෙන කොළඹ මහ නගර සභාව විසින් තැන්පතුවක දමා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு நகரின் மலக்கழிவகற்றல் அமைப்பை மேம்படுத்துவதற்காக கொழும்பு மாநகர சபைக்கு ஆசிய அபிவிருத்தி வங்கியால் வழங்கப்பட்ட நிதி மற்றும் அந்நிதியில் இதுவரை பயன்படுத்தப்பட்டுள்ள தொகை என்பன வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) ஆசிய அபிவிருத்தி வங்கியால் வழங்கப்பட்ட நிதியில் ஒரு தொகை நிதி பயன்படுத்தப்படாமல் கொழும்பு மாநகர சபையால் வைப்பிலிடப் பட்டுள்ளமையை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், அந்நிதி எவ்வளவு என்பதையும்;

(iv) அது தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the amount that has been granted by the Asian Development Bank to the Colombo Municipal Council for the improvement of the sewerage system in the City of Colombo and the amount that has been utilized, out of the said grant by now, separately;

(ii) whether he is aware that a portion of the funds granted by the Asian Development Bank has not been utilized and has instead been deposited in an account by the Colombo Municipal Council;

(iii) if so, the said amount; and

(iv) the measures that will be taken in this regard?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

(අ) (i) කොළඹ නගරයේ මලාපවාහන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා කොළඹ මහා නගර සභාව වෙත ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය මුදල සහ එම මුදලෙන් මේ වන විට භාවිත කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් පහත පරිදි වේ.

ණය සංරචකය

| ණය මුදල් අංක | ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන | භාවිත කර ඇති මුදල රුපියල් |
|---|---|---|
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | | |
| OCR - 2557 | 80.00 | රුපියල් වටිනාකම රු. 12,252,570,646.95 (ඇමෙරිකානු ඩොලර් මිලියන 74.98) |
| ADF - 2558 | 14.37 | රුපියල් වටිනාකම රු. 1,394,407,698.88 (ඇමෙරිකානු ඩොලර් මිලියන 10.21) |
| මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන | | |
| ADF - 3030 | 8.00 | රුපියල් වටිනාකම රු. 1,757,929,866,70 (ඇමෙරිකානු ඩොලර් මිලියන 7.92) |
| ADF - 3348/3349 | 90.00 | රුපියල් වටිනාකම රු. 5,156,796,516,69 (ඇමෙරිකානු ඩොලර් මිලියන 26.53) |

* වියදම් කළ අගය ශ්‍රී ලංකා රුපියල් මඟින් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, එම වියදම් දැරීම වර්ෂ ගණනාවක් පුරා සිදුකර ඇති අතර, කාලයත් සමඟ විනිමය අනුපාත වෙනස්වීම මත වියදම් කළ මුදලෙහි දළ අගයක් ඇමෙරිකානු ඩොලර් මඟින් දක්වා ඇත.

(ii) ආසියානු සංවර්ධන බැංකුව විසින් උක්ත ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද මුදල්වලින් කොටසක් භාවිතයට නොගෙන කොළඹ මහ නගර සභාව විසින් කිසිදු තැන්පතුවක දමා නොමැත.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මෙම පිළිතුර ලබා දෙනකොට මම ඉක්මනින් ටයිප් කරගෙන එම මුදලේ වටිනාකම බැලුවා. ඒ අනුව, ඩොලර් මිලියන 178ක වාගේ ප්‍රමාණයක් තමයි ආසියානු සංවර්ධන බැංකුවෙන් අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලැබී තිබෙන්නේ කියන එක තමයි මට තහවුරු වුණේ.

ගරු ඇමතිතුමනි, අතිගරු ජනාධිපතිතුමා පසුගිය අය වැය ඉදිරිපත් කරනකොට රුපියල් බිලියන 13.6ක් අපජල කළමනාකරණය සඳහා වෙන් කරලා තිබුණා. ඒ වාගේම ආසියානු සංවර්ධන බැංකුවෙනුත් ඩොලර් මිලියන 178ක මුදලක් ලැබිලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එක්තරා මොහොතකදී අපේ සංචිතත් ඩොලර් මිලියන 200ක් දක්වා අඩු වෙච්ච යුගයක් තිබුණා. එතකොට, අපජලය සඳහා අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. මේ වසරෙත් රුපියල් බිලියන 2.5ක් බේරේ වැව ආශ්‍රිත අපජල කළමනාකරණය කිරීම සඳහා වෙන්කරලා තිබෙනවා.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. මෙච්චර මුදලක් වෙන් කරලාත් -මේ රටේ බදු ගෙවන ජනතාවගේ සල්ලි රුපියල් බිලියන 13.3ක් වෙන් කරලා, ඊට අමතරව අපට විදේශ ආධාර හැටියට ලැබුණු ඩොලර් මිලියන 178කුත් වියදම් කරලා- කොළඹ නගරයේ සිටින ජනතාවට අපජල කළමනාකරණය කිරීමට තවම නිසි ක්‍රමවේදයක් නැහැ. ඒ වාගේම වැසිකිළි කැසිකිළිවලින් එන ජරාව; අපද්‍රව්‍ය බැස යෑම කළමනාකරණය කරන්නත් නිසි ක්‍රමවේදයක් නැහැ. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව ගන්න ඉදිරි ක්‍රියාමාර්ගය මොකක්ද? මොකද, අපි එකම දෙයකට තමයි දිගින් දිගටම මුදල් වෙන් කරන්නේ, ගරු ඇමතිතුමනි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය නිවැරදියි.

මේ ප්‍රශ්නය අපි දකින්නේ මේ විධියට. මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය 2010 වර්ෂයේදී තමයි ආරම්භ කර තිබෙන්නේ. ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම් අත්සන් කර තිබෙන්නේ 2009 දෙසැම්බර් 18වැනි දා. ආසියානු සංවර්ධන බැංකුව මේ ව්‍යාපෘතියට අදාළ අරමුදල් සැපයීම 2023 ජූනි මස 30වන දිනෙන් අවසන් කර තිබෙනවා. අවසන් වූ ක්‍රියාවලිය ඇතුළේ 2023.06.30 දින වන විට ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත් 4ක් තිබුණා. එකක් තමයි, මෝදර උතුර හා වැල්ලවත්ත දකුණ මලාපවහන නළ පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව. ඒක සම්පූර්ණයෙන් අවසන් කර තිබෙනවා. අනෙක් එක තමයි, කොළඹ නගර සහා ප්‍රදේශය තුළ කිලෝමීටර 10ක අපජල නළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ කිලෝමීටර 125ක අපජල නළ මාර්ගවල තත්ත්වය තක්සේරු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව. ඒකත් සම්පූර්ණ කර තිබෙනවා. ඊළඟට, වනාතමුල්ල ගුරුත්වාකර්ෂණ අපවහන ජාලය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර තිබෙනවා. නමුත්, කොළඹ මහ නගර සීමාව තුළ පිහිටි අපජල ප්‍රවාහන පොම්පාගාර සැලසුම් කොට ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව අර්ධ වශයෙන් තමයි සම්පූර්ණ කර තිබෙන්නේ.

ඒ අතර සැපයුම් ගිවිසුම් දෙකක් තිබුණා. ජංගම ජෙට්න් සහ රික්තක ට්‍රක් රථ මෙහෙයුම් හා නඩත්තු උපකරණ සම්පූර්ණ කර තිබෙනවා. මෙහෙයුම් සහ නඩත්තු උපකරණ සම්පූර්ණ කර තිබෙනවා. ඒ අතර උපදේශන ගිවිසුම් දෙකක් තිබුණා. සැලසුම් අධීක්ෂණය හා කළමනාකරණය සම්පූර්ණ කර තිබෙනවා. සැලසුම් අධීක්ෂණය සහ කළමනාකරණයේ දෙවැනි උපදේශන ගිවිසුමත් සම්පූර්ණ කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට, විශාල පිරිවැයක් දරලාත් මේ වැඩකටයුතු අවසාන කර ගැනීමට නොහැකි වීම පිළිබඳව අප ඉදිරියේ ගැටලුවක් තිබෙනවා. ඒ වාගේම මෙහි

දෙවැනි කොටස වන මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන 2016 වර්ෂයේදී තමයි ආරම්භ කර තිබෙන්නේ. ණය ගිවිසුම් අත්සන් කර තිබෙන්නේ 2014 වර්ෂයේදී.

ඒ වාගේම ණය ගිවිසුම්වලට අදාළ අරමුදල් සැපයීම 2022 ඔක්තෝබර් 24 දිනෙන් අවසාන වෙලා තිබෙනවා. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේත් ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත්තු තුනක් තිබුණා. භූ තාක්ෂණික පරීක්ෂණ සිදු කර තිබෙනවා. කිලෝමීටර 24ක විවෘත කැපුම් තිරස් දිශානුගත කැණීම් සහ ක්ෂුද්‍ර උමං මාර්ග නළ එළීමේ කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව අවසන් කරලා තිබෙනවා.

කිරුළපන මලාපවහන පද්ධතිය සහ පොම්පාගාර ඉදිකිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව අර්ධ වශයෙන් අවසන් වෙලා තිබෙන්නේ. වැල්ලවත්ත අපජල පවිත්‍රාගාර කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය අවබෝධය මත අවසන් කරලා තිබෙනවා. උපදේශන ගිවිසුමක් තිබුණා. ඒක සම්පූර්ණ කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, නමුත් මේ ව්‍යාපෘති දෙකේදීම සමහර කොටස් අවසන් කර ගන්න බැරි වෙච්ච ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා තවමත් අපට මේ සඳහා විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, සෞඛ්‍ය සම්පන්නව ජීවත් වෙන්න තමයි මේ රටේ සිටින හැමෝම උත්සාහ ගන්නේ. ඔවුන්ට ඒ අවස්ථාව සලසා දීම තමයි රජයේ වගකීම විය යුත්තේත්. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් අපේ රටේ ජනතාවට ලබා දෙන්න අවශ්‍යයි. උදාහරණයක් විධියට, කොළඹ 5, කොළඹ 6 වාගේ ප්‍රදේශවලත් මේ සඳහා නිසි ක්‍රමවේදයක් නැහැ. අපි කොළඹ 7ට කියන්නේ "සුපිරි ප්‍රදේශ" කියලා නේ. නමුත් අප ජලය, එහෙම නැත්නම් මේ ගලි connect කරලා ඒවා ගෙන යෑමේ නිසි ක්‍රියාමාර්ගයක් තවම කොළඹ 5 ප්‍රදේශයේත් වෙන්නේ නැහැ. මම ඒක ඔබතුමාට කියන්නේ බොහොම වගකීමෙනුයි. විශේෂයෙන්ම ගත්තොත්, ජරාව අරගෙන යනවා, නමුත් ඒ නිවාස හිමියෝ ඒ ආයතනවලට ඒ කටයුතු සඳහා පෞද්ගලිකව කීයක් ගෙවන්න ඕනෑද කියලා මම දන්නේ නැහැ. නමුත් නිසි පද්ධතියක් ඒ වෙනුවෙන් මේ මොහොතේත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ, අවම වශයෙන් ගත්තොත් කොළඹ 7 ප්‍රදේශය ආශ්‍රිතව තිබෙන නිවාසවල.

ගරු ඇමතිතුමනි, පළාත් පාලන ආයතනවලට අදාළ වන තවත් කාරණයක් තමයි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ. මොකද, කොළඹ නගරයේ දිනකට මෙට්‍රික් ටොන් 600කට ආසන්න කැළි කසළ ප්‍රමාණයක් එකතු වෙනවා. මේ එකතු වන කැළි කසළ ගිහිල්ලා දමන්නේ මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ තිබෙන වත්තල ආසනයේ කැළි කසළ අංගණයට. දැන් එතැන කැළි කසළ ගොඩගැහිලා තිබෙනවා. අපි කටුනායක අධිවේගී මාර්ගයේ - expressway එකේ - යනකොටත් ඒ දුගඳ පැහැදිලිව දැනෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා වත්තල ප්‍රදේශයේ ජනතාවට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකට මැදිහත් වෙලා එක්කෝ මේ අපද්‍රව්‍ය recycle කරන්න කියලායි. විශේෂයෙන්ම මේ වැසි කාල සීමාව තුළ මුතුරාජවෙල ආශ්‍රිත සමස්ත ප්‍රදේශයේම මේ කුණු දිය වෙලා ඒවායේ තිබෙන විස ජලයට එකතු වෙලා ඒ පළාතේ ජීවත් වන ජනතාවගේ ජීවිතවලට හානි වෙලා තිබෙනවා, සෞඛ්‍යයට හානි වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ තුළින් දැඩි දුගඳක් හමනවා. ඒ මිනිස්සුන්ට දැන් ඒ පළාතේ ජීවත් වන්න බැහැ. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා. මොකද දිනකට කුණු මෙට්‍රික් ටොන් 600ක් එක තැනකට ගිහිල්ලා දමනකොට අර මීතොටමුල්ලට වෙච්ච දේ තමයි එතැනටත් වෙන්නේ. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම මම කරනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
**(**The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරපු කාරණය නිවැරදියි. මම හිතන විධියට, කොළඹ මහ නගර සභාව ආරම්භ කරලා අවුරුදු 100කට වැඩියි. එදා සිට ගොඩගැසුණු ප්‍රශ්න විසඳන්නේ නැතුව තිබිලා දැන් අපි ඒවා විසඳන්න පටන්ගෙන තිබෙනවා. ඒ අනුව 2027.12.31 දින වන විට අපි කලින් සඳහන් කරපු ව්‍යාපෘති දෙකට අදාළ සියලු කටයුතු අවසන් කරනවා.

ගරු මන්ත්‍රීතුමා මතු කරපු අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ප්‍රශ්නය විසඳීම සඳහා අපි මේ වනවිට අවශ්‍ය මූලික කටයුතු කරමින් පවතිනවා.

## 2020 සිට සිදුවන සමූහ ප්‍රචණ්ඩ ක්‍රියා: විස්තර

2020 முதல் நடைபெற்ற கும்பல் வன்முறைச் சம்பவங்கள் : விபரம்

MOB VIOLENCE INCIDENTS SINCE 2020: DETAILS

1010/2025

**2. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා සෑම වර්ෂයකදීම ශ්‍රී ලංකා පොලිසිය වෙත වාර්තා වී ඇති සමූහ ප්‍රචණ්ඩ ක්‍රියා හෝ කල්ලි විසින් නීති විරෝධී ලෙස මරණ දඬුවමට ලක් කිරීම් සංඛ්‍යාව සහ දණ්ඩ නීති සංග්‍රහය හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ හෝ මහජන ආරක්ෂාව සම්බන්ධ නීති යටතේ පවරා ඇති නඩු සංඛ්‍යාව, එක් එක් පළාත් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලිසිය සහ පළාත් පරිපාලනය වෙත නිකුත් කරන ලද කවර හෝ නියෝගද ඇතුළුව, සියලුම පළාත් තුළ සමූහ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධ නීති සහ නීතිමය ක්‍රියා පටිපාටි ඒකාකාර ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) අමාත්‍යාංශය විසින් සමූහ ප්‍රචණ්ඩ ක්‍රියා ඇති විය හැකි කිසියම් අධි අවදානම් දිස්ත්‍රික්ක හෝ ප්‍රදේශ හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එවැනි දිස්ත්‍රික්කවල/ප්‍රදේශවල අනාගතයේදී සමූහ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීම සඳහා කර ඇති මැදිහත්වීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

[ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා]

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டு முதல் இற்றைவரை, கும்பல் வன்முறை அல்லது கும்பல் கொலைச் சம்பவங்கள் தொடர்பாக ஒவ்வோர் ஆண்டும் இலங்கைப் பொலிஸில் பதிவுசெய்யப்பட்டுள்ள சம்பவங்களின் மொத்த எண்ணிக்கை யாதென்பதையும் தண்டனைச் சட்டக் கோவையின்கீழ் அல்லது நடைமுறையிலுள்ள பயங்கரவாதத் தடுப்பு அல்லது பொதுமக்கள் பாதுகாப்புத் தொடர்பான சட்டங்களின்கீழ் வழக்குத் தொடரப்பட்ட வழக்குகளின் எண்ணிக்கை யாதென்பதையும், மாகாண ரீதியாக வெவ்வேறாகவும்;

(ii) கும்பல் வன்முறை தொடர்பாக, இலங்கைப் பொலிஸாருக்கும் உள்ளூர் நிருவாகத்துக்கும் வழங்கப்பட்ட ஏதேனும் பணிப்புரைகள் உள்ளடங்கலாக அனைத்து மாகாணங்களிலும் சட்டங்களையும் சட்டச் செயன்முறைகளையும் சமச்சீராக அமுல்படுத்துவதை உறுதிப்படுத்த எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாதென்பதையும்;

(iii) கும்பல் வன்முறையால் பாதிக்கப்படக்கூடிய உயர் அபாயநேர்வுடைய ஏதாவது மாவட்டங்களை அல்லது பிரதேசங்களை அமைச்சு அடையாளம் கண்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின், அத்தகைய மாவட்டங்களில்/ பிரதேசங்களில் எதிர்காலத்தில் கும்பல் வன்முறைச் சம்பவங்களைத் தடுப்பதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the total number of mob violence or mob-lynching incidents reported to the Sri Lanka Police and the number of cases prosecuted under the Penal Code or prevention of terrorism or public security-related laws in each year since 2020 to date, separately provincial-wise;

(ii) the steps taken to ensure uniform implementation of laws and legal procedures concerning mob violence across all provinces, including any directives issued to the Sri Lanka Police and local administration;

(iii) whether the Ministry has identified any high -risk districts or areas vulnerable to mob violence; and

(iv) if so, the interventions undertaken in such districts/areas to prevent future incidents of mob violance?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| පළාත | 2020 | | 2021 | | 2022 | | 2023 | | 2024 | | 2025 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මනුෂ්‍ය ඝාතන ගණන | නඩු පැවරූ ගණන | මනුෂ්‍ය ඝාතන ගණන | නඩු පැවරූ ගණන | මනුෂ්‍ය ඝාතන ගණන | නඩු පැවරූ ගණන | මනුෂ්‍ය ඝාතන ගණන | නඩු පැවරූ ගණන | මනුෂ්‍ය ඝාතන ගණන | නඩු පැවරූ ගණන | මනුෂ්‍ය ඝාතන ගණන | නඩු පැවරූ ගණන |
| උතුරු මැද | 7 | 5 | 6 | 6 | 7 | 7 | 7 | 5 | 9 | 4 | 4 | 2 |
| බස්නාහිර | 33 | 16 | 36 | 26 | 64 | 30 | 56 | 22 | 51 | 19 | 51 | 8 |
| දකුණ | 27 | 22 | 33 | 20 | 45 | 22 | 38 | 14 | 43 | 19 | 26 | 5 |
| මධ්‍යම | 9 | 8 | 10 | 7 | 11 | 8 | 17 | 8 | 13 | 7 | 4 | 0 |
| උතුරු | 8 | 4 | 20 | 10 | 11 | 7 | 22 | 9 | 12 | 9 | 11 | 2 |
| නැගෙනහිර | 11 | 9 | 12 | 8 | 6 | 4 | 3 | 3 | 14 | 3 | 9 | 2 |
| සබරගමුව | 11 | 9 | 14 | 12 | 18 | 13 | 19 | 11 | 16 | 7 | 17 | 2 |
| වයඹ | 4 | 4 | 15 | 15 | 13 | 11 | 12 | 9 | 13 | 5 | 16 | 5 |
| ඌව | 10 | 7 | 8 | 4 | 2 | 0 | 6 | 6 | 9 | 3 | 7 | 2 |
| **එකතුව** | **120** | **84** | **154** | **108** | **177** | **102** | **180** | **87** | **180** | **76** | **145** | **28** |

(ii) සමස්ත දිවයින පුරා නීති හා නීතිය ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය ඒකාකාරීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති, නියෝග, උපදෙස් හා මඟ පෙන්වීම් සඳහා විධිවිධාන, පොලිස් ආඥාපනත, පොලිස් දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පති චක්‍රලේඛ මඟින් සලස්වා ඇත.

(iii) ඔව්.

සංවිධානාත්මක අපරාධ කල්ලි හා සමූහ ප්‍රචණ්ඩ ක්‍රියා බස්නාහිර හා දකුණු පළාත තුළ බහුල වශයෙන් වාර්තා වන බවට හඳුනා ගෙන ඇත.

- බස්නාහිර පළාතෙහි

  කොළඹ උතුර, නුගේගොඩ, ගම්පහ යන පොලිස් කොට්ඨාසයන්හිද,

- දකුණු පළාතෙහි

  ඇල්පිටිය, තංගල්ල, ගාල්ල හා මාතර යන පොලිස් කොට්ඨාසයන් තුළ ද එවැනි අපරාධ සෙසු පොලිස් කොට්ඨාසයන්ට සාපේක්ෂව වැඩි අගයක් ගන්නා බව සංඛ්‍යා දත්ත පරීක්ෂා කිරීමේ දී අනාවරණය වී ඇත.

(iv) • බුද්ධි නිලධාරීන් හා පෞද්ගලික ඔත්තුකරුවන් මඟින් පොලිස් වසම් තුළ සංවිධානාත්මක අපරාධකරුවන් සිටින්නේ ද යන්න හා අපරාධ සිදු කිරීම සඳහා සැලසුම් සකසන්නේ ද යන්න පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

- දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවන් හා අපරාධ සඳහා සිරගතව සිට නිදහස ලබා පැමිණි අය පිළිබඳව අධීක්ෂණය හා පසු විපරම් සිදු කිරීම.
- මහජනතාව, පාසල් ළමුන් පවතින අපරාධ පිළිබඳව දේශන මඟින් දැනුවත් කිරීම.
- පොලිස් වසම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ජංගම සංචාර, පාමුර සංචාර, යතුරුපැදි සංචාර, පාපැදි සංචාර හා මාණ්ඩලික සංචාර දිවා රාත්‍රී යොදවමින් අහඹු ලෙස නිවාස හා පුද්ගලයින් පරීක්ෂාවට ලක් කිරීම.

  දැනට වාර්තා වී ඇති අපරාධයන්වලට අදාළව සැකකරුවන් අනාවරණය කර අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම හා ඒ සඳහා විශේෂ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.
- දිවයින තුළ අපරාධ සිදු කර විදේශගතව සිටින සැකකරුවන්ට එරෙහිව ජාත්‍යන්තර රතු නිවේදන ලබා ගනිමින් ඔවුන් අත්අඩංගුවට ගැනීම හා විදෙස්ගතව සැඟව සිට අපරාධ මෙහෙයවන්නන් අත්අඩංගුවට ගෙන දිවයිනට රැගෙන ඒම.
- විදෙස්ගතව සිට රැගෙන එන හා මෙරටදී අත්අඩංගුවට ගන්නා සැකකරුවන්ගෙන් අනාවරණය කරගන්නා තොරතුරු මඟින් ගිනි අවි, මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම හා ඉදිරියේදී සිදු කිරීමට නියමිතව සිටි අපරාධ වළක්වා ගැනීම.
- අපරාධ සිදුකර පලා යන සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ක්ෂණික ප්‍රහාරක යතුරු පැදි ඒකක කොට්ඨාස මට්ටමින් ස්ථාපිත කිරීම.
- අපරාධ සිදුකර පලා යන සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක කළ යුතු හදිසි ආරක්ෂක සැලසුම් පොලිස් ස්ථාන කොට්ඨාස මට්ටමින් සකස්කොට පෙර පුහුණුවීම් පවත්වා නිලධාරීන් සූදානම් කර තැබීම.
- සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධතා පවත්වනු ලබන දූෂිත නිලධාරීන් හඳුනා ගැනීම සහ ඔවුන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම මෙන්ම එවැනි නිලධාරීන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට බුද්ධි අංශ ක්‍රියාත්මක කිරීම.
- අපරාධයකට අදාළව සැකකරුවෙකු අත්අඩංගුවට ගත් වහාම විමර්ශන අවසන් කර සැකකරුවන්ට විරුද්ධව චෝදනා පත්‍ර ගොනු කර ඔවුන් වැරදිකරුවන් කිරීමට අවශ්‍ය අධිකරණ ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීම.
- නීතිපතිතුමා වෙත යොමු කරන ලද ගොනුවලට අදාළව කඩිනමින් උපදෙස් ලබා ගැනීමට හැකි වන පරිදි නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය වී කටයුතු කිරීම.
- සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් හා ජාවාරම්කරුවන් නීති විරෝධී ලෙස උපයා ගන්නා දේපළ පිළිබඳ විමර්ශනය කිරීම.
- පොලිස් වසම් තුළ පිහිටුවා ඇති විවිධ කර්මාන්තයන්වල නියැළෙන පුද්ගලයන්, පිටස්තර පුද්ගලයන් පිළිබඳව තොරතුරු එක් රැස් කිරීම හා නිතර සෝදිසි කර සැක සහිත පුද්ගලයන් සම්බන්ධව පියවර ගැනීම.
- අපරාධකරුවන් හා අපරාධවලට සම්බන්ධ අයවලුන් නීති විරෝධී ලෙස මුහුදු මඟින් පලායෑම් සහ පැමිණීම් පිළිබඳව ප්‍රදේශයේ ධීවර වරායන්, බහුදින ධීවර යාත්‍රා ආදිය සෝදිසි කිරීම. බුද්ධි තොරතුරු ලබා ගැනීම, වැටලීම් සහ මෙහෙයුම්වලදී ඒ සම්බන්ධ අවධානය යොමු කර පරීක්ෂාවන් සිදු කිරීම.
- අපරාධකරුවන්ගේ තර්ජනවලට ලක්ව සිටින පුද්ගලයන් සම්බන්ධව බුද්ධි අංශ මඟින් තොරතුරු අනාවරණය කරගෙන එම අයවලුන්ට දැනුම් දී, ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- සංවිධානාත්මක අපරාධකරුවන් පිළිබඳව හා ඇඟිලි සලකුණු පිළිබඳව දත්ත පද්ධති පවත්වාගෙන යාම.
- බන්ධනාගාරගත රැඳවියන් බැලීමට පැමිණෙන පුද්ගලයන් පිළිබඳව සහ බන්ධනාගාර අවට ආරක්ෂාව පිළිබඳව වෙනම පොලිස් නිලධාරීන් යොදවා පසු විපරම් කිරීම හා ශ්‍රී ලංකා පොලීසිය සහ බන්ධනාගාරය එක්ව සතිපතා සාකච්ඡා පැවැත්වීම මඟින් බන්ධනාගාර ආශ්‍රිත අපරාධ මැඩලීමට පියවර ගැනීම.
- බන්ධනාගාර තුළින් සොයා ගන්නා ජංගම දුරකථන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ බුද්ධි අංශ මඟින් විශ්ලේෂණය කර තොරතුරු ලබා ගැනීම.
- Border Risk Assessment Centre - BRAC - වැනි ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීම.
- සෑම පළාතකටම අපරාධ විමර්ශනය සඳහා දිසා අපරාධ කොට්ඨාස ස්ථාපිත කිරීම සහ ඉදිරියේදී ඒවායේ විමර්ශන ආරම්භ කිරීම.

  කොළඹ දිසා අපරාධ කොට්ඨාසය - CCD

  බස්නාහිර උතුර අපරාධ කොට්ඨාසය

  බස්නාහිර දකුණ අපරාධ කොට්ඨාසය

  මාතර දිසා අපරාධ කොට්ඨාසය

  කළුතර දිසා අපරාධ කොට්ඨාසය

  මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය

(ආ) පැන නොනඟී.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, தற்போது நாடளாவிய ரீதியில் போதைப்பொருள் பாவனையைக் கட்டுப்படுத்துவதற்கும் குற்றங்களை ஒழிப்பதற்கும் மாண்புமிகு சனாதிபதி அவர்கள் எடுத்திருக்கின்ற

[ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා]

நடவடிக்கைகள் தொடர்பில் மக்கள் மகிழ்ச்சி அடைவதுடன், நம்பிக்கையையும் வெளியிட்டு இருக்கின்றார்கள். இருந்தபோதிலும், யாழ்ப்பாணத்தில் இரண்டு - மூன்று தினங்களுக்கு முன்னர், குறிப்பாக திருநெல்வேலி மற்றும் கொக்குவில் சந்தைகளில் போதைப்பொருள் சார்ந்த கும்பல்கள் அடாவடிகளைச் செய்திருக்கின்றன. இவர்கள் இந்தச் சந்தைக்கு வந்த மக்களைத் துன்புறுத்தி இருக்கிறார்கள்; தாக்கி இருக்கிறார்கள். இதுபோன்ற குற்றச்செயல்களில் ஈடுபடுகின்றவர்கள் கூடுதலாகப் போதைப்பொருளை விற்று, அதன்மூலம் வருகின்ற பணத்தை அதிக வட்டிக்குக் கொடுத்துவிட்டு, வட்டிப் பணத்தைப் பெறுவதற்காகப் பல்வேறுபட்ட பாரிய குற்றச்செயல்களில் ஈடுபட்டு வருகின்றார்கள். இது அண்மையில் பத்திரிகையில் வெளிந்த ஒரு செய்தி! இப்படியான சம்பவங்களை யாழ்ப்பாண மாவட்டத்தில் கட்டுப்படுத்த வேண்டும். அது தொடர்பான நடவடிக்கைகள் என்ன? என நான் கேட்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්නම්. විශේෂයෙන් අපි මෑතකදී ස්ථාපිත කළා, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ විමර්ශන කොට්ඨාසය. ඒ හරහාත් විශේෂයෙන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වාගේම වෙනත් අපරාධ හරහා උත්පාදනය කරන දේ පිළිබඳව විමර්ශන සිදු කරනු ලබනවා. ඒ අනුව ඔබතුමා කියූ පරිදි, යාපනය සම්බන්ධයෙනුත් අපි විශේෂ අවධානයක් යොමු කරලා ඒ කටයුතුවලට මැදිහත් වීමක් සිදු කරන්නම්.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

## අම්පාර, බ්‍රයන්තුරේ කණ්ඩම් ගඟ සහ හැඩ ඔය හරහා පාලම් ඉදිකිරීම: වර්තමාන තත්ත්වය
## அம்பாறை பிரேம் கண்ட ஆறு மற்றும் ஹெட ஓயாவுக்குக் குறுக்காகப் பாலம் அமைத்தல்: தற்போதைய நிலை
## CONSTRUCTION OF BRIDGES ACROSS BRYANTHURAI KANDAM RIVER AND HEDA OYA IN AMPARA: CURRENT STATUS

1212/2025

**3. ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බ්‍රයන්තුරේ කණ්ඩම් ගඟ හරහා පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ හැඩ ඔය පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය පසුගිය රජය විසින් ආරම්භ කරන ලද බවත්;

(ii) මේ වනවිට එම පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිවල වැඩ කටයුතු අතරමග නවතා ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත පාලම් දෙකේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එම පාලම් දෙක ඉදිකිරීමේ ව්‍යාපෘති විශේෂ සංවර්ධන වැඩසටහනට ඇතුළත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தில் பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில், பிரேம் கண்ட ஆற்றின் குறுக்காகப் பாலம் அமைக்கும் கருத்திட்டமும் ஹெட ஓயா ஆற்றின் குறுக்காகப் பாலம் அமைக்கும் கருத்திட்டமும் கடந்த அரசாங்கத்தால் ஆரம்பிக்கப்பட்டன என்பதையும்;

(ii) இன்றளவில் மேற்படி பாலங்களை நிர்மாணிக்கும் கருத்திட்டங்களின் பணிகள் இடைநடுவில் நிறுத்தப்பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி இரண்டு பாலங்களின் நிர்மாணப் பணிகளை மீண்டும் ஆரம்பிக்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) அந்த இரண்டு பாலங்களை நிர்மாணிக்கும் பணிகளை விசேட அபிவிருத்திக் கருத்திட்டத்தில் சேர்க்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Is he aware that -

(i) the project to construct a bridge across the Bryanthurai Kandam River in the Pottuvil Divisional Secretary's Division of the Ampara District as well as the project to construct the Heda Oya Bridge were initiated by the previous Government; and

(ii) the construction work of the projects to construct those bridges has been stopped halfway by now ?

(b) Will he inform this House whether-

(i) steps have been taken to resume the construction work of the aforesaid two bridges; and

(ii) steps will be taken to include the projects of constructing the aforesaid two bridges in the Special Development Programme?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)
- මෙම පාලම් දෙක මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගයක පිහිටා ඇති අතර, 2013 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සැලසුම් කර ඇස්තමේන්තු සකස් කර ඇත.
- ඒ අනුව, මෙම පාලම් දෙක ඉදිකිරීම සඳහා 2014.12.01 දින ලංසු කැඳවා 2014.12.23 දින ලංසුපත් විවෘත කර ඇති අතර, එම පාලම ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් කොන්ත්‍රාත් පිරිනමා නොමැත.

(ii) ඔව්.
- හැඩ ඔය හරහා ආතිමුනේ පාලම අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රාමීය පාලම් වැඩසටහන යටතේ 2021දී ඉදිකිරීමට යෝජනා කර තිබූ අතර, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව - SD & CC - කොන්ත්‍රාත්කරු විය.
- 2021/2022 වසරවලදී රට තුළ ආර්ථික අර්බුද පැවති වකවානුවේ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව - SD & CC ආයතනය - විසින් අදාළ කටයුතු නතර කර ඇත.
- බ්‍රයන්තුරේ කණ්ඩම් ගහ හරහා යෝජිත පාලම ඉදිකිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පියවර ගෙන නොමැත.
  ගරු කථානායකතුමනි, එම පාර මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරක් නොවෙයි.

(ආ) (i) ඔව්.
හැඩ ඔය හරහා ආතිමුනේ පාලම නැවත ආරම්භ කිරීමට පියවර ගෙන තිබේ.

(ii)
- හැඩ ඔය හරහා ආතිමුනේ පාලම නැවත මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සැලසුම් කිරීම හා ටෙන්ඩර් කිරීමට තීරණය කර ඇත.
- මෙය 2026 වර්ෂය මුලදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.
- එහෙත් බ්‍රයන්තුරේ කණ්ඩම් ගහ හරහා වන පාලම ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරියෙහි ඉදිරි සැලසුම්වලට ඇතුළත්ව නොමැත.

(ඇ) බ්‍රයන්තුරේ කණ්ඩම් ගහ හරහා යෝජිත පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඇතුළත් කිරීම සම්බන්ධයෙන් මෙතෙක් තීරණය කර නොමැත.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களே, பொத்துவில் பிரதேச மக்களுக்கு மிகவும் தேவையாக இருக்கின்ற 'பிரேம் கண்ட' ஆற்றுக்குக் குறுக்கான பாலத்தை அமைப்பதற்கு அப்போதைய அரசாங்கம் வீதி அபிவிருத்தி அதிகாரசபையால் அல்ல, நெடுஞ்சாலைகள் அமைச்சின் ஊடாகத்தான் tenders call பண்ணியது. அப்பாலத்தை அமைப்பதற்கு soil report எடுப்பதற்காக நெடுஞ்சாலைகள் அமைச்சு 4 மில்லியன் ரூபாயைச் செலவு செய்து இருக்கிறது என்றே நான் நினைக்கின்றேன். மண் ஆய்வு செய்யப்பட்டு, ஒப்பந்தக்காரர்கள் பாலத்தை அமைக்கும் வேலைகளை ஆரம்பிக்கும் வேளையில்தான் பொருளாதார நெருக்கடி ஏற்பட்டது. அதன் காரணமாக அந்தப் பாலம் அமைக்கும் பணி தடைப்பட்டது. அதற்குப் பின்னர் வந்த அரசாங்கங்களும் அந்தப் பாலத்தை அமைக்கின்ற விடயத்தில் பொத்துவில் பிரதேச ஏழை மக்களை ஏமாற்றியிருக்கின்றன.

இந்தப் பால நிர்மாணிப்புக்காக அதிகளவு பணத்தை நெடுஞ்சாலைகள் அமைச்சு செலவு செய்திருக்கிறது. அண்மையில் நீங்கள் அம்பாறை மாவட்டத்துக்கு வருகைதந்தபோது, அங்குள்ள நிறைய பாதைகளை அபிவிருத்தி செய்வதற்கு நிதி ஒதுக்கினீர்கள். அதற்காக நான் உங்களுக்கு நன்றி சொல்கின்றேன். பொத்துவில் பிரதேச மக்களின் நன்மை கருதி இந்த இரண்டு பாலங்களையும் நீங்கள் அமைத்துத் தர வேண்டும். ஏனெனில், அந்தப் பிரதேசங்களிலுள்ள விவசாயிகளும் மக்களும் கம்பியால் ஒரு பாலம் அமைத்துத்தான் பசளையையும் நெல்லையையும் ஆற்றின் மறுபக்கம் கொண்டு செல்கிறார்கள். எனவே, நீங்கள் இந்தப் பாலத்தை கிராமியப் பாலங்கள் அபிவிருத்தித் திட்டத்தில் உள்வாங்குவீர்களா? எனக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම පිළිතුරේදී කිව්වා මන්ත්‍රීතුමා අහන ප්‍රශ්න දෙකෙන් හැඩ ඔය ආතිමුනේ පාලම නැවත ඉදිකිරීමට මුදල් වෙන් කර තිබෙනවා කියලා. එය 2026 වර්ෂයේදී කරනවා. නමුත් මෙහි පසුබිම මම කියන්න ඕනෑ. මේ පාලම් දෙකම RDA එකට අයිති ඒවා නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නැඟෙනහිර පළාත් සභාවේ මහාමාර්ග අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරලා තිබෙනවා. ඔබතුමා ජනතාවගේ අවශ්‍යතාව මත මේ සඳහා ටෙන්ඩර් කැඳවන්න යෝජනා කරලා තිබෙනවා. නමුත් ගරු කථානායකතුමනි, 2014දී ඒවා කළාට Transport, Highways and Urban Development Ministry එකට වුණත් එහෙම බලයක් නැහැ. මොකද, ඒ පාර අයිති පළාත් සභාවට. ඒ නිසා මට මේ සම්බන්ධව දෙන්න තිබෙන පිළිතුර මෙයයි. බ්‍රයන්තුරේ පාලමට යන වියදම කොපමණද කියලා මම දන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා rural bridges යටතේ මේක අනුමත කරලා එවන්න පුළුවන් නම් අපට ප්‍රශ්නයක් නැහැ. අපි 2026 වර්ෂයට ග්‍රාමීය මාර්ග හදන්න රුපියල් බිලියන 26ක් වෙන් කරලා තිබෙනවා.

ඊට අමතරව, අම්පාර දිස්ත්‍රික්කයේ කාර්තිව් පාරේ පාලමට රුපියල් මිලියන 300ක්, පල්ලම්ඔය පාරේ පාලමට රුපියල් මිලියන 250ක්, කුඹුක්කන පාරේ පාලමට රුපියල් මිලියන 275ක්, පදියතලාව පාරේ පාලමට රුපියල් මිලියන 75ක් යනාදි වශයෙන් රුපියල් මිලියන 600කුත්, තවත් රුපියල් මිලියන 900කුත් වෙන් කරලා තිබෙනවා. ඔබතුමා කියන කාරණය සම්බන්ධයෙන් කියනවා නම්, ඒක RDA එකට අයිති නැති නිසා මට බලයක් නැහැ, ඒකට අපෙන් මුදල් වෙන් කරන්න. නමුත් ඔබතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා සමඟ මේ ගැන සාකච්ඡා කරලා අනුමත කරලා එව්වොත්, අපි හදන්නම්.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களே, அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழு ஊடாக அது தொடர்பான சிபாரிசுகளைத் தருகிறேன். நன்றி!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1467/2025- (1), ගරු වානක මාදුගොඩ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කොවිඩ් වසංගතය පැවති කාලයේ මහ ජනතාවට ලබා දුන් මූල්‍ය ආධාර: යොදාගත් අරමුදල්
## கொவிட் பெருந்தொற்று நிலவிய காலப்பகுதியில் மக்களுக்கு வழங்கப்பட்ட நிதி உதவி: பயன்படுத்திய நிதி
## FINANCIAL ASSISTANCE PROVIDED TO PUBLIC DURING COVID PANDEMIC: FUNDS UTILIZED

1492/2025

**5. ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය පැවැති සමයේදී ජනතාවට ලබා දෙන ලද මුළු මූල්‍යමය ආධාරවල වටිනාකම කොපමණද;

(ii) ඉහත සඳහන් මූල්‍යමය ආධාර ලබා දීම සඳහා සමෘද්ධි සංවර්ධන අරමුදලේ මුදල් භාවිත කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) එම මුදල නැවත පියවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் கொவிட்-19 பெருந்தொற்று நிலவிய காலப்பகுதியில் மக்களுக்கு வழங்கப்பட்ட நிதி உதவிகளின் மொத்தப் பெறுமதி யாது என்பதையும்;

(ii) மேற்படி நிதி உதவியை வழங்குவதற்கு சமுர்த்தி அபிவிருத்தி நிதியத்தின் நிதி பயன்படுத்தப்பட்டதா என்பதையும்;

(iii) ஆமெனில், அந்நிதித் தொகை யாது என்பதையும்;

(iv) அந்நிதித் தொகை மீளச் செலுத்தப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -

(i) the total value of financial assistance provided to the public during the COVID-19 pandemic in Sri Lanka;

(ii) whether the Samurdhi Development Fund was utilized to provide the said financial assistance;

(iii) if so, the amount; and

(iv) whether the sum mentioned above has been settled?

(b) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2020 සහ 2021 වසරවල විශේෂයෙන් කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූවන්ට ලබා දුන් මුළු මූල්‍ය ආධාර පිළිබඳ තොරතුරු වර්තමාන ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය සතුව නැහැ. නමුත් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දුන් මුදල් පිළිබඳව මම මේ ගරු සභාවට වාර්තා කරනවා.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් රුපියල් මිලියන 58,760ක මුදලක් මේ වෙනුවෙන් වැය කර තිබෙනවා.

(ii) "සමෘද්ධි සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පිහිටුවා නොමැත. එවකට පැවැති ශ්‍රී ලංකා සමෘද්ධි සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යන ලද හා දෙපාර්තමේන්තුගත වීමෙන් පසු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින "සමෘද්ධි අරමුදලේ" මුදල් ද ඉහත කාර්යය සඳහා භාවිත කර නැහැ. නමුත්, 2020 සහ 2021 වර්ෂයන්හි කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත්වූවන්හට සමාජ ප්‍රතිලාභ ගෙවීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කර තිබෙනවා. ඒ සඳහා පහත පරිදි මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබෙනවා. කාණ්ඩ තුනක් යටතේයි එය සඳහන්ව තිබෙන්නේ.

| ණය ලබා ගත් ආයතනය | 2020 වර්ෂය (රු. බිලියන) | 2021 වර්ෂය (රු. බිලියන) | එකතුව (රු. බිලියන) |
|---|---|---|---|
| මහා භාණ්ඩාගාරය විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථාවර තැන්පතු ඇපයට තබා ලංකා බැංකුවෙන් ලබා ගත් මුදල | 8.00 | 8.00 | 16.00 |
| මහා භාණ්ඩාගාරය විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථාවර තැන්පතු ඇපයට තබා මහජන බැංකුවෙන් ලබා ගත් මුදල | 8.00 | 6.00 | 14.00 |
| මහා භාණ්ඩාගාරය විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙතින් ලබා ගත් මුදල | 28.76 | - | 28.76 |
| මුළු එකතුව | 58.76 | | |

(iii) මා කලින් කිව්වා වාගේ, ඒ අනුව සමස්ත මුදල ආසන්න වශයෙන් රුපියල් බිලියන 58.76ක්.

(iv) ගරු කථානායකතුමනි, මේ ලබා ගත් මුදල් 2020 සහ 2021 වර්ෂවල තමයි ලබාගෙන තිබෙන්නේ.

ලංකා බැංකුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තැන්පතු ඇපයට තබා ලබා ගත් මුදල් ගෙවා තිබෙනවා පොලියත් සමඟ. ඒ වාගේම, මහජන බැංකුවේ මුදලුත් ගෙවා

තිබෙනවා. නමුත්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි ප්‍රතිලාභින්ගේ දායකත්ව මුදලින් - ක්ෂුද්‍ර මූල්‍ය මුදලින් - ලබා ගත් මුදල් 2020 අප්‍රේල් මාසයේ 08වැනි දා තමයි ලබා ගෙන තිබෙන්නේ. අපි බලයට පත් වන විටත් ඒවා පියවා තිබුණේ නැහැ. අපි 2024 දෙසැම්බර් මාසයේ 31වැනි දා ඒ මුදල පියවූවා. නමුත්, ඒ මුදලට අය විය යුතු පොලී මුදල් ගෙවීම සිදු කිරීමට නොහැකි වෙලා තිබෙනවා. ලංකා බැංකුවෙන් ලබා ගත් මුදල් හා මහජන බැංකුවෙන් ලබා ගත් මුදල් 2023 වර්ෂයේදී ගෙවලා තිබෙනවා. ඒ අනුව මුදල් පියවා තිබෙනවා. නමුත්, සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් මුදල් ලබා ගැනීමේදී වැය වෙච්ච පොලී මුදල් ගෙවලා නැහැ.

(ආ) අදාළ නොවේ.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, අපේ රටේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 335ක් තිබෙනවා. ඒ වාගේම, සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1,092කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. පසුගිය කාලයේ මේ බැංකුවල රුපියල් බිලියන 400කට ආසන්න මුදලක් විගණනයට ලක් වුණේ, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය යටතේ පමණයි. නමුත්, ගරු අමාත්‍යතුමා මැදිහත් වෙලා, ඒවායේ විගණනය සිද්ධ කරන්න ජාතික විගණන කාර්යාලයට බලය ලබා දීම පසුගිය දවසක කරපු සංශෝධනයෙන් සිද්ධ වුණා.

නමුත් ගරු කථානායකතුමනි, ඒ සංශෝධනයට ගෙනාවාට කෙනෙකුට හිතෙන්න පුළුවන්, අශ්වයා පැනලා ගියාට පස්සේ ඉස්තාලය වැහුවාද කියලා. ඉන්න අශ්වයෝ රැක ගන්න ඉස්තාලය වහන්නත් ඕනෑ, පැනපු අශ්වයා අල්ලා ගන්නත් ඕනෑ.

ඒ නිසා ගරු අමාත්‍යතුමාගෙන් මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි, අහිංසක දුප්පත් ජනතාවගේ තැන්පතු මුදල් වෙනත් කුමන හෝ කාර්යයක් සඳහා භාවිත කර තිබෙනවා නම්, ඒවාට අදාළ නිශ්චිත පොලිය ලබා දීලා නැත්නම්, ඒ පොලිය නැවත අත්පත් කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද, ඒ වාගේම ඒ පොලිය අත් නොවීම නිසා ඇති වෙලා තිබෙන ඛේදවාචකය කවරක්ද කියන එක.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයෙන් මේ මුදල් ලබා ගෙන තිබෙන්නේ, 2021 අප්‍රේල් මාසයේ 25වැනි දා අනුමත කරන ලද, එවකට මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ කැබිනට් පත්‍රිකාවක් මඟින්.

ඒ කැබිනට් පත්‍රිකාවට අනුව, මම කලින් කිව්වා වාගේ මහජන බැංකුවෙන් සහ ලංකා බැංකුවෙන් සමෘද්ධි සංවර්ධන අරමුදල් ඇපයට තබා ලබාගත් මුදල්වලට සියයට 6.67ක පොලියක් අයකර ගැනීම අනුමත කර තිබෙනවා. නමුත් ගරු කථානායකතුමනි, සමෘද්ධි ප්‍රතිලාභින්ගෙන් ලබා ගත් මිලියන 28,767ට පොලිය අයකර ගැනීමක් සම්බන්ධයෙන් ඒ කැබිනට් පත්‍රිකාවේ අනුමැතියක් හෝ සඳහන් වෙලා නැහැ. මේ නිසා අපි දැනට දුෂ්කරතාවට මුහුණ දීලා තිබෙනවා. ඇත්තටම කියනවා නම්, ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ රටේ දුප්පත් අහිංසක ජනතාවගේ අනිවාර්ය ඉතුරුම් මුදල් තමයි සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ තිබෙන්නේ. ඒ මුදල්වලින් තමයි රුපියල් මිලියන 28,767ක් ලබාගෙන තිබෙන්නේ. අපි ගණන් බලා තිබෙනවා, 2020 සිට මේ වනකොට දළ වශයෙන් රුපියල් බිලියන 20ක් විතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට මේ නිසා පාඩු වෙලා තිබෙන බවට. ඒ නිසා මේ පොලී මුදල ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයට අවස්ථා කිහිපයකදීම අපි ඉල්ලීම් කර තිබෙනවා. නමුත්, මේ කැබිනට් පත්‍රිකාවේ පොලී මුදලක් අයකර ගැනීමක් සම්බන්ධයෙන් සඳහන් කර නොමැති නිසා අපට මේ මුදල් නැවත අයකර ගැනීමට අපහසු වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

ඒ වාගේම මම කියන්න ඕනෑ, 16ලක්ෂයක විතර ඉතුරුම්ලාභින්ගේ ඉතුරුම් මුදල් තමයි මෙලෙස භාවිත වෙලා තිබෙන්නේ කියන එක. ඒ අනුව, අපේ රටේ දුප්පත්, ඒ වාගේම ආධාර ලැබිය යුතු අඩු ආදායම්ලාභී පුද්ගලයන්ගේ මුදල් විශාල ප්‍රමාණයක් මේ හරහා අහිමි වෙලා තිබෙනවා. එම මුදල් අයකර ගැනීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා. නමුත්, ඒ මුදල් ලබා ගන්නා අවස්ථාවේදී කැබිනට් මණ්ඩලය ලබා දුන් තීන්දුව නිසා තමයි අපට මේවා අයකර ගැනීම දුෂ්කර වෙලා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, 1989දී ජනසවිය වැඩසටහන ගෙනාවා, ග්‍රාමීය වශයෙන් අත්වෙලා තිබෙන දිළිඳුභාවය තුරන් කිරීම සඳහා. හැබැයි, ඒ වනකොට ආහාර මුද්දර වැඩසටහනක් ක්‍රියාත්මක වුණා. නමුත්, ඒක අහෝසි කරමින් ජනසවිය වැඩසටහන ගෙනාවා. එදා ලක්ෂ 70කට අධික දිළිඳු ජනතාවක් හිටියා, ලක්ෂ 14කට ආසන්න පවුල් ප්‍රමාණයක් හිටියා. 1994දී ජනසවිය වැඩසටහන අහෝසි කරමින් සමෘද්ධි වැඩසටහන ආවා. නැවත 2014දී දිවි නැඟුම වැඩසටහන ආවා. ඊට පස්සේ නැවත 2017දී සමෘද්ධි වැඩසටහන සක්‍රිය වුණා. දැන් අස්වැසුම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය වෙන්නේ, ග්‍රාමීය වශයෙන් තිබෙන දිළිඳු බව -දුප්පත්කම- තුරන් කිරීම සඳහා ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කිරීමේ හැකියාව තිබෙන මේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සවිබලගැන්වීම ඉදිරි කාලය තුළ සිද්ධ වනවාද, එහෙම නැත්නම් මේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ක්‍රමානුකූලව ස්වාභාවික මරණයක් අත්පත් කර දෙන තත්ත්වයට පත් කරනවාද කියන එකයි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේම, අපේ රටේ ක්‍රියාත්මක වූ දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහන් බොහෝ වෙලාවට එක වැඩසටහනක් අවසන් කරලා තමයි ඊළඟ වැඩසටහන ආරම්භ කළේ. ඒවාත් එක්ක සමාජයීය සහ ආර්ථික ගැටලු රාශියකටත් අපේ සමාජයට මුහුණ දෙන්න සිදු වුණා. අපි බලයට පත් වනකොට ක්‍රියාත්මක වුණේ, අස්වැසුම වැඩසටහන. ඊයේ ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා වාගේ අපට මේ වැඩසටහන්වල නම් මාරු කිරීමක් හෝ ආයතන වෙනස් කිරීමක් හෝ වසා දැමීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. මේ වනකොට අස්වැසුම වැඩසටහන සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හරහා වෙනම ක්‍රියාත්මක වන අතරතුර, අපි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම අපේ රටේ සමාජය, ප්‍රජාව සවිබලගැන්වීම දෙසට යොමු කරලා තිබෙනවා. ඒ නිසා ප්‍රධානතම කාර්යභාරය විධියට ප්‍රජා සවිබලගැන්වීමත්, ශක්තිමත් ක්ෂුද්‍ර මූල්‍ය බැංකුවක් බවට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පත් කිරීමත් අරඹයා අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ අනුව, ගරු කථානායකතුමනි, අපි මේ වනකොට පස් වැදෑරුම් ප්‍රජා

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

සවිබලගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. එහි පළමු පියවර තමයි ජීවනෝපය ප්‍රවර්ධනය හරහා විශේෂයෙන්ම අපේ රටේ අඩු ආදායම්ලාභී ප්‍රජාව සවිබලගැන්වීම. ඒ තුළින් ඒ පවුල්වල ජනතාව ස්වයං රැකියාවලට යොමු කිරීම සඳහා අපි වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා, ආසියානු සංවර්ධන බැංකුවේත්, ලෝක බැංකුවේත් ආධාර ඇතුව. ඒ වාගේම අපේ භාණ්ඩාගාරයේ මුදල් ප්‍රතිපාදන යටතේත් ස්වයං රැකියා සඳහා යොමු කිරීම සඳහා කටයුතු කරනවා. අපේ සමෘද්ධි සංවර්ධන නිලධාරින් හරහා ඒ පවුල් හඳුනාගෙන, ඔවුන් වෙනුවෙන් ව්‍යාපාරික සැලැස්මක් හදලා දීලා, ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අපි රුපියල් 150,000ක ආධාරයකුත් ලබා දෙනවා. ඊට අමතරව අවශ්‍යතාව අනුව සමෘද්ධි සංවර්ධන බැංකු හරහා මූල්‍ය පහසුකම් -ණය පහසුකම්- ලබා දීමේ වැඩසටහනකුත් ක්‍රියාත්මක කරනවා.

දෙවැනි පියවර විධියට, අපේ රටේ අඩු ආදායම්ලාභී පවුල්වල මානව සම්පත දියුණු කිරීම සඳහා "Next Sri Lanka" කියලා වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරලා තිබෙනවා.

ඒ වැඩ පිළිවෙළ යටතේ 50,000කට වෘත්තීය පුහුණුව ලබා දීමට අපි මේ වෙනකොට කටයුතු ආරම්භ කරලා තිබෙනවා. රාජ්‍ය අංශයේත්, පෞද්ගලික අංශයේත් ආයතන සමඟ සම්බන්ධ වෙලා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ පවුල්වල ඉන්න තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීලා, ඒ වාගේම ඔවුන් ඩිප්ලෝමාධාරින් සහ සහතිකපත්‍රලාභින් බවට පරිවර්තනය කරලා සවිබලගැන්වීමේ වැඩසටහනක් ලෙස. ජීවනෝපාය ප්‍රවර්ධන වැඩ පිළිවෙළ විතරක් නොවෙයි අපේ පස් වැදෑරුම් වැඩ පිළිවෙළ තුළ මූල්‍ය අන්තර්කරණය ඔස්සේ මූල්‍ය සාක්ෂරතාව වැඩි කිරීම, ඉතුරුම් සහ ආයෝජන දිරිගැන්වීම වාගේ වැඩ කොටස්ද ඇතුළත් වෙනවා.

තුන්වෙනුව, අපි මනෝ සමාජයීය වශයෙන් මේ පවුල් සහ ඒ පුද්ගලයන් සවිබලගැන්වීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. මනෝවිද්‍යාත්මක උපදේශනය හරහා මානසික යහ පැවැත්ම, මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමත්, ඒ අවශ්‍ය මඟ පෙන්වීම් ලබාදීමත් සිදු කරනවා.

ඒ පස් වැදෑරුම් වැඩ පිළිවෙළේ හතරවෙනි කොටස මෙයයි. ගරු කථානායකතුමනි, සමාජ ආරක්ෂණයක් අවශ්‍යයි අපේ රටේ අඩු ආදායම්ලාභී පවුල්වලට. ඒ අය බොහෝ වෙලාවට අවිධිමත් ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරනවා වෙන්න පුළුවන්. සමහරවිට මේසන් වැඩ කරනවා වෙන්න පුළුවන්, කුලී වැඩ කරනවා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් වඩු වැඩ කරනවා වෙන්න පුළුවන්. මෙන්න මේ සියලුදෙනාටම සමාජ ආරක්ෂක අරමුදලක් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන සමාජ ආරක්ෂණ මණ්ඩලය යටතේ අපි හඳුන්වා දීලා තිබෙනවා. ඒ මඟින් දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයට මේ පුද්ගලයන්, මේ පවුල්වල සාමාජිකයන් යොමු කිරීම සඳහා අපි මේ වන විට කටයුතු කරමින් සිටිනවා.

පස්වෙනුව, මේ සියලු කාරණා සමඟ ඔවුන්ට දැනුම සහ කුසලතා අවශ්‍යයි. 20,000කට ආසන්න අපේ දෙපාර්තමේන්තුවේ ඉන්න ක්ෂේත්‍ර නිලධාරින් හරහා අපි නිරන්තරයෙන් මේ ජනතාවට අවශ්‍ය මඟ පෙන්වීම කරමින්, සමාජ සජීවීකරණය ලබා දෙමින් ඔවුන් සවිබලගැන්වීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මේ වෙනකොට දිශාගත කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි වටය.

## ධාන්‍ය සහ අල වර්ග නිෂ්පාදනය ඉහළ නැංවීම: 2025 අය වැයෙන් වෙන් කළ ප්‍රතිපාදන
## தானிய மற்றும் கிழங்கு வகைகளின் உற்பத்தியை அதிகரித்தல்: 2025க்கான பாதீட்டில் ஒதுக்கப்பட்ட நிதி
## INCREASE OF PRODUCTION OF GRAINS AND YAMS: ALLOCATIONS FROM BUDGET, 2025

1467/2025

**4. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු චානක මාදුගොඩ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சானக மாதுகொட சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Chanaka Madugoda)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වී හැර අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල නිෂ්පාදනය සහ ඵලදායිතාව මනිනු ලබන මිනුම් දඬු කවරේද;

(ii) ධාන්‍ය වර්ග සහ අල බෝග වර්ග නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා 2025 වර්ෂයට අදාළ අය වැය මඟින් වෙන් කරන ලද ප්‍රතිපාදනය කොපමණද;

(iii) එම ප්‍රතිපාදන භාවිත කරමින් නිෂ්පාදනය ඉහළ නැංවීමට අපේක්ෂා කරනු ලබන ධාන්‍ය වර්ග සහ අල බෝග වර්ග කවරේද;

(iv) 2024 වර්ෂයට සාපේක්ෂව 2025, 2026 සහ 2027 යන වර්ෂවලදී ඉහත සඳහන් එක් එක් ධාන්‍ය වර්ගයෙන් සහ අල බෝග වර්ගයෙන් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நெல் தவிர்ந்த ஏனைய களப் பயிர்களின் உற்பத்தி மற்றும் விளைதிறனை அளவிடப் பயன்படுத்தப்படும் அளவுகோல்கள் யாவை என்பதையும்;

(ii) தானிய வகைகள் மற்றும் கிழங்குப் பயிர் வகைகளின் உற்பத்தியை அதிகரிப்பதற்காக, 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்பட்டுள்ள நிதி எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நிதி ஒதுக்கீட்டைப் பயன்படுத்தி, எந்தெந்தத் தானிய வகைகளின் மற்றும் கிழங்குப் பயிர் வகைகளின் உற்பத்தியை அதிகரிக்க எதிர்பார்க்கப்படுகிறது என்பதையும்;

(iv) 2024ஆம் ஆண்டுடன் ஒப்பிடுகையில், 2025, 2026 மற்றும் 2027ஆம் ஆண்டுகளில் மேற்குறிப்பிட்ட ஒவ்வொரு தானிய வகை மற்றும் கிழங்குப் பயிர் வகையையும் உற்பத்தி செய்வதற்கு எதிர்பார்க்கும் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) criteria used to measure the production and productivity of field crops other than paddy;

(ii) provision that was allocated in the Budget for the year 2025 for increasing the production of grains and yams;

(iii) specific grains and yams of which the production is expected to be increased with these provisions; and

(iii) expected production quantities for each of the above grain and yam variety in 2025, 2026 and 2027, compared to the year 2024, separately?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)

(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) නිෂ්පාදනය - කිලෝග්‍රෑම් හෝ මෙට්‍රික්ටොන්

එලදායීතාව - හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් හෝ මෙට්‍රික්ටොන්

(ii)

| ආයතනය | වෙන් කරන ලද ප්‍රතිපාදන (රුපියල් මිලියන) | |
|---|---|---|
| | ධාන්‍ය වර්ග | අල වර්ග |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 203.55 | 145 |
| මහවැලි අධිකාරිය | 360ක් වෙන් කර ඇත. | |
| බස්නාහිර පළාත | 38.14 (වී සඳහා පමණි) | නැත. |
| උතුරු පළාත | 59ක් වෙන් කර ඇත. | |
| දකුණු පළාත | වී - 153.35 අනෙක් - 10.07 | 6 |
| මධ්‍යම පළාත | 9.55ක් පමණ වෙන් වී ඇත. | |
| නැගෙනහිර පළාත | 169.391ක් පමණ වෙන් වී ඇත. | |
| උතුරු මැද පළාත | 190.38 | නැත |
| සබරගමුව පළාත | 11.4 | 8.5 |
| ඌව පළාත | 29.02ක් වෙන් වී ඇත. | |
| වයඹ පළාත | 5.7ක් වෙන් කර ඇත. | |

2025 අය වැය මඟින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට ද රුපියල් මිලියන 150ක් අතිරේක ආහාර බෝග වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ වෙන් වී ඇත.

(iii)

| ආයතනය | ධාන්‍ය වර්ගය | අල වර්ග |
|---|---|---|
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | රටකජු, බඩඉරිඟු, මුං, උඳු, කව්පි, සෝයා බෝංචි, කුරක්කන්, තල | අර්තාපල්, මඤ්ඤොක්කා, බතල, වැල් අල, කිරි අල, ඉන්නල |
| මහවැලි අධිකාරිය | බඩඉරිඟු, කව්පි, මුං, උඳු, සෝයා බෝංචි, රටකජු | - |
| බස්නාහිර පළාත | වී | - |
| උතුරු පළාත | උඳු, මුං, රටකජු, කව්පි, කුරක්කන් | - |
| දකුණු පළාත | වී, බඩඉරිඟු, මුං, කව්පි | මඤ්ඤොක්කා, කිරි අල, වැල් අල, ඉන්නල |
| මධ්‍යම පළාත | කුරක්කන් | අර්තාපල්, මඤ්ඤොක්කා, කිරි අල, වැල් අල, ඉන්නල |
| නැගෙනහිර පළාත | බඩඉරිඟු, රටකජු, කව්පි, උඳු, මුං, තල, කුරක්කන් | මඤ්ඤොක්කා, බතල |
| උතුරුමැද පළාත | බඩඉරිඟු, කව්පි, මුං, උඳු, රටකජු | - |
| සබරගමුව පළාත | මුං, රටකජු. කව්පි, තල, කුරක්කන්, බඩඉරිඟු | වැල් අල, කිරි අල, මඤ්ඤොක්කා, බතල, ඉන්නල |
| ඌව පළාත | උඳු, කව්පි, කුරක්කන්, මුං, රටකජු, බඩඉරිඟු | අර්තාපල් |
| වයඹ පළාත | බඩඉරිඟු, කව්පි, මුං, උඳු, රටකජු, කුරක්කන් | - |

(iv) ධාන්‍ය වර්ග

| 1. ධාන්‍ය වර්ගය | 2. නිෂ්පාදිතය (mt) | 3. අපේක්ෂිත නිෂ්පාදිතය (mt) | | |
|---|---|---|---|---|
| | 2024 | 2025 | 2026 | 2027 |
| බඩඉරිඟු | 375,996 | 340,000 | 509,642 | 577,500 |
| මුං ඇට | 21,078 | 17,020 | 24,366 | 27,467 |
| උඳු | 13,810 | 17,263 | 20,166 | 22,600 |
| කවුපි | 12,567 | 13,372 | 14,907 | 25,720 |
| තල | 17,485 | 17,450 | 17,932 | 16,226 |
| රටකජු | 29,624 | 38,820 | 41,086 | 37,470 |
| සෝයා | 910 | 1,321 | 13,035 | 17,600 |
| කුරක්කන් | 3,790 | 3,947 | 5,126 | 8,390 |

| ධාන්‍ය වර්ගය | 2024 නිෂ්පාදිතය (mt) 2024 | අපේක්ෂිත නිෂ්පාදිතය (mt) | | |
|---|---|---|---|---|
| | | 2025 | 2026 | 2027 |
| අර්තාපල් | 42,207 | 49,881 | 81,825 | 94,175 |

[ගරු නාමල් කරුණාරත්න මහතා]

අර්තාපල් හැර වෙනත් අල වර්ග

| අල බෝගය | වර්තමාන නිෂ්පාදනය (t) | අපේක්ෂිත නිෂ්පාදනයේ වැඩිවීම (t) | | |
|---|---|---|---|---|
| | 2024 | 2025 | 2026 | 2027 |
| මඤ්ඤොක්කා | 356,125 | 5,000 | 8,000 | 10,000 |
| බතල | 53,559 | 5,000 | 8,000 | 10,000 |
| වැල් අල | දැනට නිෂ්පාදන දත්ත නොමැත.** | 1,500 | 3,000 | 5,000 |
| කිරි අල | | 1,000 | 2,000 | 5,000 |
| ඉන්නල | | 1,000 | 2,000 | 5,000 |

**වැල් අල, කිරි අල සහ ඉන්නල යන බෝගවල නිෂ්පාදන දත්ත විධිමත් පරිදි නොමැත. එසේ වුවද මෙම බෝග ගෙවතු මට්ටමින් සහ කුඩා පරිමාණ වගා වශයෙන් දැනටමත් සිදු කරන අතර, විදෙස් වෙළෙඳ පොළ සඳහාද ඉල්ලුමක් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ප්‍රතිලාභ සහ "එට්කා" ගිවිසුම පිළිබඳ සාකච්ඡා
### இந்திய-இலங்கை சுதந்திர வர்த்தக ஒப்பந்தத்தின் நன்மைகள் மற்றும் ETCA தொடர்பான பேச்சுவார்த்தைகள்
### BENEFITS OF INDO-SRI LANKA FREE TRADE AGREEMENT AND NEGOTIATIONS ON ETCA

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, I seek your permission to raise the following Question under Standing Order No. 27(2).

Twenty-five years ago, Sri Lanka and India took a decisive step towards economic integration. The Indo-Sri Lanka Free Trade Agreement was signed on the 28th of December, 1998 and came into force on the 01st of March, 2000, the first bilateral FTA in our history. It dismantled tariffs in stages and by November, 2008, both sides had completed their liberalization schedules. Since then, India has remained one of our top export markets and our second largest source of imports.

The FTA's core outcomes are clear: thousands of tariff lines are now duty-free, with additional quotas for key products such as tea and garments. Bilateral trade multiplied in the 2000s and the Agreement gave many Sri Lankan firms their first real foothold in a vast neighbouring market. But, the structure is now outdated and there are non-tariff frictions - standards, testing, logistics, rules-of-origin compliance - which often blunt the headline preferences. An upgrade is overdue.

That upgrade is the proposed Economic and Technology Cooperation Agreement, ETCA, a modern framework to extend cooperation beyond goods into services, investments, technology and mutual recognition of standards and qualifications. Talks restarted in November, 2023 after years of pause, but have since drifted. As of late, in September, 2025, India had asked Sri Lanka to appoint a chief negotiator to resume structured rounds of talks; we have not done so to date.

Meanwhile, our trade gap with India remains widened. In 2024, Sri Lanka's exports to India were US Dollars 884 million and imported goods worth US Dollars 3.76 billion, an exports-to-imports ratio of roughly 24 per cent.

Sir, when I was Minister of Trade, that particular ratio was in the range of about 70 per cent to the advantage of India and at that time, it was improved to the benefit of Sri Lanka, but still, there is a huge gap that needs to be rectified or corrected to the advantage of Sri Lanka.

We should be using an upgraded pact to push more value-added exports, have easier access to services and investment in supply chains that create jobs at home.

Finally, we cannot ignore the global context: India is on track to become the world's third largest economy by 2027. We appreciate and hope that that momentous gain would certainly benefit countries such as Sri Lanka as its closest neighbour. As this transformation unfolds, Sri Lanka should position itself as a partner, influencer and facilitator in India's supply chains, logistics corridors and services integration. By doing so, we would not merely be a bystander; we would share India's dramatic growth, multiplying our own opportunities in trade, investment and employment. The cost of delay is immense; the benefits of timely engagement would be exponential.

Sir, I wish to ask from the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism - I do not see his presence today - the following Questions:

1. Trade Balance Impact

   Could the Hon. Minister explain why, despite the Indo-Sri Lanka Free Trade Agreement being in force for 25 years, Sri Lanka's exports to India remained only at US Dollars 884 million compared to the imports of US Dollars 3.76 billion in 2024, an export-to-import ratio of merely 24 per cent, and what corrective measures are planned to close this persistent deficit?

2. Non-Tariff Barriers

   What steps has the Government taken to address the non-tariff barriers and technical restrictions such as product testing, standards certification and Customs delays that continue to obstruct Sri Lankan exporters from fully utilizing the duty-free access granted under ISFTA?

   Sir, you could see that owing to imposition of tariff by President Trump, there is a huge potential that exists for us to export our textiles to India because the Indian middle-class population has gone up to about 400 or 500 million. So, there is a huge potential to take advantage of in the short term.

3. ETCA Negotiation Stalemate

Talks on the Economic and Technology Cooperation Agreement - ETCA - were revived in November, 2023, but remain stalled. Why has the Government failed to appoint a chief negotiator and establish a clear mandate for Sri Lanka, despite repeated requests from India to resume structured negotiations?

This Agreement benefits Sri Lanka, not India. So, we need to take cognizance of that fact and take advantage of it.

4. Strategic Leverage with India's Rise

Given that India is projected to become the world's third largest economy by 2027, why is Sri Lanka not positioning itself more aggressively to integrate into India's value chains, logistics corridors and services ecosystem so that our economy benefits dramatically from that transformation?

Sir, if you take your mind back to the 1990s, that was what Hong Kong did with China, and this is the ideal situation for Sri Lanka to integrate into the Indian market. I guess, being a close neighbour and with a lot of strategic intent, that is what we must try to obtain at this moment.

5. Safeguards for Local Sectors

What specific safeguards such as negative lists, phased liberalization schedules or labour market tests will the Government commit to in ETCA negotiations to ensure that vulnerable domestic sectors and professional services are protected, while still enabling growth opportunities?

6. Investment and Technology Corporation

Has the Government outlined a plan within ETCA to secure Indian investment into priority areas such as renewable energy, digital technology, shipping and logistics and higher education? If so, can such plans be tabled in this House for scrutiny?

7. Mutual Recognition and Professional Mobility

Sri Lankan professionals, particularly in IT, engineering and health services, often face barriers in India due to lack of mutual recognition of qualifications. Will ETCA include binding Mutual Recognition Agreements - MRAs - and if so, by when will those be finalized?

The Hon. Minister of Health is here. I am sure he has a major problem with MRA, where he is unable to bring medicines which are accepted in India. So, this is a good time to ensure that mutual recognition so that what is recognized in India would be accepted here and then, you would have procurements in the health sector done under meaningful conditions. I can remember that when you were in India, you had this problem. So, ETCA could be an answer to that.

8. Accountability and Parliamentary Oversight

Why has the Government not tabled a comprehensive review of 25 years of ISFTA - India-Sri Lanka Free Trade Agreement - performance, covering sectoral winners and losers, net job creation, FDI flows and trade imbalances before proceeding with ECTA negotiations so that Parliament and the public are properly informed?

9. Tourism, Ports and Banking Synergies

India is today Sri Lanka's largest source of tourists, a key partner in Colombo and Trincomalee port activities and a growing force in cross-border banking and digital payments. What specific provisions would ETCA include to deepen cooperation in tourism promotion, port development and financial-sector integration so that these critical areas translate into higher earnings and job creation for Sri Lanka?

Sir, I look forward to an Answer, especially after the President's Budget Speech yesterday, which impacts on neighbourly development. So, this is the way forward to lead with immediate effect.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ යොමු කරන ලද ප්‍රශ්නය මට ඊයේ තමයි ලැබුණේ. ගරු මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නය යටතේ ප්‍රශ්න 9ක් ඇසුවා. එතුමා විශේෂයෙන්ම ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳවත්, ETCA එකේ වර්තමාන තත්ත්වය පිළිබඳවත් ප්‍රශ්න කර තිබෙනවා. ගරු කථානායකතුමනි, එතුමාගේ මෙම ප්‍රශ්නයට පිළිතුරක් ලබා දීම සඳහා මම සතියක කාලයක් ඉල්ලා සිටිනවා. සතියක් ඇතුළත මෙම ප්‍රශ්නයට උත්තරය ලබා දෙනවා. මොකද, මීට අදාළ පිළිතුර සකස් කළ යුත්තේ Government එකේ ප්‍රතිපත්ති වාගේම වර්තමාන තත්ත්වය පිළිබඳව යම් සාකච්ඡාවක් එක්කයි. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමාට සතියකින් උත්තරය ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: ගරු චාමර සම්පත් දසනායක මහතා විසින් 2025.10.23 දින මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය
## சிறப்புரிமை: 2025.10.23ஆம் திகதி கௌரவ சாமர சம்பத் தசநாயக்க அவர்களால் எழுப்பப்பட்ட சிறப்புரிமை வினா
## PRIVILEGE: QUESTION OF PRIVILEGE RAISED BY HON. CHAMARA SAMPATH DASANAYAKE ON 23.10. 2025

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த 2025 ஒக்ரோபர் 23ஆம் திகதி வியாழக்கிழமை பாராளுமன்ற சிறப்புரிமை

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

மீறலில் நான் ஈடுபட்டுள்ளதாகக் குறிப்பிட்டு, உண்மைக்கும் அறத்துக்கும் மாறான வகையில் பதுளை மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சாமர சம்பத் அவர்களால் எனக்கு எதிரான சிறப்புரிமை வினாவொன்று சமர்ப்பிக்கப்பட்டுள்ளது.

இலங்கையின் அரசியலமைப்புக்கு 2018ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட பதினெட்டாவது திருத்தத்தின் பிரகாரம், 2024 டிசம்பர் 06ஆம் திகதி எதிர்க்கட்சி உறுப்பினர்கள் 11 பேரின் இரகசிய வாக்களிப்பின்மூலமான தேர்தலில் உயர் பதவிகளைத் தீர்மானிக்கும் அரசியலமைப்புப் பேரவைக்கு ஓர் உறுப்பினராக நான் ஜனநாயக முறைப்படி தெரிவு செய்யப்பட்டேன். இப்பதவியில் கண்வைத்து கௌரவ பாராளுமன்ற உறுப்பினர் சாமர சம்பத் உட்படப் பலர் திரைமறைவு நடவடிக்கைகளில் ஈடுபட்டபோதும், நானும் கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஜீவன் தொண்டமான் அவர்களும் தேர்தலில் போட்டியிட்டு, நான் தெரிவு செய்யப்பட்டேன். தெரிவுசெய்யப்பட்ட 2024.12.06ஆம் திகதி முதல் இன்றுவரை நேர்மையுடனும் அரசியலமைப்பு உறுப்புரை 09இன் பிரகாரமும் எனது கௌரவமான பங்களிப்பை வழங்கி, மனச்சாட்சிக்கு இணங்கச் செயற்பட்டு வருகிறேன். இலங்கை அரசியலமைப்பின் உறுப்புரை 29இன் பிரகாரமும் உறுப்புரை 7இன் பிரகாரமும் எனது தேசத்து மக்கள் சார்ந்து பொதுநலனை - மக்கள் நலனை - முன்னிறுத்தியே எனது முடிவுகளை மிகத் தெளிவாக அரசியலமைப்புப் பேரவையில் முன்வைத்துள்ளேன். எனது கட்சிக்காகவோ அல்லது வெளிநபர்களின் நெருக்குதலுக் காகவோ எந்த முடிவுகளையும் நான் மாற்றிக் கொள்ளவில்லை. எந்தவித வெளிப்புற அழுத்தமும் என்மீது பிரயோகிக்கப் படவுமில்லை. அவ்வாறு பிரயோகிக்கவும் முடியாது என்பதைக் கடந்த ஓராண்டு காலமாக நேர்மையுடனும் கண்ணியத்துடனும் அறம் சார்ந்து நடந்துகொண்டு தைரியத்துடன் நிரூபித்துள்ளேன்.

“ சிவில் புத்தி பெரமுன” என்ற அமைப்பைச் சேர்ந்தவர் எனக் கூறப்படும் சஞ்சய் மகவத் என்பவரால் நிதிக் குற்றப் புலனாய்வுப் பிரிவில் - FCIDஇல் - நான் தவறான வழியில் சொத்துக்கள் குவித்து வைத்திருப்பதாக 2025 யூலை 25ஆம் திகதியில் முறைப்பாடொன்று செய்யப்பட்டிருப்பதாக வெளியான செய்தியைப் பத்திரிகைகளில், சமூக ஊடகங்களில் நான் பார்வையிட்டிருந்தேன். இச்செய்தி வெளிவந்தவுடனேயே இதைப்பற்றி பகிரங்க விசாரணையைச் செய்து உண்மையை வெளிக்கொண்டு வருமாறு வெளிப்படையாகக் கூறியிருந்தேன். இன்று ஏறத்தாழ மூன்றரை மாதங்களை நெருங்குகின்றபோதும் இதுவரை நிதிக் குற்றப்புலனாய்வுப் பிரிவினரால் எந்த முடிவுகளும் வெளியிடப்படவில்லை.

கௌரவ சபாநாயகர் அவர்களே, இப்பொழுதும் இந்த உயர்ந்த சபையினூடாக உங்களிடம் ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன். எனது பெயரிலோ என் குடும்ப உறுப்பினர்கள் பெயரிலோ அல்லது பினாமிகள் பெயரிலோ எனக்குச் சொத்துக்கள் இருந்தால், அதனை விசாரணை செய்து சட்ட நடவடிக்கை எடுக்குமாறு பகிரங்கமாகக் கேட்கின்றேன். அதேபோல், எனது சிபாரிசிலோ எனது பெயரிலோ கடந்த காலங்களில் நான் மதுபானசாலைக்கான அனுமதிப்பத்திரம் ஏதும் பெற்றிருந்தால், சிபாரிசு செய்திருந்தால் அதை உடன் வெளிப்படுத்தி, என்மீது சட்ட நடவடிக்கை எடுக்குமாறும் கோருகின்றேன்.

அரசியலமைப்பின் உறுப்புரை 41இன் பிரகாரம் நான் நீதியான முறையில் தேர்தல்மூலம் ஜனநாயக முறைப்படி தெரிவு செய்யப்பட்டுள்ளேன். அரசியலமைப்புப் பேரவையில் உள்ள மொத்தம் 10 உறுப்பினர்களில் நான் மட்டுமே இலங்கை வரலாற்றில் முதன்முதலில் தேர்தல்மூலம் தெரிவுசெய்யப் பட்டவன் எனக் கருதுகிறேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 29(2)இன் பிரகாரம் இது ஒரு சிறப்புரிமை மீறல் அல்ல என்பதையும் அரசியலமைப்பின் உறுப்புரை 41ஏ(1)இன்படி விசாரணை நடாத்தி உண்மையை முதலில் வெளிக்கொணர்ந்து நீதியை நிலைநாட்டுமாறும் தயவுடன் கேட்டுக் கொள்கின்றேன்.

மிக முக்கியமாக, கௌரவ சாமர சம்பத் அவர்கள் ஊவா மாகாண முதலமைச்சராக இருந்தபோது, தமிழ் பெண் அதிபர் ஒருவரை முழங்காலில் இருக்கவைத்து விசாரித்த ஒரு

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

என்பதை இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகிறேன். ஆகவே, கௌரவ சபாநாயகர் அவர்களே, நீதியான முறையில், நியாயம் கிடைக்கக்கூடிய வகையில் இதனை உடனடி விசாரணைக்குட்படுத்தி, நான் தவறான வழியில் சொத்துக்கள் சேர்த்து வைத்திருந்தால் அல்லது யாருக்காவது மதுபானசாலை அனுமதிப்பத்திரத்துக்குச் சிபாரிசு செய்திருந்தால் அல்லது எனது பெயரில் அதனைப் பெற்றிருந்தால், என்மீது சட்ட நடவடிக்கை எடுத்து, எனது பதவியைப் பறிப்பதற்கும் இந்த உயர்ந்த சபையினூடாகப் பூரண சம்மதத்தைத் தெரிவித்து, எனக்கு நீதி கிடைக்க வேண்டுமென்பதை இந்த இடத்திலே வலியுறுத்தி நிறைவு செய்கின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, I will consider whether there had been a breach of Privilege.

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### කෝපා කමිටුවේදී ලබා දුන් සාක්ෂිවලට එරෙහිව පෞද්ගලික සමාගමක් විසින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග
### அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவில் அளிக்கப்பட்ட சாட்சியத்திற்கு எதிராக தனியார் நிறுவனமொன்றால் எடுக்கப்பட்ட சட்ட நடவடிக்கை
### LEGAL ACTION BY PRIVATE COMPANY AGAINST EVIDENCE GIVEN AT COPA

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අරවින්ද සෙනරත් මහතා විසින් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 සැප්තැම්බර් 11 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026, දෙවන වර කියවීමේ විවාදය. පළමුවැනි වෙන් කළ දිනය.

විවාදය ආරම්භ කිරීම, the Hon. (Dr.) Nalinda Jayatissa. You have 20 minutes. - *[Interruption.]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විපක්ෂයෙන් නේ පටන් ගන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
විපක්ෂයෙන් නේ අය වැය විවාදය පටන් ගන්නේ. මේ මොකක්ද කරන්නේ? විපක්ෂයෙන් නේ Debate එක පටන් ගන්නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අය වැය විවාදයේ පළමුවැනි speech එක කරන්නේ විපක්ෂයෙන්. එදා රොනී ද මැල් මැතිතුමා කථා කළේත් එහෙමයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මොකක්ද මේ කරන්නේ?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේදී ඉස්සර රොනී ද මැල් මැතිතුමා අය වැය විවාදය ආරම්භ කරමින් කථා කරනකොටත් මම අර ගැලරියේ ඉඳලා බලාගෙන ඉඳලා තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ජනාධිපතිතුමා Debate එක පටන් ගත්තා නේ. මේ Committee Stage Discussion එක නොවෙයි. මේ Second Reading Debate එක නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මොකක්ද මේ කරන්නේ?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ලේකම් මණ්ඩලයටත් වරදිනවා කියන්නේ ඉතින්, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I beg your pardon. The Hon. (Dr.) Harsha de Silva. You have 45 minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
කමක් නැහැ, ගරු කථානායකතුමනි. ප්‍රශ්නයක් නැහැ, අපි පටන් ගනිමු.

ඊයේ ජනාධිපතිතුමා කියනවා, එතුමා ව්‍යවස්ථාපිත ඒකාධිපති කෙනෙක් නොවෙයි කියලා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Cut එක move කරන්න ඕනෑ නේද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Cut එක move කරන්නේ නැහැ. Cut එක move කරන්නේ Committee Stage Discussion එකේදි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මේ, Second Reading Debate එක.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අද මොකද මේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභානායකතුමාට mike එක දෙන්නකෝ. එතුමාට mike එක දෙන්නේත් නැහැ, ඇමතිකමෙනුත් අයින් කරලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව විපක්ෂයෙන් තමයි අය වැය විවාදය ආරම්භ කළ යුත්තේ. ඒ නිසා අපට ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
අපිම නේ කිව්වේ, විපක්ෂයට විවාදය පටන් ගන්න කියලා. ප්‍රශ්නයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ලේකම් මණ්ඩලය ලබා දුන් උපදෙස්, ඔබතුමා කථා කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
No problem. අපි මුල ඉඳලා පටන් ගනිමු, ගරු කථානායකතුමනි. මට මුල ඉඳන් වෙලාවත් දෙන්න.

# විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය - [නොවැම්බර් 07]***
***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 07]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக".- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [07th November]*
*"That the Bill be now read a Second time".- [ The Hon. Anura Kumara Dissanayake]*
*Question again proposed.*

[පූ.භා. 10.32]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, ඊයේ ජනාධිපතිතුමා කිව්වා, එතුමා ව්‍යවස්ථාපිත ඒකාධිපති කෙනෙක් නොවෙයි කියලා. මොනවාටද භය වෙන්නේ කියලා එතුමා අපෙන් ඇහුවා. එතුමා අපට කිව්වා, විපක්ෂයේ අනෙක් කණ්ඩායම් එක්ක එකතු වෙන්න අවශ්‍යතාවක් නැහැ, මොනවාටද විරෝධතා කරන්නේ, ඒවා අනවශ්‍යයි කියලා. ඒත් එක්කම එතුමා විපක්ෂයත් එක්ක පැටලිච්ච අවස්ථාවේදී අපට හොඳින්ම තේරුම් ගියා, කිසිම විධියකට 2026 අවුරුද්දේදී මැතිවරණයකුත් බලාපොරොත්තු වෙන්න බැහැ කියලා. හැබැයි ජනාධිපතිතුමනි, අමතක කරන්න එපා, ඔබතුමා කොච්චර ඔහොම කථා කළත් ඔබතුමාට තිබෙන්නේ ඡන්ද සියයට 43ක් පමණයි කියන එක. ඔබතුමන්ලා කොළේ වහලා ලොකු ව්‍යාපාරයක් යටින් අරගෙන යන බව අපි කවුරුත් දන්නවා. මොකක්ද, ඒ? ඒ තමයි තමන්ගේ ජේවීපී පක්ෂයට රාජ්‍ය බලය පවරා ගන්න උත්සාහ කිරීම. ඒ සඳහා දැවැන්ත ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. බහු පක්ෂ ක්‍රමය වෙනස් කරන්න හදනවා. කලින් සන්නද්ධව කර ගන්න බැරි වෙච්ච දේ, දැන් ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යුහය තුළ කරන්න ඔබතුමන්ලා උත්සාහ කරනවා. ඔබතුමන්ලා සමහර වෙලාවට කියනවා, අපි යන්නේත් නැහැ, අපව යවන්න ඉඩ දෙන්නේත් නැහැ වාගේ කථාවක්. ගමේ ප්‍රජා සමිතියේ, ග්‍රාම ආරක්ෂක කමිටුවේ, පොලිසියේ බලය අල්ලා ගෙන one-party rule එකක් හදන්න උත්සාහයක් තිබෙන බව කාටත් පෙනෙනවා. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්න, බහු පක්ෂ ක්‍රමය පිළිගන්න බහුතර ජනතාව වෙනුවෙන් විපක්ෂය නියෝජනය කරන පක්ෂවලින් විරෝධතා අවශ්‍ය වන අවස්ථා තිබෙනවා. පාර්ලිමේන්තුව ඇතුළේත්, පිටතත් ජනතාව වෙනුවෙන් විරෝධතා කරන්න විපක්ෂය ඕනෑම වෙලාවක පැහැදිලිව බලා ඉන්නවා කියලා අපි ජනාධිපතිතුමාට කියන්න කැමැතියි. ඒ නිසා කවුරුවත් කලබල වෙන්න ඕනෑ නැහැ, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් විපක්ෂය හරි වෙලාවට හරි දේ කරයි.

ඊයේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය කථාව සම්බන්ධයෙන් හුදු දේශපාලනයෙන් ඔබ්බට ගිය තාර්කික සහ දත්ත මත ගොඩ නැඟුණු ධනාත්මක විවේචනයක් මේ ගරු සභාවේදී කරන්න මා අද බලාපොරොත්තු වෙනවා. ඉස්සෙල්ලාම මම කියන්න ඕනෑ, මේ ආණ්ඩුව විසින් සාර්ව ආර්ථිකය ස්ථාවර කර තිබෙනවා කියන එක සමස්තයක් හැටියට අපි පිළිගන්නා බව. ඒක හොඳයි කියන එක නොකියා ඉන්න තරම් පැකිළීමේ අවශ්‍යතාවක් අපට නැහැ.

හැබැයි, අපි අභියෝග කරනවා, ඔබතුමන්ලාට ඊළඟට තිබෙන step එක, ඒ කියන්නේ වර්ධනය ලබා ගන්න වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර නැහැ කියලා. මම ඒක පෙන්වන්නම්. පළමුවෙන්ම අපි ජනාධිපතිතුමා ක්‍රියාත්මක කරනු ලබන දූෂණ විරෝධී වැඩ පිළිවෙළ අගය කරනවා. හොරකම් නිසා ජනතාව හෙම්බත් වෙලා හිටියේ. ඒක ඇත්ත. දැවැන්ත බලාපොරොත්තුවක් තිබෙනවා, හොරු අල්ලයි කියලා. ජනතා මුදල් වංචා කරපු අයට - දේශපාලනඥයින්ට, නිලධාරින්ට- එරෙහිව 2024දී සම්මත වෙච්ච පනත් හරහා සහ ශක්තිමත් වෙච්ච CIABOC එක හරහා නීතිය සාධාරණව ක්‍රියාත්මක විය යුතු බවට සියලුදෙනා බලාපොරොත්තු වෙනවා. අපේ සම්පූර්ණ සහයෝගය එතුමාට ඒ සම්බන්ධයෙන් තිබෙනවා.

හැබැයි, මේ කටයුත්ත හුදෙක් දේශපාලන දඩයමක් වෙන්න බැහැ. මොකද, අපි සීනි ගනුදෙනුව පිළිබඳව කථා වුණා. නමුත්, වෙච්ච දෙයක් නැහැ. E-visa ගනුදෙනුව ගැන කථා කළා. මාස තුනහමාරක කාලයකදී US Dollars 1.8 million එකතු කරලා VAT එකයි, SSCL එකයි හැටියට ඒ බදු රජයට ගෙවා නැහැ කියලා Auditor-Generalගේ Audit Report එකේ තිබෙනවා. මුදල් අමාත්‍යාංශය මේ ගනුදෙනුව කරන්න එපා කියලා උපදෙස් දී තිබියදීත් unsolicited bid එකක් හරහා ගනුදෙනුව කළා කියලා විගණකාධිපතිවරයා තමන්ගේ වාර්තාව තුළ කියනවා. ගරු කථානායකතුමනි, එවකට ඔබතුමා පාර්ලිමේන්තුවේ හිටියේ නැති වුණත් මෙතැන හිටපු සමහරුන්ට මතක ඇති, කොච්චර අපහසුතාවක් මතද, පීඩනයක් මතද අපි රජයේ මුදල් පිළිබඳ කමිටුව හැටියට පිටු 665ක වාර්තාව එදා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ කියලා.

දැන් මොකද වෙන්නේ? කන්ටේනර් 323 සම්බන්ධයෙන් ඉදිරිපත් කළ වාර්තාවට මොකද වුණේ? අඩුම ගණනේ ගරු කථානායකතුමා එම වාර්තාව සභාගත කළාද? නැහැ. මහා

භාණ්ඩාගාරයේ DST ඒ.කේ. සෙනෙවිරත්න මහතාගේ නායකත්වයෙන් යුත් එම කමිටු වාර්තාවේ පැහැදිලිව කියනවා, රතු ටැග් එක ගසන ලද කන්ටේනර් අනිවාර්යයෙන්ම භෞතික පරීක්ෂාවෙන් තොරව පිට කිරීම වැරදියි කියලා.

රේගුවේ දැවැන්ත තදබදයක් තිබුණා, ඒ නිසා තමයි මේ නිදහස් කිරීම කළේ කියන එක පිළිගන්න බැහැ කියලා මේකේ කියනවා. මේ ගනුදෙනුවට සම්බන්ධ අය නම් කරලා ඔවුන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්න කියලා ඒ වාර්තාවේ කියනවා. නමුත්, ඔබතුමන්ලාගේ රජය ඒ වෙනුවට ඒ නිලධාරීන්ට promotion එකක් දීපු බව තමයි අපට ආරංචි වෙන්නේ.

ගරු කථානායකතුමනි, අලුත්ම කථා බහ තමයි මේ ඩබල් කැබ් වැඩේ; ඩබල් කැබ් 1,775ක් ගන්න හදන එක. අඩු දින ගණනක් දීලා tender bender එකක් කරලා, වැඩේ කරන්න යනවා කියලා තමයි අපට ආරංචි වෙන්නේ. ගරු කථානායකතුමනි, ඊයේ ජනාධිපතිතුමා වැඩේ ෂේප් කරන්න උත්සාහ කළා. මන්ත්‍රීවරු 225දෙනාට -ගරු කථානායකතුමනි, ඔබතුමාත් ඇතුළුවද මම දන්නේ නැහැ- පාවිච්චි කරන්න මේ වාහන දෙනවාය කියනවා. ජනාධිපතිතුමා එහෙම කියන අතරේ e-procurement ගැන කථා කරනවා. ඒ වාගේම දූෂණ කරන්න දෙන්න බැහැ කියනවා. නමුත්, Procurement Guidelinesවල මොකක්ද තිබෙන්නේ? දින 42ක් දෙන්න ඕනෑ, ටෙන්ඩර් එකක් වහන්න කලින්. නමුත්, දුන්නේ දින 12යි. ආයතන කිහිපයකට අයිතිවාසිකමක් තිබෙන්න ඕනෑ, ටෙන්ඩර් එකට ඉදිරිපත් වෙන්න. නමුත් ඉතාම පටු කොන්දේසි නිසා කොම්පැනි එකක් හෝ දෙකක් විතරයි මේ සඳහා ඉදිරිපත් වෙලා තිබෙන්නේ. තව ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ගරු කථානායකතුමනි, මගේ මතය නම්, මේ ටෙන්ඩර් එක suspend කරන්න කියන එකයි. මේක investigate කරන්න. පගා දීලා, 159දෙනාටමත්, විපක්ෂයටත් කැබ් දෙනවා කියලා මේ වැඩේ ෂේප් කර ගන්න අපි සූදානම් නැහැ කියන එක ඉතාම ඕනෑකමින් මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අද උදේ කෙනෙක් මට call එකක් අරගෙන කථාවක් කිව්වා. ඊයේ පෙරේදා විවෘත කළා, People's Bank එකේ ලොකු ගොඩනැඟිල්ලක් Union Place එකේ. ඔබතුමන්ලා දකින්න ඇති, ඒක විශාල වීදුරු ගොඩනැඟිල්ලක්. ඒකේ විශාල වංචා සිද්ධ වෙලා තිබෙනවාය කියා Board එකේ හිටපු Director කෙනෙක් කිව්ව නිසා ඒ Directorව අයින් කළා කියලා අපට පැමිණිල්ලක් ලැබිලා තිබෙනවා. මෙහෙම වෙන්න බැහැ. යම්කිසි වංචාවක් සිද්ධ වෙලා තිබෙනවාද, මොන දේශපාලන පක්ෂය බලයේ ඉන්නකොටද ඒක වුණේ කියන එක අදාළ වෙන්න බැහැ, හරි විධියට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා නම්. එවැනි දේවල් තව බොහොමයක් තිබෙනවා. හැබැයි, සත්‍ය වශයෙන්ම දූෂණයට එරෙහි වෙනවා නම්, පක්ෂ පාට භේදයකින් තොරව එය ඉෂ්ට කරන්න කියලා මම ගරු ජනාධිපතිතුමාගෙන් බොහොම ඕනෑකමින් ඉල්ලනවා.

ඊත් එක්කම තව වැදගත් කාරණාවක් කියන්න තිබෙනවා. Proceeds of Crime Investigation Division එකේ headquarters ළඟදී විවෘත කළා. පොලීසිය භාර ගරු ඇමතිතුමා මෙන්න මෙහෙම කථාවක් එතැනදී කිව්වා. "අවුරුදු ගාණක් තිස්සේ -අවුරුදු 75ක් තිස්සේ- ලංකාව රුපියල් ට්‍රිලියන 8ක ණය අරගෙන තිබෙනවා. හැබැයි, ඇත්තවශයෙන්ම වත්කම් තිබෙන්නේ රුපියල් ට්‍රිලියන 2යි. රුපියල් ට්‍රිලියන 6ක් හොරකම් කළා වාගේ කථාවක් තිබෙනවා. මෙය අල්ලා ගන්න ඕනෑ" කියලා එතුමා කිව්වා.

මේකට ඉතිහාසයක් තිබෙනවා. මීට වසර කිහිපයකට කලින් විගණකාධිපතිවරයා සහ මුදල් අමාත්‍යාංශය අතර තිබෙන පරස්පරයක් නිසා තමයි මේ කථාව ජනගත වෙලා තිබෙන්නේ. ඇත්තවශයෙන්ම රුපියල් ට්‍රිලියන 6ක් කවුරුවත් හොරකම් කරලා නැහැ. යම්කිසි හොරකමක් සිද්ධ වෙලා තිබෙන බව අපි කවුරුත් දන්නවා. නමුත් මෙතැන තිබෙන ගැටලුව මේකයි. සමහර වෙලාවට වත්කම් තිබෙන්නේ වෙන වෙන ආයතනවල. නමුත්, ණය තිබෙන්නේ මුදල් අමාත්‍යාංශයේ. ඒක තමයි ඇත්ත කථාව. මේක අවුරුදු ගාණක් තිස්සේ correct කරන්න උත්සාහ කරනවා. මුදල් අමාත්‍යාංශය කියන්නේ මේ වැඩේ නිදහස් කරගන්න තවත් අවුරුදු 6ක්, 7ක් ගත වෙයි කියලා. ඒ නිසා මෙන්න මෙහෙම පල් හොරකම් තමයි වෙලා තිබෙන්නේ කියලා අපි කථා කරනකොට, ජනතාවට අභවනකොට අප කියන දේවල් සම්බන්ධයෙන් මීට වඩා responsible වෙන්න ඕනෑ කියලා මම හිතනවා.

දැන් මම අය වැය ගැන කථා කරන්නම්, ගරු කථානායකතුමනි. 2022-2023 කාලයේ ආර්ථිකය කඩා වැටුණාට, 2024 වෙනකොට ආර්ථිකය ස්ථාවරභාවයකට ගෙනෙන්න එදා පැවති රජයට හැකි වුණා. ඒක ඇත්ත. මහජනතාව ඒ වෙනුවෙන් දැඩි කැප කිරීමක් කළා. ඒකත් ඇත්ත. අනුර කුමාර දිසානායක මැතිතුමා 2024දී ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනකොට සියයට 70ට තිබුණු උද්ධමනය සියයට ඍණ 1ට අඩුවෙලා තිබුණා. සියයට 35ට තිබුණු පොලී අනුපාතය සියයට 8ට අඩුවෙලා තිබුණා. රුපියල් 370ට ගිය ඩොලරය රුපියල් 294ට අඩුවෙලා තිබුණා. හැබැයි, ඊයේ ජනාධිපතිතුමා ඒකට credit එක ගන්න උත්සාහ කළා, ඒක අවුරුද්දකින් වෙච්ච දෙයක් කියලා. ඒක එහෙම නොවෙයි. ඒක කරපු පුද්ගලයන්ට, ඒ වෙනුවෙන් කැප වෙච්ච ජනතාවට අපි ඒ credit එක ලබා දෙමු. හැබැයි, අද වෙනකොට ඩොලරයේ අගය රුපියල් 307ට වැඩි වෙලා තිබෙනවා. එන්න එන්න රුපියල බාල්දු වෙමින් පවතිනවා. ඇත්තවශයෙන්ම ස්ථාවරභාවය ක්‍රියාත්මක කරනවා නම් කොහොමද ඒක කරන්නේ කියන එක ගැන ජනාධිපතිතුමාට කල්පනා කරන්න සිද්ධ වෙනවා.

ඒ වාගේම, පාඩු ලබමින් තිබුණු රාජ්‍ය ආයතන ලාභ ලබන ආයතන බවට පරිවර්තනය වෙලා තිබුණා. මේ දවස්වල සමහර මන්ත්‍රීවරු කියනවා මම අහගෙන හිටියා, "මෙන්න බලන්න, මෙන්න මෙහෙම ලාභයක් ලබා ගත්තා" කියලා. ලංකා විදුලිබල මණ්ඩලයේ 2022දී පාඩුව බිලියන 298යි; 2023දී ලාභය බිලියන 61යි; 2024දී ලාභය බිලියන 144යි. Ceylon Petroleum Corporation එකේ 2022දී පාඩුව බිලියන 617යි; 2023දී ලාභය බිලියන 120යි; 2024දී ලාභය බිලියන 33යි. මේකට මූලික හේතුව වුණේ ඔබතුමන්ලාගේ විරෝධය නොතකා එවකට පැවති රජය, ප්‍රධාන විපක්ෂය හැටියට අපේත් සහයෝගය සමඟ IMF එක සමඟ ගිවිසුමකට පැමිණීමයි.

ඒක තමයි ඇත්ත කථාව. ඒ ගිවිසුමේදී කොන්දේසි සියල්ලට අපි එකඟ වුණේ නැහැ, ගරු කථානායකතුමනි. නමුත්, එදා අපි ආණ්ඩුවේ කකුලෙන් ඇද්දේ නැහැ. ඔබතුමන්ලා කිව්වේ මොකක්ද? "IMF එකට යන්න එපා. IMF එකෙන් ගොඩ ගිය රටක් මේ ලෝකයේ නැහැ. ණය ගත්තේ හොරකමට. ඒ ණය ගෙවන්න ඕනෑ නැහැ. මේවා odious ණය" යනාදී වශයෙන් ඔබතුමන්ලා ඒ වෙලාවේදී මේ වැඩ පිළිවෙළ විවේචනය කළා. නමුත්, අපිට එදා වෙන විකල්පයක් තිබුණේ නැහැ, IMF එකත් එක්ක යෑම හැර. අද ගරු ජනාධිපතිතුමා IMF එක ගැන කථා කරන්නේ ඉතාම ඉහළින්. එතුමා IMF එක සම්බන්ධයෙන් එක විවේචනයක් ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ කෙසේ වෙතත්, මූලික වශයෙන් එදා එකඟ වුණේ කොහොමද? රජය ආදායම් වර්ධනය මත පදනම් වූ ආර්ථික ස්ථාවර කිරීමේ වැඩසටහනකට යමු කියලා; they agreed on a fiscal consolidation agreement. It was a matter of increasing revenue; it was a revenue-based agreement that we went into. ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වාගේ ආයතනවල පිරිවැය ප්‍රකාරව

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මිලක් විදුලියට සහ ඉන්ධනවලට නියම කරන්න. අපි ඒකට කියනවා, cost-recovery pricing කියලා. මේ කටයුතු සඳහා රජය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත - Public Financial Management Act, රාජ්‍ය ණය කළමනාකරණ පනත - Public Debt Management Act, ශ්‍රී ලංකා විදුලිබල පනත සම්මත කර ගත්තා. එදා JVP එකේ කට්ටිය, NPP එකේ කට්ටිය මේකට විරුද්ධ වුණා. නමුත් ඒ පනත් සම්මත කර ගත් නිසා තමයි අපිට අද වනකොට මේ ස්ථාවරභාවය ලබා ගන්න හැකි වෙලා තිබෙන්නේ.

ඊට අමතරව, මහ බැංකුව ස්වාධීන කිරීම සඳහා මුදල් අච්චු ගැසීම නවත්වන්න ශ්‍රී ලංකා මහ බැංකු පනත සම්මත කර ගත්තා. ඔබතුමන්ලාගේ දේශපාලන කණ්ඩායම එදා මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. මේ සියලු කාරණාවලට අතිශයින්ම වැදගත් වුණු විදේශීය සහ දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වීමට සතියකට කලින් සම්මත කර ගැනුණා. ඒක තමයි ඇත්ත කථාව. එතකොට කවුරු මොනවා කිව්වත් 2025 අය වැය ඉදිරිපත් කළේ ස්ථාවර ආර්ථිකයක් තිබුණු පරිසරයකයි. ජනාධිපතිතුමා ලොකුවට කිව්වා, "system change එක තමයි මේ" කියලා. නමුත්, කනගාටුවෙන් වුවත් අපි ජනාධිපතිතුමාට කියන්න ඕනෑ, ඔබතුමා ජනාධිපති වෙන්න කලින් තමයි system change කරලා ඒ rules-based order එකක් ගෙනාවේ කියන එක. 2025 අවුරුද්දේ රජය IMF එකඟතාව ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළා. ද්විපාර්ශ්වික ණය සහ ස්වෛරී බැඳුම්කර - ISB - ණය පිළිබඳව වචනයක්වත්, ඉලක්කමක්වත් ඒ agreementsවලින් වෙනස් කළේ නැහැ.

Macro-linked bonds කියලා අලුත් instrument එකක් ඉදිරිපත් කළා. ඒක වෙනස් කළෙත් නැහැ. ඒ හරහා 2025 වසර පුරා ආර්ථිකයේ ස්ථාවරත්වය රැකගන්න බොහෝදුරට රජයට හැකි වුණා. මම නැවතත් කියනවා, ඒක හොඳයි කියලා. ඒක තමයි විය යුතුව තිබුණේ.

මේ සියලු ඉලක්ක සපුරාගන්න මූලික වෙච්ච එක ප්‍රධාන කාරණයක් තිබෙනවා. ඒ තමයි, බලාපොරොත්තු නොවුණු ආකාරයට වාහන ආනයනය සිද්ධ වීම. ඔව්, ඔබතුමන්ලා අපට හිනා වුණා. ඔබතුමන්ලා ඇත්තවශයෙන්ම බලාපොරොත්තු වුණෙත් නැහැ මෙච්චර වාහන ප්‍රමාණයක් ලංකාවට ආනයනය කරයි කියලා. අපි හිතුවෙත් නැහැ. ඒක අපට වැරදුණා. US Dollars 1,900 million - ඒ කියන්නේ, බිලියන 2කට කිට්ටු වෙන්න - LCs විවෘත කර තිබුණා. ඩොලර් මිලියන 1,400කට වැඩි ප්‍රමාණයක වාහන import කරලා තිබුණා. ඉතින්, කවුරුත් හිතපු නැති විධියට රජයට බදු ආදායමක් ලැබුණා. "IMF එක රකුසෙක්" කියපු අය, IMF එකෙන් කිසි දවසක රටක් ගොඩ දමන්න බැහැ කියපු අය IMF එකේ වැඩ පිළිවෙළ හරහා දැවැන්ත බදු ප්‍රමාණයක් ලබා ගනිද්දී, භාණ්ඩාගාරය පළමුවරට උතුරා ගිහිල්ලා තිබෙනවා, අපි දන්න ඉතිහාසය තුළ. හැම වෙලාවේම OD එකක් තමයි භාණ්ඩාගාරයට තිබුණේ. හැබැයි, වැඩිපුර සල්ලි වශයෙන් මෙවර රුපියල් ට්‍රිලියනයක් තිබෙනවා, People's Bank එකේ සහ Bank of Ceylon එකේ. ඒ සල්ලි පරිපාලනය කරන්නේ කොහොමද, මේ සල්ලි manage කරන්නේ කොහොමද කියන එක පිළිබඳව ආණ්ඩුවට මීට වඩා අවධානය යොමු කරන්න වෙනවා. මොකද, එවැනි බලාපොරොත්තු නොවුණු මුදල් ප්‍රමාණයක් ලැබිලා OD එක cash surplus එකක් වෙනකොට, අඩුම ගානේ ඊයේ ජනාධිපතිතුමාට හැකියාවක් තිබුණා, යම් බදු ප්‍රමාණයක් හෝ අඩු කර ජනතාවට සහනයක් ලබා දෙන්න.

ඡන්දෙට කලින් ඔබතුමන්ලා බොහෝ දේ පොරොන්දු වුණා, cost of living සම්බන්ධයෙන්. බදු සම්බන්ධයෙන් විතරක් කථා කළොත්, කිරි, බිත්තර, අත්‍යවශ්‍ය ආහාර, ඖෂධ, පාසල් පොත්, උපකරණ, කෘෂි උපකරණ, පොහොර, සූර්ය පැනල, උපාංග, පුනර්ජනනීය ජනන යන්ත්‍ර, දේශීය මෘදුකාංග නිෂ්පාදන, IT සේවා යනාදියේ VAT අයින් කරනවා කිව්වා. හැබැයි, මොකද කළේ? සමහර ඒවා සියයට 18ටම තිබුණා. සමහර ඒවා බින්දුවේ සිට සියයට 18 දක්වා වැඩි කළා. ඊයේ VAT එකෙන් නිදහස් කරනවා වෙනුවට මොකක්ද කළේ? VAT එක අය විය යුතු කණ්ඩායම තවදුරටත් පුළුල් කළා.

ගරු කථානායකතුමනි, ඒ කියන්නේ, සාමාන්‍ය කඩයක් කරන පුද්ගලයෙකුට මාසයකට රුපියල් මිලියන 5ක බිස්නස් එකක් තිබෙනවා නම් එයාට VAT එක වැදුණේ නැහැ; එයාගෙන් VAT අය කෙරුණේ නැහැ. නමුත්, ඊයේ ඒක රුපියල් මිලියන 3.6ට අඩු කළා. ඒකෙන් කියන්නේ, දවසකට රුපියල් ලක්ෂයක බිස්නස් එකක් තිබෙනවා නම්, ඒ පුද්ගලයාට VAT ගෙවන්න වෙනවා කියන එකයි. එතකොට ඒකෙන් මොකක්ද වෙන්නේ? කුඩා ව්‍යාපාරිකයාගෙනුත් VAT අය කරන්න වෙනවා. එයා ඒක තමන්ගේ profit එකෙන් අඩු කර ගන්නේ නැහැ; ඒක කෙළින්ම පාරිභෝගිකයාට යනවා. ඒ හරහා ජීවන වියදම වැඩි වෙන එක තමයි වෙන්නේ. ඒත් රටේ ජනතාව දැන ගත්තොත් හොඳයි, මේ දේ කරන්නේ අද අය කරන බද්ද අඩු කරන්න ඕනෑවටත් වඩා හැකියාවක් තියෙද්දියි කියන එක. ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් IMF එකත් එක්ක අඩු ගාණේ එක සාකච්ඡාවක්වත් ජනාධිපති අනුර කුමාර දිසානායකගේ රජය පැවැත්වූවේ නැහැ කියන එක ඉතාම කනගාටුවෙන් අපට කියන්න සිද්ධ වෙනවා. තමන්ට ඡන්දය දීපු ජනතාව පාපිස්සට දැම්මා කියන්නේ මේක තමයි.

බොහෝ අය බලාපොරොත්තු වුණා, ඊයේ අය වැයෙන් අඩු ගාණේ 2026 වසරටවත් යම් බදු සහනයක් ලැබෙයි කියලා. නමුත්, එහෙම දෙයක් නැහැ. මේ දැවැන්ත බදු ඒ විධියටම තිබෙනවා. ඒ වෙනුවට මොකක්ද වෙන්නේ? 2027 ඉඳලා දේපළ බද්දක් ක්‍රියාත්මක වෙනවා. ඒ ගැන කවුරුවත් කථා කළේ නැහැ. 2026 අවුරුද්ද පුරාම ඉඩම් මැනුම් කරන්න, ඔප්පු බලන්න රජය ක්‍රියාත්මක වෙනවා. ඊයේ ජනාධිපතිතුමා පොඩි අදහසක් දෙකක් කිව්වා; සමහර වෙලාවට playground එකක් value කරන්නේ එක විධියකට, industrial property එකක් value කරන්නේ තව විධියකට වාගේ කථාවක් ඊයේ එතුමා කිව්වා. හැබැයි, එතුමා කිව්වේ නැත්තේ මොකක්ද? 2027 පළමුවැනි කාර්තුවේදී මේ දේපළ බද්ද අය කරන්න ගරු ජනාධිපතිතුමා IMF එකත් එක්ක එකඟ වෙලා තිබෙනවා. ඒක එතුමා ඊයේ කිව්වේ නැහැ. ඒ නිසා 2027 වෙනකොට දේපළ බද්දත් ගෙවන්න බලාපොරොත්තුවෙන් ඉන්න.

කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික අංශයේ හිටපු ප්‍රධානී මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා ළඟදී කරපු කථාවක් මම අහගෙන හිටියා, ගරු කථානායකතුමනි. එතුමා එහිදී කිව්වා, unseen poverty ගැන. අපි නොදකින, නමුත් මැද පන්තියේ තිබෙන දරිද්‍රතාව පිළිබඳව එතුමා කථා කළා. එතුමා විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් ගැන කථා කළා. ඔව්, රැකියාවක් තිබෙනවා, ගෙයක් තිබෙනවා, වාහනයක් තිබෙනවා. හැබැයි, සමාජයට කියන්න බැරි ආර්ථික ප්‍රශ්නවලට ඔවුන් මුහුණ දෙනවා. මේ ආර්ථික අර්බුදයත් එක්ක පහළ වැටුණු ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවන්න කිසිසේත්ම ඊයේ ඉදිරිපත් කරපු අය වැයෙන් රජයට හැකිවෙලා නැහැ කියන එක තමයි ඔහුගේ තර්කය වුණේ.

ගරු කථානායකතුමනි, මේ රජය සම්පූර්ණ ස්වාධීන තීරණ මත තමයි 2026 අය වැය ලේඛනය ඉදිරිපත් කළේ. ඒ අයට කියන්න බැහැ, ගිය ආණ්ඩුවේ ප්‍රශ්න නිසා මේ දේවල් වුණා කියලා. මොකද, මේ තමන්ගේ අය වැය.

සම්පූර්ණයෙන් රජයේ ස්වාධීන තීරණ තිබෙන්නේ. තමන්ගේම ජනාධිපති, තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුව, අතිබහුතරයක් මන්ත්‍රීවරු සහිත පළාත් පාලන ආයතන හිමියි. ජනතාව තවමත් විශ්වාසයෙන් රැඳී සිටිනවා. ජනතාව තුළ ඒක තිබෙනවා. මේ ආණ්ඩුව පිළිබඳව තවමත් ජනතාව කියන්නේ, "ඔව්, කාලයක් දෙන්න" කියන එකයි. මේ ඔක්කෝමත් එක්ක තමයි ඊයේ Budget එක ඉදිරිපත් කළේ. හැබැයි, අලුත් දේ මොකක්ද? ජනාධිපතිතුමා ඊයේ ඉදිරිපත් කරපු අය වැයට අනුව තමන්ගේ ආණ්ඩුවේ system change එක මොකක්ද? මොකක්ද, වෙනස? අපි දකින විධියට නම් කිසිම system change එකක් ඊයේ අය වැයෙන් ඉදිරිපත් කළේ නැහැ. Same thing, different day. අදායම් බදු සියයට 14.2යි, බදු නොගෙවන යම් කිසි ප්‍රමාණයයි, මුළු ආදායම අඩුවරයි, මෙච්චරයි කියලා කිව්වා. මම ඒ සම්බන්ධ දත්ත අද මෙතැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. නමුත්, ගිය අවුරුද්දට සාපේක්ෂව මහ ලොකු වෙනසක් කිසිම විධියකට ඉදිරිපත් වුණේ නැහැ. එදා මිනී මරනවා වාගේ කෑ ගැහුවා, "ණය ගන්නවෝ, ණය ගන්නවෝ" කියලා. මේ ආණ්ඩුව 2026 වසරට දේශීය ණය විතරක් රුපියල් බිලියන 3,110ක්, ඒ කියන්නේ රුපියල් ට්‍රිලියන 3.1ක් ගන්න බලාපොරොත්තු වෙනවා කියලා ජනාධිපතිතුමා ඊයේ කිව්වා. විදේශීය ණයත් එකතු කළාම මුළු එකතුව රුපියල් බිලියන 3,800ක්. ඒ කියන්නේ රුපියල් ට්‍රිලියන 3.8ක්. ඕක තමයි ඇත්ත කථාව.

ජනතාව රැවැට්ටුවා. "අන්න, අර මිනිස්සු ණය ගන්නවා. එහෙම ණය ගන්නේ මොනවාටද" කියලා ඇහුවා. එහෙම නම්, අපි අනුර දිසානායක ජනාධිපතිතුමාගෙන් අහන්න ඕනෑ, "ඇයි ජනාධිපතිතුමා, ඔබතුමා මේ කථාව කියන්නේ" කියලා. ඕක තමයි යථාර්ථය. ඔබතුමන්ලා ජනතාවට කිව්වේ මොකක්ද, දැන් ඇවිල්ලා කරන්නේ මොකක්ද කියන එක තමයි මම අහන්නේ.

"76 වසරක් තිස්සේ රට විනාශ කරපු කණ්ඩායම වෙනුවට රට හදන්න පුළුවන් අය තමයි ජේවීපී එකේ, එන්පීපී එකේ ඉන්නේ" කියලා තමයි 2024 ජනාධිපතිවරණය කාලයේත්, 2024 මහ මැතිවරණය කාලයේත් කිව්වේ. 2025දී කිව්වා, "මේක පළමුවැනි අවුරුද්ද, ටිකක් ඉවසන්න, මේ අවුරුද්දේ කරන්න අමාරුයි, 2026 වෙනකොට මේවා ඉෂ්ට කරලා දෙන්නම්" කියලා. ගරු කථානායකතුමනි, ජේවීපී, එන්පීපී අයට ඡන්දය දීපු කණ්ඩායමේ උගත්, තරුණ කිහිප දෙනෙකුට මම කථා කළා. සමහරු කසාද බැඳලා, සමහරු කසාද බැඳලා නැහැ. මම ඇහුවා, "ඇයි, ඔයාලා මේ අයට ඡන්දය දුන්නේ?" කියලා. ඒගොල්ලෝ කියපු කථාවේ සාරාංශය තමයි, මොවුන් අපේ තරුණ සිහින සැබෑ කරයි කියලා දැවැන්ත බලාපොරොත්තුවක් මත තමයි අපි ඔවුන්ට ඡන්දය දුන්නේ කියන එක. මම ඇහුවා, මොනවාද ඒ සිහින කියලා. මහ ලොකු දේවල් නොවෙයි, ඔවුන් කාරණා 5ක් කිව්වා. පළමුවැනි එක, යහමින් ජීවත් වෙන්න පුළුවන් පඩියක් ලැබෙන රැකියාවක් හෝ තමන්ගේ ව්‍යාපාරයක් පටන් ගන්න එක. දෙවැනි එක තමයි, කුඩා වාහනයක් ගන්න එක. තුන්වැනි එක, පොඩියට හෝ තමන්ට නිවාසයක් ලබා ගන්න එක. හතරවැනි එක, දෙමව්පියන්ට සලකන්න හැකියාවක් ලබා ගන්න එක. පස්වැනි එක තමයි, දරුවෙක් හෝ දෙදෙනෙක් හදා ගන්න එක.

අපි බලමු, මේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න ඡන්දයට කලින් දීපු පොරොන්දුයි, 2026 වර්ෂය වෙනුවෙන් ඊයේ ඉදිරිපත් කරපු අය වැයයි අතර තිබෙන පරස්පරය මොකක්ද කියලා. පළමුවැනි බලාපොරොත්තුව, රැකියාවක් හෝ ව්‍යවසායක අවස්ථාවක් කියන එක. මොකක්ද ලැබුණු අවස්ථාව, ගරු කථානායකතුමනි? "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ 72 පිටුවෙහි සඳහන්ව තිබෙනවා රැකියා විරහිත උපාධිධාරීන්ට කඩිනමින් - immediately - රැකියා ලබා දීමට පියවර ගන්නා බව. ගුරුවරුන් හැටියට 20,000ක් බඳවා ගන්නවා, STEM අංශයෙන් 3,000ක් බඳවා ගන්නවා, non-STEM අංශයෙන් IT රැකියාවලට 9,000ක් බඳවා ගන්නවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, Sri Lanka Customs එකට, Sri Lanka Foreign Service එකට, සංචාරක කර්මාන්තයට තවත් 3,000ක් බඳවා ගන්නවා කියලා එහි සඳහන් කර තිබෙනවා. හැබැයි, ඊයේ මොකක්ද කිව්වේ? කවදා හරි බඳවා ගන්නවා කිව්වා; උද්ඝෝෂණ කරන්නේ නැතිව පාරෙන් ඉවත් වෙන්න කිව්වා; ගෙදර යන්න කිව්වා. ඒක තමයි කිව්වේ. කඩිනමින් රැකියා දෙනවා කියලා ඇවිල්ලා, ගෙදර යන්න කියලා ඊයේ කිව්වා. එතකොට අර බලාපොරොත්තුවලට මොකද වෙන්නේ? පඩි පිළිබඳව වචනයක්වත් කථා කළේ නැහැ. කලින් දීපු increment එකෙන් තුනෙන් එකක් විතරයි ජනවාරි මාසයේ ලැබෙන්නේ.

පෞද්ගලික අංශයේ රැකියා ගැන කථා කරන්න කලින් බලමු, පොරොන්දු වෙච්ච බදු අඩු කිරීම් ගැන. PAYE Tax එකේ අවම බදු නිදහස මාසයකට රුපියල් ලක්ෂයක් ලෙසයි තිබුණේ. ඒ බදු සීමාව රුපියල් ලක්ෂ දෙක දක්වා වැඩි කරනවා කිව්වා. ඒ කියන්නේ, මාසයකට රුපියල් ලක්ෂ දෙකක් පඩි ගන්න පුද්ගලයෙකුට PAYE Tax එක ගහන්නේ නැහැ කියලා තමයි පොරොන්දු වුණේ. ඒ පොරොන්දු ගැන තමයි අපි මහා විශාල ලෙස දේශපාලන වේදිකාවල කථා කළේ. මොකද, අපි කිව්වා ඒක කරන්න බැහැ කියලා. රුපියල් ලක්ෂයේ සිට එක්ලක්ෂ පනස්දහසට සියයට එකක් ගහන්න, ඊට පසුව සියයට හයක් ගහන්න කියලා අපි කිව්වා. නමුත් ඔබතුමන්ලා කිව්වා, "නැහැ නැහැ. මේ කට්ටියට කරන්න බැහැ. අපට කරන්න පුළුවන්" කියලා. කළාද? කළේ නැහැ. අඩු ගණනේ බදු සල්ලි නිසා Treasury එක උතුරන මේ අවස්ථාවේ රුපියල් ට්‍රිලියනයක cash surplus එකක් තිබෙන කොටවත් ඒ පොරොන්දු වෙච්ච බද්ද අඩු කරන්න බැරිද කියලා අපට ජනාධිපතිතුමාගෙන් අහන්න වෙනවා.

මොකක්ද වුණේ පෞද්ගලික අංශයේ රැකියා උත්පාදනයට, SME ව්‍යාපාරිකයාට? පරාටේ නීතිය දාලා තිබෙන නිසා SME ව්‍යාපාරිකයන්ගේ මැෂින් ටිකයි, ඉඩම් ටිකයි මේ දවස්වල ඒ කට්ටියගෙන් ගැලවිලා යනවා. හැබැයි, විසඳුමක් දෙනවා කියලා කිව්වා. මොකක්ද දුන්නු විසඳුම? එදා කිව්වේ මොකක්ද? හිඟ ණය ප්‍රශ්නය විසඳන්න නව සහන බැංකුවක් දෙනවා කිව්වා. හිඟ ණය ප්‍රශ්නය විසඳන්න, නව සහන බැංකුවක්! කෝ, ඒ සහන බැංකුව, ගරු කථානායකතුමනි? කෝ ඒක?

වතු කම්කරුවන්ට දෛනික වැටුප විධියට රුපියල් 1,350 වෙනුවට රුපියල් 1,550ක් දෙනවා කිව්වා. රුපියල් 200ක් වැඩි කරන්න කොම්පැනිවලට නිර්දේශ කරනවා කිව්වා. හැබැයි ඊයේ ඒක කියපු ගමන් ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා අපේ පැත්තට හැරිලා කිව්වා, "බලන්න හර්ෂ, සේවකයින් 140,000ක් ඉන්නවා. බිලියන 8ක් ඕනෑ මේ වැඩේට. හැබැයි, දීලා තිබෙන්නේ රුපියල් බිලියන 5යි" කියලා. අඩුම තරමින් මේ ගණනවත් හදාගන්න පුළුවන් වෙන්න එපා යැ. ආණ්ඩු පක්ෂයේ ඉන්න, වතු කම්කරුවන් නියෝජනය කරන මේ මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියලා ගරු ජනාධිපතිතුමාට කියන්න එපා යැ, "මේක කරන්න පුළුවන් වැඩක් නොවෙයි" කියලා. ඊට පසුව ආයතන විසිනුත් රුපියල් බිලියන 8ක් වැඩිපුර දෙන්න ඕනෑ, මේ කියන රුපියල් 1,550 හදන්න.

අපේ ධීවරයන්ට, කුඩා ව්‍යවසායකයින්ට, ගමේ contractorට, පෞද්ගලික බස් හිමියන්ට දීපු අත්වැල මොකක්ද? තරුණ ව්‍යවසායකයාට මොකක්ද ලැබුණේ? SMEsවලට පොරොන්දු වෙච්ච දේවලට මොකද වුණේ? පොලී නැතිව ණය ගන්න පුළුවන් ජාතික සංවර්ධන බැංකුවක් හදනවා කිව්වා. ඊයේ ජනාධිපතිතුමා කිව්වා, ඇප නැතිව ණය රුපියල් මිලියන 4,000ක් වාගේ ප්‍රමාණයක් දීලා තිබෙනවා කියලා. මට ඒ ගණන හරියටම

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඇහුණේ නැහැ. පොලී නැති ණය ගැන තමයි එදා කථා කළේ. නමුත්, ඊයේ ජනාධිපතිතුමා කථා කළේ ඇප නැති ණය ගැනයි. ඇප නැති ණය ගන්න පුළුවන්, - අපේ පක්ෂයත් ADB එකේ කට්ටියත් එක්ක කථා කළා - National Credit Guarantee Institution එක හරහා.

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Deputy Minister, generally, you do not stop the Hon. Member speaking. So, reply when you speak. ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න පුළුවන් ඇප නැති ණය මොනවාද, පොලී රහිත ණය මොනවාද කියන එක ගැන. නමුත්, ඊයේ පොලී රහිත ණය ගැන කථා කළේ නැහැ. ඇප නැති ණය ගැන විතරයි කථා කළේ.

මාර්ගගත ක්‍රමයට - online ක්‍රමයට - freelance කරන විශාල කණ්ඩායමක් ඉන්නවා. ඔවුන්ගේ වෘත්තියට තිබෙන සියලු බාධක ඉවත් කරනවා කියලා තමයි කිව්වේ. හැබැයි, මොකක්ද කළේ? 2025දී ගැහුවා, අලුත් බද්දක්. Freelance කරන කට්ටිය සියයට බින්දුවයි බදු ගෙව්වේ. ගරු කථානායකතුමනි, ඒ බද්ද සියයට 15 දක්වා වැඩි කළා 2025දී. ඔවුන් හිතුවා ඒක ඉවත් කරයි කියලා. නමුත්, කිසි විධියකින් ඒක ඉවත් කළේ නැහැ. අවමයක් හැටියට වියදමවත් යන්නේ නැති අන්තර්ජාලය හරහා online job bank එකක් දානවා කිව්වා; එය වහාම ස්ථාපනය කරනවා කිව්වා. ඒක populate කරලා supply එකයි, demand එකයි අනුව ඒ දේ තීරණය වෙන්න ඉඩ දෙනවා කිව්වා. අඩුම ගණනේ ඒ job bank එකවත් දාගන්න පුළුවන් වුණාද කියලා මට ආණ්ඩුවෙන් අහන්න සිදු වෙනවා. ඊළඟට, තරුණ තරුණියන් වෙනුවෙන් හදන "V4R" එකක් ගැනත් කිව්වා. "පුනරුදය සඳහා අපි" - "We for the Renaissance" - නමින් Digital platform එකක් හදනවා කිව්වා. සංවර්ධන යෝජනා ඒ හරහා සෘජුවම රජයට ඉදිරිපත් කරන්න පුළුවන් කියලා කිව්වා. ඒක හැදුවාද? ඒවාට සල්ලි වියදම් වෙනවාද? නැහැ නේ. ඒවා තමයි තරුණ ප්‍රජාව බලාපොරොත්තු වෙච්ච දේවල්. නමුත් ඔවුන්ට ඒවා ලැබුණේ නැහැ.

වෙළෙඳාම් කරන ප්‍රජාවට මොකක්ද වුණේ? මහා පරිමාණ වෙළෙඳ හා හුවමාරු මධ්‍යස්ථාන දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපනය කරනවා කිව්වා. එවැනි මධ්‍යස්ථාන 25ක් කෙසේ වෙතත්, මේ මාස 12ට එක මහා පරිමාණ වෙළෙඳ හා හුවමාරු මධ්‍යස්ථානයක්වත් හැදුවාද කියලා මට ආණ්ඩුවෙන් අහන්න සිදු වෙනවා. එකක් හරි හැදුවාද? දැනට තිබෙන ටිකත් අවුල් වෙලා යන බවක් තමයි අපට පෙනෙන්නේ, ගරු කථානායකතුමනි. අත්තනෝමතික ලෙස මිල ඉහළ දැමීමෙන් වෙළෙඳ පොළ ඒකාධිකාරයක් නිර්මාණය වෙලා තිබෙනවා කිව්වා; ඒක විනාශ කරනවා කිව්වා. සහල් මාෆියාව බිඳිනවා කිව්වා. SMEsලාට අත දෙනවා කිව්වා. මොකක්ද වුණේ, ගරු කථානායකතුමනි? හොඳට හිතලා බලන්න, සහල් මාෆියාවට මොකක්ද වුණේ කියලා. ඒ කට්ටියට තවත් වාසි වැඩි කරලා හාල් ටික විකුණා ගන්න අවස්ථාවක් ලබා දුන්නා; ඒ කට්ටියට මිල වැඩි කරලා දුන්නා. කුඩා මෝල් හිමියාට කන පැළෙන්න ගැහුවා. මේ ළඟදී රජයේ තිබෙන වී මෙට්‍රික් ටොන් 50,000ක් අඹරන්න පවා ඔවුන්ට අවස්ථාව දුන්නේ නැහැ කියන එක ගැන අපි මෙතැනදී සාකච්ඡා කළා. ඒකෙන් මෙට්‍රික් ටොන් 30,000ක් දෙනවා කිව්වා. වසන්ත ඇමතිතුමා ඒ document එක table කරනවා කිව්වා. එතුමා ගියාට පස්සේ අපි ඒක හෙව්වා. එහෙම එකක් table කළේ නැහැ කියලා ගරු කථානායකතුමා කිව්වා.

කෘෂි නිෂ්පාදනවලට මොකක්ද වුණේ? ශීත ගබඩා සැකසුම් ඒකක හදනවා කිව්වා. දඹුල්ලේ "ප්‍රභාෂ්වර" කෘෂි ගබඩා සංකීර්ණයට මොකක්ද වුණේ කියලා අපට අහන්න සිදු වෙනවා. හැබැයි, ඊයේ ජනාධිපතිතුමා කථා කරන කොට මටම ඇඟිල්ල දිගු කරලා කිව්වා, "හර්ෂ, අපි කොහොම හරි දඹුල්ලේ 'ප්‍රභාෂ්වර' වැඩේත් මේ අවුරුද්දේ ඉවර කරනවා" කියලා. මිලියන 250ක solar panel එකක් සවි කරනවා කිව්වා. අකමැත්තෙන් හරි මට අහන්න වෙනවා, "අනේ! ඉන්දියාවේ මෝදි අගමැතිතුමා ආපු වෙලාවේ ඔහුවත් රැවට්ටුවා නේද?" කියලා. කමක් නැහැ. කොහොම හරි ඒ වැඩේ ඉවර කරනවා නම් ඒ අහිංසක ලූනු ගොවියාට, ඒ අහිංසක අල ගොවියාට තමන්ගේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්න අවස්ථාවක් ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

තව මොනවාද කිව්වේ? වසර පහක් තිස්සේ කෘෂි ව්‍යවසායකයන් 50,000ක් හදනවා කිව්වා. එහෙම නම් ගරු කථානායකතුමනි, 2025දී කෘෂි ව්‍යවසායකයන් 10,000ක් හදන්න එපා යැ. එක් කෙනෙක්වත් හැදුවාද කියලා අපට ඔබතුමන්ලාගෙන් අහන්න වෙනවා. කිරි නිෂ්පාදන ගොවි පොළවල් 7,500ක් හදනවා කිව්වා. ඒකෙන් එකක්වත් හැදිච්ච බවක් අපට නම් පෙනෙන්න නැහැ.

ගරු කථානායකතුමනි, මට තවත් දිගට කථා කරන්න පුළුවන්. නමුත් වෙලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපි focus කරමු, විශාල ආයෝජකයන් සම්බන්ධයෙන්. මොකද ඒ අය තමයි විශාල පරිමාණයේ රැකියා නිර්මාණය කරන්නේ.

ඊළඟට බලන්න, කවුද ආවේ, BoI එකට? පළමුවැනි මාස 9දී BoI එකට ආපු සෘජු විදේශ ආයෝජන සියයට 138කින් වැඩි වුණා කියලා ආණ්ඩුව ලොකුවට press release එකක් කළා. ඊයේ ගරු ජනාධිපතිතුමා කිව්වා, ඩොලර් මිලියන 823ක් ආවා කියලා. හැබැයි, ඇත්ත කථාව මොකක්ද? 2015දී ඩොලර් මිලියන 1,161ක් ආවා. 2016දී ඩොලර් මිලියන 1,098ක් ආවා. 2017දී ඩොලර් මිලියන 1,910ක් ආවා. 2018දී ඩොලර් මිලියන 2,139ක් ආවා. එහෙම නම් මොනවාද මේ කියන්නේ? ඩොලර් මිලියන 823ක් ආපු එකක් ගැන කියන්නේ, ලංකාවේ ප්‍රථම වතාවට එහෙම දෙයක් වුණා වාගෙයි. පසුගිය අවුරුදු දෙකේ ඒ ව්‍යවසායකයන්ට, ආයෝජකයන්ට පිට රටවලින් ණය ගන්න බැරි වෙච්ච නිසා, outside loans අඩු වෙච්ච නිසා තමයි යම්කිසි ප්‍රමාණයකට FDIs ප්‍රමාණය අඩු වෙලා තිබෙන්නේ, BPM6 calculation එක හරහා.

ගරු කථානායකතුමනි, අපි හොයලා බැලුවා, මොනවාටද ඒ කියන ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ කියලා. මොනවාටද, ඒ ආයෝජන ඇවිල්ලා තිබෙන්නේ? මෙතුමන්ලා කිව්වේ, මෙතුමන්ලා කෙරෙහි විශ්වාසය ගොඩනැඟිලා තිබෙනවා, ඒ නිසා ආයෝජකයන් දැන් දිගට හරහට දුවගෙන එනවා කියලායි. එහෙම නොවෙයි. අදානි සමාගම සමඟ 2021දී ගිවිසුම් අත්සන් කළ වරාය ව්‍යාපෘතියට ඩොලර් මිලියන 229යි; ඊට පසුව 2024දී

ගිවිසුම් අත්සන් කළ Melco casino එකට ඩොලර් මිලියන 85යි; Indian apartmentsවලට අදාළව ඩොලර් මිලියන 47යි; ඊළඟට Michelin company එකයි CEAT company එකයි කරපු share exchange එක නිසා, ඒ restructure එක නිසා ඩොලර් මිලියන 83යි. එතකොට ඔය ආවා කියන ආයෝජනවලින් සියයට 67කට වඩා ඇවිල්ලා තිබෙන්නේ, අර පරණ කාලයේ කරපු investmentsවල ප්‍රතිඵලයක් හැටියට. එහෙම නැතුව ඔබතුමන්ලා කළ දෙයක් නිසා නොවෙයි.

Then, Hon. Speaker, what about exporters? What steps have you all taken to safeguard the lifeline - the exporters - that keeps our economy going? Beyond celebrating your so-called success at US tariff negotiations, how are you making sure that our exporters will continue to be competitive? Since I do not want to enter into another controversy over the Trump tariff, I will keep away from that discussion. But, let me tell you, talk is cheap. Just last week, many of our competitors in the region got super trade deals agreed with the United States during President Trump's visit to Asia. While most nations are doing their utmost to support the export industry, all what you all did was to remove the SVAT from exporters and their suppliers. They promised a 45-day refund, which is still a promise. The promise of a parallel run was never fulfilled. With the cost of doing business going up, the removal of SVAT and imported inputs becoming cheaper than local purchases, we may actually see a reversal of  backward integration in the export industry and that is really a serious concern.

Last night, I watched online a part of Deloitte's Budget Webinar. The Government representatives were all gung-ho about the Budget and dismissed any impact on SVAT withdrawal and instead, blamed the industry for leakage. Actually, they did. But, the representative from the Joint Apparel Association Forum was not amused, Sir. He clearly articulated that there is a huge challenge in the promised 45-day refund. He said that certainly there would be much pressure on cash flow and margins and that it would specifically be more pronounced for small and medium enterprises.

In the last Budget, the President spoke about RCEP. That is, Regional Comprehensive Economic Partnership with ASEAN and five other countries. He talked about strengthening trade relations with Asia and Africa. Sir, but yesterday, he did not speak a word about the RCEP, did not even mention the term "RCEP". Please, tell us whether an iota of work had been done to achieve that objective. The Hon. Ravi Karunanayake just now asked a Question on ETCA. But, there was no answer. Why? Because there is no answer to be given, Sir.

Like I said, talk is cheap. Both the Hon. President and the Hon. Prime Minister, who is here, visited India this year. But, none of them even mentioned about CEPA or ETCA in their statements. The Hon. Prime Minister spoke about many things, but she forgot to mention the two four -letter words - ETCA and CEPA. Why is that? Because, there is no real intention of integration with the region and there is no political will to walk the talk. Madam, you do not have the political will to walk the talk. All what you people are doing is using flowery language to fool the masses, hoping that God would create jobs for them. God is not going to create jobs for us. Honestly, there had been some 14 rounds of discussions between Sri Lanka and India on CEPA and ETCA. After another two rounds, the agreements could have been concluded. Why on earth are you all dragging your feet? Talking about RCEP is pie in the sky, Madam Prime Minister; it cannot be completed, if you cannot complete ETCA. That is because there is absolutely no way that you all would be willing to liberalize trade in services to even think about RCEP. Some of you all are living in a fool's paradise.

මම කියා ගෙන ආවේ, එදා ඔබට ඡන්දය දීපු කණ්ඩායම්වල බලාපොරොත්තු ගැන. ඔවුන්ගේ රැකියාව, ජීවන තත්ත්වය සහ කඩවුණු බලාපොරොත්තු ගැන. ඒ අයගේ දෙවැනි බලාපොරොත්තුව වුණේ පොඩි වාහනයක් ගන්න එක. Vitz car එකක් ගන්න පුළුවන් කියපු පොරොන්දුව ඔබතුමන්ලා අමතක කරන්න එපා. ජපානයෙන් ගෙනෙන මෝටර්සයිකල් එකක් ගන්න පුළුවන් කිව්වේ වෙන කවුරුත් නොවෙයි, ගරු ජනාධිපතිතුමා. මැතිවරණය කාලයේ කිව්වේ. ජපානයෙන් ගෙන්වපු මෝටර්සයිකල් පදින්න පුළුවන් කිව්වා. ඊයේ වාහනවලට තවත් බද්දක් පැනෙව්වා. ඒ තමයි, Social Security Contribution Levy එක. ඒක වාහනය විකුණන කොට refund කරනවා කිව්වා. ඒක මට පැහැදිලි නැති නිසා, මම ඒ සම්බන්ධයෙන් දැන් කථා කරන්නේ නැහැ. මොකද, අලුත් බද්දක් වදිනවාද, නැද්ද කියන එක ගැන confused. නමුත්, තිබෙන බදු අඩු කළේ නැති බව නම් මෙතැනදී කියන්න සිද්ධ වෙනවා. ලෝකයේ දෙවැනි වැඩිම වාහන tax එක තමයි ලංකාවේ තිබෙන්නේ. ඔබතුමන්ලා සතුටු වෙනවා ඇති. පොඩි Vitz car එකක් ගන්න බලාපොරොත්තුවෙන් හිටපු අයට ඔබතුමන්ලා ඇත්තටම ලබා දීපු දේ ඒක තමයි.

ගරු කථානායකතුමනි, තමන්ට කියලා ගෙයක් හදා ගන්න එක තමයි, තුන්වැනි බලාපොරොත්තුව හැටියට ජනතාවට තිබුණේ. අපි පිළිගන්නවා, අපේ රටේ බොහෝ අයට ඉන්න තැනක් තිබෙන බව. හුඟක් වෙලාවට දෙමාපියන්ගේ ගෙදර කාමරයක් දෙකක් හෝ කොටසක් බෙදලා දීලා තිබෙනවා. සමහර වෙලාවට ඒවා නීත්‍යානුකූලව දීලා තිබෙනවා; සමහර වෙලාවට ඇනෙක්ස් එකක් හදලා දීලා තිබෙනවා. හැබැයි, කවුරුත් කැමැතියි තමන්ගේ කියන තැනකට යන්න. ගරු කථානායකතුමනි, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 31වැනි පිටුවේ සඳහන් වෙනවා, තරුණ විවාහක පිරිස් සඳහා නව නිවසක් මිලදී ගැනීමට හෝ නිවසක් ඉදිකර ගැනීමට මූල්‍ය පහසුකම් ලබා දෙනවා කියලා. ඒවා තමයි පොරොන්දු. ඒවා කියලා තමයි ඡන්ද  ලබා ගත්තේ.

ඊළඟට, නාගරික ප්‍රදේශවල මහල් නිවාස ඉදි කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීමට රජයෙන් ඉඩම් ලබා දෙනවා කිව්වා. නිවාස ඉදි කිරීමේදී ඉඩම් අයිතියේ ගැටලු විසඳනවා කියලා ඔබතුමන්ලා කිව්වා. මම අහන්න කැමැතියි, "උරුමය" වැඩසටහනට මොකක්ද වුණේ කියලා. ගරු කථානායකතුමනි, හොඳට අහගන්න. නිවාස 70,000ක් හදන්න ඕනෑ කියනවා. නමුත් ඊයේ කියපු විධියට, 2026දී නිවාස 10,000ක් හදන්න මුළු වියදම හැටියට වෙන් කරන්නේ, රුපියල් මිලියන 10,200යි. ගෙවල් 70,000ක් හදන්න ඕනෑ, ඒකෙන් 10,000ක් 2026දී හදනවා. ඒ සඳහා වෙන් කරන්නේ රුපියල් බිලියන 10.2යි. ඒ කියන්නේ ගෙයකට රුපියල් මිලියනයයි. මට කියන්න, මිලියනයකින් ගෙයක් හදන්න පුළුවන්ද කියලා. *[බාධා කිරීම්]* හරි, මම පෙන්වන්නම්. අද වර්ග අඩියක් අඩු quality එකෙන් හදන්න රුපියල් 10,000ක් යනවා. ඉඩමට නැතුව, වර්ග අඩියක් හදන්න රුපියල් 10,000යි. ඔව්, ගෙයක් හදන්න පුළුවන්. හැබැයි, ඒ ගෙයි ප්‍රමාණය වර්ග අඩි 100යි.  *[බාධා කිරීම්]* වර්ග අඩි 100ක ගෙයක් හදන්න පුළුවන්.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ඊට පස්සේ කියනවා, ඇපල් වත්තේ, මාදම්පිටියේ, ෆර්ගසන් මාවතේ, ස්ටේඩියම් ගමේ, කොළඹගේ මාවතේ, ටොරින්ටන් පෙදෙසේ සහ අපේ කෝට්ටේ අරුණෝදය මාවතේ ගෙවල් කිහිපයක් හදන්න රුපියල් බිලියන 15ක් වෙන් කරලා තිබෙනවා කියලා. ඇත්ත වශයෙන්ම ගරු කථානායකතුමනි, ඒක 2018-2019 වර්ෂවල project proposal එකක්. මම ගිහිල්ලා Urban Regeneration Plan එක බැලුවා. ඒකේ cost එක රුපියල් බිලියන 90යි; it was US Dollars 300 million at that time. ඉතින්, රුපියල් බිලියන 15ක් වෙන් කරලා මේ ගෙවල් හදනවා කියලා බොරු පොරොන්දු තමයි, ඔබතුමන්ලා ඊයේ දීලා තිබෙන්නේ.

ඊට වඩා හොඳ කථාවක් ඊයේ ජනාධිපතිතුමා කිව්වා. මේක තමයි ඒ best කථාව. රාජ්‍ය සේවකයන්ට සහන පොලී යටතේ නිවාස ණය දෙනවා කිව්වා. රුපියල් ලක්ෂ 30ක් දක්වා, සියයට 4ක පොලී සහනයක් දෙනවා කිව්වා. මෙහෙමත් කිව්වා. "පොලිය සියයට 10ක් නම්, සියයට 6යි ඔයගොල්ලෝ ගෙවන්නේ, ඉතිරි සියයට 4ක් අපි ගෙවනවා" කියලා ජනාධිපතිතුමා කිව්වා. ඒක රුපියල් ලක්ෂ 30කට limit කරලා තිබෙනවා. තවත් රුපියල් ලක්ෂ 20ක් ගන්න පුළුවන්, වෙනම ක්‍රමයකට. නමුත්, අපි හිතමු, උපරිමය ලක්ෂ 30ක් සියයට 10ක පොලියට ගත්තා කියලා. සියයට 10ට ගත්තොත්, අවුරුද්දකට පොලිය රුපියල් ලක්ෂ තුනයි. එයින් ණයකරු ගෙවනවා, රුපියල් 180,000ක්. රජය ගෙවනවා, රුපියල් 120,000ක්. කෙනෙකු කියන්න පුළුවන්, ඒක කොච්චර හොඳයිද කියලා. බලන්න, මෙච්චර හොඳට අපිට සලකනවා කියන්න පුළුවන්. හැබැයි, ඒ සඳහා වෙන් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 500යි. මේ රටේ රජයේ සේවකයෝ මිලියන 1.4ක් ඉන්නවා. මේ කථාව අනුව ඒ අයගෙන් 4,166දෙනෙකුට ණය දෙන්න පුළුවන්. *[බාධා කිරීම්]* එහෙම නම් මේක joke එකක්ද, එහෙම නැත්නම් reality එකද කියලා කනාගටුවෙන් හරි අහන්න අපට සිද්ධ වෙනවා.

ඒ නිසා යථාර්ථය මොකක්ද කියන එක අපට දැනගන්න සිද්ධ වෙනවා. ඇත්ත කථාව මේකයි ගරු කථානායකතුමනි. අපි සොයා බැලුවා. අපි බැංකුවලට කථා කළා. State banks, private banks ඔක්කොටම කථා කරලා ඇහුවා, ඇත්තටම මේ ණයක් ගන්න නම් කොච්චර විතර ගෙවන්න ඕනෑද, කොච්චර විතර පඩියක් තිබෙන්න ඕනෑද කියලා. ඒගොල්ලන් කියනවා, පඩියෙන් උපරිම සියයට 60ක් housing loan එකක් හැටියට ගන්න පුළුවන්, forced sale value එකෙන් සියයට 70ට අඩු වෙන්න ඕනෑ, අවුරුදු 10ක loan එකක් ගන්නවා නම් පොලිය සියයට 10ත්, 14ත් අතර වෙනවා, රුපියල් 80,000ක මාසික පඩියක් තිබෙනවා නම් රුපියල් මිලියන 2.3ත්, 2.8ත් අතර loan එකක් ගන්න පුළුවන් කියලා. එතකොට, පඩියෙන් රුපියල් 40,000ක්, 48,000ක් ගෙවන්න වෙනවා, රුපියල් 80,000ක් පඩිය ලැබෙන කෙනෙක්. රුපියල් මිලියන 2.5ට මැද පන්තියේ ගෙවල් කොහේද තිබෙන්නේ, ගරු කථානායකතුමනි? *[බාධා කිරීමක්]* රුපියල් මිලියනයකට ගෙවල් තිබෙනවා කියලා ගරු ඇමතිතුමා කියනවා. හැබැයි, රුපියල් මිලියනයකට තිබෙන ගෙවල් කියන්නේ වර්ග අඩි 100ක විතර ගෙවල්. එහෙම නොවෙයි අපි කථා කරන්නේ. අඩුම ගණනේ වර්ග අඩි 500ක්, 600ක්වත් තිබෙන්න ඕනෑ ගෙයක් වුණාම. අපේ construction cost එක ඉතාම ඉහළයි. තායිලන්තය, ඉන්දියාව වාගේ අපේ කලාපයේ අනෙක් රටවල් එක්ක compare කරනකොට අපේ රටේ construction cost එක අතිශයින් වැඩියි. අපි සොයා බැලුවා ඒ ඇයි කියලා. මෙච්චර බලාපොරොත්තුවක් තිබෙනවා නම් තරුණ කට්ටියට ගෙයක් හදාගන්න උදවු කරන්න, ඒකට සහනයක් දෙනවා කියලා කියනවා නම්, බදු ගහලා ගහලා Treasury එක උතුරනවා නම් ඇයි ඒක නොකරන්නේ? මෙන්න, මම කියන්නම් ඒවාට තිබෙන බදු ටික. ගෙවල් හදනකොට තිබෙන බදු ටික. HS codeවලට අනුව සිමෙන්තිවලට ගහනවා සියයට 49ක්, ඇස්බැස්ටෝස්වලට ගහනවා සියයට 99ක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you have another two minutes.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට කාලය මදි. මට තව විනාඩි 15ක් ලබා දෙන්න, සංවිධායකතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව විනාඩි 5ක කාලයක් ලබා දෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
විනාඩි පහළොවක් දෙන්න.

Wall tilesවලට සියයට 60ත්, 105ත් අතර, bathroom fittingsවලට සියයට 60ක්, කොන්ක්‍රීට්වලට සියයට 60ක්, PVC පයිප්පවලට සියයට 92ක්, insulated wiresවලට සියයට 53ක් වශයෙන් බදු ගහනවා. ඇත්තටම ප්‍රජාවට ගෙයක් හදන්න උදවු වෙනවා නම්, මෙන්න මේ ප්‍රශ්නය විසඳන්න කියලා අපි ජනාධිපතිතුමාට කියනවා. ඒ සඳහා මේ Cess එක, PAL එක අයින් කරන්න අවශ්‍ය වෙනවා. මේ බදු ටික අඩු කරගන්න වෙනවා. අර විනෝද ගමනක් යන අවස්ථාවක් ගැන අපි කථා කරන්නේ නැහැ. ඒකට වෙලාව නැහැ. ඔබතුමන්ලාට ඡන්දය දුන්නාද, නැද්ද කියන එකට එහා ගිහින්, මේ ගැනත් හිතා බලන්න.

අපේ සමාජයේ තිබෙන වැදගත්ම ලක්ෂණයක් තමයි දරුවන්ගේ කැමැත්ත මත දෙමාපියන් රැක බලාගැනීම. ඒක මූලිකම අංගයක්. ජීවත්වීමට යම් ආදායමක් තිබෙන්න ඕනෑ ඒ අයට. ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කරන්න ඕනෑ. තමන් බලා ගත්ත දෙමාපියන් බලාගන්න අපේ දරුවෝ කැප වෙලා ඉන්නවා. ඒක තමයි අපේ රටේ සංස්කෘතිය. එහෙම තමයි අපි හැදිලා තිබෙන්නේ. මොනවාද ඒ අයට දීපු පොරොන්දු? සියලු අංශවල ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදනවා කිව්වා. විශ්‍රාම වැටුප් අරමුදලක් හදනවා කිව්වා මහ බැංකුවත් එක්ක එකතු වෙලා. මේ වැඩේ කරන්න අවම වශයෙන් යම් කතිකාවක්වත් පටන් ගත්තාද කියලා ගරු ජනාධිපතිතුමාගෙන් අහන්න වෙනවා. පෞද්ගලික අංශයේ සියලු ස්තරවල ශ්‍රමිකයන්ට සෞඛ්‍ය, ජීවිත රක්ෂණ ක්‍රමයක් දෙනවාය කියනවා.

මේ සියලු ක්‍රමවලට දායක ක්‍රමයක් අවශ්‍ය වනවා කියලා කිව්වා. ඒ කියන්නේ, contributory pension එකක්. නමුත්, ඊයේ ජනාධිපතිතුමා ඉතාම irresponsible වැඩක් කළා. ඒ මොකක්ද? රංජිත් මද්දුම බණ්ඩාර මහත්මයා පෙන්නලා කිව්වා, ඒ දවස්වල බඳවා ගැනීම් කරනකොට ගහපු ගැසට් එක ඉවත් කරනවා කියලා. ඒකෙන් මොකක්ද එතුමා අදහස් කළේ? එතුමා අදහස් කළේ අපි කිසිම විධියකට දායකත්වයක් ලබා ගන්නේ නැතිව දිගටම මේ ගිනි කන්ද උඩම ජීවත් වෙන්න බලාපොරොත්තු වෙනවා කියලායි. 2015දී වැටුප් සඳහා රුපියල් බිලියන 562යි; විශ්‍රාම වැටුප් සඳහා බිලියන 157යි. 2026දී වැටුප් සඳහා රුපියල් බිලියන 1,323යි; විශ්‍රාම වැටුප් සඳහා රුපියල් බිලියන 517යි. ඒ කියන්නේ සියයට 135කින් වැටුප් වැඩි වෙලා තිබෙනවා. සියයට 230කින් විශ්‍රාම වැටුප් වැඩි වෙලා තිබෙනවා.

අපි කවුරුත් දන්නවා, අපේ රටේ වයසක ප්‍රජාව එන්න එන්න වැඩි වන බව. ඒ අයට ජීවත් වීමට සරිලන පසුබිමක් හදන්න නම්, ඒ අවශ්‍ය දායකත්වය ලබා දෙන්න නම් අපට pension එකක් හදන්න සිද්ධ වනවා. හරි, මේවා ලෙහෙසි නැහැ කියමුකෝ. කලින් රජය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ fixed depositsවලට සියයට 5ක් වැඩිපුර ගෙව්වා. ගිය අවුරුද්දේ ඔයගොල්ලන් ඒක සියයට 3ට අඩු කරලා කිව්වා, ලක්ෂ 10ක් වනකල් ගෙවනවා කියලා. ඊයේ ජනාධිපතිතුමා කිව්වා, පරණ arrears වගයක් ගෙවන්න තිබෙනවා කියලා. එතුමා කිව්වේ නැත්තේ මොකක්ද, ගරු කථානායකතුමනි? එතුමා කිව්වේ නැත්තේ, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වැඩිපුර ලබාදෙන සියයට 3ක පොලිය මේ අවුරුද්ද ඉවර වනකොට නවත්වනවා කියන එක. එතුමා ඒක කිව්වේ නැහැ. එහෙම තමයි IMF එකත් එක්ක එකඟ වුණේ. අපි අභියෝග කරනවා. පුළුවන් නම් පෙන්වන්න, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දෙන පොලී සහනය මේ අවුරුද්ද ඉවර වනකොට නවත්වන්න IMF එකත් එක්ක එකඟ වුණේ නැද්ද කියලා.

දෙමව්පියන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන කථා කරනකොට නොයෙකුත් පොරොන්දු දුන්නා. කෙටි කාලයකදී සෞඛ්‍ය වියදම සියයට 3ක් කරනවා කියලා පොරොන්දු වුණා. සියයට 1.5ක්, 1.6ක් වියදම් වනවා ඇති. කවදාද මේක වෙන්නේ කියලා මම දන්නේ නැහැ. හැබැයි, හොඳ දෙයට හොඳයි කියලාත් කියන්න ඕනෑ. යම් මුදල් ප්‍රමාණයක් base hospitalsවලට වෙන් කර තිබෙනවා. ආරෝග්‍යා මධ්‍යස්ථානවලට මුදල් වෙන් කර තිබෙනවා. ඒවා හොඳයි. අවුරුදු 40ට වැඩි සියලුදෙනාට - ඔබතුමාත් සමහර විට මේක ලියන්න උදවු වෙන්න ඇති - වාර්ෂිකව නොමිලේ වෛද්‍ය පරීක්ෂණයක් කරනවා කිව්වා. එහෙම කිව්වා නේ. ඒක සඳහන් කර තිබෙනවා. හැබැයි, කිසිම විධියකට ඒ ගැන කථාවක් වෙන්නේ නැහැ. නිදන්ගත රෝගීන්ට රුපියල් 10,000 ගණනේ ලබා දෙනවා කියලා තිබෙනවා. ඒක තැලසීමියා රෝගීන්ට විතරක් දෙන්න කියලා රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා.

ඖෂධ මිල සාධාරණ ලෙස පවත්වාගෙන යෑම සහතික කරනවා කියලා කියනවා, නිසි පරිදි ඖෂධ තොග පවත්වා ගන්නවා කියලා කියනවා. මම හිතන විධියට, ඒ ගැන කථා කරලා ඇති වැඩක් නැහැ. අපි දන්නවා, ඖෂධවල තත්ත්වය මොකක්ද කියලා. ඊළඟට කියනවා, රජයේ රෝහල්වල online ක්‍රමයට appointments ගන්න වැඩසටහනක් වහාම හඳුන්වා දෙනවා කියලා. මේක කරන්න සල්ලි යන්නේ නැහැ නේ, ගරු ඇමතිතුමනි. හැබැයි, ඒකවත් කළේ නැහැ නේ. අවුරුද්දක් තිස්සේ ඒකවත් කරලා නැහැ. මේ, පොඩි දෙයක්. Doc990, eDoc වැනි ගොඩක් දේවල් තිබෙනවා. ඒ වාගේ දෙයක් කරන්න හැකියාවක් තිබෙනවා. අඩු ගණනේ ඒ වාගේ දෙයක්වත් කරන්න. එහෙම නොවුණොත් මිනිස්සුන්ට දවස් ගණන් පෝලිම්වල ඉන්න වෙනවා. Lab test එකක් කළාම, ඒ පිළිබඳව පැය 24 පුරා දුරකථනයෙන් වෛද්‍යවරයෙකුගේ හා nurse කෙනෙකුගේ interpretation එකක් කරන්න දෙනවා කියලාත් කියා තිබෙනවා. හැබැයි, ඒවාට වියදම් කරන්න රුපියල් 5ක්වත් allocate කරලා නැහැ.

"සුවසැරිය" ගිලන් රථ සේවාවේ නම වෙනස් කරන්න උත්සාහ කළා. ඒවා කරලා වැඩක් නැහැ. ඒක අපි ජාත්‍යන්තර තලයට ගෙනැවිත් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඊයේ තේ පැන් සංග්‍රහය වෙලාවේ ජනාධිපතිතුමා මට කිව්වා, ඒකේ වෙනසක් කරන්නේ නැහැ, ඒක ඒ විධියට කරගෙන යනවා කියලා. බොහොම හොඳයි. පොරොන්දු වෙච්ච දේවල් ඉෂ්ට කරන්න.

ගරු කථානායකතුමනි, තරුණ කණ්ඩායම්වල මූලික බලාපොරොත්තුව තමයි, දරුවෙක් දෙදෙනෙක් හදා ගන්න එක. නමුත් වියදම දරා ගන්න වෙන නිසා ඒක අමාරුයි කියලා තමයි ඔවුන් ඒ සම්බන්ධයෙන් කථා කරනකොට කියන්නේ. රජයේ පාසලකට දරුවෙක් දමා ගන්න ඕනෑ. ඔව්, ගරු අග්‍රාමාත්‍යතුමිය නොයෙකුත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරනවා. අපි ඒවාට සහයෝගය දෙනවා. හැබැයි, PowerPoint presentation එකකින් විතරක් මේක කරන්න බැහැ. අධ්‍යාපනය ආයෝජනයක් නොවෙයි, අයිතිවාසිකමක් කියන එක අපි පිළිගන්නවා. අපි එතැනින් පටන් ගනිමු. නමුත්, මීට එහාට ගිහිල්ලා, ඔයගොල්ලන් 1980 White Paper එක ගෙනාපු වෙලාවේ ඒවාට ගිනි තියන්නේ නැතිව, ඒවාත් එක්ක එකඟ වෙලා වැඩ කළා නම් අද අපි කොච්චර ලොකු තැනක ද ඉන්නේ කියලා මට අහන්න සිද්ධ වෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
හරියට හරි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම තව කාරණයක් කියන්න ඕනෑ. ගමේත්, නගරයේත් දෙමව්පියන්ගෙන්, තමන්ගේ දරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් උගන්වන්න පුළුවන්ද, ඒකට කැමැතිද කියලා මම අහන ගොඩක් වෙලාවට සියයට සියයක් දෙනා කියන්නේ, "ඔව්" කියලා. ඒ නිසා සමහරු ණය අරගෙන, ඉඩම් විකුණලා, රැකියා දෙකක් කරලා ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙන ගන්න international schoolsවලට, private schoolsවලට දරුවන්ව යවනවා.

මම සොයා බැලුවා, Grade 4 ඉගෙන ගන්නා ළමයෙකුට term එකකට කොච්චර විතර වියදමක් යනවාද කියලා. ඒ වාගේ ඉස්කෝලයක ඉගෙන ගන්න term එකකට රුපියල් 75,000ක්, 150,000ක් විතර වැය වනවා, ගරු කථානායකතුමනි. රුපියල් 50,000ක් හෝ 60,000ක් වැනි ඊට වඩා අඩු මුදලක් වැය වන පාසලුත් තිබෙනවා. මම මේ විග්‍රහ කළේ අපේ රටේ සාමාන්‍ය, මැද පන්තියේ තරුණ තරුණියන්ගේ සරල සිහින හා එම සිහින සැබෑ කර ගන්න ඔබතුමන්ලා දුන් පොරොන්දු සහ ඊයේ ඉදිරිපත් කළ යථාර්ථය අතර තිබෙන දැවැන්ත වෙනස ගැනයි. රටේ දරිද්‍රතාව ගැන මම අද ගැඹුරින් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැති වුණාට -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over now.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමාට තව ටිකක් කාලය ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Another five minutes?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I will finish in ten minutes, Sir.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Ten minutes?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Yes. ගරු කථානායකතුමනි, කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

රටේ සියයට 25ක පමණ ජනතාවක් දුප්පත්කමෙන් පෙළෙන බවත්, සියයට 50කට කිට්ටු ප්‍රමාණයක් දරිද්‍රතා අවදානම් කලාපයේ සිටින බවත් අපි කවුරුත් දන්නවා. හැබැයි, ඊයේ ඉදිරිපත් කළ සමස්ත අය වැය ලේඛනය තුළින්, දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව ගොඩ ගන්නේ කොහොමද කියන කාරණය කථා කරන්න ජනාධිපතිතුමාට අමතක වුණා. අස්වැසුම ප්‍රතිලාභය ලබා දෙනවා කියලා තැන් තැන්වල කිව්වාට, සමාජ ආරක්ෂණය ගැන බලාපොරොත්තු වුණු විධියට කථාවක් සිද්ධ වුණේ නැහැ.

ගරු කථානායකතුමනි, කාල වේලාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා මම අවසාන වශයෙන් මේ කාරණය කියන්න කැමැතියි. තිරසාර සංවර්ධනයක් කරා යන්න නම්, අපේ රටේ දරිද්‍රතාව තුරන් කරන්න නම්, රැකියා නිර්මාණය කරන්න නම්, 2048 වනකොට ඉහළ ආදායම් ලබන රටක් මට්ටමට යන්නම් හෝ ගොඩ වෙන්න නම්, 2026 ඉඳලා හැම අවුරුද්දේම රටේ ආර්ථිකය සියයට නවයත්, නවයහමාරත් අතර ප්‍රමාණයකින් මූර්ත වර්ධනයක් කර ගන්න සිද්ධ වනවා. ජනාධිපතිතුමා කියපු සියයට 7ක වර්ධනය හොඳටම මදි. ආණ්ඩුවට තිබෙන අවුල තමයි, ස්ථාවරත්වයෙන්, වර්ධනය කරා ඉදිරියට යන්න තෝරා ගන්නේ මොන පාරද කියන එක; you all are confused about your own ideology. ඒක තමයි මම ඊයේ එතුමාගේ කථාව ඉවර වුණාම කිව්වේ, "මම දැක්කේ, පල්ලියේ father කෙනෙක් පන්සලේ බණ කියනවා වාගේ කථාවක්" කියලා. මොකද, බයිබලයේ කරුණු තුළින්ද කථා කරන්නේ, ධම්ම පදය තුළ තිබෙන කරුණු තුළින්ද කථා කරන්නේ කියන එක පිළිබඳව අවබෝධයක් නොතිබුණු බව තමයි මට පෙනුණේ. ඔබතුමන්ලාගේ ආර්ථික දැක්ම මොකක්ද කියලා අහන්න මට සිද්ධ වනවා. ටිල්වින් සිල්වා මහත්මයාගේ සමාජවාදය ද, එහෙම නැත්නම් අනුර කුමාර දිසානායක ජනධිපතිතුමාගේ නව ලිබරල්වාදය ද, එහෙම නැත්නම් මාලිමාවේ කටුව කොයි පැත්තටද කැරකෙන්නේ, එය කැරකිලා කැරකිලා නවතින්නේ නැද්ද කියන ප්‍රශ්න මට අහන්න වනවා. මේවාට උදාහරණ මහ ගොඩක් අපට දෙන්න පුළුවන්. නමුත්, කාලය නොමැති නිසා මම උදාහරණ දෙකක් විතරක් ගන්නම්.

විදුලි බිල සියයට 30කින් අඩු කරනවාය කිව්වා. IMF එකත් එක්ක එකඟ වනවා නම්, විදුලි බිල සියයට 30කින් අඩු කරන්නේ කොහොමද? පිරිවැයට අනුකූලව තමයි tariff එකක් කියලා ගහන්නේ. එහෙම නම් විදුලි බිල අඩු කරන ක්‍රමවේදයක් සඳහා ඉදිරිපත් වෙන්න ඕනෑ. නමුත්, ආණ්ඩුව මොකක්ද කළේ? ආණ්ඩුව කළේ විදුලි බිල වෙනස් කරන්න ශ්‍රී ලංකා විදුලිබල පනත සම්පූර්ණයෙන්ම reverse කරපු එක. Reverse කරලා යම්කිසි විධියකට පෞද්ගලික ආයතන එන්න තිබුණු අවස්ථාව වැහුවා. වහලා, සියයට සියයක් එය රජයේ ආයතනයක් බවට පරිවර්තනය කළා. එහෙම කරලා, Transmission Network එක stabilize කරන්න ඩොලර් බිලියන 5ක ආයෝජනයක් ගෙනැල්ලා පුනර්ජනනීය බලය ලාභයට grid එකට ලබා ගන්න උත්සාහ කරනවා. ඒක කරන්න බැහැ. එක්කෝ, එම ආයෝජන කරගෙන යන්න ආණ්ඩුව භාර ගන්න ඕනෑ. එහෙම නම් එය වෙන ක්‍රමයක් - වෙන model එකක් - අනුව කරන්න ඕනෑ. එහෙම නැත්නම් private sector එකට භාර දෙන්න ඕනෑ. ඒක තව ක්‍රමයක්, තව model එකක්. මෙතැන පටලැවිල්ලක් වෙලා තිබෙනවා. JVP එකයි, NPP එකයි ඉස්සරහට කරගෙන යන ආර්ථික model එක පිළිබඳව, ideology එක පිළිබඳව අවුල් සහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, වෙලාව නැති නිසා, I will give just one other classic case of confusion. Yesterday, the President said that the plan is to diversify exports, reduce barriers to global trade and restart all stalled FT agreements et cetera. His intention seems to be to remove barriers to trade, to liberalize the trade policy.

The National Tariff Policy approved in 2024 has been implemented as at 01st of January, 2025. Yesterday, the President announced that he will move from the existing four-band tariff structure of 0 per cent, 10 per cent, 15 per cent and 20 per cent plus para-tariffs to a four-band tariff structure of 0 per cent, 10 per cent, 20 per cent and 30 per cent, as planned. But, the complementary action to remove the trade distortionary para-tariffs, which was ongoing for Cess by one-third every year in three years and for PAL, by one-fifth every year in five years, has been postponed without a timeline, but, unfortunately, it was said that the restart would be during the post-2027 period.

ගරු කථානායකතුමනි, ඇත්තටම මෙතැනදී mixed signal එකක් තමයි අපට ඇවිල්ලා තිබෙන්නේ. එක වෙලාවක අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා සම්පූර්ණ නව ලිබරල් ප්‍රතිපත්තියක් හරහා රනිල් වික්‍රමසිංහගේ IMF වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යනවාය කියනවා. අනෙක් පැත්තෙන්, සමාජවාදය ගැන කථා කරන, JVP එකේ ideology එක විශ්වාස කරන පිරිස සමඟ විශාල ideological conflict එකකට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපට ගරු ජනාධිපතිතුමාගේ මේ අය වැයෙන් නැවතත් පේන්නේ පල්ලියේ father කෙනෙක් පන්සලේ බණක් කිව්වා වාගේ එකක් පමණයි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Nalinda Jayatissa. You have 20 minutes.

[පූ.භා. 11.27]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, අපේ ආණ්ඩුවේ දෙවන අය වැය කියන්නේ, ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සම්පූර්ණයෙන් අන්ත අසරණ කළ අය වැයක්. සාමාන්‍යයෙන් හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සලකන්නේ සමගි ජන බලවේගයේ ආර්ථික මහ පෙන්වන්නා හැටියට නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, හැබැයි මට හිතෙන්නේ, ඔබතුමාට විනාඩි 45ක් වෙන් කර තිබීම යම් කුමන්ත්‍රණයක් වාගේයි. පැයක් විතර වෙන් කරලා ඔබතුමාව

නැති කරලා දැම්මා. ආයේ මෙතැනින් එහාට ආර්ථිකය ගැන කථා කරන්න ඔබතුමාට අවස්ථාවක් නොදෙන තරමටම කවුරු හරි කුමන්ත්‍රණයක් කළා. ඉස්සෙල්ලා ඒක හොයලා බලන්න. ඇත්තටම අපටත් පුළුවන්කමක් තිබුණා නම්, අපිත් ඔබතුමාට කාලය දෙනවා. ඔබතුමා වාගේ කෙනෙක්වත් කරකවලා අතහරින්න පුළුවන් තරමට මේ අය වැය හැදුවා කියන්නේ මේ රට හොඳටම ඉදිරියට යනවා කියන එක තමයි. ඒ අසරණභාවය කොච්චරද කියනවා නම්, මහජන බැංකු ගොඩනැඟිල්ල ඉදිකිරීමේදී වංචාවක් වුණා කියලා ඒකේ අධ්‍යක්ෂවරයෙක් කාට හරි කියලා ඒ කියපු කෙනා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට ඒක කිව්වාම ඔබතුමා ඒක පාර්ලිමේන්තුවේ කියනවා. එහෙම නේ?

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පාර්ලිමේන්තු අත්දැකීම් බහුල, පරිණත මන්ත්‍රීවරයෙක්. ඒ නිසා, ගම්පහින් ආ අලුත් මන්ත්‍රීවරයා වාගේ වෙන්න එපා. මම දැක්කා, චැනල් එකකට ගිහින් කවුදෝ ඔය වාගේ තොරතුරක් දුන්නා, ඒ නිසා මීට පස්සේ අපට ඒ වාගේ බොරු කියන්න එපා, තොරතුරු දෙන්න එපා කියලා ප්‍රසිද්ධියේ ඒ මන්ත්‍රීවරයා කිව්වා. *[බාධා කිරීමක්]* ප්‍රසාද්. ඔබතුමාටත් එහෙම වෙන්න පුළුවන්.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම අහගෙන හිටියා, ඔබතුමා ඉස්සෙල්ලාම කථාව පටන් ගත්තේ, මේ ආණ්ඩුව විසින් ආර්ථිකය ස්ථාවර කළා කියලා ඒකට ගරුත්වයක් ලබා දීලා. හැබැයි ටිකක් දුර යනකොට ඒ ස්ථාවර කථා පැත්තක තබා අර ඇඟ ඇතුළේ හිටපු සතා මතු වෙන්න පටන් ගත්තා, මේ අය වැයට ආණ්ඩුවට credit එක දෙන්න බැහැ, අරකයි මේකයි කියලා. මම දන්නවා, වෙච්ච වැඩේ මොකක්ද කියලා. ඊයේ එළියට බැහැලා voice-cut එක දුන්නා නේ. ඒ voice-cut එකට ආ comments බැලුවාද? ඔබතුමා ඒවා කියවනවා නේ. ඒ commentsවල තනිකර තිබුණේ මේ අය වැය විවේචනය කිරීම ගැන ඔබතුමාට බැණලා, ඔබතුමාව විවේචනය කරලා. එහෙම නේද? ඒ වචන මම කියන්නේ නැහැ. ඒ comments ටික බලලා අද උදේ කථාව පටන් ගන්නකොට කියන්න හිතාගෙන ආවා, අපේ ආණ්ඩුව ආර්ථිකය ස්ථාවර කළාය කියන එක. එතැනින් පටන් ගත්තේ ඒකයි. හැබැයි, ටිකක් දුර යනකොට ඇතුළේ ඉන්න කෙනා එළියට ආවා.

ගරු කථානායකතුමනි, 2024 සැප්තැම්බර් 21වෙනි දා අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා භාර ගත්තේ මොන වාගේ රටක්ද? 2022 අප්‍රේල් 12වෙනි දා නිල වශයෙන් බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කළ රටක් එතුමා භාර ගත්තේ. පොහොර නැතිව ගොවියා අසරණ වෙලා හිටපු, රට සාගතයේ ඉම දක්වා තල්ලු කරපු, ඖෂධ නැතිව මිනිස්සු මැරුණු, තෙල් නැතිව මිනිස්සු පෝලිම්වල හිටපු, වාහන නතර වෙලා තිබුණු, විදුලිය කපපු, උසස් පෙළ ශිෂ්‍යයෝ පාඩම් කරන්න විදුලිය ලබා දෙන්න කියද්දි ඒකට ඇහුම්කන් නොදීපු ආණ්ඩුවක් තිබුණු රටක් තමයි අපි යම් කාලයකට පස්සේ -සැප්තැම්බර් 21වෙනි දා- භාර ගත්තේ. ඒ වන විට අපට ණය ගෙවා ගන්න බැරිව තිබුණේ. ණය ශ්‍රේණිගත කිරීමේ සියලු ආයතන අපිව පහළට දාලා තිබුණා. ලෝකය අපට වීසා දුන්නේ නැහැ. ක්‍රීඩකයෙක්ද, කලාකරුවෙක්ද, දේශපාලනඥයෙක්ද, ව්‍යාපාරිකයෙක්ද, කවුද කියලා නොසලකා ලෝකයේ රටවල් වීසා නොදෙන තැනට අපි ඇද වැටිලා තිබුණා. ඒ කියන්නේ ලෝකයට සැකයක් හදලා තිබුණා, මොනයම් හෝ හේතුවකට කෙනෙකු රට ගියා නම් ඔහු ඒ රටේදී පනීවි කියලා. අපේ පාස්පෝර්ට් එකට වලංගුභාවයක් නැති වෙලා තිබුණා. ඔබතුමා කිව්වා නේ, අපට credit එක දෙන්න බැහැ, ඒක කලින් කරලා තිබුණේ කියලා. කලින් කරලා තිබුණා නම් පළාත් පාලන මැතිවරණය පවත්වන්න තිබුණා නේ. 2022 පෙබරවාරිවල, මාර්තුවල පවත්වන්න තිබුණු පළාත් පාලන මැතිවරණය ඇයි තිබ්බේ නැත්තේ? අද ඔබතුමන්ලා ගිහිල්ලා සාකච්ඡා කරන නායකයා, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේදී, එළියේදී මොකක්ද කිව්වේ? මැතිවරණය පවත්වන්න සල්ලි නැහැ කිව්වා. සල්ලි නැති නිසා ප්‍රජාතන්ත්‍රවාදය පරදු තියන්නේ ලෝකයේ මොන රටේද? එහෙම කරන්න බැහැ.

එහෙම නම්, ලෝකයේ ඕනෑම රටකට, ඕනෑම නායකයෙකුට ඕනෑම වෙලාවක අවස්ථාවක් හම්බ වෙනවා, රටේ ආර්ථිකය අස්ථාවරයි, භාණ්ඩාගාරයේ මුදල් නැහැ, මැතිවරණ තියන්න බැහැ කියන්න. හැබැයි මතක තබා ගන්න, 2022දී පවත්වන්න තිබුණු මැතිවරණය, 2024දී අපි ඇවිල්ලා පවත්වනකම් තමුන්නාන්සේලා තිබ්බේ නැහැ කියලා. තමුන්නාන්සේලා අගය කරන නායකයා එදා කිව්ව දේ තමයි, මැතිවරණය තියන්න සල්ලි නැහැ කියන එක. එහෙම රටක් තමයි අපි භාර ගත්තේ. එවකට හිටපු ජනාධිපතිවරයා -පත් වෙච්ච කෙනා- සහ ආණ්ඩුව කියපු දෙයක් තමයි, මේ මාසය අමාරුයි, ඊළඟ මාසය තවත් අමාරුයි, ඊළඟ මාසය ඊටත් වඩා අමාරුයි කියන එක. එහෙම තමයි ගියේ. ඒ වාගේම ජනතාවට කිව්වා, -ජනාධිපතිතුමාත් ඊයේ ඒක කිව්වා- 2019දී පැවති ආර්ථිකයට එන්නවත් අඩු ගණනේ තව අවුරුදු 10ක් යයි කියලා. 2048 අවුරුද්ද කියන කැරට් අලය පෙන්වලා තිබුණා, 2048 වෙනකම් පටි තද කරගෙන ඉන්න කියලා. එහෙම තිබුණු රටක් තමයි අපි භාර ගත්තේ. ආර්ථිකය සුනු විසුනු කරලා, ආර්ථිකයේ පදනම දෙදරලා තිබුණේ. ඒ වාගේ රටක් තමයි ජනතාව විසින් අපට භාර දුන්නේ. මම හිතනවා, 2024 සැප්තැම්බර් මාසයේදී පැවති ජනාධිපතිවරණයේදී හා නොවැම්බර් මාසයේදී පැවති මහ මැතිවරණයේදී ජාතික ජන බලවේගයට බලය දෙන්න ජනතාව තීන්දු කරනකොට, අපි මේ රටේ ආර්ථිකය කවර මට්ටමකින් ස්ථාවර කරයිද කියන එක පිළිබඳව ජනතාව තදබල ලෙස -සියයට සියයක්ම- විශ්වාස කරන්නේ නැතිව ඇති කියලා. මොකද, ඒ ජනතාව දන්නේ ඔබතුමන්ලාගේ කෙරුවාව නේ. ඒ නිසා, "රයිට්, දීලා බලමු" කියලා බොහෝදෙනෙක් ඡන්දය දෙන්න ඇති. එහෙම හිතලා තමයි ජනතාව අපට ඡන්දය දෙන්න ඇත්තේ. හැබැයි මතක තබා ගන්න, ඒ වසර ඇතුළතදී ආර්ථිකය ස්ථාවර කරගන්න අපට පුළුවන්කම ලැබුණු බව.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටත් මේ අය වැය විවාදයේ පළමු කථාවේදීම පිළිගන්න සිද්ධ වන තරමටම අපි මේ රටේ ආර්ථිකය ස්ථාවර කළාය කියන්නේ, ඔබතුමාටත් ඒක නොකියා ඉන්න බැරි වුණා නේ. ඔබතුමා විතරක් නොවෙයි, ජාත්‍යන්තර මූල්‍ය ආයතනත්, සංවිධානත් අද පිළිගන්නවා, අපි මේ රටේ ආර්ථිකය ස්ථාවර කරලා තිබෙන්නේ කියලා. මේකට හේතු වුණේ මොකක්ද? ඒකයි වැදගත් වෙන්නේ. ආණ්ඩුවක් අවුරුද්දක් තිබුණා, ජනාධිපතිවරයෙක් හිටියා, අය වැය දෙකක් ඉදිරිපත් කළා, අපි අමාත්‍යාංශ කරගෙන ගියා කියන එක නිකම්ම -ඕපපාතිකව- වෙච්ච දෙයක් නොවෙයි. සමහර ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ අපේ රටේ ආර්ථික විශේෂඥයින් පවා පුරෝකථනය කළේ නැහැ, වසරක් ගත වන විට මෙවැනි ආකාරයේ ආර්ථික ස්ථාවරත්වයක් රටේ ඇති වේවි කියලා. ඔබතුමන්ලා දන්නවා, සමහර ආර්ථික වර්ධන නිර්ණායක, පුරෝකථන තිබුණේ ගොඩක් පහළින් කියලා. මා නම් කියනවා, ඒ ආයතන එහෙම කරන එක සාධාරණයි කියලා. මොකද, ඒ අයට තිබෙන්නේ පැරණි ආණ්ඩුවල අත්දැකීම්. නමුත්, අපි ඉලක්ක ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. ඒ, කොහොමද?

ගරු කථානායකතුමනි, මෙතැනදී ප්‍රධාන වශයෙන් බලපෑ ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා. එකක්, රාජ්‍ය මූල්‍ය විනය. දෙවැනි එක, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය. මෙන්න මේ දෙක තමයි මේ රටේ ආර්ථික ස්ථාවරත්වය සඳහා බලපෑ ප්‍රධාන සාධක දෙක. එහෙම නැතිව, අපේ ණය භාරගෙන ගෙවන්න කවුරුවත් හිටියේ නැහැ. එහෙම නැත්නම්, "මම රට ගොඩ ගන්නම්" කියලා කරන්න කෙනෙක් හිටියේත් නැහැ. ඒ වාගේම ප්‍රාතිහාර්ය පාන්න කෙනෙක් හිටියේත් නැහැ. අපි වසරක් තුළදී රාජ්‍ය මූල්‍ය

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

කළමනාකරණයත්, රාජ්‍ය මූල්‍ය විනයත් නිසි පරිදි පවත්වාගෙන යෑම විසින් තමයි මේ ප්‍රතිඵල අත්පත් කර දීලා තිබෙන්නේ. ඒ නිසා ඒකේ කිසිම ආකාරයක අහම්බයක් නැහැ. මූල්‍ය විනය සහ මූල්‍ය කළමනාකරණය පවත්වාගෙන යෑමට විශේෂයෙන්ම ජනාධිපතිවරයා මුදල් අමාත්‍යවරයා හැටියට, අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා හැටියට, රාජ්‍ය නායකයා හැටියට නිලධාරින් එකතු කරගෙන දරන ලද සාමූහික ප්‍රයත්නය සහ මහන්සිය තුළින් කරන ලද දෙයින් තමයි මේ ප්‍රතිඵලය අත්පත් කර දීලා තිබෙන්නේ. ඒක තමයි ප්‍රධාන හේතුව. ඒ නිසා තමුන්නාන්සේලා වෙන දේවල් ගැන කල්පනා කරලා වැඩක් නැහැ. ඒ කියන්නේ මෙහෙමයි. කොටස් වෙළඳ පොළේ ගේම් ගහලා කවුරුහරි කියනවා නම්, මෙන්න මේ මානසිකත්වය හදා ගත්තොත් රට දියුණු වෙයි කියලා, ඒවා මනෝරාජික වැඩ නේ. අවුරුද්දක් තිස්සේ අපි පියවරෙන් පියවර අනුගමනය කරන ලද සැලසුම්, ක්‍රියාමාර්ග, දැඩි තීන්දු විසින් තමයි මේ ආර්ථික ස්ථාවරත්වය නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒක තමයි මේකේ තිබෙන වැදගත්කම.

ගරු කථානායකතුමනි, බෙන්ජමින් ෆ්‍රෑන්ක්ලින් කියනවා, "Beware of little expenses. A small leak will sink a great ship" කියලා. ඒ කියන්නේ, ආර්ථික අර්බුදයක් පවතින කාලයකදී දරන කුඩා වියදමක් වුණත් සමහර විට ආර්ථිකයට දැවැන්ත ලෙස බලපාන්න පුළුවන්. Pakistan Institute of Development Economics එක කියා තිබෙනවා, "Fiscal Discipline is the Key to Reforms" යනුවෙන්.

රාජ්‍ය මූල්‍ය විනය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කියන එක අපේ රටේ නොතිබුණු දෙයක්. හිටපු ආණ්ඩු, හිටපු ජනාධිපතිවරුන් එම වගකීම භාරගෙන තිබුණේ නැහැ. නමුත් මම කලින් සඳහන් කළ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් හැටියට අපට පුරෝකථන අභිභවා යමින් මේ තත්ත්වයට එන්න පුළුවන්කම ලැබුණා. මොකක්ද, ප්‍රතිඵලය? මම හිතන විධියට අපි ඉතිහාසයේ පළමුවෙනි වතාවට වෙන්න ඇති, ඉලක්කගත රාජ්‍ය ආදායමට වඩා වැඩිපුර උත්පාදනය කිරීම, ආදායම එකතු කිරීම සිදු කර තිබෙන්නේ. ආදායම එකතු කරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, Sri Lanka Customs එක, සුරාබදු දෙපාර්තමේන්තුව ආදී සියලු ආයතන තමන්ගේ ඉලක්ක අභිභවා යන ලෙස රාජ්‍ය ආදායම එකතු කර දුන්නා. ඒ නිසා අපට පුළුවන්කම ලැබුණා, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 15.3ක් ලෙස දක්වා තිබෙන රාජ්‍ය ආදායම් මට්ටම ඉක්මවා යන්නට. ජනාධිපතිතුමා ඊයේ කියපු හැටියට සමහර විට එම ප්‍රමාණය සියයට 16ට ළඟා වෙන්න පුළුවන්. දැනට එය සියයට 15.3 ඉක්මවා ගිහින් තිබෙනවා.

අපි රාජ්‍ය වියදම කළමනාකරණය කළා. අපි ඉලක්ක කර තිබුණේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 13ක මට්ටමකට රාජ්‍ය වියදම සීමා කර තබා ගන්නයි. අපි ඒක කර තිබෙනවා. ඒ අනුව තමයි අපේ ප්‍රාථමික අතිරික්තය සියයට 2.3ට වඩා වැඩිපුර තබා ගන්න අපට පුළුවන්කම ලැබී තිබෙන්නේ. ඒක ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. එහෙම විනයක් නොතිබුණු, එහෙම මූල්‍ය කළමනාකරණයක් නොතිබුණු, එහෙම ආදර්ශයක්වත් නොතිබුණු රටක අපට පුළුවන්කම ලැබුණා, රාජ්‍ය ආදායම ඉලක්ක කළ ප්‍රමාණයට වඩා වැඩි කරන්නත්, රාජ්‍ය වියදම සීමාකරණය කරගන්නත්, අනෙක් පැත්තෙන් ඒකේ ප්‍රතිඵලයක් හැටියට ප්‍රාථමික අතිරික්තය සියයට 2.3ට වඩා අරගෙන යන්නත්. ඒ වාගේම අපේ ඩොලර් සංචිතය බිලියන 6ට වඩා වැඩි කරගෙන තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා, ඉතා ඉක්මනට ඩොලර් බිලියන 7 දක්වා ගමන් කරන්න. අපිට සතුටින් කියන්න පුළුවන්, ඩොලර් බිලියන 6ට වැඩි සංචිතයක් අපි පවත්වාගෙන යන බව.

අපේ රට ආර්ථික බංකොලොත්භාවයට පත් වී ඇති බව ප්‍රකාශයට පත් කළ 2022 කාලය වෙනකොට අපේ ණය ප්‍රමාණය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 114යි. ඒක 100ට වඩා අඩු කරගන්න තිබුණේ තව අවුරුදු ගණනක් ගිහිල්ලා. හැබැයි, 2026 වෙනකොට අපිට ඒක 100ට වඩා අඩු මට්ටමකට -සියයට 96කට, සියයට 97කට- ගෙනෙන්න පුළුවන්කමක් තිබෙනවා. 2030 වෙනකොට ඒක සියයට 90ට වඩා අඩු ප්‍රමාණයකට ගෙනෙන්න පුළුවන්කමක් තිබෙනවා. මේවා තමයි අපි ස්ථාවරත්වය හැදුවා කියා පෙන්වන්න පුළුවන් නිර්ණායක. ණය ශ්‍රේණිගත කිරීම්වලින් අපි ඉහළට යනවා. ආර්ථික වර්ධනය සියයට 4.6 - 4.8 මට්ටමේ පවත්වාගෙන යනවා. ජනාධිපතිතුමා ඊයේ කිව්වා වාගේම 2019දී තිබුණු ආර්ථික මට්ටමට අපි 2025 වසරේ අග වෙනකොට එනවා. මේ රටේ ආර්ථික ස්ථාවරත්වයක් නිර්මාණය කරනකොට, අපි රජයක් හැටියට ආර්ථිකය ස්ථාවර කරන ගමන්ම ජනතාවට සහන දීමේදී පැකිළුණේ නැහැ. ඔබතුමන්ලා අගය නොකළාට අපි ජනතාවට දිය හැකි සහන හැම තිස්සේම ලබා දෙමින් ඉන්නවා. මම දැක්කා, ඊයේ විපක්ෂ නායකතුමාත් එළියට ගිහිල්ලා voice-cut එකක් දෙනවා, මේක ජනතාවට සහන නොදීපු අය වැයක් ආදී අරවා මේවා කියමින්. මම හිතුවා නිදාගෙන හිටියේ අර්චුනා මන්ත්‍රීතුමා විතරයි කියලා. බලනකොට විපක්ෂ නායකතුමාත් ඊයේ නිදාගෙන ඉඳලා තිබෙන්නේ. එක්කෝ, හොරාට නිදාගෙන. මොකද, පසුගිය වසර තුළ අපි දෙන්න පුළුවන් සහන කොතරම් ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවාද? මම ඒ ගැන කෙටියෙන් කියන්නම්, මට තිබෙන වෙලාව අනුව.

රාජ්‍ය සේවකයන්ට දැනෙන විධියේ මූලික වැටුප් වැඩිවීමක් අපි ලබා දුන්නා. පසුගිය මාර්තු මාසයේ සම්මත කළ අය වැයෙන් යෝජනා කරලා, අප්‍රේල් මාසයේ එහි 1වැනි කොටස ලබා දුන්නා. 2වැනි කොටස ලබන ජනවාරි මාසයේ ලබා දෙනවා. ඊළඟ කොටස ඊළඟ ජනවාරියේ ලබා දෙනවා. රාජ්‍ය සේවකයෝ උද්ඝෝෂණය කළේ නැහැ, මූලික වැටුප් වැඩි කරන්න කියලා. හැබැයි, අපි දැනෙන මූලික වැටුප් වැඩිවීමක් ඔවුන්ට ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, සමහර තැන්වලට ගියාම සමහර රාජ්‍ය සේවකයෝ කියනවා, මූලික වැටුප ඔච්චර වැඩි කරන්න ඕනෑත් නැහැ කියලා. හැබැයි, අපි 2027දී ආර්ථිකයට රුපියල් බිලියන 330ක් අමතරව දරා ගන්න බලාගෙන මූලික වැටුප් වැඩිවීමක් ලබා දුන්නා. ඒ මූලික වැටුප මත පදනම් වෙලා අප්‍රේල් මාසයේ ඉඳලා අතිකාල, නිවාඩු දිරි දීමනා ඇතුළු සියලු දේවල් වැඩි වෙනවා. සියලු දීමනා වැඩි කර තිබෙන්නේ. මට මතකයි, ගියවර අපි අය වැය ඉදිරිපත් කරනකොට, තමුන්නාන්සේලාගේ වෘත්තීය සමිති යොදාගෙන ජනතාව භය කළ ආකාරය. මාර්තුවේ අතට ලැබුණු වැටුපට වඩා අඩුවෙන් තමයි අප්‍රේල් මාසයේ ලැබෙන්නේ කියා කිව්වා. එහෙම කිව්වේ නැද්ද? මට මතකයි, ඔය යූඑන්පී එකේ වෘත්තීය සමිති නායකයන්, හෙද සංගමයේ වෘත්තීය සමිති නායකයන් කෑට තියලා කිව්වා, මාර්තු පඩියට වඩා අඩුයි කියලා අප්‍රේල් මාසයේ පඩිය. හැබැයි, ජනතාව ගෙදර ගෙනියන salary එක වැඩි වෙලා තිබෙන්නේ. මේ ජනවාරියෙන් පසුව එය තව වැඩි වෙනවා. ඒවා ලබා දීලා තිබෙන්නේ.

ඊළඟට, විශ්‍රාම වැටුප්වල තිබෙන විෂමතා දැන් ඉවත් කරගෙන යනවා. 2020ට පෙර විශ්‍රාම ගිය අයට බරපතළ ප්‍රශ්නයක් තිබුණා. අපි 2025 මාර්තු මාසයේ සම්මත කළ අය වැයේදී ඒ අයගේ විශ්‍රාම වැටුප 2018 වැටුප් පරිමාණයට ගෙනාවා. මේ අය වැයෙන් අපි 2019 වැටුප් පරිමාණයට ගෙනැවිත් තිබෙනවා. ඊළඟ අය වැයෙන් අපි 2020 වැටුප් පරිමාණයට ගෙනෙනවා. ඒ අනුව, 2020ට කලින් විශ්‍රාම ගිය අයගේ ප්‍රශ්නය නිරාකරණය කරනවා.

2025 ජනවාරි 01වැනි දායින් පසුව විශ්‍රාම ගිය අයට හොඳ විශ්‍රාම වැටුපක් ලබා දීලා තිබෙනවා. අපි බලයට පත් වුණාට පසුව හැම විශ්‍රාමිකයාටම රුපියල් 3,000ක විශ්‍රාම වැටුප් වැඩි වීමක් ලබා දුන්නා. ඒ විධියට, විශ්‍රාම ගිය අයට දෙන්න පුළුවන් සහන අපි ලබා දීලා තිබෙනවා.

අපි අස්වැසුම දීමනාව වැඩි කළා. අස්වැසුමෙන් පවුල් ලක්ෂ 8ක් ඉවත් වෙන්න තිබ්බා. අපි අස්වැසුමෙන් ඉවත් වෙන්න තිබුණු පවුල් ටික තව කාලයක් තියා ගත්තා පමණක් නොවෙයි, අස්වැසුම දීමනාව වැඩි කරලාත් දුන්නා. රුපියල් 8,500ක් ලබා ගත් ප්‍රතිලාභියාට අපි රුපියල් 10,000ක් දෙනවා. රුපියල් 15,000ක් ලබා ගත් ප්‍රතිලාභියාට අපි රුපියල් 17,500ක් දෙනවා. අස්වැසුම නොලැබුණු අයගෙන් අයදුම්පත් කැඳවලා තවත් පවුල් ප්‍රමාණයකට ඒ ප්‍රතිලාභය ලබා දෙන්න ඇමතිතුමන්ලා කටයුතු කරනවා. නොවැම්බර්, දෙසැම්බර් වෙනකොට ඒ අයදුම්පත් කැඳවීම අවසන් කරනවා. ඒ ප්‍රතිලාභ ලැබිය යුතු පවුල්වලට අපි ඒක ලබා දෙනවා.

එපමණක් නොවෙයි. අපි මේ අය වැයෙන් ආබාධ සහිත අයට රුපියල් 10,000 බැගින් ලබා දෙනවා. එවැනි අය 140,000ක් පමණ ඉන්නවා. ආබාධ සහිත කෙනෙක් පෞද්ගලික අංශයේ රැකියාවක් කරනවා නම් ඒ අය දිරිගැන්වීමක් හැටියට රුපියල් 15,000ක උපරිමයකට යටත්ව ඒ අයගේ වැටුපෙන් සියයට 50ක් අවුරුදු දෙකක් තිස්සේ ගෙවන්න අපේ රජය භාර ගන්නවා. මේවා කවදාවත් කරපු වැඩ නොවෙයි.

ගරු කථානායකතුමනි, ඔටිසම් වාගේ ආබාධ තිබෙන දරුවන්ට දිවා සුරැකුම් මධ්‍යස්ථාන හදන්නත් අපි මුදල් වෙන් කර තිබෙනවා. ඒ සඳහා සමස්තයක් හැටියට ගත්තොත්, රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා. අපි මේ සඳහා කලින් රුපියල් මිලියන 547ක් වෙන් කරලා තිබුණා. දැන් මෙවර අලුතෙන් තවත් රුපියල් මිලියන 500ක් වෙන් කරලා, රුපියල් මිලියන 1,000කට වඩා වෙන් කරනවා, ඔටිසම් වැනි ආබාධ සහිත දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන හදන්නට. අපි පසුගිය වතාවේ වෙන් කරපු මුදලින් ඔටිසම් තිබෙන දරුවන්ට ප්‍රතිකාර මධ්‍යස්ථානයක් හදන්න දැන් LRH එක කටයුතු කරමින් සිටිනවා. ආබාධ සහිත අයට පොදු ස්ථාන වෙත ප්‍රවේශ වීමේ පහසුකම් සඳහාත්, සනීපාරක්ෂක පහසුකම් සැපයීමටත් තව රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා.

හර්ෂ මන්ත්‍රීතුමා කියනවා මට ඇහුණා, දීමනා වැඩි කළේ නැහැ කියලා. ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලා තමයි වකුගඩු රෝගීන් සඳහා වන දීමනාව රුපියල් 10,000ක් කළේ. ඒවා මතක් කර ගන්න. අපි වකුගඩු රෝගීන් සඳහා දෙන දීමනාව රුපියල් 10,000ක් කළා. වැඩිහිටි දීමනාව රුපියල් 5,000ක් කළේ අපේ ආණ්ඩුව බලයට ආවාට පසුවයි. පාසල් වාරය අවුරුද්ද මුල පටන් ගන්නකොට පාසල් දරුවන්ට ලිපි ද්‍රව්‍ය ගැනීමට එක වතාවක් රුපියල් 6,000ක් දුන්නා. දෙවැනි වතාවටත් අපි රුපියල් 6,000 ගණනේ ලබා දෙනවා. දරුවන් ලක්ෂ 16කට ඒ ප්‍රතිපාදනය හිමි වෙනවා. තවත් දරුවන් ලක්ෂ අටහමාරකට පමණ සපත්තු ගැනීම වෙනුවෙන් වූ වවුචර සඳහා රුපියල් 3,000ක් ලබා දෙමින් තිබෙනවා. අපි බලයට පත් වුණාට පසුව කරගෙන යන වැඩ මේ. ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය ස්ථාවර කරනකොට ජනතාවට ඒ සහන ලබා දෙනවා. විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත දරුවන්ට මසකට රුපියල් 5,000 ගණනේ ලබා දෙනවා. *[බාධා කිරීමක්]* මාසික මහපොළ දීමනාව අපි රුපියල් 10,000ක් කළා. මතක තබා ගන්න. අපේ ආණ්ඩුව එනකොට ඒ දීමනාව රුපියල් 5,000ට තිබුණේ. එම දීමනාව අපි දෙගුණයක් කළා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒගොල්ලන් අමුතු කෑම කැවාද? ඒගොල්ලන්ටත් දෙන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ දරුවන්ට එම දීමනා දෙන්න ඕනෑ. දෙන්න පුළුවන් හැම දෙයක්ම අපි ලබා දෙනවා. ශිෂ්‍යාධාර දීමනාව අපි රුපියල් 9,000ක් කරලා තිබෙනවා. විද්‍යාපීඨවල ඉගෙන ගන්නා අයට දෙන දීමනාව රුපියල් 2,500කින් වැඩි කළා. තැලසීමියා රෝගීන්ට රුපියල් 10,000ක් ලබා දෙනවා. වතු කම්කරු ජනතාවට දීමනා එක්ක මසකට රුපියල් 10,000ක වැටුප් වැඩි වීමක් ලබා දීලා තිබෙනවා. ඉතින්, මිදිද? අපි දීමනා දීලා තිබෙන්නේ. මේ ටික අගය කරන්න බැරි වුණා නේ. *[බාධා කිරීමක්]* පෞද්ගලික අංශයේ සේවකයන්ට රුපියල් 21,000ක අවම මූලික වැටුපක් තමයි තිබුණේ. අපි ඒක රුපියල් 27,000 දක්වා වැඩි කළා. ලබන ජනවාරි මාසයේ සිට ඒ මුදල රුපියල් 30,000 දක්වා වැඩි කරන්න අපි නීති සම්පාදනය කරලා තිබෙනවා.

ඊළඟ එක තමයි අඩු ආදායම්ලාභීන්ගේ නිවාස පිළිබඳ කාරණය. දැන් මේ ගරු සභාවේදී අපෙන් ඇහුවා, රුපියල් ලක්ෂ 10කින් නිවාස හදන්නේ කොහොමද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have another two minutes.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මම වැඩිපුර විනාඩි තුනක් ගන්නවා.

අපි මේ වනකොට අඩු ආදායම්ලාභීන්ට රුපියල් ලක්ෂ 10 ගණනේ නිවාස ආධාර ලබා දීලා තිබෙනවා. අපි නිවාස ආධාරය ලබා දීලා කළුතර දිස්ත්‍රික්කයේ විතරක් නිවාස 196ක් හදනවා. මේ අවුරුද්දේ රටේම නිවාස 3,700ක් හදනවා. මේ ගණන 4,200 දක්වා ගෙන යන්න පුළුවන්. දැන් අපෙන් අහනවා, රුපියල් ලක්ෂ 10ට නිවසක් හදන්නේ කොහොමද කියලා. සජිත් ප්‍රේමදාස මැතිතුමා නිවාස ඇමති කාලයේ රුපියල් ලක්ෂ 6ට නිවසක් හැදුවේ කොහොමද? රුපියල් ලක්ෂ 6 එකසැරේ දුන්නේත් නැහැ. රුපියල් ලක්ෂයක් දුන්නා, ගෙයක් හදා ගන්න කියලා. ඒක වර්ග අඩි 550ක නිවසක්. *[බාධා කිරීම්]* ඒ කාලයේ ආර්ථික කටයුතු රාජ්‍ය ඇමතිවරයා. අපි රුපියල් ලක්ෂ 10ක් දෙනවා. අපි ඒ ගෙවල් හදලා භාර දෙනවා, තව උදවු කරනවා. *[බාධා කිරීම්]* ලබන අවුරුද්දේ ගෙවල් 10,000ක් හදන්න තමයි මේ ගණන වෙන් කරලා තිබෙන්නේ. බෙදලා බලන්නකෝ. රුපියල් මිලියන 10,200ක් වෙන් කළේ ගෙවල් 10,000ක් හදන්න.

නාගරික වතු නිවාස සංවර්ධනයට අපි රුපියල් මිලියන 15,000ක් වෙන් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම කොළඹ අවට තිබෙන නාගරික වතු නිවාස සංවර්ධනයට තමයි රුපියල් මිලියන 15,000ක් වෙන් කළේ. පැරණි මහල් නිවාස අලුත්වැඩියා කිරීමට රුපියල් මිලියන 1,180ක් වෙන් කරලා තිබෙනවා. මලෙයගම් ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳීමට රුපියල් මිලියන 5,600කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා. නාය යෑම් අවදානමට ලක් වෙච්ච ජනතාව වෙනුවෙන් මේ අවුරුද්දේ නිවාස 1,200ක්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

හදන්න වෙන් කර තිබෙන මුදලට අමතරව අතිරේක රුපියල් මිලියන 2,000ක් වශයෙන් රුපියල් මිලියන 3,000ක් අපි වෙන් කරලා තිබෙනවා.

උතුරු, නැඟෙනහිර යුද්ධයෙන් අවතැන් වෙච්ච ජනතාවට ගෙවල් 2,500ක් හදලා දෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. රුඳවුම් නිවාසවල ඉන්න දරුවන් එතැනින් එළියට ආවාට පසුව ඒ අයට හොඳ ජීවිතයක් ලබා දෙන්න ඕනෑකම තිබෙනවා. ගිය සැරේ අය වැයෙනුත් අපි ලබා දුන්නා, දීමනාවක්. ඒ වතාවේ අපි කිව්වා, නිවාසයක් හදන්න රුපියල් ලක්ෂ 10ක් ලබා දෙන්නම් කියලා. මේ සැරේ එවැනි රුඳවුම් නිවාසවලින් එළියට ආපු අයට නිවසක් තනා ගන්න රුපියල් ලක්ෂ 20ක මුදලක් ලබා දෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීවරුනි, අපි ආර්ථිකය ස්ථාවර කරන ගමන් -මම මේ කිහිපයක් විතරයි කිව්වේ- ජනතාවට දිය හැකි සහන ලබා දෙමින් සිටිනවා.

අපේ ඊළඟ පියවර මොකක්ද? ඊළඟ පියවර තමයි සියයට 7ක අඛණ්ඩ ආර්ථික වර්ධනයක් කඩිනමින් අත්පත් කර ගන්න එක. ඒකට අපි වැඩ පිළිවෙළ හදලායි තිබෙන්නේ. ඒකට තමයි අපි සෘජු විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා කටයුතු කරමින් සිටින්නේ. ඔබතුමා කිව්වා, 2015දී, 2016දී මෙච්චර ආවා කියලා. මතක තියා ගන්න, අපි ආණ්ඩුව ගත්තේ 2022න් පසුව. ජනාධිපතිතුමා ඊයේ කිව්වේ, මිලියන 800 ගාණක් ආවා කියලා, පසුගිය මාස 8ට. අවුරුද්ද අවසන් වෙනකොට බලන්න, කොච්චර ඒවිද කියලා. ඒ සෘජු විදේශ ආයෝජන පහසුකම් සලසන්නට අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණය කරනවා; ඉඩම් පරිහරණ සැලසුම් වෙනස් කරලා දෙනවා; ඒ අයට ආයෝජනය කිරීම පහසු කරන යන්ත්‍රණය සකස් කරනවා. ඒකට මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ වාගේම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෝ ශක්තිමත් කරනවා. ඒ අයට විවිධ ණය යෝජනා ක්‍රම හරහා ණය ලබා දෙනවා. අපි යෝජනා කරලා තිබෙනවා, රුපියල් බිලියන 80ක විතර ණය යෝජනා ක්‍රම, ඔඩපණ ණය, ප්‍රතිමූල්‍ය ණය, ඇප රහිත ණය ආදී වශයෙන්. ඒවා හරහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෝ ශක්තිමත් කරනවා. මේ ඔක්කෝටම අපි ඩිජිටල්කරණය ගේනවා. එතකොට මේක තවත් පහසු වෙනවා. නවෝත්පාදනය, research and development සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒකට අවශ්‍ය කරන යන්ත්‍රණය ජනාධිපතිවරයා හරහා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේ ආදී වශයෙන් ගත්තොත්, ඊළඟ ආර්ථික වර්ධනය අත්පත් කර ගැනීම සඳහා වන වැඩ පිළිවෙළ මේක ඇතුළේ තිබෙනවා.

අපි භාණ්ඩාගාරයේ මුදල් නිකම් නාස්ති කරන්නේ නැහැ. ජනතාව බදු ගෙවන රුපියලේ සිට මේ එකතු කරන වක්‍ර සහ සෘජු බදු නිකරුණේ නාස්ති කරන්නේ නැහැ. නිකරුණේ කොහේ හරි ගොඩනැඟිලි අටවන්නේ නැහැ. උපායමාර්ගික යටිතල පහසුකම් සංවර්ධනය තමයි අපේ ඉලක්කය. රාජ්‍ය ආයෝජන සිදු කරන්නේ උපායමාර්ගික යටිතල පහසුකම් හැදීම වෙනුවෙන්. ඒ නිසා අපි අධිවේගී මාර්ගවලට ප්‍රමුඛතාව ලබා දීලා ඒ ඉතිරි වැඩකොටස් ටික කරනවා. ග්‍රාමීය මාර්ගවලට රුපියල් බිලියන 24ක් වෙන් කරලා තිබෙනවා. වරාය, ගුවන්තොටුපොළ සඳහා යටිතල පහසුකම් හදනවා. බලශක්තිය දියුණු කරනවා. හැබැයි, මම එක කරුණක් කියන්නම්. මේක ඔබතුමන්ලා කවුරුවත් කරපු නැති වැඩක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, you have one more minute.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි.

අපේ රටේ ශ්‍රම බලකායේ, විශේෂයෙන් අවුරුදු 29ත්, 70ත් අතර වැඩ කරන්න පුළුවන් මිනිස්සු වැඩිපුර ප්‍රමාණයක් මිය යනවා, බෝ නොවන රෝගවලින් සහ විශේෂයෙන්ම හෘදය වස්තුව ආශ්‍රිත රෝගාබාධවලින්. ලොකු ප්‍රමාණයක් ප්‍රතිකාර සඳහා පෝලිමේ ඉන්නවා. එළියේ ප්‍රතිකාර කරන්න ගියොත් මිල වැඩියි. ඒ නිසා අපි මොකක්ද කරලා තිබෙන්නේ? අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 200ක් වෙන් කළා, ඒ අය වෙනුවෙන්. අපේ ඉලක්කය තමයි, අවුරුදු තුනක් ඇතුළතදී රුපියල් බිලියන 12ක් වියදම් කරලා වෙනම cardiac hospital එකක්, heart hospital එකක්, හෘද රෝහලක් ඉදි කිරීම, කොළඹ ජාතික රෝහල ආශ්‍රිතව. මොකද, මේ ජනතාව අපි ඉන් මුදා ගන්න ඕනෑ. මම මේ එකක් ගැන විතරයි කිව්වේ. භාණ්ඩාගාරය ශක්තිමත් වෙනකොට අපි මේ ජනතාව ජීවත් කරවන්න, ඒ ජනතාවගේ ජීවිත තව සැපවත් කරන්න, ජනතාවගේ ජීවිත පහසු කරන්න හැම පැත්තකින්ම රාජ්‍ය ආයෝජන සිදු කරනවා. ඒ නිසා මේක ඇවිල්ලා, නිකම් මූල්‍ය ලේඛනයක් නොවෙයි. නිකම් ඉලක්කම් හරඹයක් නොවෙයි. මේ ඇවිල්ලා, මේ රටේ අනාගතය වෙනුවෙන් අපි ඉදිරිපත් කරපු ආර්ථික, දේශපාලන ලියවිල්ල.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන්, විපක්ෂයේ ඉන්න මේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මම එක දෙයක් ඉල්ලන්න කැමැතියි. අය වැය ගැන අපි මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරනවා, දින 26ක්. අපි අවසානයේ මේක සම්මත කරනවා. අය වැය යෝජනා ඔබතුමන්ලා අතට ලැබෙන්න ඇති. මුදල් අමාත්‍යාංශය හැම අමාත්‍යාංශයකටම අදාළ ව්‍යාපෘති වෙන වෙනම සටහන් කරලා ඔබතුමන්ලා අතට පත් කරලා තිබෙනවා. මේවා එනවා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට. අපි මේ සියල්ල මධ්‍යගත කරනවා, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලට. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට. ඔබතුමන්ලා ඒවායේ වාඩි වෙනවා. අපි කියන්නේ මෙච්චරයි. කරුණාකරලා ඔබතුමන්ලාත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට මැදිහත් වෙලා මේ ඉදිරිපත් කරන සැලස්ම, මේ ආයෝජන, මේ ව්‍යාපෘති නිසි පරිදි නිසි වේලාවට සිදු වෙනවාද කියන එක අධීක්ෂණය කරන්න. ඒ සම්බන්ධීකරණ කමිටු හරහා ඔබතුමන්ලාට මේ රට වෙනුවෙන් කරන්න පුළුවන් ලොකු සේවයක් ඒක. මොකද, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, අපි මේ මුදල් වෙන් කළාට අපට තිබෙන බරපතළ අභියෝගය තමයි නිසි කාලයට මේවායේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කරලා, නිසි වේලාවට අවසන් කරන එක. මේවා නිසි වේලාවට අවසන් කර ගත්තොත්, භාණ්ඩාගාරයට තිබෙන බර යම් ප්‍රමාණයක් අඩු වෙනවා. උදාහරණයක් හැටියට සෞඛ්‍ය අමාත්‍යාංශය 2014දී විතර පටන් ගත්ත ව්‍යාපෘති ඒ කාලයේ අවසන් කළා නම්, රුපියල් බිලියන 29යි යන්නේ. හැබැයි, අද ඒවා අවසන් කරන්න බිලියන 58ක් යනවා. ඒ නිසා මේ ව්‍යාපෘති අවසන් කර ගන්න ඕනෑ, නිසි වේලාවට. ඒක ආණ්ඩු පක්ෂයේ වගකීමක් විතරක් නොවෙයි.

අපි ඔක්කෝම මන්ත්‍රීවරු හැටියට ඒ සම්බන්ධීකරණ කමිටුවලට මැදිහත් වෙලා, ඒ නිලධාරීන් එක්ක එකතු වෙලා මේවා අවශ්‍ය වේගයෙන් කරගෙන යමු. ඒක තමයි අපිට ජනතාවට ලබා දෙන්න පුළුවන් සහනය. ඒ නිසා මම කියන්නේ විවේචනය කරන්න දෙයක් නැත්නම් නිකම් අර සිල්ලර විවේචන කරන්න එපා කියලායි. අපි පාර්ලිමේන්තුව වෙන තලයකට අරගෙන එමු. මේ අය වැයේ තිබෙන අඩුපාඩුකම් පෙන්වන්න. හැබැයි මේකේ නොකියපු දේවල් කියලා මේක කිව්වේ නැති නිසා විවේචනයක් තිබෙනවා, අරක කිව්වේ නැති නිසා විවේචනයක් තිබෙනවා කිව්වාට වැඩක් නැහැ.

ගරු කථානායකතුමනි, මම තව විනාඩි දෙකක් අරගෙන මේ කරුණත් කියලා කථාව අවසන් කරන්නම්. දැන් මේ වැදගත් ලියවිල්ලක් තිබෙන අතරේ, එළියට කියන්න හදනවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වාහන ගන්න රුපියල් මිලියන 12,500ක් වෙන් කර තිබෙනවා කියලා. එක් නාළිකාවක් මේ ප්‍රවෘත්තිය වැරදියට පළ කර තිබුණා. ඒකේ අයිතිකරු මෙතැන වාඩි වෙලා ඉන්නවා. ඒ නාළිකාව පළ කර තිබෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වාහන ගන්න රුපියල් මිලියන 12,500ක් වෙන් කළා කියලා. ගරු කථානායකතුමනි, ඒක පට්ටපල් බොරුවක්. මේ අය වැයේ තිබෙන්නේ මොකක්ද? මේ අය වැයේ 32.3 යටතේ තිබෙනවා, රජයේ ආයතනවලට අවශ්‍ය වාහන/පළාත් පාලන ආයතනවලට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ලබා දීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 12,500ක් වෙන් කරනවා කියලා. ඔබතුමන්ලාට බලය තිබෙන පළාත් පාලන ආයතනවලට -ප්‍රාදේශීය සභා, නගර සභා, මහනගර සභාවලට- බැකෝ, ට්‍රැක්ටර් වැනි යන්ත්‍ර සූත්‍ර මොනුත් ඕනෑ නැහැ කියලා ඔබතුමන්ලා කියනවා නම් කරුණාකරලා අපිට කියන්න. හැබැයි, පළාත් පාලන අමාත්‍යාංශයෙන් අපි ලේඛනයක් අරගෙන තිබෙනවා, ඒගොල්ලන්ගේ අවශ්‍යතාවත් බලලා.

ඒ වාගේම, රාජ්‍ය ආයතන ගත්තොත්, සෞඛ්‍ය අමාත්‍යාංශය නම් ඉල්ලලා තිබෙනවා අපිට අවශ්‍ය වාහන ප්‍රමාණය කොපමණද කියලා. මොකද, අපේ MOHලාට, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් වාහන නැහැ. සමහර වාහන අවුරුදු 10,12,15 පැරණියි. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට විතරක් අපි වාහන 271ක් ඉල්ලා තිබෙනවා. තැපැල් දෙපාර්තමේන්තුවට වාහන 21ක් ඉල්ලුවා. ආයුර්වේද දෙපාර්තමේන්තුවට වාහන 12ක් ඉල්ලුවා. ජනමාධ්‍ය අමාත්‍යාංශයට වාහන 2ක් ඉල්ලුවා. Government Press එකට වාහන 2ක් ඉල්ලුවා. මේ ආදී වශයෙන් සාමාන්‍යයෙන් වාහන 2,500ක්, 2,700ක් විතර දැන් රාජ්‍ය සේවයට, පළාත් පාලන ආයතනවලට වුවමනා කරනවා. ඒ සියල්ල සඳහා තමයි මේ රුපියල් මිලියන 12,500ක මුදල ලීසිං වාරික සඳහා වෙන් කරලා තිබෙන්නේ. මේක පටලවාගෙන කියනවා, මේ සමස්ත අය වැයේම මෙන්න මන්ත්‍රීවරුන්ට-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේකේ වෙන වෙනම තිබෙනවා, පළාත් පාලන-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඔබතුමා මේක කියවන්නකෝ. මේකේ ඔක්කෝම දාලා තිබෙනවා. *[බාධා කිරීම්]* ඒකත් තිබෙනවා. තවත් දෙනවා. *[බාධා කිරීම්]* තවත් දෙනවා. මොකද දන්නවාද? වැඩ කරගන්න. අපි මේ සංවර්ධන ව්‍යාපෘති බිමට අරගෙන යනකොට, රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන හරහායි ඒ කටයුතු සිද්ධ කරන්නේ. ඒකෙදි රාජ්‍ය සේවකයා තෘප්තිමත් කරලා තියාගන්න ඕනෑ. වැටුප් දීමනා වැඩි කළේ ඒකයි. *[බාධා කිරීම්]* බඳවාගැනීම් කරන්නට ඕනෑ, වාහන ලබා දෙන්නට ඕනෑ, ඩිජිටල්කරණය කරන්නට ඕනෑ, පුහුණුවීම් දෙන්නට ඕනෑ. ඒ සියල්ලට අපි මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා මේක වැරදියට අර්ථකථනය කරන්න එපා. මොකද, කොහොමත් මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න 159දෙනාට වාහන ඕනෑ නැහැ. ජනාධිපතිතුමා කිව්වා වාගේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු වාහන පාවිච්චි කරමින් ඉන්නවා. ඒ අයට මේ වාහන අවශ්‍ය නැහැ. අවශ්‍ය අයට විතරයි වාහන දෙන්නේ. ඔබතුමන්ලාටත් අවශ්‍ය නම් විතරක් කියන්න. *[බාධා කිරීම්]* ඒ නිසා මේක පටලවාගන්න එපා. මේක නිකම් වැරදියට අර්ථකථනය කරන්න එපා. *[බාධා කිරීම්]* දැවැන්ත සංවර්ධන අය වැයක් මෙවර ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබතුමන්ලාගේ සාධාරණ විවේචන ඉදිරිපත් කරන්න, ධනාත්මක විවේචන ඉදිරිපත් කරන්න, රට මෙතැනින් ඉහළට ඔසවා තබාගන්න ආර්ථික ස්ථාවරත්වය තව ශක්තිමත් කරලා ආර්ථික වශයෙන් ලෝකයේ වැදගත්ම, ශක්තිමත්ම රාජ්‍යයක් බවට පත් කරගන්න ඔබතුමන්ලාගේ සහායත් ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මම නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Chathuranga Abeysinghe. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.55]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර අය ගොඩක් ඉගෙන ගත්තාම, පොත්පත් ගොඩක් කියවලා තිබෙනකොට සමහර කරුණු දැක්කාම එකපාරට excite වෙනවා; excite වෙලා confuse වෙනවා. ඒ විධියට confuse වෙලා, දැන් මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය පළමුවැනි අවුරුද්දේ අය වැය ප්‍රකාශය කියලා මාරු කරගත්තා. අපි ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 5කට. අපේ දැක්ම අවුරුදු 20කට එහා. මේ රට පරිවර්තනය කරන්න අපිට අවශ්‍යතාවක් තිබෙනවා. මේගොල්ලෝ මේ නව ලිබරල් ආර්ථිකය අරගෙන ගිහිල්ලා බංකොලොත් කරපු තැන ඉඳලා මේක සාධනීය සංවර්ධන ආර්ථිකයකට ගෙනියන වැඩ පිළිවෙළක් ඒකට අවශ්‍යයි. එතකොට වසරින් වසරට අපි ඉදිරිපත් කරන්නේ ඒ වසරේ තිබෙන අය වැය සීමා අනුව අපට කළ හැකි දේවල්. ඒ වාගේම තමයි ජනතාවට දීපු පොරොන්දු වසර 5ක් ඇතුළත මේ අය වැය හරහා ඉෂ්ට කරන්න තමයි මේ ආණ්ඩුව මැදිහත් වෙලා ඉන්නේ.

Hon. Deputy Speaker, it is with great pride and humble happiness that I use this opportunity to express a few words about the Second Budget of the new Government.

Sir, we have been able to bring financial stability to this nation, which is the most critical foundation for growth. For the first time in history, maybe, the first time for the last two decades, Sri Lanka has achieved all its

[ගරු චතුරංග අබේසිංහ මහතා]

financial and macroeconomic targets and it is not denied by the Opposition either. My good Friends in the Opposition had never been able to achieve that. So, that is the pain they are undergoing because they had never been able to achieve the fiscal targets of any given Budget, even from 2015.

Sir, as the Hon. (Dr.) Nalinda Jayatissa said, this has not been achieved through somebody's superpower or by one single person; this has been achieved through sheer discipline, focus and determination. When we have a budget, even in a corporate, we have to stick to that. As a team, we need to be disciplined enough to adhere to the targets of the Ministry of Finance and do your work. So, that discipline was what Sri Lanka was lacking and which put Sri Lanka into a crisis. So, even the experts were not able to achieve those targets without that discipline in this country. Therefore, we are happy that we have been able to achieve it now.

With the Budget we have presented, we are now moving from stability to growth. We are expecting a growth of 7 per cent of GDP or more and also to achieve debt sustainability by 2030. There is an absolutely well-thought-through plan for stability. Now, we are moving towards predictability. That is what investors are looking for. The economy has to be predictable and the variables have to be stable. Policy directions, structures and consistency are what we are going to bring about through this Budget. That is the difference between the Budgets that we had seen thus far and the Budget that was presented yesterday.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ පළමු වතාවට සියලු ආර්ථික නිර්ණායක, එහෙම නැත්නම් ආර්ථික අවශ්‍යතා ළඟා කර ගන්න පුළුවන් වෙච්ච එකම අවුරුද්ද 2025 අවුරුද්දයි. ඒක නිකම් ආපු එකක් නොවෙයි. ඒක ආවේ මේ ආර්ථිකය දක්ෂ පිරිසක් මෙහෙයවද්දී, කළමනාකරණය කරද්දී ඒ සම්බන්ධයෙන් ඇති වෙච්ච විනය නිසායි. මම හිතනවා ඒක ජාතික ජන බලවේගය පක්ෂයේ විනයෙන්ම ආපු දෙයක් කියලා. මේ විනය මේ විපක්ෂයේ ඉන්න කිසිම කෙනෙකුට එදා තිබුණේ නැහැ; කොච්චර ආර්ථික ඔස්තාර්වරුන් හිටියත් මීට කලින් මේ තත්ත්වයන් achieve කර ගන්න පුළුවන් වුණේත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිෂ්පාදන ආර්ථිකයක් ගැන කියලා ආපු අපි මේ ආර්ථික ස්ථායීකරණයේ ඉඳලා නිෂ්පාදන ආර්ථිකය දක්වා වන ගමන තමයි දැන් මේ යමින් ඉන්නේ. අපි මේ ආර්ථිකය සියයට 7ක වර්ධන වේගයකින් දියුණු කරන බව කියද්දී, සියයට 3.5ක ආර්ථික වර්ධන වේගයකට IMF එකට එකඟ වෙච්ච ඔස්තාර්ලා සියයට 7 මදි කියලා දැන් කියනවා. සියයට 9ක් ඕනෑ ලු. සියයට 9ත් අරගෙන දෙන්නම්, පොඩ්ඩක් ඉන්න. ඒ වාගේම, මේ ආර්ථික විචල්‍යතාව පුරෝකථනය කර ගන්න බැරිව තමයි විදේශ ආයෝජකයන් සහ දේශීය ආයෝජකයන් ආයෝජනය කළේ නැත්තේ. අපි මේ ස්ථාවරභාවය ගෙනැල්ලා විචල්‍යතාව අයින් කරලා පුරෝකථනය කරන්න පුළුවන් අය වැයක් ගෙනැවිත් තිබෙනවා. මේ අය වැය තමයි පසුගිය ඉතිහාසයේ දැවැන්ත බදු සංශෝධනයක් නැතිව ඉදිරිපත් වෙච්ච පළමු අය වැය. ඒ වාගේම ණය ස්ථාවරකරණය කරන අපි 2030 වෙනකොට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 87කට, සියයට 90කට ගෙනෙන්න තමයි සැලසුම් කරලා තිබෙන්නේ. මෙය ඉතා සාධනීය, දුර දක්නා සැලැස්මක් තුළ යන අය වැයක්. නමුත්, 2025දී මොකුත් වෙලා නැහැ කියලා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කිව්වා. 2025දී මොකුත්ම වෙලා නැහැ, අපි මොකුත්ම කරලා නැහැ, රනිල් වික්‍රමසිංහ ගෙනැල්ලා දීපු එක අපි ඔහේ අරගෙන ගියා කියලා ඒ අය කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන්න කැමැතියි, අපනයන නිෂ්පාදන විතරක් සියයට 7කින් වර්ධනය වෙලා තිබෙන බව. කාර්මික නිෂ්පාදන සියයට 9කින් වර්ධනය වෙලා තිබෙනවා. පෞද්ගලික අංශයේ ණය ගැනීම් සියයට 22කින් වර්ධනය වෙලා තිබෙනවා. පෞද්ගලික අංශයේ ණය ගැනීම් කියන්නේ ඒගොල්ලන්ට කන්න බොන්න ගත්තු ඒවා නොවෙයි. ආයෝජන සඳහා තමයි එම ණය ගන්නේ. මීට කලින් මෙතුමන්ලා කළමනාකරණය කරපු ආණ්ඩු මුදල් වෙළෙඳ පොළේ සියලු මුදල් ටික ආණ්ඩුවේ ණය විධියට ගත්තා. නමුත් දැන් ආණ්ඩුව මුදල් වෙළෙඳ පොළට මුදල් දානවා, ණය ගෙවීමෙන්. දැන් ණය ගන්නේ නැහැ.

අපේ සංචාරක ක්ෂේත්‍රය විශාල වශයෙන්ම පුළුල් වුණා; IT ක්ෂේත්‍රය සියයට 15කින් වර්ධනය වුණා. FDIs ඩොලර් මිලියන 800 ගණනයි ඇවිල්ලා තිබෙන්නේ කියලා විපක්ෂය කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජකයෝ මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. මීට ඉහත අවුරුදුවලත් ආයෝජකයන්ට කථා කළා නේ. නමුත්, විශ්වාසය නැත්නම් කවුරුවත් ආයෝජන ගෙනෙන්නේ නැහැ නේ. ඔබතුමන්ලා එදා කිව්වේ මේ ආණ්ඩුව ආවාම ආයෝජකයන්ගේ විශ්වාසය නැති වෙනවා කියලා. BoI එකට විතරයි මිලියන 829. Colombo Port City එකට එකඟ වෙච්ච ආයෝජන ප්‍රමාණය බිලියන 1.2යි. ඒ වාගේම, අපි Sinopec agreement එක sign කරන්න ඉතාම කිට්ටුයි. එහිදී සාක්ෂාත් කරපු ප්‍රමාණය බිලියන 3.7යි. ලංකා ඉතිහාසයේ වැඩිම විදේශ ආයෝජන ප්‍රමාණයක් සාක්ෂාත් කර ගත්තු වර්ෂය විධියට 2025 සහතික වෙනවා. ඒ අනුව, බිලියන 5.9කට යන්න පුළුවන් හැකියාව අපට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම කිව යුතුයි, මහ බැංකුව විසින් ඉදිරිපත් කරන Purchasing Managers' Index එක ගැන. ඒකෙන් කියැවෙන්නේ ආර්ථිකයේ ශක්‍යතාවයි. Construction industry එකේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශකාංක 67කට ඇවිල්ලා තිබෙනවා. Manufacturing PMI එක 55 කියන දර්ශකාංකයට ඇවිල්ලා තිබෙනවා. මේකෙන් කියැවෙන්නේ 2025දී මේ ආර්ථිකය කොච්චර සක්‍රියව පවත්වාගෙන ගියාද කියලායි. ඒ නිසා බොරු කියලා වැඩක් නැහැ, ආර්ථිකයට මොකුත් වුණේ නැහැ කියලා. ඔබතුමන්ලා කිව්වා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අපි මොකුත් කළේ නැහැ කියලා. ඇත්තටම මේ ආණ්ඩුව ආවාට පස්සේ විවිධ ක්‍රියාමාර්ග ගත්තා මුදල් අමාත්‍යාංශය මැදිහත් වෙලා ණය අර්බුදයට ලක් වෙලා ඉන්න කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහනයක් සලසන්න. අපි ඔවුන්ට ආරාධනා කළා බැංකුත් එක්ක negotiate කරන්න අපත් එක්ක යමු කියලා. මම මේ සඳහා එක උදාහරණයක් කියන්නම්. දිස්ත්‍රික් ඒකාබද්ධ ව්‍යවසායක සංවිධානය කර්මාන්ත අමාත්‍යාංශයට ආවේ මාර්තු මාසයේ. ඔවුන්ගෙන් ව්‍යවසායකයෝ 1,000ක් විතර ඉන්නවා. ඒ ව්‍යවසායකයෝ 300ක් ණය අර්බුදයට ලක් වෙලා ඉන්නවා. ඒ ව්‍යවසායකයන් 300ත් සමඟම අමාත්‍යාංශය -අපි- සාකච්ඡා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියන්න සතුටුයි ඒකෙන් ව්‍යවසායකයන් 200දෙනෙකුට ණය ප්‍රතිව්‍යුහගතකරණ විසඳුම් ලබා දෙන්න මේ වෙනකොට බැංකුත් එක්ක එකඟ වෙලා තිබෙනවා. සමහර අයට සියයට 50ත්, සියයට 65ත් අතර පොලී කපා හැරලා ප්‍රතිව්‍යුහගතකරණය කරගෙන තිබෙනවා. ඒ වාගේ

සද්භාවයෙන් ආපු, නැවත ව්‍යාපාරය ඉදිරියට අරගෙන යන්න සුදුසු ව්‍යාපාරවලට අපි දැවැන්ත මැදිහත්වීමක් කරලා තිබෙනවා. ඔවුන්ට ලබා දීපු ණය ප්‍රමාණය ලබා දෙන්න තවදුරටත් ප්‍රමාදයක් තිබෙනවා. ඒ සඳහාත් අපි ඉදිරියේදී මැදිහත් වෙනවා. මේ කථාව කියාගෙන යද්දී මට තේරුණේ විපක්ෂයේ අයට නව ලිබරල් ද, නව ලිබරල් නොවෙයි ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ද මොකක්ද කියලා confuse වෙලා තිබෙන්නේ. මෙතුමන්ලා මේ ආර්ථිකයට කළ යුතු දේවල් -දශක ගණනාවක් තිස්සේ කර ගන්න බැරි වෙච්ච දේවල්- අපි කරන කොට දැන් පොඩ්ඩක් වේදනාව එනවා ඇති.

ඔබතුමන්ලාට බැරි වුණා අපේ ආර්ථිකයේ බදු ටික එකතු කරගන්න. ඒක තමයි මූලිකම බැරි බැරියාව. තිරු බදු ප්‍රතිපත්තිය ගැන බයිලා කිව්වාට තිරු බදු ප්‍රතිපත්තිය ගේන්න බැරි වුණා. Land bank එකක් හදාගන්න බැරි වුණා. PPP පනත් කෙටුම්පතක් ගේන්න බැරි වුණා. ආයෝජන ආරක්ෂණ පනත් කෙටුම්පත ගේන්න බැරි වුණා. Single Window එක හදන්න බැරි වුණා. SOE Management Bill එක ගේන්න බැරි වුණා. SMEsවලට බිලියන 80ක ණය යෝජනා අපි ගෙනැත් තිබෙනවා. මේ විපක්ෂය බලයේ ඉන්නකොට ඒවා කරගන්න බැරි වුණා. SME sector එකට venture capital fund එක ගේන්න ඔබතුමන්ලාට බැරි වුණා. ඒක මේ අයවැයෙන් අනුමත කරලා තිබෙනවා. IT ක්ෂේත්‍රයට startup ecosystem එකක් ගේන්න ඔබතුමන්ලාට බැරි වුණා. ඒක මේ අයවැයෙන් යෝජනා වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලා බයිලා කිව්වාට කරගන්න හැකියාවක් තිබුණේ නැහැ. ඒ අයට කරගන්න හැකියාවක් නොතිබුණු නිසා තමයි, අපි ඒවා කරනකොට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය අය වැය ප්‍රකාශය කියලා හිතාගෙන ඒ එකින් එක සංසන්දනය කරමින් සිල්ලර සාකච්ඡාවකට ගිහින් තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, මේ අය වැය තුළ සංචාරක ක්ෂේත්‍රයට විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. එය දැවැන්ත ආර්ථික විභවයක්.

ඒ වාගේම තමයි බලශක්ති ක්ෂේත්‍රය. බොරු බේගල් කිය කිය ගියා, අපි පුනර්ජනනීය බලශක්තියට විරුද්ධයි කියලා. පුනර්ජනනීය බලශක්තිය නිසියාකාරයෙන් ගේන්න තමයි මේ ආණ්ඩුව මැදිහත් වුණේ. ඔබතුමන්ලා අදානි සමාගමට දෙන්න ගියේ විදුලි ඒකකයක් ඇමෙරිකානු ඩොලර් ශත 8.26ට. Press conferences තියලා ඔස්තාර්ලා කිව්වා, "බුදු අම්මෝ, මිලියන 400ක් නැති වුණා, ආයෙත් නම් ආයෝජකයන් පැත්ත පළාතේ එන්නේ නැහැ" කියලා. නමුත් අපි කියන්න කැමතියි, මේ වෙනකොට ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය සඳහා ආයෝජකයන් BoI එකේ පෝලිම් ගැහිලා ඉන්න බව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathuranga Abeysinghe, you have two more minutes.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Sir, could I have two more minutes?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
Sir, I can give two minutes from my time.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Environmental feasibility study එකක් කරලා, අවශ්‍ය තැන් නිශ්චය කරලා ආයෝජකයන්ට ලබා දුන්නාම තමයි ආයෝජකයන්ට තමන්ගේ ආයෝජන කටයුතු වේගයෙන් කරන්න පුළුවන් වෙන්නේ. Green energyවලට යන්න ඔබතුමන්ලාට අවුරුදු 10ක් විතර තිබුණා. හැබැයි, කවදාවත් ඔබතුමන්ලාට එහෙම ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ඩිජිටල්කරණය පළමු වතාවට ලංකාවේ ශක්තිමත්ව ආරම්භ කළේ 2025 වර්ෂයේ. ඒක ඉස්සරහට යනවා. ඒක චක්‍රාකාරයෙන් කර්මාන්තවලටත්, ආර්ථිකයටත් දැඩි දායකත්වයක් දෙනවා.

ඊළඟට අපි බලමු, කෘෂිකාර්මික අගය දාමය ගැන. ලූනු ගෙඩියක්, අල ගෙඩියක් ගැන දැන් බයිලා කථා කළාට, ඔබතුමන්ලාට ඒ අගය දාමය හදාගන්න බැරි වුණා නේ. ඔබතුමන්ලාට බැරි වුණා නේ ගොවි සමුපකාර ටික හදාගන්න. ඔබතුමන්ලාට හදාගන්න බැරි වුණා නේ, බෙදා හැරීමේ ජාලය. ඒවා තමයි අපි මේ අයවැයෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තොත්, මම එදා කිව්වා, Logistics Performance Index එකේ අපි ඉන්නේ 73වැනි ස්ථානයේ කියලා. ඔබතුමන්ලාගේ 76 වසරක සාපය හින්දා තමයි අපි එතැන ඉන්නේ. හැබැයි, port logistics centre එක, airport එක, Sri Lanka Customs එක දියුණු කිරීම, public transport හැදීම යන මේ සියල්ලම මේ අයවැයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ, දශක ගණනක් නොවිසඳුණු ගැටලු. අත්හැරලා තිබුණු කොටස්. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයා. අපට ශක්තිමත් රාජ්‍ය සේවයක් අවශ්‍ය වෙනවා පරිපාලන ක්ෂේත්‍රය වෙනුවෙන්. ඒ වාගේම ආබාධ සහිත පුද්ගලයන්, පරිසරයේ තිබෙන ගැටලු, අලි-මිනිස් ගැටුම, නිවාස ගැටලුව සහ ප්‍රාදේශීය මට්ටමින් තිබෙන කුණු ගැටලුව යන මේ එකක් ගැනවත් කථා කළේ නැහැ නේ ඔය ඔස්තාර්ලා. මෙච්චර කාලයක් අතහැරලා තිබුණු ක්ෂේත්‍රවලට තමයි අපි මුදල් වෙන් කර තිබෙන්නේ. ඒවා තමයි මේ වෙලාවේ ජනතාවගේ ඉල්ලීම්.

අපි මේ කොහේටද යන්නේ? අපේ strategy එක ගැන ඔබතුමන්ලා අහනවා නේ. නව ලිබරල්, නව ලිබරල් කියලා පටලවන්න හදනවා නේ. අපේ දැක්ම ගැන කිව්වොත්, ඉතාම පැහැදිලියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි යන්නේ සම්පත් ඵලදායිතාව වැඩි කරන්න. අපේ රටේ ඉඩම්වල, අපේ රටේ ගොවි බිම්වල, අපේ රටේ කර්මාන්තවල ඵලදායිතාව වැඩි කරන්න දැවැන්ත ආයෝජනයක් අපි කරගෙන යනවා. එතුමන්ලා අවසානයේ ඉතිරි කළේ සියයට 50ක ඵලදායිතාව තිබෙන රටක්. ඒ වාගේම කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හදන්නේ නැතිව දියුණු වෙච්ච රටක් කොහේවත් නැහැ. මොකද, Ease of Doing Business Index එකේ ඔබතුමන්ලා අපව තිබ්බේ 99වෙනි ස්ථානයේ. ඒක පහළට ගේන්න අපි වැඩ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමන්ලාට නිෂ්පාදන වෙළඳපොළ විවිධාංගීකරණය කරලා අපනයනය පුළුල් කරගන්න බැරි වුණා නේ. මෙච්චර කාලයක් හිටියාට අපේ රටේ ආර්ථිකයට

[ගරු චතුරංග අබේසිංහ මහතා]

access එක හදාගන්න පුළුවන් වුණාද, භාණ්ඩ විවිධාංගීකරණය කරගන්න පුළුවන් වුණාද? ඔයගොල්ලන්ට මොකුත් කරගන්න බැරි වුණා නේ. Economic Complexity Index එකේ අපි ඉන්නේ පහළ ස්ථානයක. ඔයගොල්ලන් කරගත්තේ නැති දේවල් දැන් අපි කරන්නයි යන්නේ.

ඒ වාගේම FDIs ගැනත් කථා කළා. FDIs එන්නේ නැති ප්‍රධාන හේතුව තමයි ආර්ථික ස්ථායිතාවක් නැතිකම, policy inconsistency එක, land bank එකක් නැතිකම සහ protection එකක් නැතිකම. මේ තත්ත්වය නැති කරන එක තමයි අපේ strategy එක. අපි ඉතාම හොඳින් දන්නවා, මේ දේවල් කළාට පසුව අපේ ආර්ථිකයේ වර්ධන වේගය අපට ලබා ගන්න පුළුවන් කියලා.

Export diversification එකක්, startup ecosystem එකක්, SOE restructuring කරලා දුන්නේ නැහැ නේ. ඒ නිසා අපි කරනවා. කලබල වෙන්න එපා. අපි SOEs ටික පිළිවෙළට හදලා, රජයට පංගුවත් අරගෙන, ඒවායේ සමාජ කාර්යභාරයත් ඉෂ්ට කරගෙන අපි ඒකේ managementවලට Act එකක් ගෙනැල්ලා ඒ ටික කරනවා. ඒවා ඔබතුමන්ලාට කරගන්න බැරි වෙච්ච දේවල්. ඊට පස්සේ ප්‍රාග්ධනයට හිමිකාරීත්වය, අයිතිය නැති හින්දා තමයි අපි බැංකු ක්ෂේත්‍රයත් එක්ක access to capital හදන්න යන්නේ. ඒ වාගේම, advanced capital allowance එකක් අපි දීලා තිබෙනවා. දැන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට තමන්ගේ ප්‍රාග්ධනය යොදවනකොට මාසයකට ඩොලර් මිලියන 3ක තිබුණු threshold එක ඩොලර් 250,000 දක්වා ගෙනැල්ලා අපට පුළුවන් වෙලා තිබෙනවා ඒක දෙන්න. ඒ වාගේම තමයි, කර්මාන්තකරණයට, රටට අවශ්‍ය skill එක හදාගන්න ඔබතුමන්ලාට බැරි වුණා. ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කරන්නේත් වර්තමාන ආණ්ඩුව. ඒකත් මේ Budget එකෙන් ඉස්සරහට යනවා. ඒ වාගේම තමයි, tax base එක පුළුල් කර ගත්තේ නැහැ. 1990 ඉඳලාම හරියට ලංකාවේ බදු එකතු කර ගත්තේ නැහැ. ආර්ථිකය අවකළමනාකරණය කරපු ඔස්තාර්ලා නිසා තමයි අපට ISBsවලට 2015දී යන්න වුණේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Chathuranga Abeysinghe, you have exhausted your time.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නව ලිබරල් කියන වචනය පැහැදිලි කර ගන්න. ඒකෙන් කියන්නේ, රජය වෙළෙඳ පොළෙන් ඉවත් වෙන ආර්ථික මොඩලය. ඒක තමයි ඔබතුමන්ලා කරගෙන ගියේ. අපි ඒක නැවැත්වුවා නේ. අපි ඒක නවත්වලා, රජය අත්‍යවශ්‍ය තැන්වල විශාල ශක්තිමත් පංගුවක් කරනවා. වාණිජ ව්‍යාපාර ටික අපි holding company එකට දානවා. Strategic ව්‍යාපාර ටික ආණ්ඩුව කරනවා. ඒ වාගේම cost of corruption, ඔබතුමන්ලාගේ corruption නිසා ආර්ථිකයට ඇති වෙච්ච හානියත් මනින්න මේ වෙලාවේ research ආයතනවලට සිද්ධ වෙනවා. අවසානයේ සංවර්ධිත රටක් වාගේම level playing field එකක් හදන්න අපි මේ වෙලාවේ උත්සාහ කරනවා. හැමෝටම ආර්ථිකයට දායක වෙන්න සාධාරණ අවස්ථාවක් හදන එක තමයි අපේ ආර්ථික ප්‍රතිපත්තිය. ඒක තමයි ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය. අන්න ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න විපක්ෂයේත් සහාය ඉල්ලා සිටිනවා. ඒ නිසා සිල්ලර කථාවල එල්ලෙන්න එපා. මේක දැවැන්ත ආර්ථික පරිවර්තනයක්. අවුරුදු 20ක්, 30ක් මේක හයියට ඇදගෙන යන්න ඔබතුමන්ලාගේත් සහාය අපි ඉල්ලනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Sivagnanam Shritharan. You have 22 minutes.

[பி.ப. 12.12]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்திலே நான் என்னுடைய ஆரம்ப உரையை ஆற்றுகின்ற இந்த நேரத்தில், வழமையான வருடாந்த வரவு செலவுத்திட்டச் சடங்கு நடந்து முடிந்திருக்கின்றது. அந்தச் சடங்கிலே பல அடிப்படை விடயங்கள் கூறப்படவில்லை. அதாவது, இந்த நாட்டிலே நீண்ட காலமாக நீடித்திருக்கின்ற இனப் பிரச்சினைக்கான தீர்வுகளைக் காண்பதற்கோ அல்லது வடக்கு, கிழக்கிலே வாழுகின்ற தமிழ் மக்களுடைய அரசியல் அபிலாஷைகளை நிறைவேற்றுவதற்கான அடித்தளத்தை இடுவதற்கோ மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் எந்தவிதமான கருத்துகளும் இல்லை. இந்த நாட்டை இப்பொழுது ஆட்சி செய்கின்ற தலைவர்களிடம்கூட அதுபற்றிய தூரநோக்கு இல்லையென்பதை இந்த வரவு செலவுத்திட்டம் தெளிவாக எடுத்துக் காட்டுகின்றது.

குறிப்பாக, நேற்று கொண்டுவரப்பட்ட வரவு செலவுத்திட்டத்தில் செலவினம் 10 பங்காக இருந்தால், அதில் கிட்டத்தட்ட ஒன்றரைப் பங்கு, யுத்தம் இல்லாத நாட்டின் பாதுகாப்புத் துறைக்கு ஒதுக்கப்பட்டு இருக்கின்றது; பாதுகாப்பு, பொதுமக்கள் பாதுகாப்பு என்ற அடிப்படையில் கிட்டத்தட்ட ஒன்றரைப் பங்கு ஒதுக்கப்பட்டு இருக்கின்றது. ஆனால், அந்தப் பத்துப் பங்கில் அரைப் பங்குதான் இந்த நாட்டினுடைய கல்விக்கு ஒதுக்கப்பட்டு இருக்கின்றது. அப்படியென்றால், இந்த நாட்டின் கல்வி நிலையை நீங்கள் எடுத்துக்கொள்ளும் விதம் என்ன? யுத்தம் இல்லாத அல்லது வேறு நாடுகளோடு போர் செய்யாத இந்த நாட்டின் பாதுகாப்புத் துறைக்கு ஏன் இவ்விதம் ஒன்றரைப் பங்கு ஒதுக்கப்பட வேண்டும்? 100 சதவீதமான ஒதுக்கீட்டில் கிட்டதட்ட 15 சதவீதத்தைப் பாதுகாப்புத் துறைக்கு ஒதுக்கியிருப்பதன்மூலமே உங்களுடைய உண்மை முகம் மிகத் தெளிவாகத் தெரிகிறது. மொத்த ஒதுக்கீடுகளில் அதிகமான ஒதுக்கீடு பாதுகாப்புத் துறைக்கே ஒதுக்கப்பட்டு இருக்கின்றது. கல்வித் துறைக்கு வெறும் 5 சதவீதமே ஒதுக்கப்பட்டு இருக்கின்றது. இந்த நாட்டில் டிஜிட்டல் மயப்படுத்தல் பற்றி பேசுகின்றீர்கள். நாங்கள் அதைச் செய்கிறோம், இதைச் செய்கிறோம் என்று முன்னேற்றங்கள் பற்றி சொல்கிறீர்கள். ஆனால், கல்வித் துறைக்கு உங்களுடைய ஒதுக்கீடு வெறும் 5 சதவீதம்! எப்படி நாடு வளர முடியும்? நாட்டினுடைய சுய பொருளாதாரம் எப்படி வளர முடியும்? பிள்ளைகளுடைய எதிர்காலம் எப்படி அமையும்? அது ஒருபுறம்!

அடுத்து, நேற்று மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சுவாரஸ்யமான ஒரு செய்தியைச் சொன்னார், “மாகாண

சபைத் தேர்தலை நடத்துவதற்காக 10 பில்லியன் - 10,000 மில்லியன் - ரூபாயை நாங்கள் ஒதுக்கியிருக்கிறோம். ஆனால், தேர்தல் நடத்துவது பற்றி நாங்கள் பிறகு பேசலாம். அதை எந்த முறையில் நடத்துவது என்பதைப் பற்றி பேசலாம்; அதுபற்றி கட்சிகள் எல்லாம் சேர்ந்து முடிவு செய்யலாம்" என்று. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாடாளுமன்றத்திலே அதிகமான ஆசனங்களை - 159 ஆசனங்கள் - கொண்டவர்கள் நீங்கள். இந்த NPP அரசுக்கு மூன்றில் இரண்டு பெரும்பான்மை உண்டு. இந்த நாட்டிலுள்ள இனப் பிரச்சினை யைத் தீர்ப்பதற்காக, இலங்கை-இந்திய ஒப்பந்தத்தினூடாக அரசியலமைப்புக்கு நீங்கள் கொண்டுவந்த 13ஆவது திருத்தத்தின்படியான மாகாண சபை ஆட்சி முறையை நடைமுறைப் படுத்துவதற்கு ஏன் தயங்குகின்றீர்கள்? உங்களுடைய தயக்கத்துக்கான காரணம் என்ன?

நீங்கள் வெளிநாடுகளுக்குச் சென்று, இங்கே யுத்தம் நடக்கவில்லை என்பது போலவும், யுத்தத்தின் மூலமாகப் மிகப்பெரிய இனவழிப்பு நடக்கவில்லை என்பது போலவும், போர்க் குற்றங்கள் நடக்கவில்லை என்றும் குறிப்பிடு கின்றீர்கள். அதுபற்றி சர்வதேச விசாரணை வேண்டாம் என்று மிகவும் மண்டியிடுகிறீர்கள். இந்த நாட்டிலே யுத்தக் குற்றங்கள் நடக்கவில்லை என்றால், ஓர் இனத்துக்கு எதிரான அழிப்புகள் நடக்கவில்லை என்றால், ஏன் நீங்கள் அந்த விசாரணைக்குத் தயங்க வேண்டும்? நேர்மையும் நெஞ்சுரமும் உங்களிடம் இருந்தால், நீங்கள் தைரியமான ஓர் இனமாக இருந்தால், உங்கள்மீது பிழை இல்லையென்றால், அவ்வாறு விசாரிப்பதை ஏன் நீங்கள் தடுக்க வேண்டும்? ஒருபுறம் அதனை நீங்கள் தடுத்து வைத்துக்கொண்டு, இன்னொரு புறத்திலே "மாகாண சபைத் தேர்தல்கள் நடக்கும்; ஆனால் நடக்காது" என்று சொல்கிறீர்கள். இதுதான் சனாதிபதியினுடைய நேற்றைய அறிவிப்பு!

1987ஆம் ஆண்டில் இந்தியாவினுடைய முயற்சியின் காரணமாக, இலங்கையிலே இருக்கின்ற தமிழர்கள்மீது புரியப்பட்ட யுத்தத்திற்கான ஓர் இடைக்காலத் தீர்வாக, இலங்கை-இந்திய ஒப்பந்தத்தினூடாகக் கொண்டுவரப் பட்டதுதான் இந்தப் 13ஆவது திருத்தச் சட்டம். இணைந்த வட-கிழக்கிலே ஒருமுறை மாகாண சபை ஆட்சி முறை இருந்திருக்கிறது; கிழக்கு மாகாணம், வடக்கு மாகாணத்துக் கான ஆட்சி முறைகள் இருந்திருக்கின்றன. இந்த ஆட்சி முறைகள் நிறுத்தப்பட்டு 5 ஆண்டுகள் முடிவுற்றிருக்கிறது. ஆனால், இன்னும் இந்த நாட்டிலே மாறிமாறி ஆட்சிக்கு வருகின்ற நீங்கள் மாகாண சபைத் தேர்தல்களை நடத்தப் பின்னடிக்கிறீர்கள். காரணம், இந்த நாட்டிலே நீங்கள் தமிழர்களை தோல்வியடைந்த ஓர் இனமாக, உங்களுடைய சிகிச்சையின் மூலமாக அவர்களைத் தோல்விகண்டு இருப்பவர்களாக நடத்தப் பார்க்கின்றீர்கள். அவர்களைத் தோல்வி மனப்பாங்கிலேயே வைத்திருந்துகொண்டு, நீங்கள் சொல்வதை அவர்கள் கேட்டுக் கொண்டிருந்தால் போதும் என்பது போன்ற உங்களுடைய மன நிலையை எங்களால் உணர முடிகிறது. ஆனால், இது நல்லதல்ல; இந்த நாட்டுக்கும் மக்களுக்கும் இந்த நாட்டின் நாளைய எதிர்காலத்துக்கும் ஒரு யதார்த்தமான நல்ல நிலையை இது தரப்போவதில்லை.

தயவுசெய்து ஒன்றைப் புரிந்து கொள்ளுங்கள்! இதுவொரு நீண்ட காலப் பிரச்சினை. இன்று நேற்று அல்ல, 80 ஆண்டுகளுக்கும் மேலாகத் தமிழர்கள் தங்களுடைய உரிமைகளுக்காகப் போராடுகின்ற ஓர் இனம்! அவர்கள் ஒரு தேசிய இனம்! தமிழ்ப் பேசும் மக்கள் தங்களுக்கே உரித்தான மொழி, கலாசாரம், பண்பாடு, வரலாற்று ரீதியான நிலம் போன்ற அடையாளங்களைக் கொண்ட ஓர் இனம்! அவர்களை அடக்கி வைத்துக்கொண்டு, யுத்தத்தில் தோற்றுப்போன இனமாக நினைத்துக்கொண்டு, மாறி மாறி ஆட்சிக்கு வருகின்ற நீங்கள் ஒவ்வொருவரும் தமிழர்கள்மீது ஆதிக்கத்தைச் செலுத்தலாம் என்று நினைத்தால், வரலாறு இன்னொரு திசைக்குத் திரும்பும்!

இன்றைக்கு உங்களுக்குப் பெரும்பான்மை இருக்கலாம், உங்களைவிடப் பெரும்பான்மையோடு ஆட்சிக்கு வந்தவர் கோட்டாபய ராஜபக்ஷ. அவர் வந்த வரத்து என்ன? பின்னர் போன போக்கு என்ன? ஆகவே, இது நிலையானது அல்ல. நீதியும் தர்மமும் அறமும் நிலைக்காத வரைக்கும், புத்த பகவானுடைய போதனைகளைப் பின்பற்றுகின்ற இனமாக நீங்கள் அவருடைய போதனைகளின்கீழ் ஒரு சரியான பாதையில் ஆட்சியை அமைக்கத் தவறினால், இந்த நாடு மீண்டும் ஓர் அழிவுப் பாதையை நோக்கிப் போகுமே தவிர, நியாயமான, நிம்மதியான பாதையில் இந்த நாட்டைக் கொண்டுசெல்ல முடியாது. அதனால்தான் நான் இதனை வலியுறுத்துகின்றேன். வெறும் வாய்ப்பேச்சுகளால் அல்ல, "காசு ஒதுக்குகின்றோம், ஆனால் தேர்தலைப் பற்றி பின்னர் சிந்திப்போம்" என்றால், ஒரு திடமான நம்பிக்கையுடன் நாட்டின் தலைவரால் அதைச் சொல்ல முடியவில்லை. "எங்களிடம் 159 உறுப்பினர்கள் இருக்கின்றார்கள்; மூன்றிலிரண்டு பெரும்பான்மை உள்ளது; நாங்கள் செய்வோம்" என்று சொல்லும் தைரியமும் மூச்சும் நேற்றைய தினம் அவரிடம் காணப்படவில்லை. ஆகவேதான் நான் சொல்லுகின்றேன், இதுவொரு சடங்கு! வழமையானது போன்ற ஒரு வரவு செலவுத்திட்டச் சடங்கை மாண்புமிகு சனாதிபதி அவர்கள் நேற்றைய தினம் ஒரு பிரசங்கமாகச் செய்துவிட்டுப் போய்விட்டார். நீங்கள் அந்தப் பிரசங்கத்துக்குப் பக்கவாத்தியங்களாகப் பேசுகிறீர்கள். ஆனால், நாட்டில் இருக்கின்ற பிரச்சினைகளைத் தீர்ப்பதற்கு நீங்கள் தயாரில்லை.

அபிவிருத்தி தொடர்பாகப் பார்க்கும்போது, நேற்று முன்தினம் 06ஆம் திகதி கிளிநொச்சியில் அபிவிருத்திக் குழுக் கூட்டம் நடைபெற்றது. அந்தக் கூட்டத்தில் உங்களுடைய ஒரு பாராளுமன்ற உறுப்பினர் மாம்பழத் தோட்டச் செய்கை பற்றி கதைத்தார். மக்களுக்கு - வடக்கு, கிழக்கில் உள்ள மக்களுக்கு - குடியிருப்பதற்குக் காணியில்லை. யாழ்ப்பாண மாவட்டத்தில் 13,000 பேருக்கு குடியிருப்பதற்குக் காணியில்லை. கிளிநொச்சி மாவட்டத்தில் 4,000 பேருக்கு குடியிருப்பதற்குக் காணி யில்லை. அதேபோன்று வவுனியா, மன்னார், முல்லைத்தீவு, மட்டக்களப்பு, அம்பாறை, திருகோணமலை மாவட்டங்களில் குடியிருப்பதற்குக் காணியில்லாத மக்கள் இருக்கின்றார்கள். ஆனால், மக்கள் குடியிருக்கக்கூடிய, மக்களுடைய குடிநீர்த் தேவைக்கான நல்ல நீர் உள்ள இடங்களில் மாம்பழத் தோட்டம் செய்யப் போகின்றாராம். ஏனென்றால், அவர் உற்பத்தியை ஊக்குவிக்கப் போகின்றாராம்; வெளிநாட்டு முதலீடுகளை வரவழைக்கிறாராம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டத்திலே பல அபிவிருத்திகள் தொடர்பாகவும், பிரச்சினைகள் தொடர்பாகவும் சனாதிபதி அவர்கள் சொன்னார். குறிஞ்சாத்தீவில் ஓர் உப்பளம் இருக்கின்றது. அது ஆசியாவிலே வெள்ளை உப்பு உற்பத்திக்குப் பெயர்போன ஓர் உப்பளம். உலகத்திலே மிகப் பெறுமதி வாய்ந்த உப்பு உற்பத்தி செய்யப்பட்ட இடம் குறிஞ்சாத்தீவு. அதற்காகக் குறைந்தது 1,000 மில்லியன் ரூபாயைக்கூட இந்த அரசாங்கத்தினால் ஒதுக்க முடியவில்லை. அதன் அபிவிருத்தி நடவடிக்கைகளுக்காக 2,000 மில்லியன் ரூபாயை ஒதுக்கியிருந்தால் அதன் ஒரு கட்ட வேலையைத் தொடங்கி

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

இருக்கலாம். ஏற்கனவே ஆனையிறவு உப்பளம் இயங்கிக் கொண்டிருக்கின்றது. அங்கு இன்னும் பல அபிவிருத்தி வேலைகளைச் செய்யவேண்டிய தேவைகள் உண்டு.

ஆனால், அதனைச் செய்வதற்குக் காசு எதுவும் ஒதுக்கப்படவில்லையே! மட்டக்களப்பில் வாழைச்சேனை காகிதத் தொழிற்சாலை அபிவிருத்தி செய்யப்படாமல் அப்படியே இருக்கின்றது. யாழ்ப்பாணத்திலுள்ள சீமெந்துத் தொழிற்சாலையில் உள்ளூர் மூலப்பொருட்களைப் பயன்படுத்தாது வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யப்படும் மூலப்பொருட்களைக் கொண்டு சீமெந்து தயாரித்து, பொதிசெய்து, விற்பனை செய்வதற்கான காணியை, அதற்கான உரித்தை முருகதாஸ் தலைமையிலான ஓர் ஆய்வு அறக்கட்டளை நிறுவனம் கேட்டிருந்தது. அவர்கள் அந்த விண்ணப்பத்தைச் செய்து ஒரு வருடத்துக்கும் மேலாகியும் இதுவரை அரசாங்கம் அதனை வழங்குவதற்குத் தயாராயில்லை. ஆனால், வெளியே அபிவிருத்தி தொடர்பாகப் பேசுகின்றீர்கள்; அபிவிருத்திக்கு முன்னுரிமை என்கிறீர்கள்.

புலம்பெயர் நாடுகளில் இருப்பவர்களை நாட்டுக்குத் திரும்பி வாருங்கள் என்கிறீர்கள். வடக்கில் இருக்கக்கூடிய, மிகப் பிரதானமான மூலவளங்களைக் கொண்ட சீமெந்துத் தொழிற்சாலையில் சீமெந்து பொதி செய்வதற்கு அனுமதி வழங்கவில்லை. குறிஞ்சாத்தீவு உப்பளத்தை மீண்டும் ஆரம்பிக்கத் தீர்மானித்து ஓர் ஆண்டு கடந்திருக்கின்ற நிலையிலும் அதற்கு உங்களால் குறைந்தது 1,000 மில்லியன் ரூபாயை ஒதுக்க முடியவில்லை. ஆனையிறவு உப்பளத்தை அபிவிருத்தி செய்வதற்குக் காசு ஒதுக்கப்படவில்லை. வாழைச்சேனை காகிதத் தொழிற்சாலையை அபிவிருத்தி செய்வது தொடர்பாக உங்களிடம் எந்தக் கருத்துகளும் இல்லை. அப்படியானால் என்ன உற்பத்தி? என்ன வேலை? யாருக்கு நீங்கள் என்ன செய்யப் போகின்றீர்கள்? வெறுமனே உங்களுடைய சில பாராளுமன்ற உறுப்பினர்களின் தேவைகளுக்காக மாம்பழங்களையும் பலாப்பழங்களையும் உற்பத்தி செய்வதைத்தான் இந்த நாட்டின் அபிவிருத்தி என்று கருதுகின்றீர்களா? தயவுசெய்து சிந்தியுங்கள்!

அதனால்தான் நாங்கள் கேட்டோம், காங்கேசன்துறைத் துறைமுகத்தை அபிவிருத்தி செய்வதற்கான முழுமையான நிதியை இந்தியா grantஆக - இனாமாக வழங்கத் தயாராக இருக்கின்றது; அதன்மூலம் அதை அபிவிருத்தி செய்யுங்கள் என்று. அது இந்தியாவிலிருந்து பிரயாணிகள் கப்பல்கள் வந்து போவதிலிருந்து இந்தியப் பொருட்களைக் கொண்டுவரவும் இலங்கைப் பொருட்களைக் கொண்டுசெல்லவும் மிகப் பெரிய வாய்ப்பாக அமையும். ஆனால், உங்களுக்கு அதில் விருப்பமில்லை. ஏனென்றால், அந்தத் துறைமுகம் அபிவிருத்தி யடைந்தால், கப்பல்கள் வந்து போனால், யாழ்ப்பாணம் ஒரு வர்த்தக மையமாக மாறும். அது உங்களுக்கு விருப்பமில்லாமல் இருக்கிறது. அதுதான் அடிப்படை!

திருகோணமலை, சிகிரியா ஆகிய உள்ளூர் விமான நிலையங்களுக்கும் யாழ்ப்பாணம் சர்வதேச விமான நிலையத்துக்கும் சேர்த்து அவற்றின் அபிவிருத்திக்கு 1,000 மில்லியன் ரூபாய் ஒதுக்கியதாக ஜனாதிபதி அவர்கள் வரவு செலவுத்திட்ட உரையிலே கூறியிருந்தார். பலாலி விமான நிலையத்தினூடாக ஒருவர் 15 கிலோவுக்கு மேல் பொதிகளைக் கொண்டுவர முடியாது. அத்துடன், 80 பேருக்கு மேல் பயணம் செய்யக்கூடிய விமானங்களைக் கொண்டுவரவும் முடியாது. ஆனால், அது ஒரு சர்வதேச விமான நிலையம்! அப்படியென்றால், அது ஒரு சர்வதேச விமான நிலையமாக அங்கிருந்து ஏனைய நாடுகளுக்கோ அல்லது ஏனைய பிரதேசங்களுக்கோ செல்வதற்கான அடுத்த கட்ட நகர்வு என்ன? அதன் ஓடுபாதையை விஸ்தரியுங்கள்; அதற்காகப் பெற்ற காணிகளுக்கான நிவாரணத்தை அந்த மக்களுக்கு வழங்குங்கள்; அந்த விமான நிலையத்தை மேலும் விஸ்தரித்து பெரிய விமானங்கள் வந்து இறங்கக்கூடிய வகையில் அதனை சர்வதேச தரத்துக்கு மாற்றுங்கள் என்று நாங்கள் இங்கே பல தடவை கேட்டிருந்தோம். ஆனால், அதனை மேற்கொள்ள அரசாங்கத்திற்கு விருப்பமில்லை. ஆகவே, நீங்கள் போலியாகப் பேசுகின்ற அபிவிருத்தி அல்லது முகத்துக்காகப் பேசுகின்ற அபிவிருத்தி என்பது உண்மையான அபிவிருத்தி அல்ல; தயவுசெய்து புரிந்து கொள்ளுங்கள்!

காங்கேசன்துறைத் துறைமுகம் அபிவிருத்தி செய்யப் பட்டால் அது அபிவிருத்தியாக அமையலாம்; யாழ்ப்பாணம் சர்வதேச விமான நிலையம் விஸ்தரிக்கப்பட்டால் அது அபிவிருத்தியாக இருக்கும்; குறிஞ்சாத்தீவு உப்பளம் அபிவிருத்தி செய்யப்பட்டால் அது அபிவிருத்தியாக இருக்கும்; ஆனையிறவு உப்பளம் விருத்தி செய்யப்பட்டால் அது அபிவிருத்தியாக இருக்கும்; வாழைச்சேனையிலே காகித ஆலையில் அபிவிருத்தி நடந்தால் அது அபிவிருத்தியாக மாறும். ஆனால், நீங்கள் இந்த நாட்டிலிருக்கின்ற வளங்களை விற்பதற்குத் தயாராகின்றீர்கள்; காணிகளை விற்பதற்குத் தயாராகின்றீர்கள்.

வாருங்கள், வாருங்கள் என்று நீங்கள் வெளிநாட்டு முதலீட்டாளர்களை அழைக்கிறீர்கள். சுற்றுலாப் பயணிகளால் பெருமளவு அந்நியச் செலாவணி கிடைப்பதாகச் சொல்கின்றீர்கள். இங்கிருக்கின்ற சுற்றுலாத் தளங்களை நீங்கள் காண்பிப்பது நல்லது. சுற்றுலாப் பயணிகள் நாட்டுக்கு வருவதால் அந்நியச் செலாவணி கிடைப்பது நாட்டுக்கு வருமானமாக இருக்கட்டும்! ஆனால், அதுதான் நிரந்தர வருமானம் அல்ல. யப்பானியர்கள் சொந்தக் காலில் நிற்பதுபோல, சிங்கப்பூர் மக்கள் தங்கள் சொந்த உழைப்பில் நிற்பதுபோல, மக்கள் தங்களுடைய சொந்தக் காலில் நிற்கக்கூடிய நாடாக முதலிலே இந்த நாடு மாற வேண்டும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, தமிழீழ விடுதலைப் புலிகளுடைய கட்டுப்பாட்டிலே யாழ்ப்பாணம், வன்னி, மட்டக்களப்பு பகுதிகள் இருந்தபொழுது, அவர்களால் தூரநோக்கோடு உருவாக்கப்பட்ட 'தமிழீழ பொருண்மிய மேம்பாட்டுக் கழகம்' என்ற அமைப்பின் ஊடாக அவர்களுடைய வழிகாட்டலிலே சுய உழைப்பின்மூலம் - சொந்த உழைப்பின்மூலம் - அந்த மக்கள் சொந்தக் காலிலே நின்றார்கள். அது உங்களுக்குத் தெரியும். அப்போது மக்கள் 14 ரூபாய்க்கு ஒரு கிலோ அரிசியை வாங்கினார்கள். கல்வி கற்றார்கள், போக்குவரத்து இருந்தது, சுதந்திரமாக வாழ்ந்தார்கள். ஆனால், இன்றைக்கு அரிசியின் விலை என்ன? பருப்பின் விலை என்ன? மரக்கறிகளின் விலை என்ன? அடுத்த கட்டப் பொருளாதார நகர்வு என்ன? தேயிலை, தெங்கு, இறப்பர் உற்பத்தியிலே நாட்டுக்கு எவ்வளவு வருமானம் வருகின்றது? வழமையான வருமான கலாசாரத்திலிருந்து இலங்கை எவ்வளவுதூரம் பின்னோக்கி விழுந்திருக்கின்றது! நீங்கள் வெறுமனே கட்டிடங்களைத் திறப்பதன்மூலம் நிதி பாயும் என்று நினைக்காதீர்கள்; அது நிதிப் பாய்ச்சல் அல்ல, அது அபிவிருத்திப் பாய்ச்சல் அல்ல. அது இந்த நாட்டின்மீதான பார்வைக்கான ஒரு விமர்சனம். கலாசாரமென்று நீங்கள் வயோதிபர்களுக்கு மாலை போடுவதும், அம்மாமாரைக் கட்டியணைத்துக் கொஞ்சுவதும் மட்டும் நாட்டின் அபிவிருத்தி அல்ல. நாட்டிலே இருக்கின்ற

ஒவ்வொரு வயோதிபரும் தன்னுடைய சொந்த உழைப்பிலே வாழுகின்றாரா? அம்மாமார் மகிழ்ச்சியாக வாழ்கின்றார்களா? அவர்களுக்கு வாழ்வதற்கு எந்தத் தடையும் இல்லை என்ற நிலைமையை உருவாக்குங்கள்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் ஒன்றைச் சொல்ல விரும்புகின்றேன். முதலில் இந்த நாட்டிலே இருக்கின்ற இனப் பிரச்சினையைத் தீர்ப்பதற்குத் தயாராகுங்கள்! நீங்களும் நாங்களும் இந்த நாட்டினுடைய பங்காளிகள். கௌரவ பிரதமர் அவர்கள் இருக்கின்றார்; பல உறுப்பினர்கள் இருக்கின்றீர்கள். நீங்கள் சோசலிசவாதிகள் என்று நான் நினைக்கின்றேன். நான் பல யதார்த்தவாதிகளைப் பார்த்திருக்கின்றேன், லிபரல்வாதிகளைப் பார்த்திருக் கின்றேன். ஆனால், நீங்கள் உங்களை 'சோசலிசவாதிகள்' என்று சொல்லிக் கொள்கிறீர்கள். ஒடுக்குமுறைக்கு எதிரான உங்களுடைய போராட்டத்தை, காலனித்துவத்துக்கு எதிரான போராட்டத்தை, நவகாலனித்துவத்துக்கு எதிரான போராட்டத்தை நாங்களும் கொஞ்சம் கொஞ்சம் ஏற்றுக் கொண்டவர்கள்; அந்த எண்ணங்களைக் கொண்டவர்கள். அதனால்தான் நாங்கள் தமிழ் பேசும் மக்களாக தமிழ் மக்களும் முஸ்லிம் மக்களும் இந்த நாட்டிலே ஒரு நிரந்தரத் தீர்வை உங்களிடம் கேட்கின்றோம். தமிழ் பேசும் மக்களுடைய பிரச்சினையை, ஒடுக்கப்பட்டிருக்கின்ற அந்த மக்களுடைய சுயநிர்ணய உரிமையை அங்கீகரிக்காத சோசலிசம் என்றால் அது என்ன சோசலிசம்? ஒடுக்குமுறைக்குள் வாழுகின்ற மக்களுக்கான சுயநிர்ணய உரிமை என்றால் என்னவென்று உங்களுடைய கட்சியின் செயலாளர் நாயகமும், ஜே.வி.பீ. ஸ்தாபகர்களில் ஒருவராகவும் இருக்கின்ற ரில்வின் சில்வா அவர்களைக் கேளுங்கள்!

சுயமாக வாழ்ந்த ஓர் இனம், வடக்கிலும் கிழக்கிலும் தன்னுடைய பாரம்பரியமான வரலாற்று நில அடையாளங்களோடு, தனக்கே உரித்தான மொழியோடு, தனக்கே உரித்தான பாரம்பரியக் கலாசார அடையாளங்களோடு வாழ்ந்த இனம் இன்று ஒடுங்கி நிற்கின்றது, ஒடுக்கப்பட்டிருக்கிறது. ஆனால், அதைப்பற்றி பேசுகின்ற திராணி, தைரியம் இந்த நாட்டிலே எந்தத் தலைவருக்கும் இல்லை. நான் ஒன்றைத் தெளிவாகச் சொல்கிறேன். நாங்கள் மீண்டும் ஓர் ஆயுத யுத்தத்தை விரும்பியவர்கள் அல்லர், ஆயுதங்கள்மீது காதல் கொண்டவர் களும் அல்லர், துப்பாக்கிகள் பற்றி சிந்திக்கின்றவர்களும் அல்லர். ஆனால், நீங்கள் இப்படியே போனால், அரசியல் தீர்வு என்பதை இனிமேல் அந்த மக்கள் உங்களிடம் கேட்க மாட்டார்கள் என்று நீங்கள் நினைத்தால், நீங்கள் விடுகின்ற மிகப் பெரிய வரலாற்றுத் தவறாக அது அமையும். அதனால்தான் நான் குறிப்பிட்டேன், வரவு செலவுத்திட்ட மென்பது வெறும் சடங்கல்ல என்று. அது வருடாந்தம் நாட்டின் செயற்பாடுகள் பற்றி சொல்லப்படுகின்ற ஒரு கொள்கை விளக்கம்.

இந்த நாட்டினுடைய பொருளாதார வல்லமையை, இந்த நாட்டினுடைய கொள்கையை, அடுத்த ஆண்டிலே எவ்வாறு அராசங்கம் நடைமுறைப்படுத்த இருக்கின்றது என்பதைச் சொல்லுகின்ற மிகப் பெரிய ஒரு கொள்கை விளக்கத்துடனான ஆவணம்தான் நாட்டினுடைய பாதீடு எனப்படுகிறது. எதிர்வரும் ஆண்டிலே ஈட்டுகின்ற வருமானத்திற்கு ஏற்ப செலவினங்களை எவ்வாறு சமப்படுத்துவது என்பதை மட்டுமல்லாது, இந்த நாட்டிலே இருக்கின்ற இனங்களுக்கிடையில் எவ்வாறு ஒற்றுமை ஏற்படுத்தப்படும், இனங்களுக்கான பிரச்சினைகள் எவ்வாறு தீர்க்கப்படும், இனங்களுக்கான நீதி எவ்வாறு வழங்கப்படும், கடந்த ஆண்டுகளில் நடந்தவற்றில் இருந்து நாங்கள் எவ்வாறு முன்னேறுவோம் என்பவற்றையும் சொல்வதற்கான ஓர் இடம்தான் இந்த வரவு செலவுத்திட்டம்.

கடந்த ஜெனீவா கூட்டத்தொடரில் முன்வைக்கப்பட்ட பிரேரணையின்போதுகூட, உங்களுடைய வெளிநாட்ட லுவல்கள் அமைச்சர் சொல்லியிருந்தார், "நாங்கள் சர்வதேச விசாரணைக்குத் தயாரில்லை" என்று. உங்களுடைய முதுகில் புண் இல்லை என்றால் - உங்களுடைய முதுகில் காயம் இல்லை என்றால் ஏன் நீங்கள் பயப்படுகின்றீர்கள்? ஏன் நீங்கள் பயப்பட வேண்டும்? நீங்கள் குற்றம் செய்யவில்லை என்றால், நெஞ்சை நிமிர்த்தி "நாங்கள் அதனைச் செய்யவில்லை" என்று சொல்லுங்கள்! ஆனால், இந்த நாட்டிலே இதுவரையும் பாதிக்கப்பட்ட மக்களுக்கு நல்லிணக்க ஆணைக்குழுவால் நீதி கிடைக்கப்பெறவில்லை; சனாதிபதி ஆணைக்குழுவால் நீதி கிடைக்கப்பெறவில்லை; உங்களாலும் நீதி கிடைக்காது என்றுதான் நாங்கள் இந்த நாட்களிலே நம்புகின்றோம். அதனால்தான் நாங்கள் மீண்டும் மீண்டும் சர்வதேச விசாரணை வேண்டும் என வலியுறுத்துகின்றோம்.

இந்த நாட்டிலே சிங்கள மக்கள் தமிழர்களுக்கான நீதியை வழங்க மாட்டார்கள்; சிங்களத் தலைவர்கள் அதற்கு அனுமதிக்க மாட்டார்கள். ஆகவேதான் இலங்கை - இந்திய ஒப்பந்தத்தினூடாக கொண்டுவரப்பட்ட 13ஆம் திருத்தச் சட்டத்தில் சொல்லப்பட்ட சாதாரண விடயங்களைக்கூட நிறைவேற்ற இந்த அரசு மறுக்கிறது. ஆகவே, சர்வதேச சமூகம் தமிழர்களுக்கான நீதியை வழங்கத் தயாராக வேண்டும் என்றொரு கோரிக்கையை நான் இந்த உயர்ந்த சபையினூடாகச் சர்வதேச சமூகத்திடம் முன்வைக்கிறேன். தமிழர்களுக்கான நீதி கிடைக்க வேண்டும் என்றால், அது சர்வதேசத்தின் தலையீட்டுடன் மட்டுந்தான் சாத்தியமானதாக மாறும். அந்தச் சாத்தியமான, நீதியான நல்லிணக்கப் பொறிமுறை என்பது சர்வதேசத்தினுடைய தலையீட்டுடன், சர்வதேசத்தின் பார்வையில் நடைபெற வேண்டும் என்பதைத்தான் நாங்கள் மீண்டும் மீண்டும் வலியுறுத்து கின்றோம்; சர்வதேச சமூகம் இதைப் புரிந்துகொள்ள வேண்டும்.

பல உலக நாடுகளின் தலையீட்டுடன் இலங்கை - இந்திய ஒப்பந்தம் கைச்சாத்திடப்பட்டது. இதில் அமெரிக்காவினுடைய தலையீடும் இருந்தது. இந்தியாவினுடைய பெரும் பங்களிப்பு இருந்தது; இந்தியா அதிலே மிகப் பெரிய தலையீட்டைச் செய்திருந்தது. ஆனால், இந்த இலங்கை-இந்திய ஒப்பந்தத் தினூடாகக் கொண்டுவரப்பட்ட 13ஆம் திருத்தத்தின்படியான மாகாண சபை முறைமையை நடைமுறைப்படுத்துவதற்கு இன்று இந்த நாடு தயங்குகிறது. இந்த நாட்டினுடைய ஆட்சியாளர்கள் இதற்குத் தயங்கு கிறார்கள் என்றால் அது மிகப் பெரிய ஆபத்தான விடயம்! இது ஓர் இனத்திற்குச் செய்யப்படுகின்ற மிக மோசமான ஒரு பின்னடைவான செயற்பாடு! அதனால்தான் அரசியல் தீர்வுக்கு நீங்கள் தயாராகுங்கள் என்று நாங்கள் வலியுறுத்துகிறோம். எங்களுடைய கட்சி சார்பில் சனாதிபதி அவர்களுக்கு இரண்டு கடிதங்கள் எழுதப்பட்டிருந்ததென நான் நினைக்கிறேன். ஆனால், இதுவரை சனாதிபதியிடம் இருந்து எந்தப் பதிலும் வரவில்லை. ஓர் ஆரம்பப் புள்ளியாக இருக்கின்ற, ஒரு தேர்தல் மூலமாக மக்களுடைய ஆணையைப் பெற்ற, ஒரு மாகாண சபையை அமைக்க நீங்கள் தயாரில்லை என்றால், அரசியல் தீர்வுக்கு நீங்கள் எப்படித் தயாராக வரப்போகின்றீர்கள்?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எங்களுடைய இலங்கைத் தமிழரசுக் கட்சியினுடைய அரசியல் யாப்பிலேயே

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

மிகவும் தெளிவாகச் சொல்லப்பட்டிருப்பது, சமஷ்டி அடிப்படையிலான அரசியல் தீர்வு! அந்த வகையில், இந்த நாட்டிலே நாங்கள் கேட்பது சமஷ்டி அடிப்படையிலான தீர்வையே. இன்றைக்கு பெல்ஜியத்திலே இருக்கிற ஆட்சி முறை மற்றும் சுவிட்சர்லாந்தில் இருக்கிற ஆட்சி முறையினால் அந்த நாடுகளிலே பிரிவினை ஏற்படவில்லை. ஏன், இந்தியாவிலோ அமெரிக்காவிலோ இருக்கின்ற semi - சமஷ்டி ஆட்சிமுறைகளால்கூட அந்த நாடுகளில் பிரிவினை ஏற்படவில்லை; அந்த முறைகள் அந்த நாடுகளை ஒற்றுமை யாக, பலமாக வைத்திருக்கின்றன. அந்த அடிப்படையில், சமஷ்டி அடிப்படையிலான அரசியல் தீர்வு என்ற அந்த ஒன்றுக்காக நாங்கள் ஏன் பேசக்கூடாது? அந்தப் பேச்சு வார்த்தைக்கு ஏன் நீங்கள் தயாராகக் கூடாது? என இந்தச் சபையிலே இருக்கின்ற கௌரவ உறுப்பினர்களிடம் நான் கேட்கின்றேன். ஒரு நியாயபூர்வமான இந்த நாட்டுக்குள்ளே ஒற்றுமையாக வாழ்வதற்கான ஒரு கூட்டாட்சி முறைக்கு நீங்கள் தயாரில்லை என்றால், வேறு எதற்கு நீங்கள் தயாராகப் போகின்றீர்கள்? எந்த சமஷ்டி பற்றி நீங்கள் பேசப் போகின்றீர்கள்? நீங்கள் எந்தத் தீர்வு பற்றி பேசப் போகிறீர்கள்? ஆகவேதான், எங்களுடைய இனத்துக்கான, தமிழ் மக்களுடைய பிரச்சினைக்கான தீர்வு என்பது மிக முக்கியமானது என்பதை நாங்கள் மீண்டும் மீண்டும் வலியுறுத்துகின்றோம், .

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நாங்கள் இந்த உலகத்திலே வான் படை, கடற்படை, தரைப்படை போன்றவற்றைக் கொண்டிருந்து பெரிய யுத்தம் செய்த ஓர் இனம், சாதாரண இனமல்ல! அவற்றில் இருந்த பல இளைஞர்கள் இன்றைக்கும் எங்களுடைய பிரதேசங்களில் இருக்கிறார்கள். அதேபோல, குண்டுகளைத் தயார் செய்யத் தெரிந்தவர்கள் இருக்கிறார்கள்; அவர்களுடைய பரம்பரை இருக்கின்றது. ஆனால், கடந்த 16 ஆண்டுகளில் அவர்களால் எங்கேயாவது ஒரு குண்டு வெடிக்கப் பட்டிருக்கின்றதா? யாராவது துப்பாக்கி தூக்கியிருக்கிறார்களா? எவ்வளவு அமைதியாகத் தமிழர்கள் இருக்கின்றார்கள்! அவர்கள் இவ்வளவு அமைதிகாக்கும்போதுகூட அவர்களுக்கான தீர்வொன்றை வழங்காமல், தோற்றுப்போனவர்களாக அவர்களை நீங்கள் நினைத்துக்கொண்டு உங்களுடைய காலங்களைக் கடத்த நினைப்பது மிக மிக மோசமானது.

உங்களுடைய - NPPஇனுடைய - தேர்தல் விஞ்ஞாபனத் தைப் பாருங்கள்! அதில் 260ஆம் பக்கத்தில் இருந்து 264ஆம் பக்கம் வரை சொல்லப்பட்டிருக்கின்ற விடயங்களில், “இந்த நாட்டிலே ஒரு பிரச்சினை இருக்கின்றது. அரசியல் கைதிகள் இருக்கிறார்கள்” என்று சொல்லியிருக்கிறீர்கள். ஆனால், நீங்கள் இன்னும் அரசியல் கைதிகளை விடுதலை செய்யவில்லை. அதுபற்றி நான் கேட்ட கேள்விக்கு கௌரவ நீதி அமைச்சர் அவர்களிடமிருந்து இன்னும் விடை கிடைக்கவில்லை. உங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தில், “அரசியல் கைதிகளை நாங்கள் விடுவிப்போம்” எனச் சொல்லி யிருக்கிறீர்கள். ஆனால், அப்படியில்லை என உங்களுடைய சில அமைச்சர்களும் உறுப்பினர்களும் சொல்கிறார்கள். அப்படியென்றால், இந்த நாட்டைப் பற்றி யோசித்துப் பாருங்கள்! உங்களுடைய அரசு ஒரு நியாயமான அரசு; நீங்கள் ஒடுக்குமுறைக்கு எதிரானவர்கள்; நீங்கள் பாதிக்கப்பட்ட மக்களுக்கு ஆதரவாகக் கருத்துகளைச் சொல்கின்றவர்கள்.

மாண்புமிகு ஜனாதிபதி அவர்கள் கடந்த காலங்களில் இந்தச் சபையிலே இதே வரிசையிலே எங்களோடு இருந்தவர்; கௌரவ பிரதமர் ஹரினி அமரசூரிய அவர்களும் எங்களோடு இங்கே இருந்தவர்; நாங்கள் எல்லோரும் ஒன்றாக இருந்தவர்கள். உங்களுக்கு எங்களுடைய பிரச்சினைகள் பற்றி தெரியும்; எங்களுடைய நிலைமை தெரியும். இவற்றைப் புரிந்துகொண்டு ஒரு தீர்வுக்குத் தயாராகாது, அடுத்த வரவு செலவுத்திட்டமும் இதே பாணியிலே வரும் என்றால், இலங்கை வேறொரு திசைக்குச் செல்லும் என்பதை நான் எச்சரிக்கையாகச் சொல்ல விரும்புகிறேன். காரணம், நீங்கள் சவால் விடுவதுபோல அல்லது நீங்கள் சொல்வதுபோல, ஒற்றுமை இல்லாத, இனங்களை அனுசரித்துப் போகாத, இனங்களின் பிரச்சினைக்கு அரசியல் தீர்வை வழங்காத இந்த நாட்டிலே எந்தவொரு வரவு செலவுத்திட்டமும் வெற்றியான வரவு செலவுத்திட்டமாக மாறாதென்பதை நான் மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්,* ***අ.භා. 1.00ට*** *නැවත පවත්වන ලදී.*
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Mahinda Jayasinghe. You have 12 minutes.

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
මම සිරිතරන් නම මම නම பெயரை - *[இடையீடு]* சிறீதரன் அவர்கள் என்னுடைய பெயரைக் குறிப்பிட்டு இருந்தார் *[இடையீடு]* அவர் என்னுடைய பெயரைக் குறிப்பிட்டு இருக்கிறார். *[இடையீடு]* காணிப் பிரச்சினை சம்பந்தமாகப் பேசும்போது என்னுடைய பெயரைக் குறிப்பிட்டு இருக்கிறார்.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නම කියලා තිබුණේ නැහැ. හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Did he mention your name, Hon. Member? I did not hear him mentioning your name.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Privilege matter එකක් ගන්න,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I did not hear him mentioning any name. I am usually on the lookout.

Hon. Mahinda Jayasignhe, you may commence your speech now.

[අ.භා. 1.01]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
Hon. Deputy Speaker, අපේ ආණ්ඩුවේ දෙවැනි අය වැය යෝජනාව පාර්ලිමේන්තුවටත්, රටටත් ඉදිරිපත් කර තිබෙන මේ මොහොතේ අපි තවම ඇහුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා දෙකක් විතරයි. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ඉතුරු කථා ටිකත් ඇහුවාම අපට බලා ගන්න පුළුවන්, ඒ අය කොයිතරම් confuse වෙලා ඉන්නවා ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වසරේ සැප්තැම්බර් 21වැනි දා අපි භාර ගත්තේ කොයි වාගේ රටක් ද කියලා විශේෂයෙන්ම ඔබතුමා දන්නවා. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉදිරි පෙළ සිටින මන්ත්‍රීවරුන්ටත්, විපක්ෂයේ අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් ඒ දේවල් අමතක වුණාට, මේ රටේ ජනතාවට ඒක අමතක වෙලා නැහැ. හැම පැත්තකින්ම බිඳ වට්ටපු රටක් තමයි අපි පසුගිය අවුරුද්දේ සැප්තැම්බර් මාසයේ 21වැනි දාත්, ඊට පසු නොවැම්බර් මාසයේ 14වැනි දාත් සම්පූර්ණයෙන් භාර ගත්තේ.

එසේ බිඳ වට්ටපු රට තමයි අපි ක්‍රමක්‍රමයෙන් හැම පැත්තකින්ම ඉහළට ඔසවමින් මේ ඉදිරියට අරගෙන යමින් තිබෙන්නේ. අද වනකොට හැම ආර්ථික දර්ශකයක්ම ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. හැබැයි, අපි දන්නේ නැහැ ආර්ථික විද්‍යාව ගැන විපක්ෂයට කොයි විධියට කරුණු කියලා දෙන්නද කියලා. හැබැයි, කියන්නේ නම් ආර්ථික විද්‍යාවෙන් කෙළ පැමිණි ආර්ථික ඔස්තාර්ලා කියලා. හැබැයි, අද පුංචි කරුණක් ගැනවත් අදහසක් හදා ගන්න බැරි තරමට ඒ අය confuse වෙලා.

කෙසේ වෙතත්, ඊයේ අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඉදිරිපත් කළ අය වැය තුළින් අපේ ආණ්ඩුවේ ගමන් මඟ පිළිබඳව, 2026 වසරේ අපි මේ රට ඉදිරියට ගෙන යන්න බලාපොරොත්තු වන තැන පිළිබඳව ඉතාම පැහැදිලිව සහ නිරවුල්ව, නිවැරදිව සඳහන් කළා.

අපි දන්නවා, අපේ රට ගොඩනඟන්න නම් අපට පැති ගණනාවකින් මේ රට ඉදිරියට අරගෙන යන්න අවශ්‍ය වෙලා තිබෙන බව. ඒ සඳහා එක පැත්තකින් අපි අපනයන විවිධාංගීකරණයකට යා යුතුයි. ඒ සඳහා ඉතාම හොඳින් සහ මැනවින් ඊයේ ඉදිරිපත් කළ අය වැය තුළින් අපි එකින් එක, එකින් එක කරුණු ගෙනහැර දැක්වූවා.අපේ රට ගොඩනඟන්න නම්, අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඉහළට ඔසවන්න ඕනෑකම තිබෙනවා. ඇප නැති ණයයි, අඩු පොලී ණයයි කියන දෙකත් දැන් මේ අය පටලවාගෙන තිබෙනවා. අපි කොහේවත් කියලා නැහැ, පොලී රහිත ණය දෙනවා කියලා. අපි කිව්වේ, ඇප නැතුව අඩු පොලියට ණය දෙනවා කියන එකයි. ඒ කථාවටත් confuse වෙලා, පටලවාගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරිගන්වන්න සහ අලුත් ව්‍යවසායකයන් නිර්මාණය කරන්න රුපියල් බිලියන 80කට වඩා වැඩි මුදලක් වෙන් කරලා තිබෙන බව.

විපක්ෂයේ ඒ මන්ත්‍රීතුමා කියනවා මම අහගෙන හිටියා, තරුණයන් ඉල්ලපු කරුණු 5ක් තිබෙනවා කියලා. ඒ කරුණු 5න්, 1ක් තමයි අලුත් ව්‍යවසායකත්වය ගොඩනඟන එක. ඒ සඳහා අපි මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත්, එතුමා ඒ ගැන කථා කරන්නේ නැහැ. ඇත්තටම ගත්තොත්, මේ අය වැයේ තිබෙන කරුණු එකින් එක, එකින් එක කියවාගෙන යද්දී ඒගොල්ලන්ට මේක ගැන කියන්න දෙයක් ඉතුරු වුණේ නැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා තමයි වෙන වෙන දේවල් කියමින් ඉන්නේ. අපේ භාෂාවෙන් කියනවා නම්, වටේ යන්නේ.

දැන් බොහොම පැහැදිලිව අපේ රටේ බිඳ වැටී තිබෙන සෞඛ්‍ය පද්ධතිය ගොඩනඟන්න අපි රුපියල් බිලියන 654ක් වෙන් කරලා තිබෙනවා. අපි දන්නවා, අද අපේ රටේ බහුතරයක් ඉන්නේ දුප්පත් ජනතාව බව. ඔවුන්ට හරිහමන් සෞඛ්‍ය පහසුකම් නැහැ. ඔවුන්ට හරිහමන් විධියට බෙහෙත් ටිකක් ගන්න විධියක් නැහැ. අපේ රෝහල් පද්ධතිය බිඳ වැටිලා. ඒ නිසා ඒවා ගොඩනඟන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපි රුපියල් බිලියන 654ක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම අධ්‍යාපනය සඳහා ඉතිහාසයේ වෙන් කළ වැඩිම මුදල වන රුපියල් බිලියන 704ක් වෙන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ලබන වසරේ සිට අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමට නියමිතව තිබෙන බව. අපි තවත් ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන්න නියමිතව තිබෙනවා. ඒ සියල්ල ඇතුළුව අධ්‍යාපනය සඳහා අපි මේ අය වැයෙන් රුපියල් බිලියන 704ක් වෙන් කරලා තිබෙනවා. ඉතිහාසයේ අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වැඩිම මුදලක් වෙන් කරපු අය වැය තමයි, පසුගිය වසරේ අපේ අය වැය. ඒ වාර්තාවත් ඉක්මවා ගිහිල්ලා අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට ඊටත් වඩා වැඩියෙන් අපි 2026 වසර සඳහා ඉදිරිපත් කළ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විපක්ෂයේ මන්ත්‍රීවරු ඊයේ අය වැය ඉවර වෙලා එළියට ගිහිල්ලා voice-cuts දෙනවා අපි දැක්කා. ඒ වාගේම අද මේ විවාදය ඇතුළේත් ජනතාව නොමඟ යවන සුළු ප්‍රකාශ නිකුත් කරමින් ඉන්නවා. විපක්ෂයේ ඉදිරි පෙළේ ඉන්නවා, එක නාළිකාවක හිමිකරුවෙක්. එතුමා අද මෙතැන හිටියා නම් හොඳයි. ඒ නාළිකාව මොකක්ද කියන්නේ? ඒගොල්ලන් ඊයේ ප්‍රවෘත්තියක් පළ කරලා තිබෙනවා, -ඒ ප්‍රවෘත්තිය මා සතුව තිබෙනවා- මන්ත්‍රීවරුන්ට කැබ් රථ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 12,500ක් වෙන් කරලා තිබෙනවා කියලා. "ආපසු භාර දීමේ පදනම මත ලබා දීම සඳහා කැබ් රථ මිලදී ගැනීමට රුපියල් මිලියන 12,500ක් වෙන් කෙරේ." ඒක තමයි news එක. ජනතාවට බොරු කියන්න එපා කියලා අපි ඒ මාධ්‍යවලින් අදත් ඉල්ලා සිටිනවා. අපි ඒක හැමදාම කියනවා, අදත් කියනවා. ජනතාවට තවදුරටත් බොරු කියන්න එපා.

ඒ මහත්මයාට අද නම් කථාවක් දීලා නැහැ. ඒ මහත්මයාට කථා කරන දවසක කොහේද එහෙම කියලා තිබෙන්නේ කියලා පෙන්වන්න කියලා අපි අභියෝග කරනවා. හැම දාම බොරු කියන මේ නයි නාළිකාවට අපි කියනවා, කාගේ හරි උපදෙස් මත රටට බොරු කියන්න එපා කියලා. සමහර අය ඒකෙන් post එක

[ගරු මහින්ද ජයසිංහ මහතා]

අරගෙන රුපියල් මිලියන 12,500, 225න් බෙදලා එක මන්ත්‍රීවරයෙකුට වෙන් වන මුදල කියලා posts share කරනවා. ඒ නිසා මේ posts share කරන මහත්වරුන්ගෙනුත් අපි ඉල්ලනවා, මේ නයි නාළිකාවල බොරුවලින් අය වැය කියවන්න එපා කියලා. WhatsApp එකේ අද මේ අය වැය කථාව තිබෙනවා. ඒකෙන් අරගෙන අය වැය කථාව කියවන්න. තවත් වෙබ් අඩවිවල තිබෙනවා. ඒවායින් අරගෙන කියවලා, ඒකට අනුව posts හදන්න. හැබැයි, අර සියල්ලට ඉහළින් ඉන්න නාළිකාව නම් මොකක්වත් කියනවා අපි දැක්කේ නැහැ. ඒක ඊයේ බොරු කියනවා අපි දැක්කේ නැහැ. ඉදිරියේදී කියයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොහොම වුණත් අපි අවධාරණය කරනවා, විශේෂයෙන් මේ රුපියල් මිලියන 12,500 වෙන් කරලා තිබෙන්නේ රජයට වාහන මිලදී ගන්න බව. ඒ වාගේම පළාත් පාලන ආයතනවලට වාහන 700ක් මිලදී ගන්න. රජයට වාහන 1,775ක්, මන්ත්‍රීවරුන්ට 225ක්, පළාත් පාලන ආයතනවලට 700ක් වශයෙන් වාහන 2,700ක් ලීසිං පහසුකම් මත මිලදී ගන්න තමයි මේ මුදල වෙන් කරලා තිබෙන්නේ. නමුත්, මම කලින් කිව්වා වාගේ ඒ ගැන එවැනි බොරු කියමින් සිටිනවා.

ඒ වාගේම, මේ ආර්ථිකය ගොඩනැඟීමේ credit එක අපට දාගන්න එපා කියනවා. අනේ නැහැ. ජනාධිපතිතුමා ඇතුළු අපේ ආණ්ඩුවේ මේ 159දෙනාටම කිසිදු මේනියාවක් නැහැ, credit දමා ගන්න. Credit දමා ගන්න මේනියාවක් අපට නැහැ. Credit එක ඕනෑ කෙනෙක් දමා ගන්න. හැබැයි, අපට මේනියාවක් තිබෙනවා. වැටිලා තිබෙන රට ගොඩනඟන මේනියාව අපට තිබෙනවා. එහෙම නැතුව අපට credit දමා ගන්න මේනියාවක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම කිව්වා, confuse වෙන නිසා බදු ගැන කථා කරන්න යන්නේ නැහැ කියලා. ඇත්තටම confuse වෙලා තිබෙන්නේ. අපි දැක්කා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අද,- මම දන්නේ නැහැ, එතුමා එක්ක ඇත්තටම මොකක් හරි තරහක් තිබෙනවාද කියලා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාට. එතුමාට විනාඩි පහ, පහ වෙලාව දෙනවා. විනාඩි පහ, පහ දීලා එතුමා අමාරුවේ දමනවා. විනාඩි පහ, පහ වැඩියෙන් දෙනවා; අමාරුවේ දමනවා. කොහොමටත් විපක්ෂ නායක සම්බන්ධයෙනුත් පොඩි ගැටලුවක් තිබෙනවා. ඒ නිසා එතුමා ඒ පැත්තේ ඉඳගෙන අර පැත්ත අමාරුවේ දමන්න කටයුතු කළාද කියන්න අපි දන්නේ නැහැ.

ඒ වාගේම හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියනවා මම දැක්කා, සියයට 7ක ආර්ථික වර්ධන වේගය හොඳටම මදි කියලා. එතුමාට අමතකයි, ඒගොල්ලන් ආණ්ඩු කරපු 2015-2019 කාලයේ සියයට 5.2ට තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 2ට ඇද වැට්ටුවා කියන එක. සියයට 5.2 ආර්ථික වර්ධන වේගය සියයට 2ට ඇද වැට්ටුවා, 2015 - 2019 දක්වා කාලය තුළ මෛත්‍රී-රනිල්-සජිත් ආණ්ඩුවෙන්. ඔබතුමන්ලාත් ඒ ආණ්ඩුවේ හවුල්කරුවන්; කොටස්කරුවන්. එතුමා එතකොට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය ඇමති ද කොහේද. ඉදිරි වසර තුළ ආර්ථික වර්ධන වේගය සියයට 7ට ගෙනියන්න අපේ පැත්තෙන් උත්සාහ කරනකොට, අපි ඒ විධියට අය වැය පුරෝකථනය කරනකොට එහෙම නොකරපු අය දැන් කියනවා, ඒක මදි කියලා. මදි තමයි. මේ රටේ ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්න, රටේ ජනතාවට හොඳ ජීවන තත්ත්වයක් උදා කර දෙන්න අඩුම ගණනේ සියයට 9ක, 10ක ආර්ථික වර්ධන වේගයකට යා යුතුව තිබෙනවා කියලා අපි හිතනවා. හැබැයි, එකවර ඒක කරන්න බැහැ.

ගිය අවුරුද්දේ පළමු කාර්තුවේ සියයට 4.6ක් වූ ආර්ථික වර්ධන වේගය මේ අවුරුද්දේ පළමු කාර්තුවේ අපි සියයට 4.8ක් දක්වා ඉහළට එසෙව්වා. තුන්වැනි කාර්තුව වෙනකොට සියයට 4.9ක් දක්වා එය ඉහළට ඔසවා තිබෙනවා. අපේ උත්සාහය ඒක සියයට 7 දක්වා ඉහළට ගන්නයි. 2028, 2029, 2030 වෙනකොට මේ ආර්ථික වර්ධන වේගය සියයට 9කට, 10කට යා යුතුයි. ඒක තමයි අපේ ඉලක්කය, target එක. ඒ වෙනුවෙන් තමයි අපි ආණ්ඩුවක් ලෙස, දේශපාලන ව්‍යාපාරයක් විධියට හඹාගෙන යන්නේ. ඒ නිසා අපි ඒ අයට කියන්න ඕනෑ, මේ ආණ්ඩුවේ වැඩ ටික ඉදිරියේදී දකිනකොට, බලනකොට තව තව confuse වෙනවා කියලා.

ඒ වාගේම එතුමා ඇහුවා, රුපියල් ලක්ෂ 10න් ගෙවල් හදන්නේ කොහොමද කියලා. මගේ දිස්ත්‍රික්කය ගම්පහ. මම එතුමාට ආරාධනාවක් කරනවා, ගම්පහට යන්න එන්න කියලා. අපි දැනට ගෙවල් 218ක් නිම කරලා තිබෙනවා. ඒ ගෙවල් 218ම පෙන්වන්නම්. ඕනෑ නම් එන්න යන්න, කොහොමද ඒ ගෙවල් හදලා තිබෙන්නේ කියලා බලන්න. මේක එහෙම දේශපාලන ව්‍යාපාරයක්. විපක්ෂයට ඒක තේරුම් ගන්න බැහැ. අපේ ගම්වල ඉන්නවා, ස්වේච්ඡාවෙන් වැඩ කරන අපේ සහෝදරවරු. ඒගොල්ලන් මේවාට දායක වෙනවා; උදවු කරනවා. අපේ කොට්ඨාස සභා තිබෙනවා. ඒ දායකත්වය, හැම දෙයක්ම අරගෙන අපි මේ නිවාස ගොඩනඟලා තිබෙනවා. Social mediaවලට ගියොත් ඇති තරම් බලන්න පුළුවන්කම තිබෙනවා, කලින් තිබුණු නිවස කොහොමද, දැන් තිබෙන නිවස කොහොමද කියලා. ඕනෑ නම් මගේ මේ දුරකථනයෙන් මට පෙන්වන්න පුළුවන්, අපි ඒ නිවාස ගොඩනැඟුවේ කොහොමද කියලා.

ඒ නිසා ඒ ගොල්ලන් confuse වෙනවා තමයි. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවක් තිබෙනවා. ඒකට අනුව, මට මතක විධියට රුපියල් කෝටි 48ක්ද කොහේදෝ නිවාස හදන යෝජනා ක්‍රමවල ප්‍රචාරක වැඩ සඳහා විතරක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේ අය confuse වෙන එක අහන්න දෙයක් නැහැ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ අය වැය ඇතුළේ රාජ්‍ය සේවකයන් වෙනුවෙන් අපේ පළමුවැනි අය වැයෙන් තබපු පියවර තවත් ඉදිරියට ගෙන යන්න කටයුතු කරලා තිබෙනවා. පෙබරවාරි 17 ඉදිරිපත් කළ අපේ පළමු අය වැයෙන් අපි ලබා දීපු වැටුප් වැඩිවීමට අනුව, 2026 වසරේ වැටුප් වැඩි වීම සඳහා තවත් රුපියල් බිලියන 110ක් වෙන් කරනවා. ලබන ජනවාරි සිට රුපියල් බිලියන 220ක් මුළුමහත් රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම සඳහා වෙන් කරලා තිබෙනවා. මේ තමයි ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩිවීම. මේ අය වැය විවාදය තුළදී අපි පෙන්වා දෙන්නම්, කොහොමද එක් එක් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිමාණය වැඩි වෙන්නේ කියලා.

රාජ්‍ය සේවකයන්ගේ උත්සව අත්තිකාරම් දීමනාව රුපියල් 10,000යි තිබුණේ. ඒක රුපියල් 15,000 දක්වා ඉහළ දමන්න අපි කටයුතු කළා. ඒකත් ප්‍රමාණවත් නැහැ. තවත් වැඩි කරන්න ඕනෑ. අපි ඒක දන්නවා. හැබැයි, රටේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව, මේ අය වැයෙන් අපට දරන්න පුළුවන් ප්‍රමාණය අනුව අපි රාජ්‍ය සේවකයන්ගේ උත්සව අත්තිකාරම් දීමනා වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ආපදා ණය රුපියල් දෙලක්ෂ පනස්දහ, ලක්ෂ හතර දක්වා ගිය අය වැයෙන් අපි වැඩි කළා. මේ අය වැයෙන් තවත් රුපියල් මිලියන 10,000ක් ඒ මුදල් ලබා දීම සඳහා වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා.

අපි වෘත්තීය සමිති නායකයන් විධියට දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු ආණ්ඩුවලින් ඉල්ලුවා, ගුරු-විදුහල්පතිවරුන්ගේ දුෂ්කර

දීමනාව වැඩි කරන්න කියලා. නමුත් වැඩි කළේ නැහැ. අන්න මෙවර අය වැයෙන් අපි රුපියල් 1,500කින් ඒ දුෂ්කර දීමනාව වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව රුපියල් 1,500 රුපියල් 3,000 දක්වා වැඩි වෙනවා. රුපියල් 2,500 රුපියල් 4,000 දක්වා වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි, විදුහල්පති දීමනාවත් වැඩි කර තිබෙනවා. මේකත් දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු ඉල්ලීමක්. මේ අය වැයෙන් විදුහල්පති දීමනාව රුපියල් 1,500කින් වැඩි කරන්න කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය සේවකයන් 9,800කට ආසන්න සංඛ්‍යාවක් ස්ථිර කරන්න මේ අය වැය තුළින් අපි තීරණය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය මුළු රටේම ජනතාවට සහන ලැබුණු, ඒ වාගේම රටක් ලෙස ආර්ථික වශයෙන් ඉහළට ඔසවන්න අවශ්‍ය පියවර තබපු අය වැයක්. විපක්ෂයට ඒකේ හොඳ දකින්න හැකියාවක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

හරි පැහැදිලිව, අපේ මේ දෙවැනි අය වැය තුළින් අපේ පළමුවැනි අය වැයෙන් මේ රට ගොඩනඟන්න තබපු පියවර තවත් පියවර ගණනාවකින් ඉස්සරහට ගෙනැල්ලා තිබෙනවා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයට කියන්න ඕනෑ, ඔබතුමන්ලා අපේ පස්වැනි අය වැයේදී කියන්න හදා ගන්න කථාව දෙවැනි අය වැයේදී කියන්න එපා කියලා. එතකොට පස්වැනි අය වැයේදී කියන්න දෙයක් නැති වෙනවා. පස්වැනි අය වැයේදී කියන්න ඕනෑ දෙයක් දැන් කියන්න එපා. අපි එතුමන්ලාට මේ කාරණය කියන්න ඕනෑ. අපට අය වැය පහක් තිබෙනවා. ඒ අය වැය පහ යනකොට අපි ඉතා පැහැදිලිව මේ රට ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන යමින්, මේ රටේ දුගීභාවය තුරන් කරමින් මේ රටේ-

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරගන්න -

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මගේ කථාව තුළදී බැහැ. ඔබතුමාගේ කථාවේදී ඒක කියන්න. මම කාගේවත් නම්-ගම් කිව්වේ නැහැ. ඉතා පැහැදිලිව - *[බාධා කිරීමක්]* පස්වැනි අය වැය කියන්න දෙන්නේ නැද්ද? හීනෙන් තමයි. පොඩ්ඩක් ඉන්න. ඔබතුමා, ඔබතුමාගේ කථාවේදී ඒක කියන්න. කලබල වෙන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඊයේ ඉදිරිපත් කරපු අය වැයට අද විපක්ෂය confused කියලා අපි දන්නවා. එතුමන්ලාට කියන්න දේවල් නැති වෙලා තිබෙනවා. ඒක නිසා මොනවා හරි දේවල් ටිකක් කියමින් ඉන්නවා. ඉතා පැහැදිලිව අපි රටක් ලෙස ඉදිරියට ගෙන යන්න ඕනෑ පියවර තබලා තිබෙනවා. තව විසඳා ගන්න ඕනෑ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, මේ අය වැය විවාදය තුළ අනෙකුත් අමාත්‍යාංශ පිළිබඳව කථා කරන අවස්ථාවේ ඒ කරුණු මතු කරන්න.

ඔබතුමාට බොහොම ස්තුතියි මේ කාලය ලබා දීම පිළිබඳව, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wijesiri Basnayake. You have 10 minutes.

[අ.භා. 1.16]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Joel A. Barker කියන පර්යේෂකයා මෙන්න මෙහෙම කියනවා: "Vision without action is merely a dream. Action without vision passes the time. Vision with action can change the world."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික, සමාජයීය, දේශපාලන වශයෙන් ඇද වැටිලා තිබුණු රටක් නව දිශානතියකට පරිවර්තනය කරන්න ජාතික ජන බලවේගය විසින් ආරම්භ කළ මෙහෙයුම තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්තිය. ඒක තමයි අපේ vision එක. ඒ vision එක යථාර්ථයක්, reality එකක් කර ගන්න මේ වෙනකොට අපට පැහැදිලි Action Plan එකක් තිබෙනවා. ඒක කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන වශයෙන් අපි කොටස් කරලා තිබෙනවා. ඒ සැලැස්මේ පළමුවැනි අදියර තමයි 2025 අය වැය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු ජනාධිපතිතුමන් මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කළේ, නිදහස් ශ්‍රී ලංකාවේ 80වැනි අය වැය ලේඛනය. එහෙම නැත්නම් ජාතික ජන බලවේගය මේ රට වෙනස් කරන, පරිවර්තනය කරන දැවැන්ත වැඩසටහන. මොකක්ද මේ අය වැය කියන්නේ? ඒ තමයි, යම්කිසි මූල්‍ය වර්ෂයකට අදාළ වාර්ෂික ආදායම් වියදම් ඇස්තමේන්තුව. නමුත් ඒක ආදායම් වියදම් ඇස්තමේන්තුවක් විතරක් නොවෙයි. ඒක මේ රටේ දිශානතිය පෙන්වන, අනාගත සංවර්ධන මාර්ගය විදහා දක්වන, පැහැදිලි දර්ශනයක් ලබා දෙන ඉතා වැදගත් ලියවිල්ලක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකාව ඉතිහාසයේ මුහුණ දුන් ගැඹුරුතම, අභියෝගාත්මක අර්බුදයෙන් අපි දැන් ක්‍රමිකව මිදෙමින් ඉන්නවා. එහෙම වෙන්නේ ඇයි? එහෙම වෙන්නේ, 2025 අපේ මංගල අය වැය තුළින් අපි ඉදිරිපත් කළ, ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් විධියට. 2025 අය වැය ලේඛනයෙන් අපි ඇස්තමේන්තු කළ විධියටම අපේ රාජ්‍ය ආදායම උපයා ගන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අය වැය හිඟය, Budget deficit එක අපේක්ෂිත මට්ටමට තබා ගැනීමට අපට හැකි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් ඕනෑම රටක අය වැයක් ඉදිරිපත් වුණාට පස්සේ වසර මැද හෝ වසර අග අතිරේක මුදල් ඉල්ලීම් තිබෙනවා. නමුත් 2025 අය වැය තුළ එහෙම කිසිවක් ඉල්ලීම් කරලා නැහැ. ඒකෙන් මොකක්ද පෙන්වන්නේ?

[ගරු විජේසිරි බස්නායක මහතා]

ඒකෙන් පෙන්නුවේ රාජ්‍ය මූල්‍ය විනය සම්බන්ධයෙන් අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව සිදු කළ ඒ දැවැන්ත ක්‍රියාදාමය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 වර්ෂයේදී අපේ ආර්ථික වර්ධන වේගය සියයට 5ට ආසන්නයට රැගෙන ඒමට අපි සමත් වෙලා තිබෙනවා. ඒ අනුව මේ අය වැය ලේඛනය රජයේ ආර්ථික විනය, ප්‍රතිසංස්කරණ, ඒ වාගේම ආදායම් වියදම් කළමනාකරණය පිළිබඳව අනුගමනය කළ ප්‍රායෝගික, ස්ථායී දර්ශනයක් ලෙස පැහැදිලි කරන්න පුළුවන්.

ගරු ජනාධිපතිතුමා ඊයේ ඉදිරිපත් කළ අය වැය ලේඛනය මූලික වශයෙන් ප්‍රධාන කණු - pillars - 6ක් මත ගොඩනැඟිලා තිබෙනවා. එහි පළමුවැනි එක තමයි තිරසර සහ සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථික වර්ධනය - sustainable and inclusive economic growth. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ප්‍රධාන උපාය මාර්ගික අරමුණ වන්නේ, තවත් වසර කිහිපයක් තුළ සියයට 7ක, එහෙම නැත්නම් සියයට 7ක් ඉක්මවා යන ආර්ථික වර්ධන වේගයක් ලබා ගැනීමයි. ඒ හරහා ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ලංකාවේ හැම අස්සක මුල්ලකම ජීවත් වන ආදරණීය ජනතාව අතර සාධාරණව බෙදී යන ක්‍රමයක් අපි ස්ථාපිත කරනවා. මේ 2025 වර්ෂයේ පළමු මාස 6 තුළ අපට හැකි වෙලා තිබෙනවා, සියයට 4.8ක ආර්ථික වර්ධන වේගයක් ලබා ගන්න. ඒ වාගේම ඍණ අගයක පැවැති උද්ධමනය මේ මොහොත වෙනකොට ධන අගයකට ගෙනැල්ලා තිබෙනවා. අපේ ඉලක්කය, එය සියයට 5ට අඩුවෙන් පවත්වාගෙන යෑමයි. අපේ විනිමය අනුපාතිකය ස්ථාවර වෙලා, අපේ දළ නිල සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. එහෙම නම් ඒකෙන් පැහැදිලි වෙනවා, අපේ පළමුවැනි pillar එක වන තිරසර සහ සැමට ප්‍රතිලාභ ලබා දෙන ආර්ථික වර්ධනය අපි ක්‍රමයෙන් අත්පත් කර ගෙන යනවාය කියලා.

ඒ විතරක් නොවෙයි. අපේ මේ 2026 අය වැය ලේඛනය පදනම් වන ඊළඟ දැවැන්ත උපාය මාර්ගික කණුව තමයි අපනයන විවිධාංගීකරණය - export diversification. රටක් විධියට ඉස්සරහට යන්න නම් අපි ගෝලීය වෙළෙඳ පොළ ජය ගත යුතුමයි. අන්න ඒ සඳහා මේ රටේ අපනයන වර්ධනය කරන්න අපි මේ මොහොත වන විට ජාතික අපනයන සංවර්ධන සැලැස්ම නිර්මාණය කරලා අහවරයි. අන්න එහිදී අපි අපනයන විවිධාංගීකරණය - diversification - කරනවා. ඉතිහාසයේ පටන් මේ මොහොත වෙනකල් අපි අපනයනය කරන්නේ, අපේ සාම්ප්‍රදායික භාණ්ඩ. හැබැයි අද වෙනකොට ගෝලීය වෙළෙඳ පොළේ අවශ්‍යතා වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා අන්න එතැනට අපි cater කරන්න ඕනෑ. එහෙම නම් අපි ඒ සඳහා අවශ්‍ය භාණ්ඩ විවිධාංගීකරණයට - product diversification - යන්න අවශ්‍ය සැලසුම් නිර්මාණය කරන්න ඕනෑ. එහෙම නොවුණොත් අපට ගෝලීය වෙළෙඳ පොළ ජයග්‍රහණය කරන්න බැහැ.

විශේෂයෙන්ම තාක්ෂණය මුල් කරගත් - IT-based - productsවලට අපි යනවා. ඒ වාගේම අපි මේ වෙළෙඳ පොළ විවිධාංගීකරණය කරනවා. මොකද, අපි දන්නවා අපට තිබෙන්නේ සාම්ප්‍රදායික වෙළෙඳ පොළවල් කිහිපයක් බව. හැබැයි එතැනින් මිදිලා, විශේෂයෙන්ම අලුත් වෙළෙඳ පොළවල් කරා යන්න අවශ්‍ය සැලසුම් අපි නිර්මාණය කරනවා. මෙන්න මෙතැනදී අපට වැදගත් වෙනවා, වෙළෙඳ ගිවිසුම්. එහෙම නම්, තිබෙන වෙළෙඳ ගිවිසුම් සංශෝධනය කරමින්, නව වෙළෙඳ ගිවිසුම් නිර්මාණය කරමින් අපේ ඉලක්කය ජයග්‍රහණය කරන්න අවශ්‍ය වැඩසටහන් නිර්මාණය කරමින් තිබෙනවා. විශේෂයෙන්ම ගෝලීය වෙළෙඳ පොළේ තිබෙන ඒ අපනයන තරගකාරිත්වය - export competitiveness - කියන එක අපි ජය ගත යුතුමයි. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගෝලීය වෙළෙඳ පොළේ තිබෙන ගෝලීය අගය දාමවලට - global value chainsවලට - අපි සම්බන්ධ වෙන්න ඕනෑ. අපේ ගමේ තිබෙන පලතුරු ටික, එළවලු ටික, ඒ වාගේම අපේ අනෙකුත් නිෂ්පාදන ඒවාත් එක්ක බද්ධ කරන්න ඕනෑ. අපි දන්නවා, රටක් විධියට අපට කාර් එකක් නිෂ්පාදනය කරන්න බැරි බව, අපට mobile phone එකක් නිෂ්පාදනය කරන්න බැරි බව. නමුත්, ඒ උපාංග නිර්මාණය කරන්න අපට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මේ අය වැයේ තිබෙන තුන්වැනි උපාය මාර්ගික pillar එක තමයි, ණය තිරසරභාවය සහතික කිරීම. ණය තිරසරභාවය සහතික කිරීම හරහා මේ මොහොත වන විට අපි විශේෂ ජයග්‍රහණ රාශියක් පැහැදිලිවම අත්පත් කරගෙන තිබෙනවා. මේ මොහොත වන විට රාජ්‍ය ණය කළමනාකරණය කරන්න වෙනම කාර්යාලයක් ස්ථාපිත කරලා, අපි ඒ හරහා ණය කළමනාකරණ කාර්යය සිදු කරනවා. ඒ වාගේම, මේ මොහොත වන විට ණය ශ්‍රේණිගත කිරීම්වලින් ලංකාව ඉහළට ඇවිත් තිබෙනවා. විශේෂයෙන්ම Fitch Ratings ආයතනය, Moody's ආයතනය, S&P ආයතනය වැනි අන්තර්ජාතික ආයතනවල දර්ශකවලින් අපි ඉහළට ඇවිත් තිබෙනවා. එහෙම නම්, මේකෙන් මොකක්ද කියන්නේ? ශ්‍රී ලංකාවේ ආයෝජනය පිළිබඳ විශ්වාසය තහවුරු කිරීම ගැනයි කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අය වැයේ තිබෙන ඊළඟ දැවැන්ත කනුව වන්නේ නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමයි. ශ්‍රී ලංකාවේ තිබෙන්නේ බහුල වශයෙන් ආනයන මත රඳා පවත්නා ආර්ථිකයක්. ඒ නිසා ගෝලීය අර්බුද හමුවේ දැඩි අවදානමක් අපට තිබෙනවා. එහෙම නම් මෙන්න මෙතැනින් මිදෙන්න නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ අය වැය තුළ ඉතා පැහැදිලිව දක්වා තිබෙනවා. ඒ හරහා අපි එම ආනයනය කරන භාණ්ඩවලට දේශීයව ආදේශක භාණ්ඩ නිර්මාණය කරනවා. ඒ විතරක් නොවෙයි. මේ රටේ දස අතේ විසිරිලා ඉන්න ව්‍යවසායකයන් සඳහා, ඒ වාගේම SMEs සඳහා අපි විශාල අනුබලයක් දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කිරීමත්, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීමත් හරහා අපි දැවැන්ත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සූදානම්. අන්න ඒ පිළිබඳ සාකච්ඡාව තමයි මේ අය වැය තුළ තිබෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලනවා, මේ පිළිබඳ බොරු, මිථ්‍යා මත පතුරන්නේ නැතිව ඉන්න කියලා. විශේෂයෙන්ම ලංකාවේ තිබෙන පව මුදා හරින නාළිකාවලට - ඉස්සර වෙලාම බොරු කියන; සියල්ලටම ඉහළින් බොරු කියන නාළිකාවලට, ඒ වාගේම නයි නටවන නාළිකාවට- අපි කියනවා, මේ රටේ මහ ජනතාවට සත්‍ය ප්‍රකාශ කරන්න කියලා. අපි ඔක්කොම එකතු වෙලා අපේ රට ආසියාවේ තිබෙන ප්‍රබලම රට විධියට නිර්මාණය කරමු. බොහොම ස්තුතියි, ඔබතුමාට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Anuradha Jayaratne. You have 14 minutes.

[අ.භා. 1.27]

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ අදහස් දැක්වීමට මට වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මෙහිදී මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මෙය, මේ ආණ්ඩුව අවුරුද්දක් අවසානයේ තමන්ගේ අය වැය ඉදිරිපත් කරන වෙලාව. මේ ආණ්ඩුවේ කාලය සහ ක්‍රියා කරපු ආකාරය අනුව ඔවුන් කොයි තරම් දුරට ප්‍රායෝගිකව මහ පොළොවේ කටයුතු කර තිබෙනවාද කියන එක බලන්න, ඒ ගැන නැවත පසු විපරමක් කරන්න මෙය හොඳ අවස්ථාවක් බව විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මොන විධියට කිව්වත්, මේ ආණ්ඩුවට තවත් අවුරුදු 4ක, 5ක කාලයක් තිබෙනවා කිව්වත්, පළමු අවුරුද්ද, දෙකතුන තුළ උපරිම වශයෙන් වැඩ කරයි. එතැනින් එහාට ඔය කියන වේගය ඔය විධියටම රඳා පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැහැ, ගරු අගමැතිතුමියනි. ඒක තමයි ඇත්ත; ඒක තමයි යථාර්ථය. ඒ නිසා මේ පළමු වර්ෂය කියන්නේ ඔබතුමියලාගේ රජයට උපරිම ආකාරයට වැඩ කරන්න පුළුවන් කාලයක්. හැබැයි, පසුගිය කාලයේ ගත්තු තීන්දු තීරණ මහ පොළොවේ කොච්චර දුරට ක්‍රියාත්මක වෙලාද නැද්ද, කින්ද මන්ද කියන එක බලන්න නියම අවස්ථාවක් තමයි, අලුත් අය වැය ඉදිරිපත් වන මේ වෙලාව.

මෙහිදී එක කාරණාවක් කියලා මම අය වැය ගැන කථා කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගරු ජනාධිපතිතුමා අය වැය කථාව අවසන් කරන අවස්ථාවේ පාතාලය පිළිබඳව, මත් ද්‍රව්‍ය පිළිබඳව කියද්දී කිව්වා, අඩුම ගණනේ ඒක මර්දනය කරන වැඩ පිළිවෙළටවත් විපක්ෂයේ සහයෝගය, ශක්තිය එකතු කරන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි සියලුදෙනා විපක්ෂය හැටියට එක අතක් නොවෙයි, අත් දෙකම එකතු කරලා ඒකට සහයෝගය දෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි ගැටලුවක් තිබෙනවා. සමහර කණ්ඩායම් අද සමාජගත කරන්න උත්සාහ කරන දෙයක් තමයි, මේ ආණ්ඩුව පත් වෙලා නොවැම්බර් මාසය වෙනකොට අවුරුද්දයි, හැබැයි, අවුරුද්දකට කලින් මේ රටට ගෙනාපු මත්ද්‍රව්‍ය තමයි දැන් අළෙවි කරන්නේ කියන එක. ඒක තමයි හදලා තිබෙන චිත්‍රය. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේරුම් ගන්න ඕනෑ යථාර්ථය මෙයයි. රජය ගැන, පොලිස්පතිතුමා ගැන, ත්‍රිවිධ හමුදාපතිවරුන් ගැන අපට ප්‍රශ්නයක් නැහැ. පොලිස්පතිතුමා පොඩි තැන ඉඳලා ආපු කෙනෙක්. අපි ඒකට ගෞරව කරනවා. ඒ පිළිබඳ ප්‍රශ්න තර්ක නැහැ. හැබැයි, තිබෙන පාලනයේ යම් කඩා වැටීමක ප්‍රතිඵලයක් හැටියට තමයි, මේ මත්ද්‍රව්‍ය ඇතුළු සියල්ල මේ විධියට රට තුළට ඇවිල්ලා අද ඒක බරපතළ ගැටලුවක් බවට පත් වෙලා, ජනාධිපතිවරයාට පවා හැම වේදිකාවකම, හැම තැනම කථා කරලා මේ විධියට විපක්ෂයේ සහයෝගය, ශක්තිය ඉල්ලන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි කියනවා, ඒ කාරණය මාධ්‍යයට පමණක් සීමා කර ගන්නේ නැතුව, වේදිකාවට පමණක් සීමා කර ගන්නේ නැතුව කටයුතු කරන්න කියලා. සමහර කාරණා පාර්ලිමේන්තුවේ හෝ එළියේ කියන්න ඕනෑ දේවල් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ තත්ත්වය පාලනය කරන්න කටයුතු කළ යුතු විධියක් තිබෙනවා. ඒක සරලව ඒ විධියට කළාට කමක් නැහැ. මිලියන 22ක් වෙච්ච මේ රටේ මිනිස්සු බේරා ගන්න ඕනෑ නම්, මාධ්‍ය සංදර්ශනවලට, වෙනත් ඒවාට සීමා නොවී ඒක නිවැරදි විධියට ක්‍රියාත්මක කරන්න ඕනෑ. අපි ඒකට අපේ අත් දෙකම ඔසවලා අපට දෙන්න පුළුවන් හැම සහයෝගයක්ම, ශක්තියක්ම ලබා දෙනවාය කියන එක විශේෂයෙන්ම මම සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ගත්තාම, මේ අය වැයේ කාරණා දෙකකට අපි විශේෂයෙන් සුබ පතනවා. ඒ පළමුවැනි කාරණාව තමයි මෙහිදී ලෝකයට පෙනෙන අය වැය; සරලව ගත්තොත්, අපේ external Budget එක. මේ external Budget එක හදලා තිබෙන්නේ ලෝක බැංකුවට, විදේශ ණය හිමියන්ට, IMF එකට පෙන්වන්න. ඒ වාගේම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට සියයට 2.3ක ඓතිහාසික ප්‍රාථමික අතිරික්තයක් ඇති කර ගත්තා කියලා කථා කළා. ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක විදෙස් සංචිත තිබෙනවා කියනවා. සියයට 4.8ක ආර්ථික වර්ධනයක් තිබෙනවා කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු කාරණා තුළ තිබෙන්නේ external Budget එකක්. ඒක ලෝකයට පෙනෙන්න හදන අය වැයක්. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකේ අනෙක් පැත්තත් අපි බැලිය යුතුව තිබෙනවා. ඒ තමයි, අපේ ආර්ථිකයට, ගෙදරට දැනෙන අය වැය කොතැනද තිබෙන්නේ කියන කාරණය. ඒ තමයි internal Budget එක. Internal Budget එක හරියටම බලන්න පුළුවන් විධිය තමයි, 2025දී අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අය වැය ලේඛනය එක්ක සසඳන එක. ඒ අය වැයේ සඳහන් කාරණා කොපමණ ප්‍රමාණයක් නිවැරැදිව ඉටු කර ගන්න පුළුවන් වුණාද, කොපමණ කාරණා මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන් වුණාද කියන කාරණාව අපි බලන්න ඕනෑ. අපි ලෝකයට පෙන්වන සංඛ්‍යාලේඛන හොඳ වුණාට, මේ කියන internal Budget එක, එහෙම නැත්නම් අපේ ගෙදර තිබෙන අය වැය හොඳද කියලා බලා ගන්න පුළුවන් වෙන්නේ ඒ සංසන්දනයත් එක්ක තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැම කෙනෙකුම කියපු එක් කාරණාවක් තමයි, ප්‍රාථමික අතිරික්තය සියයට 2.3 දක්වා වැඩිවීම කියන එක. හැබැයි, ඒක නරක අතිරික්තයක්. ඒක bad surplus එකක්. ඇයි bad surplus එකක් වෙන්නේ? ඒකට හේතුව තමයි, රටේ කරන්න තිබුණු වැඩ කොටස කරන්න බැරි වෙනවා නම්, රටේ සංවර්ධනයට යොදවන්න තිබුණු මුදල් ටික නැවත වතාවක් මහා භාණ්ඩාගාරයට යනවා නම්, ක්‍රියාත්මක කරන්න ඕනෑ මහා පරිමාණ ව්‍යාපෘති නතර වෙනවා නම් එසේ තිබියදී සියයට 2.3ක ප්‍රාථමික අතිරික්තයක් තිබෙනවා කියලා කවුරු හරි පෙන්වනවා නම් ඒක හරියන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ කාරණාව කියන්නේ වෙනත් වෛරී මතවාදයක් හැටියට නොවෙයි. අපේ ආණ්ඩුත් වැටුණු තැන් තමයි මේවා. මේ අපේ හැම අය වැයකදීම රුපියල් ට්‍රිලියන ගණන් කියනවා, ව්‍යාපෘති ගැන කියනවා. නමුත් අවසානයේ ඊළඟ දෙසැම්බර් මාසයට යනකොට එකම නිලධාරීන් පිරිසක් තමයි මේ වැඩේ කරන්නේ. හැබැයි, අද ඒ ඔළුගෙඩි ටික මාරු වෙලා, මහාචාර්යවරු, ආචාර්යවරු, විද්වත්තු, විෂයන් පිළිබඳ දන්නා බොහෝ අය ඉන්නවා. ඒක ඇත්ත. හැබැයි, අමතක කරන්න එපා, එකම නඩයක් තමයි මේ වැඩේ ගෙනියන්නේ කියන එක. ඒ ගෙනියපු වැඩේ කොච්චර සාර්ථක වෙලාද කියලා බැලීමේ අවශ්‍යතාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

තවත් එක් කාරණාවක් හැටියට ලෝක බැංකු වාර්තාවේ සඳහන් කරනවා පරිපාලන අකර්මණ්‍යතාව ගැන. ඇයි, මේ පරිපාලන අකර්මණ්‍යතාව ගැන කියන්නේ. සියලු මුදල් ජාතික අය වැය දෙපාර්තමේන්තුවට යනවා. එතැනින් අමාත්‍යාංශවලට වෙන් කරලා තිබෙන විධියට, අමාත්‍යාංශවලට ඒ මුදල් ලබා දෙනවා. හැබැයි මේ ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ තිබෙන මුදල් අමාත්‍යාංශවලින් කොයිතරම් දුරට හරියට වියදම් කළාද කියන එක බරපතළ ප්‍රශ්නයක්. අද වියදම් කරපු නැති සම්පූර්ණ මුදල විතරක් රුපියල් බිලියන 642ක් වෙනවා. 2025 අය වැය ලේඛනයේ අභ්‍යන්තරයට ගිහිල්ලා මේක බැලුවොත්, වැදගත් කියලා හිතන කාරණා කිහිපයක් මම එකින් එක ගන්නම්.

එකක් තමයි ග්‍රාමීය යටිතල පහසුකම්. ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2025 අය වැයෙන් රුපියල් මිලියන 4,000ක් වෙන් කළා, ග්‍රාමීය පාරවල් ටික, පාලම් ටික හදන්න. මේ පාර්ලිමේන්තුවේ ඉන්න රජය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට විශාල වගකීමක් තිබෙන බව මම දන්නවා. මෙතුමන්ලා ගම්වල

[ගරු නිතිඥ අනුරාධ ජයරත්න මහතා]

බලාගෙන ඉන්න ඇති, පාරවල් ටික හදන්න සල්ලි එනකල්. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු බලාගෙන ඉන්න ඇති, ගමේ පාර හදනකල්. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙන් කළ මුදලින් වියදම් කරලා තිබෙන්නේ කීයද? රුපියල් මිලියන 272යි. සියයට 93ක් නැවත මහා භාණ්ඩාගාරයට. වියදම් කරලා තිබෙන්නේ රුපියල් මිලියන 272යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිකමට මේ ගැන හිතන්න. ගම බලාගෙන ඉන්නවා, පාරවල් ටික හදනකල්. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ 159දෙනෙක් බලාගෙන ඉන්නවා, පාරවල් ටික හදන්න. හැබැයි, මෙතැනදී අත උස්සලා වියදම් කරන්න අනුමත කර ගත්ත මුදල එහෙම පිටින්ම ඉතුරු වෙලා තිබෙනවා, මහා භාණ්ඩාගාරයේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් පැත්තෙන් බලන්න නිෂ්පාදන ආර්ථිකය දිහා. අපේ චතුරංග අබේසිංහ ගරු ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා නිෂ්පාදන ආර්ථිකය පිළිබඳ දීර්ඝ වශයෙන් කථා කළා. අපේ මේ උපායමාර්ගික පිහිටීම උපයෝගි කර ගැනීම පිළිබඳ ලොකු පැහැදිලි කිරීමක් කරලා, කෙරවලපිටිය ජේගු පරීක්ෂණ අංගණය හදන්න රුපියල් මිලියන 500ක් වෙන් කළා. වෙයන්ගොඩ අභ්‍යන්තර බහලුම් අංගණයක් හදන්න රුපියල් මිලියන 500ක් වෙන් කළා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකේ ප්‍රගතිය සියයට බින්දුවයි. අද ඒකේ තිබෙන තත්ත්වය අනුව ඒ ලංසු කැඳවීමේ කමිටුව තවම නිර්දේශ ටික හදනවා. එතකොට හිතන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දින 365ක් ඉවරයි; මාස 12ක් ඉවරයි. දෙවෙනි අය වැයත් ගෙනාවා. ගිය සැරේ වෙන් ඒ තැනට කරපු රුපියල් මිලියන 500 ඒ විධියටම මහා භාණ්ඩාගාරයේ තිබෙනවා. හැබැයි, ප්‍රාථමික අතිරික්තය සියයට 2.3කින් වැඩි කළා කියලා මේ පාර්ලිමේන්තුවේ ඉන්න කණ්ඩායම් දෙක හැටියට අපි සතුටු වෙනවා. ඉතින් මේක හරියනවාද ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට වැදගත්ම කාරණාව තමයි, හැම වේදිකාවේම ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව කියන්නේ ඩිජිටල් ආර්ථිකය ගැන. ඒක ඉතාම හොඳයි. ඒක වෙන්න ඕනෑ වැඩක්. One-to-one ලෙස මේ තිබෙන contacts සියල්ල නැති වෙලා ඩිජිටල් ආර්ථිකයට යන්න ඕනෑ. ඒක තමයි අපේ future එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඩිජිටල් ආර්ථිකය ඩොලර් බිලියන 15 ඉක්මවන මට්ටමකට වර්ධනය කරනවා කිව්වා. එය ඩොලර් බිලියන 15 ඉක්මවන මට්ටමකට වර්ධනය කිරීමේ පළමුවෙනි කාරණාව තමයි, ඩිජිටල් හැඳුනුම්පත. හැබැයි, ඩිජිටල් හැඳුනුම්පත හදන්න සහ මේ සියලු කාරණා සඳහා ගිය අවුරුද්දේ වෙන් කළ මුදල රුපියල් මිලියන 183යි. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි ප්‍රගතිය සියයට 0.1යි. ඒ කියන්නේ, සියයට 99.9ක් නැවත මහා භාණ්ඩාගාරයට යනවා. විශාල වශයෙන් ගෙනාපු කාරණාවක්, රටේ සම්පූර්ණ ආර්ථිකය වෙනස් කරන්න ගෙනාපු කාරණාවක් තමයි ඩිජිටල් ආර්ථිකය කියන්නේ. ඒකට වෙන් කරපු මුදල රුපියල් මිලියන 183යි. ලංකාවේ අරමුණ ඩිජිටල් ආර්ථිකය හරහා ඩොලර් බිලියන 15ට ගෙනෙන එක. හැබැයි, රජයට වියදම් කර ගන්න බැරි වෙලා තිබෙනවා, ඒ මුදලින් සියයට 99.9ක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හාන්ස් විජේසූරිය මැතිතුමා මේකට ගත්තා. හොඳ ඔළු ගෙඩි ටිකක්, වැඩ කරන්න පුළුවන් මිනිස්සු ටිකක් එකතු කළා. අපි ඒ කාරණාවලට ගෞරව කරනවා. ඒ මිනිස්සු මේ තැන්වල ඉන්න ඕනෑ. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කියන්නේ අපට මේක වුණු නිසායි. මේවා කියනකොට හයියෙන් අත් දිදෙනකල් අත්පුඩි ගහනවා; ඉවර වෙනකල් අත්පුඩි ගහනවා; අරකට 500යි කිව්වාම අත්පුඩි ගහනවා, 1,000යි කිව්වාම අත්පුඩි ගහනවා. අන්තිමට ඊළඟ අවුරුද්දට අය වැය ගෙනෙනකොට වෙන් කළ මුදලින් වියදම් නොකර තිබෙනවා සියයට 99.9ක්. වියදම් කරලා නැහැ. ඉතින් කොහොමද ඩිජිටල් ආර්ථිකය ඉදිරියට යන්නේ? ඒකට යම් යම් වැඩමුළු කළා කියලා, යම් යම් launches කළා කියලා රටේ digital economy එකක් හැදෙන්නේ නැහැ. ඒ නිසා මේ මුදලට මොකක්ද වුණේ කියන එක බලන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, රජය ඉදිරිය පිළිබඳ, අනාගතය පිළිබඳ විශාල විශ්වාසයක් තැබූ කාරණාව තමයි, ඩිජිටල් ආර්ථිකය.

ඊළඟ කාරණාව මේකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජනය හා පාලනය වෙනුවෙන් ගෙනෙනවා කිව්වා ආයෝජන ආරක්ෂණ පනත. මේක 2025 අය වැය ඉදිරිපත් කරනකොටත් කිව්වා. හැබැයි, අදටත් මේ පනත ගෙනාවේ නැහැ. එක පැත්තකින් ජනාධිපතිතුමාට ගෞරව කරනවා. එතුමාගේ චුවමනාව පෙනෙනවා. ඩිජිටල් ආර්ථිකය පිළිබඳ එතුමාගේ චුවමනාව පෙනෙනවා. අනෙක් පැත්තෙන්, මේ කියන FDIs ටික මේ රට ඇතුළට ගෙනෙන්න ආයෝජන ආරක්ෂණ පනතේ තිබෙන වැදගත්කම නිසා එතුමාට ඒක ගෙනෙන්න ඕනෑකම තිබෙනවාය කියන එක පෙනෙනවා. ඒ නිසා එතුමා ලබන අවුරුද්දේ මුල භාගයේ හරි ඒක ගෙනෙනවා කියලා සඳහන් කළා. ඒක හොඳයි. හැබැයි, පසුගිය මාස 12 තුළ ආයෝජන ආරක්ෂණ පනත මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුගත් වසන්ත ද සිල්වා මැතිතුමා අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඒක ආණ්ඩුව ගත් හොඳ තීන්දුවක්. එවැනි නියෝජනයක් මේ පාර්ලිමේන්තුවෙන් ලබා දීම වෙනුවෙන් අපි ගෞරව කරනවා. ඒ පිළිබඳ තර්කයක් නැහැ. හැබැයි, ඒ කාරණාව මතක් කරන ගමන්ම කිව්වා, රෝද පුටු ටික හදන්න, රෝද පුටු දෙන්න, ඒ අයට ආධාර කරන්න, උපකරණ දෙන්න රුපියල් මිලියන 300ක් වෙන් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ රුපියල් මිලියන 300න් කීයද වියදම් කරලා තිබෙන්නේ? වියදම් කරලා තිබෙන්නේ සියයට බින්දුවයි. ඒ මුදල එහෙම පිටින්ම මහා භාණ්ඩාගාරයේ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිකමට හිතන්න, මේ විධියේ ගැලරියේ කතන්දරත් එක්ක රටක් හැටියට අපට ඉදිරියට යන්න පුළුවන් ද කියලා? මේක වෛරී කතන්දරයක් නොවෙයි. නිල් වෙන්න පුළුවන්, කොළ වෙන්න පුළුවන් අපි සියලුදෙනාට වෙච්ච දේ මේක තමයි.

2025 වර්ෂය වෙනුවෙන් වෙන් වූ මුදල්වලට මේ ආණ්ඩුවත් ඒකම තමයි මේ කාල වකවානුව තුළ කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා ටික සිදු වෙලා තිබෙන්නේ මේ විධියට නම්, රට ඉදිරියට ගෙන යෑම පිළිබඳව බරපතළ ගැටලුවක්, ප්‍රශ්නයක් තිබෙන බව විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ. හැබැයි, එතුමාගේ කථාවේදී කියපු කාරණයක් මම මතක් කරන්න ඕනෑ. එතුමා කිව්වා, SMEsවල ව්‍යවසායකයන්ට රුපියල් බිලියන 80ක් වෙන් කරනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි 2025 අවුරුද්දේ තරුණ ව්‍යවසායකයන්ට කියලා වෙන් කළ මුදල රුපියල් මිලියන 500යි. අපි ඒකේ ප්‍රගතිය බැලුවාම සියයට බින්දුවයි.

ඒ වාගේම, ගම්වල තරුණ ව්‍යවසායකයන් හදන්න යෝජනා කළා. වර්තමානයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් 159දෙනා ගිහින් වේදිකාවල කිව්වේ

නැද්ද, තරුණ ව්‍යවසායකයන් හදන එක පිළිබඳව? ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ බොහොම උජාරුවෙන් එම යෝජනාව පිළිබඳව කථා කළේ නැද්ද? ඔබතුමන්ලා එහෙම කථා කළ එක වැරදි බව නොවෙයි මම කියන්නේ. හැබැයි මතක තබා ගන්න, වෙන් කළ මුදලින් ඉටු කළ වැඩවල ප්‍රගතිය සියයට බින්දුවයි කියන එක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට, ධීවර කර්මාන්තය. මිරිදිය ඉස්සන් ඇති කිරීම සඳහා 2025 අය වැයෙන් රුපියල් මිලියන 200ක් වෙන් කර තිබුණා. එහි ප්‍රගතියත් සියයට බින්දුවයි. අනුරාධපුරයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා රුපියල් මිලියන 750ක් වෙන් කර තිබුණා. හැබැයි, ප්‍රගතිය සියයට බින්දුවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම් ඒ පරණ අය වැය යෝජනාවලට අදාළව කරපු කටයුතුවල ප්‍රතිඵල හොඳද කියලා බලලා තමයි අලුත් අය වැයකට එන්න ඕනෑ. ඒකයි මම මේ පරණ අය වැය කතන්දර ටික කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය කථාවේදී ජනාධිපතිතුමා නව ආයෝජන ආරක්ෂණ පනත් කෙටුම්පතක් පිළිබඳව කිව්වා. එය 2026 වසරේ මුල් භාගයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන බව කිව්වා. ඒක ඉතා හොඳ දෙයක්. එතුමා ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, මම කිව්වා වාගේ තරුණ ව්‍යවසායකයන් හැදීමේ යෝජනාවට රුපියල් මිලියන 500ක් වියදම් කර ගන්න බැරි වුණා. හැබැයි, මෙවර ඒ වෙනුවෙන් රුපියල් බිලියන 80ක් වෙන් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාවද මේ රවට්ටන්නේ? රුපියල් මිලියන 500ක් වියදම් කර ගන්න නොහැකි වුණු ආණ්ඩුවකට රුපියල් බිලියන 80ක් එකපාර වෙන් කරලා දින 365ක් තුළ ඒක වියදම් කර ගන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඒ සඳහා 2027අවුරුද්දට සැලැස්මක් තිබෙන්න ඕනෑ. අපි ඔක්කෝම වරද්දා ගත්ත තැන් මේවා. මේ ආණ්ඩුව කරන්නේත් ඒ වැරැද්දමයි. අඩු ගණනේ 2027 සැලැස්මට දැන් ඉඳලා ක්‍රියාත්මක වුණේ නැත්නම්, මේ අය වැය වෙනුවෙන් අත් තැළෙන කල්, අත් රිදෙන කල් මේසයට ගැහුවත් වැඩක් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, ඒක තමයි 2025 අය වැයේ ප්‍රගතිය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, IMF එකට පෙනෙන්න සියයට 2.3ක ප්‍රාථමික අතිරික්තයක් අපි පෙන්නුවා. ඒක හොඳයි. ඒකෙන් IMF එක සතුටු කරගෙන අපේ ඉදිරි ගමන යන්න ඕනෑ කියලා අපි හිතනවා. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ ආණ්ඩුවට ඔය කියන ජයග්‍රහණ ටික ලැබිලා තිබෙන්නේ කොහොමද? එකක්, රුපියල් බිලියන 642ක් අඩුවෙන් වියදම් කරලා. දෙවැනි එක, රුපියල් බිලියන 700ක් අලුතින් ආවා. වාහනවලට තිබුණු ඒ import restrictions ටික අයින් කරපු එකෙන් වාහන එකපාර රටට ආනයනය කරන්න පටන් ගත්තා. ඒකෙන් රුපියල් බිලියන 700ක ආදායමක් ලැබුණා. එතැන රුපියල් බිලියන 700යි, ඉතුරු කළ රුපියල් බිලියන 642යි එකතු කරලා ආණ්ඩුව ලොකු චිත්‍රයක් පෙන්වුවා. හැබැයි, ඇත්තම කතන්දරය හැටියට ගත්තොත් වාහනවලින් ලැබුණු ඒ ආදායම හැම අවුරුද්දේම ලැබෙනවාද? හැම අවුරුද්දේම ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අනෙක් පැත්තෙන් හරියට මුදල් වියදම් කළොත් ආණ්ඩුව නැවත චතාවක් හිර වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon Member, your time is up now.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සියලු කාරණා ටික ගැන බලලා, අපි වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම් මේ රට ඉදිරියට ගෙන යෑම පිළිබඳව ප්‍රශ්නයක් ඇති වන බව මා මතක් කරනවා.

ඊළඟට, SOEs - ඒ කියන්නේ, රාජ්‍ය ව්‍යවසාය - ගත්තොත්, ට්‍රිලියන 1.5ක් ආණ්ඩුව වියදම් කරලා තිබෙනවා. මා මෙය කියන්නේ Advocata ආයතනයේ තිබුණු research report එක අනුව. 2024දී විතරක් බිලියන 450ක් වෙන් කළා, ඒ ටික බේරා ගන්න. මේ විධියට ගියොත් මේක බරපතළ ප්‍රශ්නයකට, අර්බුදයකට යනවා. මම මේක කියන්නේ වෛරයෙන් නොවෙයි. එහෙම නැත්නම්, මෙම ආණ්ඩුව හෙට අනිද්දා වනකොට කඩා වැටෙයි, එතකොට ආණ්ඩුව මාරු වෙයි, වෙන කවුරු හෝ බලයට එයි කියන අදහසිනුත් නොවෙයි. ගරු අගමැතිතුමියනි, අපට වැරදුණු තැන් තිබෙනවා. ඔබතුමියලා අලුත් වැඩ පිළිවෙළවල් කොච්චර හැදුවත්, කොච්චර දේවල් අලුතින් තීන්දු කළත් එකම නිලධාරීන් පිරිසක් තමයි මේවා හසුරුවන්නේ. ඒ නිලධාරීන් පිරිස හරියට හසුරුවා ගත්තේ නැත්නම්, එම කණ්ඩායම හරියට පෙළ ගස්සවා ගත්තේ නැත්නම් මෙම ආණ්ඩුව කඩා වැටෙන එක නතර කර ගන්නත් කාටවත් පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට වැඩිය දීර්ඝව කථා කරන්නේ නැහැ. මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Prime Minister. You have 20 minutes.

[අ.භා. 1.42]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු ජනාධිපතිතුමා 2026 වසර සඳහා වූ අය වැය ඉදිරිපත් කරනකොට අපි පක්ෂ, විපක්ෂ කියන ඒ බෙදීම් රේඛාව පොඩ්ඩකට අත හැරලා ඒ කථාව අහගෙන හිටියා නම්, ඇත්තටම ඒ කථාව තුළත් ඉදිරිපත් වුණු අය වැය තුළත් අපි සියලුදෙනාටම දැක ගන්න, ඉගෙන ගන්න බොහෝ කරුණු කාරණා තිබුණු බව මට හිතෙනවා. ඒක පිටුපස ඇත්තටම කථාවක් තිබෙනවා. ඒ කරුණු, ඒ යෝජනා, ඒ සංඛ්‍යාලේඛන සියල්ල පිටුපස ඉතා වැදගත් කථාවක් තිබෙනවා. අපි සියලුදෙනාම ඒ කරුණු කාරණා සහ සංඛ්‍යාලේඛන පිටුපස තිබෙන ඒ කථාව හොඳින් තේරුම් ගන්න උත්සාහ ගනිමු කියලා මම යෝජනා කරනවා. සැලසුම්කරණය හරියට සිද්ධ වනකොට, ප්‍රතිපත්ති සහ නීති සම්පාදනය කිරීම විතරක් නොවෙයි, ප්‍රතිපත්ති සහ නීති හරියට ක්‍රියාත්මක වනකොට ඉලක්කසහගතව නායකත්වයක් දීලා, සැලසුම්සහගතව, ක්‍රමානුකූලව, මූල්‍ය විනයක් සහ දේශපාලන විනයක් ඇතිව ආණ්ඩුවක් පාලනය කරලා ප්‍රතිඵල ගන්නේ කොහොමද, රටක් දියුණු වෙන්නේ කොහොමද කියන කාරණා පිළිබඳ ඉතා හොඳ කථාවක් ඊයේ ඉදිරිපත් කළ එම අය වැය තුළත්, ඒ අය වැය තුළ ඉදිරිපත් වුණු

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කරුණු සහ සංඛ්‍යාලේඛන පිටුපසත් තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒක තමයි මේ වෙලාවේ වැදගත් වන්නේ. අපි දන්නවා, මෙය මේ ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය බව.

අපි අපේ පළමු අය වැය ඉදිරිපත් කළේ 2025 අප්‍රේල් මාසයේ සිට ඉදිරි කාල සීමාව සඳහා. රට තිබුණු තත්ත්වයත්, ජාත්‍යන්තරයත්, අපේ රටේ ජනතාවත් එදා ඒ අර්බුද මොහොත ගැන දක්වපු අදහස සහ ඒ අර්බුදයෙන් ගොඩ එන්න අපට මොන වාගේ කාලයක් යයිද කියන එක ගැන කඩා වැටුණු බලාපොරොත්තු තිබුණු මොහොතකයි මේ රජය බලයට පත් වුණේ. ඒ අවස්ථාවේ කඩා වැටුණු රටක් බාර ගත්ත අපේ ආණ්ඩුව, ඒ අප්‍රේල් මාසයේ සිට ඉදිරි කාල සීමාව සඳහා තමයි පළමුවෙනි අය වැය ඉදිරිපත් කළේ. ඇත්තටම ඊයේ ඉදිරිපත් වුණු සංඛ්‍යාලේඛන බොහොමයක් අප්‍රේල් සිට සැප්තැම්බර් මාසය දක්වා තිබුණු සංඛ්‍යාලේඛන තුළින් තමයි ඉදිරිපත් වුණේ. එම අය වැය මාස 9ක අය වැයක්. එම මාස නවයේත් සම්පූර්ණ වියදම අපට පෙන්නුම් කරන්න පුළුවන් වෙන්නේ දෙසැම්බර් 31ට. එහෙම බලනකොට අපි පසුගිය මාස 6 තුළ විශාල ප්‍රගතියක් අත් කරගෙන තිබෙනවා.

වියදම් කිරීමේ ප්‍රගතිය විතරක් නොවෙයි, මේ රට ස්ථාවර කිරීමේ සැලැස්ම තුළ මූල්‍ය විනයක් ඇතුව රට පාලනය කිරීමේ, ආණ්ඩුකරණයේ සාර්ථකභාවය තමයි ඊයේ ජනාධිපතිතුමා අපට පෙන්නුම් කළේ. අපි පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව එය අගය කළ යුතුයි කියලා මම හිතනවා. ඒක පිළිගෙන තමයි ඉදිරියට මේ පිළිබඳව කථා කරන්න අපට පුළුවන් වෙන්නේත්, තිබෙන අඩුපාඩු කථා කරලා පෙන්නුම් කර ගන්න පුළුවන් වෙන්නේත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොදුවේ ගත්තොත්, මේ වෙනකොටත් පසුගිය මාස 6ක කාලය තුළ සියයට 50කටත් වැඩි වියදමක් අපේ අය වැයේ පෙන්නුම් කරලා තිබෙනවා. මේ ඉදිරි මාස දෙක තුළ, දෙසැම්බර් 31වෙනි දා වෙනකොට ඒ වියදම ඊටත් වඩා වැඩි වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මොකද, බොහෝ වෙලාවට අපේ procurements ඇතුළු ඒ සියලු කරුණු කාරණා එක්ක ව්‍යාපෘති ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තේ සැප්තැම්බර්, ඔක්තෝබර් මාසවල. ගොඩක් වෙලාවට tenders ඉවර වෙලා ඒවා procure කරලා ඒ වැඩ කටයුතු ආරම්භ වුණේ ඔක්තෝබර් - නොවැම්බර්වල. ඒ කෝණයෙනුත් බලනවා නම්, අපට වඩාත් නිවැරදි පින්තූරයක් පසු ගිය 2025 අය වැය ගැන ලබා ගන්න පුළුවන් කියලා මම හිතනවා.

අපි මේ මට්ටමට මේ රට ගත්තේ කොහොමද? අද විපක්ෂයත් අපට කියනවා, භාණ්ඩාගාරය පිරී ඉතිරිලා ගිහින් කියලා. අපට 2.3 per cent primary surplus එකක් ගන්න පුළුවන් වුණා. හොඳද නරකද කියලා ඒක ගැන තර්ක විතර්ක කරන්න පුළුවන්. නමුත් ඒ target එක අපි exceed කරලා තිබෙනවා. මූල්‍ය විනයක් - fiscal discipline - අපි පවත්වාගෙන යනවා. මේ සියල්ලම සිද්ධ වුණේ අහම්බයක් හැටියට නොවෙයි. ඒවා අහඹු නොවෙයි. ඒවා විශාල කැපවීමක, දැක්මක් සහිත නායකත්වයක ප්‍රතිඵල. මම හිතන විධියට ඒක තමයි මේ වෙලාවේ අපි ඉගෙන ගත යුතු සහ අගය කළ යුතු පාඩම.

ඒ වාගේම අපට සතුටු වෙන්නට පුළුවන් කාරණයක් තිබෙනවා. ඔව්, එකම නිලධාරින් පිරිසක් තමයි ඉන්නේ. අපි රජය භාර ගත්තාට වෙන ආණ්ඩු වාගේ අපේ මිනිස්සුන්ගෙන් ආයතන පුරවා ගත්තේ නැහැ, සේවකයනස් එහාට මෙහාට මාරු කළේ නැහැ. සමහර වෙලාවට ඒකට අපට අපේ පාක්ෂිකයන්ගෙනුත් දොස් අහන්න වුණා. ඇයි මේ සිටින නිලධාරින් එක්කම වැඩ කරන්නේ කියලා අපේ පාක්ෂිකයන් දොස් කියපු අවස්ථා නැතිව නොවෙයි. නමුත් අපට යම් දෙයක් පෙන්වන්නට ඕනෑ වුණා. මම විශ්වාස කරනවා අපි ඒක පෙන්වා තිබෙනවා කියලා. හරි නායකත්වයක් තුළ, හරි දැක්මක් තුළ සැලසුම්සහගතව වැඩ කරගෙන යන්න මේ රාජ්‍ය සේවයේ ඉන්න එකම නිලධාරි කණ්ඩායමකට, එකම ඔළුගෙඩි ටිකකට වුණත් පුළුවන්කමක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. වෙනස් වෙන්න ඕනෑ තැන් තිබෙනවා. අපි මීට වඩා කාර්යක්ෂම වෙන්න ඕනෑද? ඔව්. මීට වඩා හොඳින් වැඩ කරන්න ඕනෑද, පුළුවන්ද? ඔව්. රාජ්‍ය සේවයට අපි විශාල වැටුප් වැඩිවීමක් දුන්නේත්, ලබන ජනවාරි සිට එහි දෙවෙනි වාරිකය දෙන්නේත්, රාජ්‍ය සේවයට ලැබිය යුතු අනෙකුත් වරප්‍රසාද, දීමනා වැඩි කරන්නේත්, ඒ සඳහා මේ අය වැය තුළත් මුදල් වෙන් කරලා තිබෙන්නේත් ඇයි? රාජ්‍ය සේවය කාර්යක්ෂමව, ජනතාවාදීව ඉදිරියට ගෙන යන්න අපට අවශ්‍යයි.

නිකම් හිතුණාට ඔහේ වැඩ කරගෙන යනවාට වඩා සැලසුම්සහගතව, ඉලක්කසහගතව වැඩ කරන රාජ්‍ය සේවයක් අපට අවශ්‍යයි. ඒක මේ වෙලාවේ සියයට 100කින් අපට අවශ්‍ය තැන තිබෙනවාද? නැහැ. මේක ක්‍රියාවලියක්. 2025 වසරේ ජනවාරිවලට වඩා අද වන විට - ඔක්තෝබර් මාසය වන විට - අපට දියුණුවක් පෙනෙනවා. අපට විශ්වාසයි, 2026 වසර වන විට ඊටත් වඩා වර්ධනයක්, ඊටත් වඩා දියුණුවක්, ඊටත් වඩා වෙනසක් අපට ඇති කර ගන්න පුළුවන් වෙයි කියලා. ඒකේ තීරණාත්මක සාධකය මොකක්ද? ඒ තීරණාත්මක සාධකය වන්නේ, නායකත්වය සහ සැලසුම්සහගත සංවර්ධන ක්‍රියාවලිය අපි පෞද්ගලික, පටු දේශපාලන අරමුණු වෙනුවෙන් පාවිච්චි කරනවා වෙනුවට රටට අවශ්‍ය දියුණුව ලබා ගැනීම සඳහා කණ්ඩායමක් හැටියට, සාමූහිකයක් හැටියට සැලසුම්සහගතව ගමනක් යන එක. ඒක මේ වෙලාවේ ආණ්ඩුව විතරක් නොවෙයි, රජයේ නිලධාරින් සහ ජනතාවත් තේරුම් ගනිමින් තිබෙන නිසා තමයි අපට මේ ප්‍රතිඵල පෙන්වන්න පුළුවන් වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ක්‍රියාවලියක්. මම හිතන විධියට වෙන ආණ්ඩු රට භාරගෙන පෙන්වූ වැඩ සහ අපේ ආණ්ඩුව කටයුතු කරන ආකාරය සරලව සංසන්දනය කළාට මේ වෙලා තිබෙන වෙනස, මේ වෙමින් පවතින පරිවර්තනය තේරුම් ගන්න බැහැ. අපි රට භාර ගත්තේ කොතැනින්ද කියන එක අමතක කරලා අපට මේක හරියට තේරුම් ගන්නත් බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අපි යන ගමන වෙනස්. ඒකත් අපි පැහැදිලිව කියන්න ඕනෑ. අපි කෙටි කාලීනව හෝ පෞද්ගලික න්‍යාය පත්‍රයක් මත, පෞද්ගලික අවශ්‍යතා මත හෝ අමාත්‍යාංශයෙන් අමාත්‍යාංශයට, එක එක ඇමතිවරයාගේ ego එක වර්ධනය කරගන්න හෝ පෞද්ගලික දේශපාලන අරමුණු එක්ක හෝ නොවෙයි වැඩ කරන්නේ. අපට සැලැස්මක් තිබෙනවා. ඒ සැලැස්ම කණ්ඩායම් හැඟීමක් සහිතව හදාගත් සැලැස්මක්, රට ගැන හිතා හදාගත් සැලැස්මක්. ඒ නිසා තමයි අපේ 159දෙනාම තේරුම් ගෙන ඉන්නේ අපට පැවරුණු වැඩ කොටසක්, අපට පැවරුණු වගකීමක් තිබෙන බව. අපි ඒ වගකීම ඉෂ්ට කළාම තමයි ඒ මුළු සැලැස්ම සාර්ථක වෙන්නේ කියන එක ගැන අපට කිසිම තර්කයක් නැහැ. ඒ අනුව තමයි අපි වැඩ කරගෙන යන්නේ. ඒ අනුව වසරින් වසරට තමයි අපි ප්‍රතිඵල පෙන්වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර වෙලාවට මට හිතෙනවා, අපට වඩා විපක්ෂයේ අය අපේ Manifesto එක පාඩම් කර තිබෙනවා කියලා. ඒ අය ඒකේ පිටු අංක සහ ඡේද පවා කටපාඩම් කරගෙන ඉන්නේ. මම නැවත වතාවක් ඉතාම ආදරයෙන් මතක් කරන්න කැමැතියි, ඒක අපේ අවුරුදු 5ක

සැලැස්මක් බව. ඇත්තටම ඒක අවුරුදු 5කටත් එහා යන සැලැස්මක්. මොකද, අපට මේ රට ගැන දීර්ඝ කාලීන දැක්මක් තිබෙනවා. අපි සියලු දේ පළමුවෙනි වසරේ කරනවා කියලා කොහේවත් පොරොන්දු වෙලා නැහැ. අපි ඒක ක්‍රියාත්මක කරන වේගයක් තිබෙනවා. රටේ තත්ත්වය හදමින්, කඩා වට්ටලා තිබුණු ආයතන, දූෂණය වෙලා තිබුණු ආයතන හදමින්, නීතියක් තිබුණේ නැති රටක් හදමින්, ඒ පැවැති තත්ත්වය තුළ නිර්මාණය වෙලා තිබුණු අතිශය භයංකාර සමාජ ගැටලු පවා විසඳමින් යන ගමනක්, මේක. එහෙම යන ගමනකදී පළමුවෙනි වසර තුළ අපි කරන වැඩ කොටසක් තිබෙනවා. ඒ වාගේම දෙවැනි වසර තුළ කරන වැඩ කොටසක් තිබෙනවා. ඒ විධියට තමයි අපේ සැලසුම් ක්‍රියාත්මක වෙන්නේ. විපක්ෂයට අපි කියන්න කැමැතියි, මේ අවුරුදු 5 අවසාන වුණාම තමයි අපේ report card එක ඔබතුමන්ලාට හරියටම කියවන්න පුළුවන් වන්නේ කියන කාරණය. එතකොට අපි ඒක මැතිවරණ වේදිකාවේ කථා කරලා බේරා ගනිමු. මොකද, අවුරුදු 5කින් මැතිවරණයක් එනවා. එතකොට අපේ report card එක ගැන කථා කරන්න වෙන්නේ ඔබට විතරක් නොවෙයි, ජනතාවටත් ඒ report card එකම යනවා. මම හිතන විධියට එතෙක් මේ ගැන ඕනෑවට වඩා කලබල වෙලා තර්කානුකූල නැති විධියට, ප්‍රයෝජනයක් නැති විධියට, අන්න පොරොන්දු කැඩුවා වාගේ දේවල් කියන එකෙන් ඇත්තටම ඵලක් නැහැ. ඒ නිසා අපට වෙන් වෙලා තිබෙන මේ කාලය තුළ ප්‍රයෝජනවත් විධියට අපට මේ විවාදය කරන්න පුළුවන් කියලා මා හිතනවා,

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ වරුවේත් කියැවුණා, ප්‍රජාතන්ත්‍රවාදය අනතුරේ කියලා, බහු පක්ෂ ක්‍රමය අනතුරේ කියලා. මම විපක්ෂයෙන් අහන්න කැමැතියි, ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට ලක් වෙලා තිබෙන්නේ කොතැනද කියලා.

මේ පාර්ලිමේන්තුවට තිබිය යුතු මූල්‍ය වගකීම පිළිබඳව සම්පූර්ණ විනිවිදභාවයෙන් යුතුවයි අපි ක්‍රියාත්මක වෙන්නේ. අපි නීතිය ක්‍රියාත්මක කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධීද? තරාතිරම බලන්නේ නැතිව නීතිය ක්‍රියාත්මක කිරීම ප්‍රජාතන්ත්‍ර විරෝධීද? මෙතැන තිබෙන ප්‍රශ්නය ඒකද? නැත්නම් කොතැනද ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට ලක් වෙලා තිබෙන්නේ? බහු පක්ෂ ක්‍රමය අනතුරේ ලු. පක්ෂ ගණනාවක් නියෝජනය කරන ඔබතුමන්ලා එක පක්ෂයක් හැටියට එකතු වුණාම බහු පක්ෂ ක්‍රමය අනතුරේ තමයි. එතකොට බහු පක්ෂ ක්‍රමයක් නැහැ තමයි. ඔබතුමන්ලා සියලුදෙනාම එකතුවෙලා එක පක්ෂයක් හැදිලා තිබෙනවා. එහෙම බැලුවාම බහු පක්ෂ ක්‍රමය ඇත්තටම අනතුරේ දමාගෙන තිබෙන්නේ විපක්ෂය. ඔබතුමන්ලාට පක්ෂය ආරක්ෂා කර ගන්න බැරි වීම නිසා ඒ පක්ෂ කඩාගෙන ගිහිල්ලා තිබෙනවා. ඊට පස්සේ දැන් එකතු වෙනවා. ඊට පස්සේ අතැනින් එකතු වෙනවා, මෙතැනින් එකතු වෙනවා. ඒ නිසා මේ රටේ තිබෙන බහු පක්ෂ ක්‍රමය ඇත්තටම විනාශ කරලා තිබෙන්නේ විපක්ෂයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද ඒගොල්ලන්ට බැරි වෙලා තිබෙනවා, තමන්ගේ පක්ෂ ආරක්ෂා කර ගන්න, තමන්ගේ පක්ෂ ගොඩනගා ගන්න. තමන්ගේ පක්ෂ තුළින් ජනතාවට දැනෙන විධියට, ජනතාව නියෝජනය කරන විධියට දේශපාලනයක් ගොඩනඟන්න අපොහොසත් වීම නිසා අද රටේ බහු පක්ෂ ක්‍රමයට අනතුරක් තිබෙනවා නම්, ඒ අනතුර එල්ල වෙලා තිබෙන්නේ විපක්ෂයෙන්. ආණ්ඩුවට එහෙම කරන්න කිසිම වුවමනාවක් නැහැ. ඒ වාගේම අපට ඒක කරන්න වෙලාවකුත් නැහැ. මොකද, අපි බලයට පත් වෙලා තිබෙන්නේ විපක්ෂය target කරගෙන නොවෙයි. අපි බලයට පත් වුණේ, මේ රටේ ජනතාව වෙනුවෙන්. මේ රට හදන එකත්, මේ රටේ ජනතාවගේ අවශ්‍යතා සම්පූර්ණ කරන එකත් තමයි අපි අරමුණු කරගෙන යන්නේ. ඒ ගමන යනකොට දේශපාලනය වෙනස් වෙනවා. ජනතාව දේශපාලනයෙන් බලාපොරොත්තු වන දේ වෙනස් වෙනවා. ඒක තමයි ඇත්තටම මෙතැන සිද්ධ වෙමින් තිබෙන ලොකුම පරිවර්තනය. මෙතැන දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඇතිවෙලා තිබෙනවා. ජනතාව නැවත වතාවක් ඒ පැරණි ක්‍රමයට යන්නේ නැහැ. ඔවුන් ඒක ප්‍රතික්ෂේප කරනවා. අන්න ඒ අලුත් වන දේශපාලන සංස්කෘතිය හරියට තේරුම් ගෙන ඔබේ පක්ෂත් ඒ වෙනස් වන දෙයට අනුගත නොවී අර පරණ ක්‍රමයේම එල්ලීගෙන ඉන්න තාක්කල් බහු පක්ෂ ක්‍රමය නම් අනතුරේ තමයි. ඒ නිසා බහු පක්ෂ ක්‍රමය ආරක්ෂා කරන්න ඔබතුමන්ලාටත් වගකීමක් තිබෙනවා කියලා මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙතැනදී විශේෂයෙන්ම මතක් කරන්න අවශ්‍යයි, මේ අය වැය තුළ අපි අත් හැරපු, නොසලකා හැරපු කිසිම ක්ෂේත්‍රයක්, කිසිම සමාජ කණ්ඩායමක් නැහැ කියන එක. ඉතාම පිළිවෙළට, එකින් එකට මේ රටේ තිබෙන ප්‍රශ්න හරියට හඳුනාගෙන, අවදානමක් සහිත, රැකවරණය අවශ්‍ය ජන කණ්ඩායම් හරියට හඳුනාගෙන, ඔවුන් වෙනුවෙන් කළ හැකි දේ සහ දීර්ඝ කාලීනව කළ යුතු දේ පෙළගස්වමින්, ඒ තැන්වල තිබෙන ව්‍යුහාත්මක ප්‍රශ්න විසඳීමට ගත යුතු ක්‍රියාමාර්ග ගැනත් සිතමින් වසරක් තුළ අපට කරන්න පුළුවන් දේ ඉතාම පැහැදිලිව, ඉතාම logicallyව සහ සැලසුම්සහගතව මේ අය වැය තුළින් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා මේ අය වැයෙන් කිසිම කරුණක් අත්හැර ගිහිල්ලා තිබෙනවා කියලා අපට කියන්න බැහැ. රට ස්ථාවර වුණාට පස්සේ ඊළඟ පියවර හැටියට රටේ වර්ධනය ලබා ගන්නේ කොහොමද, පිරී ඉතිරිලා ගිහිල්ලා තිබෙන භාණ්ඩාගාරයේ මුදල් හරියට කළමනාකරණය කරමින් ඒකේ ප්‍රතිලාභ ජනතාවට බෙදා දෙන්නේ කොහොමද, ඉදිරියට ගෙවන්න තිබෙන ණය ගෙවන්න සැලසුම් කර ගන්නේ කොහොමද, මෙවැනි ආර්ථික අර්බුද නැවත එන එක වළක්වන්නේ කොහොමද කියන මේ සියල්ල ගැන හිතලා මේ වසරේදීත් අපි 2026 වසරට අදාළ අපේ සැලැස්ම ඉදිරිපත් කරලා තිබෙනවා.

මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, ඒ තුළ රාජ්‍ය සේවයට, රාජ්‍ය නිලධාරින්ට, රාජ්‍ය තන්ත්‍රයට අපි දීලා තිබෙන අවධානය පිළිබඳව. වැටුප් වැඩි කිරීම පමණක් නොවෙයි, ඔවුන්ගේ වැඩ පහසු කිරීම සඳහා කාර්යාලවලට අවශ්‍ය උපකරණ නොමැතිකම, කාර්යාලවලට අවශ්‍ය වාහන නොමැතිකම වාගේ දීර්ඝ කාලයක් තිස්සේ තිබුණු දැවෙන ප්‍රශ්න ගණනාවකට කෙටි කාලීනව අපි පිළිතුරු ලබා දීලා තිබෙනවා. ඒ වාගේම කාලයක් තිස්සේ නිර්මාණය වෙච්ච, වැටුප් විෂමතා වෙනුවෙන් වැටුප් කොමිසමක් - Wage Commission - පත් කරලා රාජ්‍ය සේවය, කාර්යක්ෂම රාජ්‍ය සේවයක්, රටට ප්‍රයෝජනවත් වන රාජ්‍ය සේවයක් දක්වා ගෙන යන්න අවශ්‍ය විශාල ආයෝජනයක් ගිය අය වැය තුළිනුත් අපි ඉදිරිපත් කර තිබුණා. ඒ වාගේම මේ අය වැය තුළිනුත් අපි එය ඉදිරිපත් කර තිබෙනවා.

රැකියා 75,000ක් දැනටමත් අනුමත වෙලා තිබෙනවා. ඒ කියන්නේ, බඳවා ගැනීම් විශාල ප්‍රමාණයක් කරන්න නියමිතයි. අපි ඒ පුරප්පාඩුවලට නිකම්ම බඳවා ගන්නේත් නැහැ. ඒවා නිකම් packages හැටියට නොවෙයි දෙන්නේ. අවශ්‍ය තැන පුරප්පාඩු පිරවීම සඳහා සහ ඔවුන්ගේ හැකියාවට ගරුත්වයක් දෙන්න පුළුවන් විධියට රාජ්‍ය සේවය තුළ අපි රැකියා අවස්ථා හදලා තිබෙනවා. ඉතින්, එහෙම තමයි ගෞරවාන්විත, ජනතාවට වැඩ කරන්න පුළුවන් රාජ්‍ය සේවයක් නිර්මාණය කරන්න අපි ආයෝජනය කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ රටේ රාජ්‍ය නිලධාරින් සියලුදෙනාගෙන් ඉල්ලීමක් කරනවා. අපි යන මේ ගමනේ කොටස්කරුවන් තමයි ඔබ. ඔබේ වගකීම් හරියට ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය පසුබිම හදන්නත්, ඔබට අවශ්‍ය ගෞරවය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

හඳුන්නත්, ඔබට ස්වාධීනව තීරණ ගැනීමට අවශ්‍ය ඒ සංස්කෘතිය රජයේ ආයතන තුළ හඳුන්නත් අපි විශාල උත්සාහයක් ගන්නවා. එම නිසා ඒ වෙනසේ කොටස්කරුවන් බවට පත් වෙන්න කියලා මම ඔබට නැවත වතාවක් අවධාරණය කරන්න කැමැතියි. අපේ අමාත්‍යාංශවල වැය ශීර්ෂ සම්බන්ධයෙන් සාකච්ඡා කරනකොට තවදුරටත් ඒ පිළිබඳව විස්තර කරන්න පුළුවන්.

අධ්‍යාපන අමාත්‍යවරිය හැටියට මම මතක් කරන්නම ඕනෑ, ලබන අවුරුද්දේ සිට ක්‍රියාත්මක වෙන්න තිබෙන ප්‍රතිසංස්කරණ සඳහා අපි අධ්‍යාපනයට මේ අවුරුද්දේ වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය ගැන. පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය දක්වා අපි සැලසුම් සකස් කරගෙන ඒවාට අවශ්‍ය මුදල් වෙන් කරගෙන තිබෙනවා. ඒ වාගේම පාසල්වල ඉන්න මානව සම්පත වන ගුරුවරුන්, විදුහල්පතිවරුන් කාලයක් තිස්සේ බලාපොරොත්තු වුණු දීමනාවක් -අන් කවර ක්ෂේත්‍රයකටවත් නොදුන් අවස්ථාවක්- ඔවුන්ට ලබා දීලා තිබෙන්නේ අධ්‍යාපනයේ වැදගත්කම අපි තේරුම් ගත්ත නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට, අපි අවුරුද්දක් තුළ විශාල ප්‍රගතියක් පෙන්වා තිබෙනවා. භාණ්ඩාගාරය පිරී ඉතිරී ගියා කියලා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරන්න පුළුවන් තැනකට අවුරුද්දකින් හර්ෂ ද සිල්වා ගෙනෙන්න පුළුවන් වුණා කියන්නේ ඒක අපි ලැබූ විශාල ජයග්‍රහණයක්. විපක්ෂය බලයට ආවා නම් එතුමා ආර්ථික කටයුතු පිළිබඳ ඇමතිවරයා ලෙස පත් වෙන්න හිටපු කෙනා නේ. එතුමා විශේෂඥයා නේ. එතුමාට ඒ කාරණය පිළිගන්න සිද්ධ වෙන එකම මම හිතන විධියට මේ සිදු වෙලා තිබෙන වෙනසේ ලොකු indicator එකක්. මම ඒ කිව්වේ පුද්ගලයෙක් ගැන නේ. පුද්ගලයා අපි පැත්තකින් තියමු. සංඛ්‍යාලේඛන, කරුණු ගත්තත් අපි නිවැරදි පාරේ ගමන් කරනවා කියන එක ගැන කිසිම සැකයක් නැහැ. ඒ ගමන තමයි අපි යන්නේ. එම නිසා කලබල වෙන්න ඕනෑ නැහැ. ගරු මන්ත්‍රීවරුනි, මේ අවුරුදු 5 අවසානයේදී අපේ report card එක අපි බලමු. එතකොට ඔබතුමන්ලාට විතරක් නොවෙයි, මේ රටේ ජනතාවටත් ඒකට ලකුණු දෙන්න අවස්ථාවක් එනවා. මට නම් විශ්වාසයි, අපි ඒක ඉහළින්ම පාස් වෙනවා කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Prof.) Ruwan Ranasinghe. You have 12 minutes.

[2.03 p.m.]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

Hon. Deputy Speaker, I am grateful for the opportunity to speak on the 80th Budget of the independent Sri Lanka.

In fact, this is the first time our Government introduced a full-scale Budget for a year. It was just for a nine-month period that we brought in the Appropriation Bill for this year. It was really challenging to put the economy destroyed in every aspect back on its correct path. We have enough global examples to show that it had taken years or decades to put bankrupt economies back on track. But, our Government, with the correct measures we took, particularly with financial discipline that has been excercised, has been able to bring in or establish macroeconomic stability within an year. This time, we need to focus our attention on continuing this macroeconomic stability for decades to come and maintain a stable economic growth of around 5 to 7 per cent so that we can reach the expected development goals in the coming decades. So, that is the key focus and the strategic objective of our Budget.

We can see what has happened to the other economies in the region. As I mentioned, this is the 80th Budget of the post-independent Sri Lanka. Yet, in the past few years, our economy resulted in bankruptcy. But, if you take India, with digitalization, high-tech agriculture, industrialization, pharmaceuticals, energy and so on and so forth, they have acquired substantial economic development during their post-independent period.

The Hon. (Dr.) Harsha de Silva was talking about the Government's political philosophy, economic ideology and said that he is in a dilemma. Well, from time to time, due to measures introduced by different governments led by your masters or representatives over 77 years resulted in the country going bankrupt. So, the country that we took over was in chaos, full of mismanagement, corruption and with issues of economic discrimination rampant. We need to pull the country from that chaos and steer it in the right direction, and we are focusing on that. In fact, the Hon. President, yesterday, proposed the way forward, which we will work on in the coming years to put this destroyed economy back on the right track.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, නිදහසින් පසු අපේ රටේ 80වන අය වැයත් ඊයේ ඉදිරිපත් කළ බව. නමුත්, වසර ගණනාවක් අපේ රටේ අය වැය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, සංවර්ධන වැඩසටහන් කළත් අපට ඉතුරු වුණේ බංකොලොත් වෙච්ච රටක්. අන්න ඒ රට ස්ථාවර ආර්ථිකයක් තුළින් ඉදිරියට මෙහෙයවන අපේ රජයේ සැලැස්ම තමයි ගරු ජනාධිපතිතුමා ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. විශේෂයෙන්ම අපි මේ අය වැයෙන් අවධානය යොමු කරනවා, ප්‍රධාන වශයෙන් උපාය මාර්ගික දිශානති හයකට. ඒ ඔස්සේ මේ ආර්ථික ස්ථාවරත්වය ඉදිරියට මෙහෙයවන්න තමයි අපි මේ අය වැය ඉදිරිපත් කරන්නේ.

පළමුවන උපාය මාර්ගික අරමුණ තමයි, තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් ඇති කිරීම. අපි දන්නවා, මේ ආර්ථිකයේ වාසි සැලසුණේ විවිධ කණ්ඩායම්වලට බව. ව්‍යාපාර කළේ cartels. ඒගොල්ලන්ට අවශ්‍ය පහසුකම් සලසන්න අණපනත් හදන්න තමයි මේ පාර්ලිමේන්තුව පාවිච්චි කළේ. අපි ඒක සම්පූර්ණයෙන් වෙනස් කරලා, මේ ආර්ථික liberalization එක ගෙනැල්ලා, මේ රටේ සාමාන්‍ය මිනිස්සු හැමෝටම ආර්ථිකයේ ප්‍රතිලාභ ගලා යන දිශාවට මේ ආර්ථිකය මෙහෙයවන්න අවශ්‍ය වැඩසටහන මේ අය වැය තුළින් ඉදිරිපත් කරලා තිබෙනවා.

දෙවන අරමුණ තමයි, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක් ලබා ගැනීම. අපි දන්නවා, නිදහසින් පසුව අද 80වන

අය වැය ගැන කථා කරනකොටත් අපේ අපනයන වෙළෙඳ පොළ තේ, පොල්, රබර් සහ ඇඟලුම්වලට සීමා වෙලා තිබෙන බව. හැබැයි, ආර්ථිකය, නිෂ්පාදනය, පාරිභෝජනය, තාක්ෂණය මේ ලෝකයේ විශාල වශයෙන් වෙනස් වෙලා තිබෙනවා. අපේ රටේ පසුගිය දශකවල හිටපු පාලකයන්ට බැරි වෙලා තිබෙනවා, අන්න ඒ ආර්ථිකයට ගැළපෙන නිෂ්පාදන ආර්ථිකයක් අපේ රටේ හදන්නට. ඒ නිසා අපනයන වෙළෙඳ පොළ විවිධාංගීකරණය කරන්න අවශ්‍ය සැලසුම්, යෝජනා අපි මේ අය වැයේ ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන් අපට මතකයි, liquid fertilizer issue එක ආපු වෙලාවේ ඒ පර්යේෂණය කළේ අපේ රටේ බව. ඒ නව සොයා ගැනීම කළේ අපේ රටේ. හැබැයි, ඒ ප්‍රතිඵලය අපි අපේ අල්ලපු රටට විකුණනවා. ඒවා ඒ රටේ නිෂ්පාදනය කරනවා. ඊට පස්සේ ඒ නිෂ්පාදනය අපි ආනයනය කරනවා. ඒකේත් ගසා කෑම්, හොරා කෑම් තමයි තිබුණේ. ඉතින්, අන්න ඒ කරුණු වෙනුවෙනුත් අපි මේ අය වැය තුළින් අවධානය යොමු කරලා තිබෙනවා. විශේෂයෙන්ම පර්යේෂණ සහ නව නිෂ්පාදන වාණිජකරණය - commercialization - හරහා අපනයන වෙළෙඳ පොළට ඒවා යොමු කරන්න අවශ්‍ය අවධානය අපි මේ අය වැය තුළින් යොමු කරලා තිබෙනවා.

තුන්වන අරමුණ තමයි, ණය තිරසරභාවය සහතික කිරීම. අපි සාර්ථක වෙලා තිබෙනවා, ණය තිරසර කර ගන්නට. විශේෂයෙන් ණය බරින් මිරිකුණු රටක් තමයි අපට හම්බ වුණේ. 2022 අවුරුද්ද ගත්තොත්, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 104ක් ණය. ඒක සියයට 97ට අඩු කරන්න අපට මේ අවුරුද්දේ පුළුවන් වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී මේක තවත් අඩු කරමින් මේ ආර්ථිකය කළමනාකරණය කරන්නට.

හතරවන අරමුණ තමයි, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම. ඒ සඳහා විශාල වශයෙන් යෝජනා අපි මේ අය වැයේ ඉදිරිපත් කරලා තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකයකට යන්න නම් අපි නව නිෂ්පාදනවලට යා යුතුයි. මම දැක්කා, උතුරු පළාතේ මන්ත්‍රීවරයෙක් කියනවා, විවිධ companiesවලට ඉඩම් ලබා දෙනවා කියලා. ඔය කෑ ගහන මන්ත්‍රීවරුන්ටත් අක්කර සිය ගණන් තිබෙනවා, ඒගොල්ලන්ගේ ඥාතීන්ගේ නම්වලට ඉඩම්වල ඔප්පු හදාගෙන. හැබැයි, ඒවායේ ඵලදායී කටයුත්තක් වෙන්නේ නැහැ. නමුත් නිෂ්පාදන සඳහා, අලුත් ආයෝජකයන්ට අපි ඉඩම් ලබා දිය යුතුයි. ඒ හරහා තමයි අපට එළවලු, පලතුරු හෝ මොනවා හෝ අලුත් නිෂ්පාදන හරහා නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතුව පසුගිය කාලයේ වාගේ දේශපාලකයෝ එකතු වෙලා ඉඩම්වලට ඔප්පු හදාගෙන ඒවා කොටස් කරලා විකුණන එක නොවෙයි පාලකයෝ විධියට අපට තිබෙන වගකීම වන්නේ. ආයෝජකයෝ කැඳවලා ඒ අයට නිෂ්පාදනවලට අවශ්‍ය පහසුකම් සලසා දීමට තමයි අපි මේ අය වැයෙන් අවධානය යොමු කරන්නේ.

පස්වන අරමුණ තමයි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම. මේකත් මේ අය වැයේ අපි අවධානය යොමු කරන අපේ ප්‍රධානම උපාය මාර්ගික අරමුණක්. විශේෂයෙන් අපි දන්නවා, දශක ගණනාවක් නිසි ආර්ථික කළමනාකරණයක් නැතුව අපේ පුරවැසියෝ විශාල ප්‍රමාණයක් තවම දිළිඳුකමේ ඉන්න බව. ඒ අය දිළිඳුකමින් මුදාගෙන, ඒ අයටත් මේ ආර්ථිකයෙන් ප්‍රතිලාභ දෙන්නට අපි යම් යම් වැඩ පිළිවෙළ, වැඩසටහන් මේ අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා.

හයවන අරමුණ තමයි, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය කිරීම. මං මුලිනුත් සඳහන් කළා වාගේ මේ කලාපයේ රටවල් ගත්තොත්, අපට වඩා විශාල ලෙස ඒගොල්ලන් ඩිජිටල්කරණයෙන් ඉදිරියට ගිහින් තිබෙනවා. අපේ රටේ විශාල වශයෙන් අපි කථා කරනවා, දූෂණය - corruption, වංචාව, නාස්තිය සහ අකාර්යක්ෂමතාව ගැන. මෙවැනි දේවල් ඇති වෙන්න හේතුව තමයි, අපට මේ ගොඩක් කටයුතු digitalize කර ගන්න බැරි වෙලා තිබීම. ඒ නිසා තමයි වෙන රටක airport එකකට ගියාම ඉතාම කාර්යක්ෂමව කර ගන්න පුළුවන් දේවල් පවා අපේ රටේ කර ගන්න බැරි. දැන් ඒ වෙනුවෙන් අපි වෙනම අමාත්‍යාංශයක් ඇති කරලා තිබෙනවා, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය නමින්. අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි වසර කිහිපය තුළ ඩිජිටල් ආර්ථිකය ඩොලර් බිලියන 15ක මට්ටමට ඉහළට ගේන්න. ඒකත් අපි විශේෂයෙන් අවධානය යොමු කරලා තිබෙන අපේ strategic direction එකක්.

ඊළඟට මම තව කරුණු කිහිපයකට අවධානය යොමු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ රටේ රාජ්‍ය සේවය ගත්තාම, ඒකත් දේශපාලනීකරණය කරලා තමන්ගේ දේශපාලන ව්‍යාපෘති, තමන්ගේ ඡන්ද campaign කරන්න පාවිච්චි කරලා තිබුණේ. මම ඊයේත් දැක්කා, විපක්ෂ නායකතුමා කණ්ඩායමක් කැඳවලා, එතැන බැහැලා, selfie ගහලා ලොකු නාට්‍යයක් පෙන්නුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශ්වවිද්‍යාලවල උගන්වනකොට අපේ ළමයින්ට කියපු කාරණයක් තිබෙනවා. අවුරුදු 16ක් පූර්ණ කාලීන අධ්‍යාපනය දීලා, මහජන ධනයෙන් උගන්වලා උපාධියකුත් දීලා තිබියදී ඒගොල්ලන් Lipton Circus එකට ඇවිල්ලා "රස්සාවක් දියව්" කියලා කියනවා නම්, මම හිතන්නේ ඒක අපරාධයක්. ඒක එහෙම වෙන්න ඕනෑ නැහැ. හැබැයි, ඒ ගොල්ලන් එකතු කරගෙන, මොනවා හරි scheme එකක් හදලා, "අපි මෙච්චර ගණනකට රස්සා දෙන්නම්" කියලා ඒක දේශපාලන ව්‍යාපෘතියක් කර ගන්නවා නම් ඒක සුදුසු නැහැ.

අන්න එහෙම කරලා තමයි මේ රාජ්‍ය සේවය විනාශ කළේ. ඒ නිසා තමයි මේවා අකාර්යක්ෂම වෙලා තිබෙන්නේ. අපේ රාජ්‍ය සේවයේ සුදුසු අය නැහැ. ඉස්සෙල්ලාත් මේ කාරණය සඳහන් කළා. යම් වැඩක් කරගන්න ගියොත්, පාරකට සැලසුමක් හදාගන්න ගියොත් අපට අවශ්‍ය නිලධාරින් නැහැ, technical officersලා නැහැ. ඇයි? ඒවා පුරවලා. දේශපාලඥයන් තමන්ගේ ගමේ අය ඒවාට දාලා. අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තොත්, කුලියාපිටියේ අය තමයි රට පුරා ඉන්නේ. කෘෂිකර්ම ක්ෂේත්‍රය ගත්තොත් නාවලපිටියේ අය රට පුරා ඉන්නේ. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, බදුල්ලේ අය ඉන්නේ. මට කියන්න පුළුවන් එහෙම පුරවපු ආයතන ඕනෑතරම්. හැබැයි රාජ්‍ය සේවය කාර්යක්ෂම වෙලා නැහැ. රජය එහෙම රස්සා දෙන තැනක් නොවෙයි. ජනාධිපතිතුමා කිව්වා,"අපි රාජ්‍ය සේවයට 75,000ක් බඳවා ගන්න කටයුතු කරලා තිබෙනවා. ඒ සඳහා අරමුදල් වෙන් කරලා තිබෙනවා. බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියක් තිබෙනවා. ඒ හරහා සුදුස්සන්ට රැකියා ලැබෙයි" කියලා. ඒක තමයි ප්‍රතිපත්තිය.

ඊළඟට අපි විශ්‍රාම වැටුප් ගනිමු. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා උදේ සඳහන් කළා, ජනාධිපතිතුමා Parliament එක mislead කළා කියලා. 2016 ජනවාරි 01වැනි දා ඉඳලා දුන්න රජයේ රැකියාවලට ඒ වාගේ condition එකක් දාලා තිබුණා. ඒ තමයි,"දායකත්ව විශ්‍රාම වැටුපකට හිමිකම් කියනු ලැබේ" කියලා. ඒ කියන්නේ රජයේ සාමාන්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමය ඒ ගොල්ලන්ට නැහැ. හැබැයි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සඳහන් කරපු නැති එක තමයි, අන්න ඒ period එකේ ඒ ගොල්ලන්ගේ දායක මුදල්, ඒ බඳවා ගත්තු පිරිස්වල දායක මුදල් අය කරගෙන නැහැ කියන එක. ඉතින් කොහොමද ඒ ගොල්ලන් දායකත්ව විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නේ? ඒ නිසා අන්න ඒ අය වෙනුවෙන් මේ අය වැය හරහා අපේ රජයෙන් යෝජනා කළා, ඒ අයත් රජයේ සාමාන්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමයට අන්තර්ග්‍රහණය කරන්න කියලා. ඒක වැරදිද? රජයේ සේවකයන්ට විශ්‍රාම වැටුපක් දෙන එක වැරදිද? ඒකට විරුද්ධයි ද මේ විපක්ෂය?

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

ඊළඟට airport එක ගැන කියනකොට විශේෂයෙන් සංචාරක කර්මාන්තය ගැන මම සඳහනක් කරන්න අවශ්‍යයි. මේ දවස්වල අපට තිබෙන අභියෝගය මේකයි. මේ winter season එක. අපට Airport එකට එන ඉල්ලීම් සපුරන්න බැහැ. අපි අඩුම ගණනේ සතියකට flights 10ක්වත් cancel කරනවා. එහෙම නැත්නම් අපට requests turn down කරන්න වෙලා තිබෙනවා, airport එකේ flights land කරන්න time schedules දෙන්න බැරුව. අපි දන්න්වා, Terminal - 2 එක develop වුණේ නැත්තේ ඇයි කියලා. දැන් Terminal - 3 එකට යන්න කාලය ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි ඒවා එහෙම ඉස්සරහට ගියේ නැහැ. එහෙම ගියේ නැත්තේ ඒවාට දේශපාලන මැදිහත්වීම් තිබුණු නිසා. ඒ ගොල්ලන්ගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න ගියා ඒවා අස්සේ.

විශේෂයෙන් ගත්තොත් අපි දන්නවා Sri Lankan Airlines අපේ ආර්ථිකයට විශාල බරක් වෙලා තිබෙනවා කියලා. එහි ඩොලර් මිලියන 200කට අධික ණය බරක් තිබෙනවා. ඒක ප්‍රතිව්‍යුහගත කරන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම අපි සංචාරක කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් මේ අය වැයෙන් විශාල ආයෝජන ප්‍රමාණයක් සිදු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ හරහා දැවැන්ත සංචාරක ආර්ථිකයක් ගොඩනඟන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම අපි දන්නවා, ඉතාම ඉහළ වියදමක් දරන සංචාරකයෝ ආවොත්, ඒගොල්ලන් පැය ගණනක් ගතවන අපේ රටේ ප්‍රවාහන මාධ්‍යය පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ කියලා. ඒ ගොල්ලන්ට ගුවන් යානා එහෙම නැත්නම් domestic airlines අවශ්‍යයි. මේ කාර්යයට අපි මේ අය වැයෙන් අවධානය යොමු කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විපක්ෂ නායකතුමා ඊයේ කියනවා මම දැක්කා, මේ අය වැය මහ පොළොවේ ඉඳලා නොවෙයි හදලා තිබෙන්නේ කියලා. ඊළඟ අය වැය අපට හදන්න වෙන්නේ සියඹලා ගහක් යට බංකුවක් තියලා ඉඳගෙන. එතකොට හරි. මම අර මුලින් සඳහන් කළා වාගේ මේ විනාශ කරපු ආර්ථිකය අපි වසරක් තුළ ස්ථාවර කරන්න සමත් වුණා. අන්න ඒ ස්ථාවරත්වය අඛණ්ඩව තව දශක ගණනාවක් ඉදිරියට මෙහෙයවන, නිෂ්පාදන ආර්ථිකයට අඩිතාලම දමන අය වැය තමයි ගරු ජනාධිපතිතුමා විසින් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අන්න ඒ හරහා අපි මේ රට, ඔබ බංකොලොත් කරපු රට සංවර්ධනය කරා මෙහෙයවන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Nishantha Jayaweera. You have 12 minutes.

[අ.භා. 2.17]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය ඉදිරිපත් කරපු දෙවැනි අය වැය විවාදයට ගන්නා මේ අවස්ථාවේදී මේ ආර්ථිකය මේ වනකොට වඩාත් ස්ථාවර තත්ත්වයට පත් කරලා තිබෙනවා කියලා විපක්ෂය පැත්තෙන් අහන්න ලැබීමත් ඉතාම සතුටට කාරණයක්. මම මුලින්ම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්, පසුගිය වසර කිහිපයේදී අය වැය මොන විධියට ඉදිරිපත් කළත් ආර්ථිකය මොන ආකාරයටද හැසිරුණේ කියන කරුණු.

2019 අවුරුද්ද ගත්තොත්, 2019දී අය වැය හිඟය විධියට පාර්ලිමේන්තුවේ සම්මත වෙලා තිබෙන්නේ රුපියල් බිලියන 685ක්. නමුත්, රජයේ නිවැරදි කළමනාකාරිත්වයක් නොතිබීම නිසා ඒ රුපියල් බිලියන 685 කළමනාකරණය කර ගන්න බැරි වෙලා සත්‍ය අය වැය හිඟය රුපියල් බිලියන 1,439ක් දක්වා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9ක් දක්වා ඉහළ යනවා. ඒ වාගේම 2020 අවුරුද්දේ ඇස්තමේන්තු කර තිබෙනවා, ට්‍රිලියන 1.2ක්. නමුත්, සත්‍ය වියදම අනුව අය වැය හිඟය ට්‍රිලියන 1.6ක් දක්වා ඉහළ යනවා. එතකොට 2020 වර්ෂයේදී මුළු අය වැය හිඟය දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 10.7ක් දක්වා ඉහළ යනවා. 2021 වර්ෂය ගත්තොත්, ට්‍රිලියන 1.5ක හිඟයක් ඇස්තමේන්තු කළත්, සත්‍ය අය වැය හිඟය ට්‍රිලියන 2ක් ලෙස, දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 11.7ක් දක්වා ඉහළ ගොස් තිබෙනවා. 2022 වර්ෂයේදී ට්‍රිලියන 1.6ක අය වැය හිඟයක් ඇස්තමේන්තු කළත්, ට්‍රිලියන 2.4ක අය වැය හිඟයක් දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. එය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 10.2යි. 2023 වර්ෂයේදී අය වැය හිඟය ට්‍රිලියන 2.4ක් විධියට තිබුණත්, සියයට 8.3ක අය වැය හිඟයක් බවට පත් වී තිබෙනවා. 2024 වර්ෂයේදී ට්‍රිලියන 2.4ක අය වැය හිඟයක් මේ පාර්ලිමේන්තුවෙන් ඇස්තමේන්තු කළත්, ඒක නව රජය පත් වීමත් එක්ක සීමා කර ගන්න සමත් වෙනවා, ට්‍රිලියන 2.2ක් ඇතුළේ. ඒ කියන්නේ, මුළු අය වැය හිඟය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 6.8ක් දක්වා අඩු කර ගන්න සමත් වී තිබෙනවා. 2025 වර්ෂයේදී අය වැය හිඟය ට්‍රිලියන 2.2ක් විධියට ඇස්තමේන්තු කරනකොට, ඒ ඇස්තමේන්තුව අනුව දළ ජාතික නිෂ්පාදිතයට සාපේක්ෂව අය වැය හිඟය සියයට 6.7ක් කියා බලාපොරොත්තු වුණා. නමුත්, නිවැරදි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මූල්‍ය විනය සහ පිස්කල් ප්‍රතිපත්තිය ඇතුළේ අය වැය හිඟය දළ ජාතික නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 4.5ක් දක්වා අඩු කර ගන්න මේ වෙනකොට රජය සමත් වෙලා තිබෙනවා.

අපි මේ කාල සීමාවේදී රජයේ ආදායම කොහොමද කියලා බැලුවොත්, 2019 වර්ෂයේදී රජය අය වැය මඟින් ඉදිරිපත් කර තිබෙනවා, ට්‍රිලියන 2.3ක ආදායමක් ලබා ගන්න. නමුත්, ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ ට්‍රිලියන 1.8යි. 2020 අවුරුද්දේ ට්‍රිලියන 1.5ක ආදායමක් ලබා ගන්න ඇස්තමේන්තු කළත්, ට්‍රිලියන 1.3යි ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. 2021 වර්ෂයේදී 1.9ක් ඇස්තමේන්තු කළත්, ට්‍රිලියන 1.4යි ලබා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. 2022 අවුරුද්දේ ට්‍රිලියන 2.2ක ආදායමක් ලබා ගන්න අය වැය මඟින් ඇස්තමේන්තු කළත්, ට්‍රිලියන 2ක් පමණයි ලබා ගන්න හැකි වෙලා තිබෙන්නේ. 2023 අවුරුද්දේ ට්‍රිලියන 3.4ක ආදායමක් ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ රජය සමත් වෙන්නේ ට්‍රිලියන 3ක ආදායමක් ලබා ගන්නයි. අපි 2024 වර්ෂයට යනකොට -මේ නව රජයත් බලයට පත් වුණා- ට්‍රිලියන 4.1ක ආදායමක් ගන්න බලාපොරොත්තු වුණා. හැබැයි, ඒ ආදායම ආසන්නයට ළඟා කර ගන්න සමත් වුණා.

මේ ජාතික ජන බලවේගය රජය බලයට පත් වී ජනවාරි සිට සිදු කරන ක්‍රියාවලිය ඇතුළේ අපි ට්‍රිලියන 4.9ක ආදායමක් ගන්න පාර්ලිමේන්තුවේ අය වැය සම්මත කරනවා. මේ වෙනකොට තිබෙන දත්ත අනුව එය ඉක්මවා ගිහිල්ලා, එතැනින් එහාට ගිය ආදායමක් ගන්න, ට්‍රිලියන 5.2ක වාගේ ආදායමකට යන්න අපි සමත් වෙලා තිබෙනවා. මම කියන්න හැදුවේ මේකයි. මෑත ඉතිහාසයේ පළමු වතාවට තමයි පාර්ලිමේන්තුවේ සම්මත කරපු අය වැයකින් ගන්න බලාපොරොත්තු වූ ආදායම ඉක්මවා ආදායමක් ගන්න සමත් වෙන්නේ. ජාතික ජන බලවේගය රජයක් තුළින් තමයි පළමු වතාවට එය සිදු වන්නේ.

ඒක ඉතා විශාල ජයග්‍රහණයක්. ඒකට විශාල වශයෙන් හේතු පාදක වෙනවා, රජයේ ආදායම ඉහළ නංවන්න අවශ්‍ය සියලු කටයුතු රජය මඟින් සම්පාදනය කිරීම, රජයේ මූල්‍ය විනය ඉතාම හොඳින් පවත්වා ගෙන යෑම, මූල්‍ය කළමනාකරණය, පිස්කල් ප්‍රතිපත්තිය ආදිය. මෙන්න මේවා රාජ්‍ය ආදායම ඉහළ නංවන්න සමත් වෙනවා. අපේ රටේ මුළු රාජ්‍ය ආදායමින් සියයට 93කට වැඩි ප්‍රමාණයක් සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වන්නේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවයි. ඉතිහාසයේ පළමුවෙනි වතාවට මේ දෙපාර්තමේන්තු තුනම ඒ ඒ මාසය වනකොට ලබා ගත යුතු ආදායම් ඉලක්ක අභිභවා ගිය ආදායමක් ලබා ගන්න සමත් වෙලා තිබෙනවා. මෙන්න මේ ජයග්‍රහණය තුළ තමයි රාජ්‍ය ආදායම ඉහළ නංවා ගන්න හැකියාව ලැබී තිබෙන්නේ. අය වැය හිඟය අවම කර ගැනීම, රාජ්‍ය ආදායම් වැඩි කර ගැනීම තුළ ප්‍රාථමික ශේෂය කියන එක හරිම වැදගත්. 2024 වර්ෂයේදී දශම 8ක්ව තිබ්බ්ව එය 2025 වනකොට සියයට 2.5කට වැඩි ධන අගයකට ගෙන යන්න අපි සමත් වෙලා තිබෙනවා. රජයේ එම නිවැරැදි ක්‍රියාකාරිත්වය තුළ මෙන්න මේ ඉලක්ක ළඟා කර ගැනීම වෙනුවෙන් මේ අය වැයෙන් ද ප්‍රධාන වශයෙන් ශක්තියක් ලබා දී තිබෙනවා.

අපි මේ රටේ ආර්ථිකය ස්ථාවරත්වයට පත් කර තිබෙනවා. ස්ථාවරත්වයට පත් කර තිබෙන මේ ආර්ථිකය වඩාත් වේගයෙන් ප්‍රසාරණය කරන්න නම් අපි වඩාත් වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගන්න ඕනෑ. වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගන්න යන ගමනේදී ඒ සඳහා ප්‍රධාන කරුණු 5ක් ඉවහල් වෙනවා. පළමුවෙනි කාරණය තමයි, අපේ අපනයන ආදායම වර්ධනය කර ගන්නා එක. 2024 අවුරුද්දට සාපේක්ෂව ගත්තාම මේ වන කොට අපි අපනයනය අතින් පැහැදිලි වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. දෙවැනි කාරණය තමයි, විදේශවලින් ලැබෙන ප්‍රේෂණ ප්‍රමාණය වැඩි කර ගන්නා එක. 2024 වර්ෂයට සාපේක්ෂව වඩාත් වැඩි විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් මේ වන කොට රජයට ලැබී තිබෙනවා. තුන්වැනි කාරණය තමයි, සංචාරක ආදායම. සංචාරක ආදායම ගත්තොත්, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා වාගේ වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට පැමිණි වර්ෂය බවට මේ වර්ෂය ඉතිහාසගත වෙනවා කියා මම හිතනවා. ඒත් එක්කම, මේ අවුරුද්දේ මේ දක්වා කාල පරිච්ඡේදය සලකන කොට 2025 වර්ෂය වඩාත් වැඩි සංචාරක ආදායමක් ලබා ගත්තු වර්ෂය බවටත් ඉතිහාසගත වෙනවා.

ඊළඟ තීරණාත්මක සාධකය තමයි, සෘජු විදේශ ආයෝජන - foreign direct investments. සෘජු විදේශ ආයෝජන ලබා ගන්න අවශ්‍ය අණ පනත් සකස් කර ඒ ඒ ආයතනවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මේ අය වැයෙන් වෙන් කර දී තිබෙනවා. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා, සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය වැඩි කර ගන්න. ඒ හරහා අපේ ආර්ථික වර්ධන වේගය වඩාත් වැඩි තලයකට ගෙන යන්න අපි උත්සාහ කරනවා. සියයට 7ට වැඩි ප්‍රමාණයකින් ආර්ථික වර්ධනයක් ලබා ගත්තොත් තමයි ඒ වර්ධනය වන ආර්ථික ප්‍රතිලාභ ජනතාව වෙත ගලාගෙන ගිහින් ජනතාවටත් ඒවා භුක්ති විඳින්න හැකියාව ලැබෙන්නේ.

මෙන්න මේ කාරණා තුළ ආර්ථික වර්ධන වේගය වැඩි කර ගන්න අවශ්‍ය වන තවත් ප්‍රධාන කාරණයක් තමයි, රාජ්‍ය ආයෝජන; රජයේ ප්‍රාග්ධන වියදම් කියන එක. රජයේ ප්‍රාග්ධන වියදම් ගැන කථා කරද්දී විපක්ෂය පැත්තෙන් මතු වුණු කාරණය තමයි, අපි 2025 අවුරුද්දේ ප්‍රාග්ධන වියදම් වෙන් කර තිබුණාට ඒවා වියදම් වෙලා නැහැ කියන එක. පසුගිය වසර කිහිපය තුළ ඒ ඒ රජයන් විසින් වියදම් කරන ලද ප්‍රාග්ධන වියදම් සලකා බැලුවොත්, ඒ බොහෝ අවුරුදුවල සියයට 50ක, 55ක ප්‍රමාණයක් තමයි වියදම් වෙලා තිබුණේ. නමුත් මේ අවුරුද්දේ අපේ ඇස්තමේන්තුවලට අනුව සියයට 70කට වැඩි ප්‍රමාණයක් වියදම් කරන්න අපි සමත් වෙනවා. හැබැයි, මේ අවුරුද්දේ අපට විශාල බාධකයක් තිබුණා. මොකද, මේ වසරට අදාළ අය වැය සම්මත වුණේ, මාර්තු මාසයේදී. මාර්තු මාසයේදී අය වැය සම්මත වෙලා මැයි මාසයේදී පළාත් පාලන මැතිවරණය පැවැත්වුණා. ඒ පළාත් පාලන මැතිවරණයට පසුව තමයි මේ වියදම් සම්බන්ධව කටයුතු කළේ; ඒවා පහළ තලයට ගලා ගෙන ගිහිල්ලා ක්‍රියාත්මක වන තත්ත්වයට පත් වුණේ. සම්බන්ධීකරණ කමිටු හරහා අපේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ මැදිහත්වීම තුළ මේ ක්‍රියාවලිය ඉක්මන් කරලා මේ වාගේ කෙටි කාලයක් ඇතුළත මෙතරම් ප්‍රමාණයක් වියදම් කර ගැනීමත් ඇත්තටම මේ රජයේ විශාල ජයග්‍රහණයක්. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා, මේ රජය ආවාට පසු විවිධ පොරොන්දු දුන්නා, බදු ආදායම අඩු කරනවා කිව්වා කියලා.

හැබැයි එතුමාට මතක නැතිව ඇති, මේ රජය ඇවිල්ලා ඉදිරිපත් කරපු පළමු අය වැයෙන්ම කළේ පුද්ගල ආදායම් බදු අය කිරීමට අදාළ රුපියල් 100,000 සීමාව රුපියල් 150,000 දක්වා වැඩි කරපු එක බව. අපේ ආණ්ඩුව එවැනි සහනයක් දුන්නා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා තමයි ඒ සීමාව රුපියල් 200,000 දක්වා වැඩි කරනවා කියලා. නමුත් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොතැනකවත් සඳහන් කරලා නැහැ, ඒ පුද්ගල ආදායම් බදු සීමාව රුපියල් 200,000ක් දක්වා වැඩි කරන එක පළමුවැනි අවුරුද්දේම කරනවා කියලා. අපි එම සීමාව ඒ දක්වා ක්‍රමානුකූලව වැඩි කරනවා තමයි. හැබැයි, අපි බලයට ඇවිත් පළමුවැනි අවස්ථාවේදීම ඉතාම පැහැදිලි බදු සහනයක්, පුද්ගල ආදායම් බදු, PAYE Tax ගෙවන අය වෙනුවෙන් ලබා දුන්නා. අපේ ආණ්ඩුව ඒ වාගේ සහන ලබා දීලා තිබෙනවා. මේ අය වැය ගත්තාම, පොදුවේ සියලු ක්ෂේත්‍ර සංවර්ධනය කරන්න, මේ වන විට නැවතී තිබෙන අපේ රටේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය යළි ආරම්භ කරන්න අවශ්‍ය සහාය ලබා දී තිබෙනවා.

අධිවේගී මාර්ග ඉදි කිරීම ද මෙච්චර කාලයක් නැවතී තිබුණා. මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමුවැනි අදියර සහ තුන්වැනි අදියර ආරම්භ කරන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ වනකොට වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම කුරුණෑගල සිට දඹුල්ල දක්වා නව අධිවේගී මාර්ගයක් ඉදි කරන්න අවශ්‍ය මූලික කටයුතු කිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. අපේ ගුවන් තොටුපොළේ නැවතිලා තිබ්බ්ව දෙවැනි පර්යන්තයේ වැඩ කටයුතු කරන්න අවශ්‍ය කටයුතු මේ වන කොට ආරම්භ කර තිබෙනවා. පසුගිය කාලයේ නැවතී තිබුණු එවැනි සංවර්ධන කටයුතු කරගෙන යන්න අවශ්‍ය විශාල මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් මේ අය වැයෙන් ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමේ දෙවන අදියර වෙනුවෙන් සහ රාජ්‍ය සේවකයන්ට දේපළ ණය ලබා ගැනීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු සඳහාත් මුදල් වෙන් කර තිබෙනවා. පොදුවේ ගත්තාම, සියලු අංශ නියෝජනය වන විධියට සමබර විද්‍යාත්මක අය වැයක් තමයි මේ වෙලාවේ ඉදිරිපත් කර තිබෙන්නේ. මේ අය වැය තුළින් වෙන් කරන මේ ප්‍රතිපාදන හරහා ඇති වන සංවර්ධනය ආර්ථික වර්ධන වේගය වඩාත් ඉහළට ගෙන යන්න මහත් රුකුලක් වෙනවා. මේ අය වැය සම්බන්ධයෙන් මට ඉතාම පැහැදිලිව කියන්න තිබෙන්නේ මෙයයි. මෙම අයවැයෙන් ඉදිරිපත් කර තිබෙන කරුණු ඉතාම විද්‍යාත්මකයි. ප්‍රතිලාභ මුළු රටේම ජනතාව වෙත සමබරව ගලා යන විධියට මෙය ඉදිරිපත් කර තිබෙනවා. මේ අය වැය ක්‍රියාත්මක වීම මඟින් අපේ රට වඩාත් ඉහළ තලයකට ගෙන යන්න අවශ්‍ය සියලු ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය සම්මත කර ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් බව සඳහන් කරමින්, මේ කාලය ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Harshana Nanayakkara. You have 18 minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.30]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

මෙම අය වැය විවාදයේදී කථාවක් කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මෙය මා අදහස් දක්වන දෙවැනි අය වැය විවාදය. මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේදීත් අපි මෙතැනදී මේ ආකාරයටම අය වැය විවාදයකදී මුණ ගැසුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප රට බාර ගන්න කොට තිබුණු තත්ත්වය මොකක්ද? ඒ ගැන බලද්දී අද අපට සෑහෙන්න සතුටක් ලබන්න පුළුවන්. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු අද විතරක් නොවෙයි, පසුගිය අවුරුද්දක කාලය පුරාම මොනවාද කිව්වේ? කලිනුත් කියැවුණා වාගේ අවුරුදු 5කට අදාළ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය බලලා, ඒවා පළමුවැනි මාස 6 තුළ කරන්නේ නැත්තේ ඇයි කියලා අපෙන් ප්‍රශ්න කරමින් හිටපු එක තමයි ඒ අය කළේ. හැබැයි ඒ අයට මතක නැහැ, අප බාර ගත්තේ මොන වාගේ රටක් ද කියන එක. ගෑස් ටැංකි පුපුරන කොට, බිත්ති හිල් කරලා ගෑස් ටැංකි එළියේ තියපු රටක් අපට තිබුණා. ඒ වාගේම, fuel පෝලිම්, කෑම පෝලිම්, බෙහෙත් පෝලිම් තිබුණා. එවැනි ගැටලු රාශියක් තිබුණු, 2022දී ආර්ථික වශයෙන් බංකොලොත් වෙච්ච රටක් තමයි අපි බාර ගත්තේ. ඒ ආකාරයටම කඩා වැටුණු රාජ්‍ය යන්ත්‍රණයක්, පූරප්පාඩු සහිත රාජ්‍ය යන්ත්‍රණයක්, සම්පත් නොමැති රාජ්‍ය යන්ත්‍රණයක් අපට ලැබිලාත් මේ කෙටි කාලය තුළ සාර්ථක ප්‍රගතියක් අත්පත් කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා. අද වන විට අපේ රට බංකොලොත්භාවයෙන් මුදා හැර තිබෙනවා. ඒ වාගේම, rating agenciesවලින් අපේ ආර්ථිකය upgrade කිරීමකට ලක් කර තිබෙනවා. විපක්ෂයේ අය නිතරම කියන දෙයක් තමයි, "මේ ගොල්ලන් මොකුත් කළේ නැහැ. රටට මොකද වුණේ?" කියන එක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සෙල්ලාම මගේ විෂයයෙන්ම කියන්නම්. රටක ආර්ථිකය සංවර්ධනය වෙන්න නම් වංචාව සහ දූෂණය නවතින්න ඕනෑ. ඒකට අවශ්‍ය නීති අණපනත් ගේන්නට ඕනෑ. එතකොට තමයි investorsලාට confidence එකක් එන්නේ. අද මේ වනවිට නවත්වපු ව්‍යාපෘති රාශියක් විදේශිකයන් නැවත පටන් අරගෙන තිබෙනවා. ඔවුන් නැවත, නැවත මේ රටට ආයෝජන ගේනවා. ඇයි? මේ රජය දූෂණ, වංචා නවත්වපු බවට ඔවුන්ට විශ්වාසයක් තිබෙනවා. තිබුණු ප්‍රභූ දේශපාලන සංස්කෘතිය අවසන් කරලා තිබෙනවා. සැවොම නීතියේ ආධිපත්‍යයට යටත් වන රටක් අපි නිර්මාණය කරලා තිබෙනවා. ඔබ දන්නා පොලිස් නිලධාරි මහත්වරුන්ගෙන් අහලා බලන්න, රජයේ ඉහළ නිලධාරීන්ගෙන් අහලා බලන්න, ඇමතිවරු, මන්ත්‍රීවරු කෝල් කරලා ඔබලාට බලපෑම් කරනවාද කියලා? උත්තරය, "නැත". අන්න එවන් වාතාවරණයක් හැදීම ම තමයි අපේ ප්‍රගතියට හේතුව.

මුලින්ම ගත්තොත්, අපි ජාතික විගණන පනතට සංශෝධනයක් ගෙනාවා. ඇයි මේ ජාතික විගණන පනතට සංශෝධනයක් ගෙනාවේ? රාජ්‍ය වත්කම් අධීක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ නියාමන රාමුව ශක්තිමත් කරලා රාජ්‍ය වත්කම් අධීක්ෂණය සහ කළමනාකරණයේදී තම වගකීම් ඉටු කිරීමට අපොහොසත් වන නිලධාරීන් සඳහා දඩ මුදල් පැනවීම පහසු කිරීම පිණිසයි අපි ඒ ජාතික විගණන පනතට සංශෝධන ගෙනාවේ. අද ඒක ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, අපරාධයකින් උත්පාදිත දේ නැවත අත් පත් කර ගැනීම සඳහා වූ නීතිය අපි මේ රටට ගෙනැවිත් තිබෙනවා. ඊට සමගාමීව ඒ සඳහා -අපරාධයකින් උත්පාදිත දේ නැවත අත් පත් කර ගැනීම සඳහා වූ පනත බලාත්මක කිරීම සඳහා- නියෝජ්‍ය පොලිස්පතිවරයකුගේ ප්‍රධානත්වයෙන් වෙනම පොලිස් කොට්ඨාසයක් දැනටමත් පිහිටුවා තිබෙනවා. මෙන්න මේවා තමයි අපි ඇවිල්ලා ගත්ත මූලික පියවරවලින් කිහිපයක්.

ඒ වාගේම අපි මෙතැනට පත්වීම සම්බන්ධයෙන් ඇති වෙන්න අපි කරුණු දක්වලා තිබෙනවා. ගන්නා ලද ණයවලින් අවශ්‍ය වත්කම් ජනිත නොකිරීම, ඒවා හොරා කෑම, දූෂණය යන මේ සියල්ලම නිසා වැටුණු රටක් අපට කොනක ඉඳලා උස්සන්න වුණා. මම කලින් කිව්වා වාගේ, අපි නොවැම්බර් මාසයේ බලයට ඇවිල්ලා අතුරු අය වැයක් ගෙනාවා. ඒ අතුරු අය වැය කාලයේ සාමාන්‍යයෙන් විශාල වියදම් කිරීම් සිදු වෙන්නේ නැහැ. ඊට පසුව මාර්තු මාසයේ තමයි අපි අය වැය සම්මත කර ගත්තේ. එහෙම නම් අපට හරියට වැඩ කරන්න හම්බ වුණේ මාස 7ක් හෝ 8ක් වාගේ සුළු කාලයක්. ඒ කාලයට අදාළ මේ දත්ත ටික පිළිබඳව මම පොඩ්ඩක් පැහැදිලි කරන්නට ඕනෑ.

2024 පළමු භාගය තුළ පැවැති සියයට 4.6ක අපගේ ආර්ථික වර්ධන වේගය 2025 වසරේ සාමාන්‍ය කාල පරිච්ඡේදය තුළදී සියයට 4.8 දක්වා වැඩිවෙලා තිබෙනවා. 2024 වසරේ පළමු කාර්තුවේ පැවැති සියයට 4.5ක විරැකියා ප්‍රතිශතය 2025 වසරේ පළමු කාර්තුවේදී සියයට 3.8 දක්වා පහත වැටිලා තිබෙනවා. 2024 වසරේ මුල් මාස 9 හා සසඳන විට 2025 වසරේ මුල් මාස 9 තුළ අපගේ භාණ්ඩ අපනයනය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 9.1 දක්වා වැඩිවෙලා තිබෙනවා. සේවක ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් බිලියන 4.8 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 5.8 දක්වා වැඩිවෙලා තිබෙනවා. සංචාරක ඉපැයීම් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.5 දක්වා වැඩිවෙලා තිබෙනවා. ආදායම් සහ ප්‍රදාන රුපියල් ට්‍රිලියන 2.9 සිට රුපියල් ට්‍රිලියන 3.8 දක්වා වැඩිවෙලා තිබෙනවා. මෙය අපගේ ඉලක්කද අභිභවා ගිය තත්ත්වයක්. ප්‍රාථමික ශේෂය රුපියල් ට්‍රිලියන 0.8 සිට රුපියල් ට්‍රිලියන 1.5 දක්වා තියුණු ලෙස වැඩි වුණා. මෙයත් අපගේ ඉලක්ක අභිභවා යෑමක්. මේ හැකියාව ලැබුණු මූලික හේතුව තමයි, අපේ තිබෙන මූල්‍ය විනය සහ දත්ත මත පුරෝකථනය කරමින් ආර්ථිකය මෙහෙයවන්න ජාතික ජන බලවේග ආණ්ඩුවට අනුර දිසානායක ජනාධිපතිවරයා දීපු සාර්ථක මඟපෙන්වීම. ඒක තමයි මේ සංඛ්‍යා දත්තවලින් අපට පෙන්නුම් කරන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි මොකක්ද කළේ කියලා විපක්ෂය අපෙන් අහනකොට අපට කියන්න තිබෙන්නේ මෙච්චරයි. ඔවුන් ඒ දවස්වලට - මීට අවුරුද්දකට කලින් - අපට කිව්වා, මේ ආණ්ඩුව මාස තුනෙන් වැටෙනවා, මාස 6න් වැටෙනවා, IMF එක රට දාලා යනවා, විදේශ ආයෝජකයෝ එන්නේ නැහැ, පෞද්ගලික දේපළ ආණ්ඩුවට පවරා ගන්නවා, දානය නවත්වනවා කියලා. ඒවා නම් පසුව කිව්වේ නැහැ. ඒවා කිව්වේ ඡන්දයට කලින්. ඒ වාගේම වාහන ගෙනාවොත් ආර්ථිකය කඩාගෙන වැටෙනවා කිව්වා. අද ඒ හා සමානම එකක් කියැවුණා. ඒ මොකක්ද? "දැන් නම් මහා භාණ්ඩාගාරය පොඩ්ඩක් පිරිලා තිබෙනවා, ඒක කොහොම කළමනාකරණය කර ගනීවිද දන්නේ නැහැ" වාගේ කථාවක් කියනවා අද ඇහුණා. කමක් නැහැ. ඉතින්, මම ජනතාවට කියනවා, ඔබලාම මේකේ විනිශ්චයකාරයෝ වෙන්න කියලා. අවුරුද්දක් තිස්සේ අපි වැඩ කරලා තිබෙනවා, විපක්ෂය අපි ගැන අසත්‍ය කියමින් ඔබ නොමඟ යවලා තිබෙනවා. ඉතුරු අවුරුදු 4ත් එහෙමම තමයි. ඉතුරු අවුරුදු හතරත් අපි වැඩ කරයි; මෙතැනින් පොඩි කෙඳිරියක් එයි. කමක් නැහැ. අපි බලාපොරොත්තු වෙනවා විපක්ෂය ඉදිරියේදී මීට වඩා සාධනීය විධියට විවේචන ඉදිරිපත් කරයි කියලා.

ඒ වාගේම තව එක කරුණක්, අපේ ගරු ජනාධිපතිතුමාත් කියපු දෙයක් නැවත මතක් කළ යුතුයි කියලා මම හිතනවා. ඒක ඉතා වැදගත්. ණය ගෙවීම සම්බන්ධයෙන් ගත්තාම, අපි දැනටමත් යම් බහුපාර්ශ්වීය ණය ප්‍රමාණයක් ගෙවනවා. නමුත් ඉදිරියේදී කරන්න තිබෙන මූලික ණය ගෙවීම් කරන්න අපේ ආර්ථිකයට බැරි වෙයි, ආර්ථිකය කඩා වැටෙයි යනාදි කරුණු කියනවා. මේ ගැන ගරු ජනාධිපතිතුමා හොඳට කරුණු පැහැදිලි කළා. මොකද, බයක් ඇති කරන්න හදනවා මේ රට වැටෙන්න යන්නේ කියලා. කමක් නැහැ. තමන්ගේ පාක්ෂිකයන්ගේ "ආතල්" එකට මොනවා හරි කිව්වාට කමක් නැහැ. නමුත් සත්‍ය ඒක නොවෙයි. මම මෙන්න මේ ටික කියවන්නම්, අපේ ගරු ජනාධිපතිතුමාගේ අය වැය කථාවෙන්. අය වැය කථාවේ 6 වැනි පිටුවේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "2028 වසරේදී විදේශ ණය ගෙවීමට නොහැකියාවක් මතු විය හැකි බවට පදනම් විරහිත මතයන් ඇතැම් පාර්ශ්වයන් විසින් සමාජගත කරමින් සිටිනවා. නමුත් සැබෑ තත්ත්වය කුමක්ද? අප 2024 දී විදේශීය ණය සේවාකරණය වෙනුවෙන් ඩොලර් මිලියන 1,674ක් ගෙවා අවසන් කළා. 2025 වසරේ විදේශීය ණය සේවාකරණය ඩොලර් මිලියන 2,435 ක් වුණු අතර, සැප්තැම්බර් 30 වන විට ඉන් ඩොලර් මිලියන 1,948 ක් ගෙවා අවසන්. මේ වසරේ දෙසැම්බර් 31 වන විට තවත් ඩොලර් මිලියන 487ක් ගෙවීමට සූදානම්. ඒ අනුව, 2025 වසරේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2024ට සාපේක්ෂව ඩොලර් මිලියන 761ක වැඩිවීමක්.
>
> ගරු කථානායකතුමනි, 2028 වසරේ අප විසින් ගෙවිය යුතු විදේශ ණය සේවාකරණය ඩොලර් මිලියන 3,259 ක් පමණයි. එනම්, 2025 වසරට සාපේක්ෂව ඩොලර් මිලියන 824 ක වැඩිවීමක් පමණයි. මෙය ගෙවීමට අපට හැකියාවක් තිබෙනවා. එබැවින් එවැනි සාවද්‍ය ප්‍රචාරයන් මේ රටේ ජනතාව පිළි නොගන්නා බව අප විශ්වාස කරනවා."

ගරු ජනාධිපතිතුමා ඒ විධියට මේ පාර්ලිමේන්තුවේ කිව්වා. මම එතැනින් තව එක පේළියක් කියන්නම්. "2028දී ඉන්නේත් අපි, ගෙවන්නේත් අපි" කියලා එතුමා අපි සියලුදෙනාට මතක් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය යනාදි කරුණු රාශියක් සම්බන්ධයෙන් කරුණු දක්වා තිබෙනවා. සංචාරක කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා කටයුතු කරමින් තිබෙනවා. 2030 වසර වනවිට සංචාරක ඉපැයීම් ඇමෙරිකානු ඩොලර් බිලියන අට දක්වාත්, සංචාරක පැමිණීම මිලියන 4 දක්වාත් වැඩි කිරීම ඉලක්ක කරගනිමින් සංචාරක අංශයේ වේගවත් වර්ධනයක් අත්පත් කර ගැනීමට අපි කටයුතු කරනවා.

ආබාධසහිත දරුවන් අධ්‍යාපනය සඳහා යොමුවීම ඉතා අඩු මට්ටමක පවතින නිසා මේ දරුවන් පාසල් වෙත යොමු කිරීමේ අරමුණින් අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධිත දරුවන් සඳහා වෛද්‍ය නිර්දේශ මත එක් දරුවෙකුට රුපියල් 5,000ක දීමනාවක් මාසිකව ලබා දීම සඳහා රුපියල් මිලියන 50ක් මෙවර අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, we are trying to create an inclusive economy; we will not leave any marginalized community behind. අන්න ඒ හේතුව හන්දා තමයි අපි ආබාධ සහිත ප්‍රජාවට සහාය දක්වන්න විශේෂ මුදල් ප්‍රමාණයක් වෙන් කරලා විශේෂ වැඩ පිළිවෙළක් හදන්නේ.

මා තව කරුණු දෙකක් පමණක් ගෙනහැර දක්වන්නම්. අස්වැසුම වැඩසටහන හරහා ආබාධ සහිත පුද්ගලයන් 140,000ක් පමණ සඳහා රුපියල් 10,000 බැගින් වූ සහනාධාරයක් ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 19,000ක ප්‍රතිපාදන දැනටමත් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ආබාධ සහිත ප්‍රජාවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දුම්රිය ස්ථාන, බස් නැවතුම්පොළ, අධිකරණ, පොලිස් ස්ථාන වැනි පොදු ස්ථාන වෙත ප්‍රවේශ වීම සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කරනවා. ආබාධ සහිත ප්‍රජාව කියන්නේ අපේ රටේ ජනගහනයෙන් සියයට 7ක පමණ ප්‍රමාණයක්. ඒ නිසා ඔවුන්ට ඒ දේවල් තිබෙන්නට ඕනෑ.

ප්‍රවාහනයේ සියලු අංශ සඳහා අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සෞඛ්‍යය, අධ්‍යාපනය යන අංශ ගත්තාම, මනුස්සයෙකුට සෞඛ්‍ය පහසුකම් ලබා දෙනවාය කියන්නේ පිනට දෙන එකක් නොවෙයි. ඒක ඔවුන්ගේ අයිතිවාසිකමක්. සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා තිබෙන වැඩ පිළිවෙළ රාශියක් අතරින් මම එකක් කියනවා. ඒ මොකක්ද? රුපියල් මිලියන 12,000ක පිරිවැයක් දරමින් වැඩි ඉඩපහසුකම් සහ නවීන උපාංගවලින් සමන්විත මහල් 16කින් යුතු ජාතික හෘද ඒකකයක් පිහිටුවන්න අවශ්‍ය මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ ඇති වන මරණවලින් සියයට 40ක පමණ ප්‍රමාණයක් හෘද රෝග නිසා ඇති වෙන්නේ. ජාතික රෝහලේ ඉතාම හොඳ උසස් මට්ටමේ හෘද රෝගී අංශයක් තිබුණාට එය ප්‍රමාණවත් නැහැ. මෙච්චර කල් ආපු ආණ්ඩු මේවා ගණන් ගත්තේ නැහැ. Heart block එකක් තිබෙන මිනිහෙක් bypass surgery එකක් කරගන්න අවුරුද්දක්, දෙකක් බලාගෙන ඉන්න ඕනෑ. පමණක් වෙලාවට මැරුණාට පස්සේ තමයි operation date එක ලැබෙන්නේ; හත් දවසේ දානයට තමයි operation date එක හම්බ වෙන්නේ.

අපි මේ රටේ ජනතාවටයි මේ ආර්ථිකය හදන්නේ. මේ රටේ වැඩ කරන මිනිසුන් බහුතරය වෙනුවෙන් තමයි අපි මේ ආර්ථිකය හදන්නේ. කිසි කෙනෙකු නොකරපු දෙයක් තමයි, විශේෂ හෘදය රෝග ඒකකයක් මේ ආකාරයට පිරිවැයක් දරලා නිර්මාණය කරන්න කටයුතු කිරීම. ඒ වාගේම අපේ පක්ෂය හැම දාම කිව්වා - that we are more supportive of labour than capital. We always look after labour because capital gets created by labour. ඒක නිසා වැඩ කරන ජනතාව ගැන අපි නිතරම කල්පනා කරමින් කටයුතු කළා.

අපේ රටේ මලයගම් ජනතාවට ආණ්ඩු කීයක් පොරොන්දු දුන්නාද? කී දෙනෙක් ඒ පොරොන්දු ඉෂ්ට කළාද? රුපියල් 1,350ට තිබෙන ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,550ක් දක්වා රුපියල් 200ක් ඒ කර්මාන්ත මහිනුත්, තවත් රුපියල් 200ක දීමනාවක් රජය විසිනුත් දිරි දීමනාවක් වශයෙන්, පැමිණීමේ

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

දීමනාවක් වශයෙන් දෙන්න කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ සඳහා අපි රුපියල් මිලියන 5,000ක් වෙන් කොට තිබෙනවා. කවුද මීට කලින් මේවා කළේ? Those populations were just used as voting blocs. කක්කුස්සි වළක් දීලා, බකට් එකක් දීලා ඡන්දය ගන්න හිටපු ජනතාවක් තමයි අපි මේ බලවත් කරන්නේ. අපි ඒ මිනිසුන්ට එහෙම ඡන්ද කැලි කියලා සලකන්නේ නැහැ. ඒ වාගේම -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92 (2) යටතේ මම අහන්නේ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ "කක්කුස්සි" කියලා කියන්න පුළුවන්ද? ඒක අයින් කර ගන්න කියන්න. මම දැන් කියපු එකත් එක්කම අයින් කර ගන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
නිදාගෙනද ඉන්නේ?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නිදාගෙන නොවෙයි, නැඟිටලා ඉන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ වචනය අනවශ්‍ය නම් අපි ඒක හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්නම්. ගරු ඇමතිතුමා කථා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කක්කුස්සියට, කක්කුස්සිය කියන්නේ නැතුව මම මොකක්ද කියන්නේ? ඒකට ඉරිදා පොළ කියලා කියන්නද? *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ භාෂා ප්‍රශ්නයක් තිබෙන්නේ. එතුමාගේ දෙවන භාෂාව සිංහල භාෂාව බව මම පිළිගන්නවා. අපි ඕනෑ නම් කථා කරලා වචනය පැහැදිලි කර ගනිමු. කක්කුස්සිය කියන්නේ අසභ්‍ය වචනයක් නොවෙයි නේ. *[බාධා කිරීමක්]* මම ඒකට වෙන මොනවා කියන්නද? *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ කාලය.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා කථා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
බොහොම ස්තුතියි. කක්කුස්සිය ගැන කියන කොට කක්කුස්සි කටවලුත් ෆෝම් වෙනවා. ඒක නේ වැඩේ. ඒක නිසා කක්කුස්සි එපා. අපි ඔහොම යමු.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොල් වගා සංවර්ධනයට අපි අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒ කථාව දැන් ඉවරද? මම මගේ කථාව කරන්නද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වැඩේ කියන්නේ- ඔහොම තමයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමා ආපහු පටලවා ගන්න එපා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
පැටලෙනවා නේ. පැටලෙන්න නැතුව තිබෙයිද, හදන්න තිබෙන එකට කක්කුස්සියක් ගැහුවා නේ ඇවිල්ලා.

අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස ගැටලුවලට පිළියමක් ලෙස නිවාස 70,000ක් මධ්‍යකාලීනව ඉදිකිරීමට අපේක්ෂා කරනවා. ඒ සඳහා, 2026 වසරේ නිවාස 10,000ක් ඉදිකිරීම වෙනුවෙන් දැනට වෙන් වී ඇති රුපියල් මිලියන 7,200ට අමතරව තවත් මිලියන 3,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

මට කියන්න වැදගත්ම දෙයක් තිබෙනවා. වාහන ගෙන්වීමට රුපියල් මිලියන 12,500ක් වෙන් කිරීමට යෝජනා කරලා තිබෙනවා කිව්වා. ඒක තිබෙන්නේ අය වැය කථාවේ 32:3 ඡේදයේ. "රජයේ ආයතනවලට අවශ්‍ය වාහන, පළාත් පාලන ආයතනවලට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ලබා දීම" යනුවෙන් තිබෙනවා. එතැනදී අපි පැහැදිලි කර ගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. රුපියල් මිලියන 12,500ක් වෙන් කරන්නේ මන්ත්‍රීවරුන්ට වාහන ගන්න නොවෙයි. ගන්නා වූ වාහන සංඛ්‍යාව 2,700ක්. කැබ් රථ 1,775කට ටෙන්ඩර් දාලා තිබෙනවා. ඒවා මන්ත්‍රීවරුන්ට නොවෙයි. ඒවා ගන්නේ අපේ පළාත් පාලන ආයතන, රජයේ ආයතන, දෙපාර්තමේන්තු, අමාත්‍යාංශවලට. ඊට අමතරව වාහන 225ක් විපක්ෂය ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට.

කට්ටිය පර්මිට් ඉල්ලුවාට වැඩක් නැහැ. හම්බ වෙන්නේ නැහැ. ජනාධිපතිතුමා දෙන්න බැහැ කිව්වා නේ. ඒ වාගේම තව වාහන 700ක් තිබෙනවා. ඒවා ට්‍රැක්ටර්, බවුසර්, කම්පැක්ටර් වාගේ පළාත් පාලන ආයතනවලට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර. නමුත් සමහර මාධ්‍ය ආයතන හුවා දක්වන්න හදනවා, මේ රුපියල් මිලියන 12,500න්ම අපිට වාහන ගෙන්වා ගන්න හදනවා කියලා. කරුණාකරලා ඔබතුමන්ලාගේ මට්ටමින් අපව මනින්න එපා. මොකද අපි හොරු නොවන නිසා. අපි මහජන මුදල් වංචා කරන්නේ, නාස්ති කරන්නේ නැත. විශේෂයෙන්ම සමහර මාධ්‍ය ආයතනවලට තමයි මේක කියන්නේ. ඒ අයිතිකාරයා නම් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026 අය වැය විවාදය ආරම්භක දිනයේ අදහස් දැක්වීමේ දී මා අවසාන වශයෙන් කියන්නේ, මේ අය වැය තුළ මනුෂ්‍යකරණය සහ ආර්ථිකය යන දෙක balance කරලා තිබෙන බවයි. ආර්ථිකයක් තිබෙන්නේම, මනුෂ්‍යයන්ට සේවය කරන්න. ආර්ථික ගැටලු නිසා දුප්පත් මිනිස්සු වැටෙන අමාරුව අපි දන්නවා. ඒ නිසා තමයි මෙම අය

වැය තුළ අවශ්‍ය සියලු සමාජ ආරක්ෂණය තබා තිබෙන්නේ. මෙය ඉතාම සාර්ථක සහ හොඳ අය වැයක්. මේක රට ඉදිරියට ගෙන යන්න පුළුවන් අය වැයක්. ඒ නිසා එයට සහාය දෙන්න කියලා විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.48]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ජනාධිපතිතුමා ඊයේ 2026 වසරට අදාළ අය වැය වාර්තාව මේ සභාවට ඉදිරිපත් කළා. මම හිතන විධියට විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු ඉතාම සාවධානව ජනාධිපතිතුමාගේ අය වැය කථාව අහගෙන හිටියා. මම හිතුවා, අය වැය කථාව අහගෙන හිටපු මන්ත්‍රීවරු එය හොඳටම තේරුම් අරගෙන ආණ්ඩුව කරගෙන යන මේ වැඩේට හොඳ සහයෝගයක් දෙයි කියලා.

හැබැයි, පසුගිය අවුරුදු 76ක කාලය තුළ එතුමන්ලාගේ අය වැය ඉදිරිපත් කළේ කොහොමද, ඒ අවස්ථාවලදී එතුමන්ලා ඇමතිවරු විධියට හැසිරුණේ කොහොමද, ජාතික ජන බලවේගයේ අය වැයත් ඒ විධියටම දකින බවක් තමයි අද උදේ ඉඳලා මේ විපක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනාම කළ කථා දිහා බලනකොට අපට තේරුණේ. පසුගිය කාලය පුරාම හැම ක්ෂේත්‍රයක් ගැනම, මුදල් වෙන් කරන්නේ නැති එක ගැනම, මේ රට බංකොලොත් වෙච්ච එක ගැනම, මිනිසුන්ගේ ප්‍රශ්න විසඳෙන්නේ නැති එක ගැනම මේ මන්ත්‍රීවරු සාකච්ඡා කළා. නමුත් අපේ ජනාධිපතිතුමා, අපේ අමාත්‍ය මණ්ඩලය ඇතුළු විද්වත් සියලුදෙනාම එකතු වෙලා සාකච්ඡා කරලා, ඒ සියලු ක්ෂේත්‍රයන්වලට අදාළව හරි විධියට මේ අය වැයෙන් මුදල් වෙන් කරද්දීත්, අපේ ආණ්ඩුවේ පස් අවුරුදු වැඩ පිළිවෙළ තුළ මේ රටේ ජනතාවට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ලබා දෙන්න පුළුවන් වන විධියට වැඩ කටයුතු කරද්දීත්, මේ ගොල්ලන් අඬනවා. ඉතින්, අපට කරන්න දෙයකුත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ 2026 අය වැය ඇත්තටම ඓතිහාසික අය වැයක් බව මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. මොකද, වතු කම්කරු ජනතාව නියෝජනය කරන නායකයකු විධියට මගේ ජීවිතයේ ඉතාම සතුටට පත් වෙච්ච දවසක් තමයි ඊයේ දවස. 2025, 2026 අය වැයවලට කලින් ඉදිරිපත් කළ හැම අය වැයකදීම වෘත්තිය සමිති නායකයෝ විධියට අපි පාරේ හිටියේ. මොකද, ඉතාම දුක්ඛිත ජීවිත ගත කරන අපේ වතු කම්කරු ජනතාවගේ වැටුප වැඩි කර දෙන්න, ඒ මිනිසුන්ගේ ප්‍රශ්න විසඳා දෙන්න, ඒ මිනිසුන්ගේ අයිතිවාසිකම් ලබා දෙන්න හැම අය වැයකදීම, හැම දාම අපි පාරේ හිටියේ. නමුත් අපේ ජනාධිපතිතුමා ඊයේ අය වැය ඉදිරිපත් කරද්දී කිව්වා, ලබන ජනවාරි මාසයේ ඉඳලා වතු කම්කරු ජනතාවට රුපියල් 1,750ක වැටුපක් ලබා දෙන බව. ඔබතුමන්ලා දන්නවා, වතු කම්කරු ජනතාවට රුපියල් 1,350ක වැටුපක් තමයි හම්බ වුණේ. හැබැයි අද වෙනකොට නවත්න බැරි වුණු කොම්පැනිකාරයොත් එක්ක කථා කරලා, ඒ සමාගම් එක්ක අමාරුවෙන් කථා කරලා, කොම්පැනියෙන් රුපියල් 200කුත්, ආණ්ඩුවෙන් රුපියල් 200කුත් එකතු කරලා, ඉතිහාසයේ පළමුවැනි වතාවට වතු කම්කරු ජනතාවට රුපියල් 400ක වැඩිම වැටුප් වැඩි කිරීමක් කරමින්, ලබන ජනවාරි මාසයේ ඉඳලා වතු කම්කරු ජනතාවට රුපියල් 1,750ක වැටුපක් ලබා දෙන්න අපි සූදානම් වෙලා ඉන්නවා. ඉතින්, මම මේ අවස්ථාවේදී වතු කම්කරුවන් වෙනුවෙනුත්, සමස්ත ලංකා වතු කම්කරු සංගමය වෙනුවෙනුත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අපේ අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිය පුද කරනවා.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நேற்றைய தினம் வாசிக்கப்பட்ட 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டமானது, நாட்டின் 80ஆவது வரவு செலவுத் திட்டமாகும். உண்மையிலேயே இது உலக சாதனை படைத்த ஒரு வரவு செலவுத்திட்டமாகும். இதன் பிரதான சாதனையாளராக இந்த நாட்டின் மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களைப் பெயரிடுவதற்கு நான் விரும்புகின்றேன். ஏனென்றால், உலக நாடுகளைப்போல், குறிப்பாக அவுஸ்திரேலியா, இந்தியா போன்ற நாடுகளின் நிதி அமைச்சர்களையும் தாண்டி, இந்த நாட்டிலுள்ள அனைத்து மக்களைப் பற்றியும் யோசித்து, கூடுதலான நேரத்தை ஒதுக்கி, 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் நேற்றைய தினம் இந்தச் சபையில் சமர்ப்பிக்கப்பட்டது. அந்த வகையில், இது சகல தரப்பினரையும் - பெண்கள், அரச துறை ஊழியர்கள், தனியார்துறை ஊழியர்கள், வலதுகுறைந்தவர்கள், முதியோர்கள் மட்டுமல்லாது சாதாரண வளர்ப்புப் பிராணிகளையும்கூட - உள்ளடக்கிய ஒரு வரவு செலவுத்திட்டமாகும். இதனை இலங்கை வரலாற்றில் மாத்திரமல்ல, உலக வரலாற்றிலும் சாதனை படைத்த ஒரு வரவு செலவுத்திட்டமாகவே நாங்கள் கருதுகின்றோம்.

நேற்று மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்த வரவு செலவுத்திட்டத்தைச் சபையில் சமர்ப்பிக்கும்போது எதிர்க்கட்சியில் உள்ள அநேகமான உறுப்பினர்கள் மிகவும் அவதானமாகக் கேட்டுக்கொண்டு இருந்தார்கள். அதைப் பார்த்தபோது, நாங்கள் யோசித்த ஒன்றுதான் எதிர்காலத்தில் இவர்கள் நல்ல பணிகளுக்கு ஆதரவளிப்பார்கள் என்பது. 2025ஆம் ஆண்டுக்கு முன்பு இவர்கள் வரவு செலவுத்திட்டத்தில் பணங்களை ஒதுக்கிவிட்டு மக்களுக்குச் சேவைகளை தொடர்ந்தார்களா? என்பது கேள்விக்குறியான விடயம். அதுபோல், இன்று காலையில் இந்தச் சபையில் அவர்கள் ஆற்றிய உரைகளைப் பார்க்கும்போது, இந்த வரவு செலவுத்திட்டத்தையும் அந்தக் கண்ணோட்டத்தில் பார்ப்பது தெரியவருகிறது.

நான் முதலில் குறிப்பிட்டதுபோன்று, இந்த வரவு செலவுத்திட்டம் அனைவரையும் உள்ளடக்கியதாக அமைந்துள்ளது. தோட்டப்புறத்தில், மலையகத்தில் வாழும் மக்களின் பிரச்சினைகளுக்கு எவ்விதமான தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்ற ஒரு சிந்தனையோடு முன்வைக்கப்பட்ட முதலாவது வரவு செலவுத்திட்டமாக 2026ஆம் ஆண்டுக்குரிய இந்த வரவுசெலவுத்திட்டம் அமைந்துள்ளது என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். விசேடமாக, இதில் தோட்டத் தொழிலாளர்களின் சம்பளம் தொடர்பாகவும், அதேபோன்று அவர்களது உட்கட்டமைப்பு வசதிகள், வீட்டு வசதிகள், காணி வசதிகள் தொடர்பாகவும் குறிப்பிடப்பட்டுள்ள அனைத்து விடயங்களையும் சனாதிபதி அவர்களால் முன்வைக்கப்பட்ட வரவு செலவுத்திட்ட அறிக்கையை மீண்டும் ஒருமுறை வாசித்துப் பார்த்தால் உங்களால் புரிந்துகொள்ள முடியும் என்று நான் நினைக்கின்றேன்.

[ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය]

மலையகத் தோட்டத் தொழிலாளர்களை எடுத்துக் கொண்டால், அவர்களது சம்பள உயர்வுகள் 1992ஆம் ஆண்டு முதல் 2021ஆம் ஆண்டு வரையிலும் இரண்டு வருடங்களுக்கு ஒருமுறை மேற்கொள்ளப்பட்ட கூட்டு ஒப்பந்தத்தின்மூலமாக மேற்கொள்ளப்பட்டது. 2025ஆம் ஆண்டுக்கு முன்னர் ஒவ்வொரு வரவு செலவுத்திட்டத்தின்போதும் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வைப் பெற்றுக்கொள்வதற் காகவும் அவர்களின் சகல உரிமைகளுக்காகவும் தொழிற்சங்கத் தலைவர் என்ற ரீதியில் வீதிகளில் இறங்கிப் போராடிய ஒருவர் நான். இந்த விடயம் எல்லோருக்கும் நன்றாகவே தெரியும். ஆனால், இப்படிப் போராட்டத்தின் மூலம் சம்பள உயர்வையும் அவர்களது உரிமைகளையும் பெற்றுக்கொண்டுவந்த வேளையில், எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கம் சகலரையும் பிரதிநிதித்துவப்படுத்தி, முதல்முறையாக வரவு செலவுத்திட்டத்தில் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை அதிகரித்துள்ளது. இது வரலாற்றில் முக்கியத்துவமிக்க ஒரு விடயமாகும்.

உண்மையிலேயே, மலையகத் தோட்டத் தொழிலாளர் களின் சம்பள உயர்வு தொடர்பாக, கம்பனிகளுடன் - பல்தேசிய நிறுவனங்களுடன் - கதைத்தும் அவர்கள் அதற்குரிய எந்தவொரு முயற்சியும் எடுக்காத பட்சத்தில், அரசாங்கமும் தொழில் அமைச்சும் பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சும் மாண்புமிகு சனாதிபதி அவர்களும் இணைந்து இந்தப் பல்தேசியக் கம்பனிகளுடன் கதைத்து, அவர்களுக்கு அழுத்தம் கொடுத்து, 'கல்லில் நார் உரிப்பது போன்று' அவர்களிட மிருந்து 200 ரூபாயைப் பெற்றுக்கொடுப்பதற்கு நாங்கள் கஷ்டப்பட்டோம். இந்தச் சம்பள அதிகரிப்புக்கு கம்பனிக்காரர் களிடமிருந்து 200 ரூபாயையும், அதேபோல் இந்தச் சபையில் என்றுமே நடைபெறாத ஒரு முன்மொழிவாக வரவு செலவுத்திட்டத்தில் அரசாங்கம் 5,000 மில்லியன் ரூபாயை ஒதுக்கி, நாளாந்த ஊக்குவிப்புக் கொடுப்பனவாக மேலும் 200 ரூபாயையும் கொடுத்து 1,750 ரூபாய் சம்பளத்தைப் பெற்றுக்கொடுப்பதற்கு ஆவன செய்யப்பட்டுள்ளது.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියගේ කථාව දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஒரு நிமிடம் தாருங்கள்!

கௌரவ ஜீவன் தொண்டமான் அவர்கள் சமூக வலைத் தளங்களிலும் தோட்டப்புற மக்களிடமும் இந்த அரசாங்கம் பெருந்தோட்ட மக்களின் சம்பளத்தைக் குறைந்தபட்சம் 10 ரூபாயாலாவது அதிகரித்துக் காட்ட முடியுமா? என்று சவால் விடுத்தார். இன்று அரசாங்கம் அதனை 400 ரூபாயால் அதிகரித்துள்ளது. அரசாங்கம் 10 ரூபாயையாவது அதிகரிக்க முடியுமா? என்று கூக்குரலிட்டுக் கொண்டிருந்த உங்களால் இதற்கு என்ன பதில் சொல்ல முடியும்? இதற்குரிய பதிலைச் சொல்ல முடியுமா? என்று நான் அவரிடம் கேட்கின்றேன். அப்படியில்லை என்றால், அவர் தன்னுடைய உறுப்பினர் பதவியை இராஜினாமா செய்துவிட்டு வீட்டுக்குச் செல்ல வேண்டும். அதுமாத்திரமல்ல, மலையக மக்களுக்கு எதிராகச் செயற்பட்ட நீங்கள் அனைவரும், விசேடமாக மலையகத்தைப் பிரதிநிதித்துவம் செய்யும் நீங்கள் அனைவரும் மலையக மக்களிடம் கட்டாயம் மன்னிப்புக் கேட்க வேண்டும் என்பதை இவ்விடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களிடமும், இங்கே விஷயம் தெரியாமல் tableஇல் தட்டுகின்ற உங்களுடைய நண்பர்களிடமும் நான் ஒரேயொரு விஷயத்தைக் கேட்க விரும்புகின்றேன். கௌரவ வசந்த சமரசிங்ஹ அவர்கள் இங்கே இருக்கிறார். அவருடன் நாங்கள் நீண்டகாலம் தொழிற் சங்க ரீதியாகப் பேச்சுவார்த்தைகளில் ஈடுபட்டிருக்கின்றோம். அவர் பல்வேறு தரப்பினருக்கும் உதவி செய்திருக்கின்றார். அவர் இங்கே இருக்கின்ற சந்தர்ப்பத்திலே நான் உங்களிடம் ஒரு கேள்வியைக் கேட்கின்றேன்.

நான் தெளிவாகச் சொன்னேன், ஜனாதிபதியால் முடிந்தால் அடிப்படைச் சம்பளத்தில் 10 ரூபாய்தானும் கூட்டிக்கொடுக்க முடியுமா? என்று. *[இடையீடு]* நான் சொல்வதை முழுமையாகக் கேளுங்கள்! ஜனாதிபதி அவர்களின் உரையில் 1,750 ரூபாய் சம்பளம் வழங்கப்படும் என்று தெரிவித்திருக்கிறார். இதில் "200 ரூபாய் நாளாந்த ஊக்குவிப்புக் கொடுப்பனவாக வழங்கப்படும் - 25 நாட்கள் வேலைக்கு வந்தால்" எனத் தெரிவிக்கப் பட்டுள்ளது. அதற்காக 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்வதற்கு முன்மொழியப்பட்டுள்ளதாகத் தெரிவித்தார். நான் ஏதாவது தப்பாகச் சொன்னால் correct பண்ணுங்கள்! முதல் விடயம், எந்தத் தோட்டத்திலே 20 நாட்களுக்கு மேலதிகமாக வேலை கொடுக்கிறார்கள்?

அடுத்து, ஜனாதிபதி அவர்கள் "அரசாங்கம் மூலமாக attendance incentiveஆக 200 ரூபாய் கொடுப்போம்" என்று சொல்லியிருக்கின்றார். அது அடிப்படைச் சம்பளம் இல்லை, கௌரவ உறுப்பினர் அவர்களே! அதை நீங்கள் மனதிலே வைத்துக் கொள்ளுங்கள்! அது attendance incentive. அது கிடைக்குமா, கிடைக்காதா என்று தெரியாது. ஏனென்றால், தோட்டக் கம்பனிகளைப் பொறுத்தவரைக்கும் அதற்குத் தகுந்த மாதிரி வேலை நாட்களை அதிகரித்தாக வேண்டும்.

அடுத்து, "பெருந்தோட்ட நிறுவனம் மூலமாக 200 ரூபாய் சம்பளம் பெற்றுக்கொடுக்கப்படும்" என்று சொல்லியிருக் கிறீர்கள். Correctதானே! பெருந்தோட்ட நிறுவனங்களின் சம்மேளத்தின் பேச்சாளர் ரொஷான் இராஜதுரை சொல்லியிருக்கின்றார், "நாங்கள் ஒற்றை ரூபாய்கூட அதிகரித்துத் தரமாட்டோம்" என்று. ஒரு விஷயத்தை நான் இந்த சபையிலே வெளிப்படையாகவே சொல்கிறேன், ஜனாதிபதி அவர்களால் அடிப்படைச் சம்பளத்தை அதிகரித்துக் கொடுக்க முடியுமென்றால் - எனக்குத் தெரியும்

1,750 ரூபாய் அடிப்படை சம்பளம் என்பது சாத்தியம் கிடையாது என்பது. ஆனால், நியாயமானளவு அடிப்படைச் சம்பளத்தைக் கூட்டிக்கொடுக்க முடியுமென்றால் - அதற்கு என்னுடைய ஆதரவு கட்டாயம் இருக்கும்; நான் இல்லையென்று சொல்லவில்லை. நீங்கள் இப்போது கேள்வி கேட்டதால் - என்னாலும் வீராப்பாகப் பேசமுடியும் - நான் கேட்ட கேள்விக்கு மட்டும் நீங்கள் பதிலை சொல்லுங்கள்!

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Samarasinghe, I am speaking to her. Let me finish. - *[Interruption.]* Please, sit down. When I tried to speak earlier, you said, "Let her finish" and asked me to sit down. Extend the same respect to me. So, let me finish and let her respond, Hon. Minister.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කරුණු පැහැදිලි කිරීම කෙටියෙන් කරන්න.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Deputy Chairperson of Committees, give me a minute. You gave her so much time. Let me speak. அதாவது, கௌரவ உறுப்பினர் அவர்களே, *[இடையீடு]* Let me ask her this. I am asking her - *[Interruption.]* Could you please relax? Why are all of you getting so psyched out? Relax.

கௌரவ உறுப்பினர் அவர்களே, எனக்குள்ளது ஒரேயொரு கேள்விதான். அடிப்படைச் சம்பளம் கூட்டப்படுமா, கூட்டப் படாதா? அப்படிக் கூட்டப்பட்டால் அடிப்படைச் சம்பளம் எவ்வளவு கூட்டப்படுகின்றது? அவ்வளவுதான் நான் கேட்கிறேன்.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට හිතෙන හැටියට ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා මේ පිළිබඳව සැකයක් සහිතව ඉන්න නිසා එතුමාට මේ ගැන මම පැහැදිලි කරන්න ඕනෑ. එතුමා මගේ නමත් කිව්වා. ඔව්, අපි වෘත්තීය සමිතිවල සැහෙන කාලයක් වැඩ කරපු අය; එකට වැඩ කරපු අය. හැබැයි ඔබතුමාත් දන්නවා, සාමූහික ගිවිසුම අත්සන් කර තිබෙන වෙලාවේ ඒ සාමූහික ගිවිසුමට පිටින් වැටුප් වැඩි කර ගැනීමක් කිරීම සඳහා රජයක් හැටියට අපි මැදිහත් වෙලා තිබෙන බව. ජනාධිපතිතුමා ඒක ඉතාම පැහැදිලිව කිව්වා. වෘත්තීය සමිති නොවෙයි, හාම්පුත්තු ගෙන්වලා කථා කළා. වතු විෂය භාරව ඉන්න ඇමතිතුමා වශයෙන් අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා මේකට සම්බන්ධ වුණා. හාම්පුත්තු ගෙන්වලා එකඟ කර ගත්තා, රුපියල් 200ක් දෛනික වැටුපට වැඩි කරන්න. ඒක ඔබතුමා නොපිළිගත්තාට වෙන කවුරු හරි කිව්වා කියලා, ජනාධිපතිතුමා ඇවිල්ලා බොරු කියන්නේ නැහැ. ඒක ඔබතුමා භාර ගන්න ඕනෑ දැන්. රුපියල් 200ක් වැඩි කළා දෛනික වැටුපට. හාම්පුත්තුත් ඒ රුපියල් 200 වැඩි කළා. ආණ්ඩුව හැටියට අපි පොරොන්දු වුණා,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ඇමතිතුමනි, පිළිතුර කෙටි කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මෙතුමා අහපු ප්‍රශ්නයට ගරු මන්ත්‍රීතුමිය උත්තර දෙන්න යනකොට, මන්ත්‍රීතුමිය කියපු කාරණය නේ මෙතුමා විග්‍රහ කරන්න ගත්තේ. ඒ නිසා,- *[බාධා කිරීමක්]* Wait, මගේ උත්තරය දෙනකල් ඉන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ඔබතුමාගේ පිළිතුර කෙටි කරන්න, ගරු ඇමතිතුමනි. විවාදයකට යන්න එපා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතුරු රුපියල් 200 ආණ්ඩුව ලබා දෙනවා. ඒ රුපියල් 200 ලබා දෙනවා, ආණ්ඩුව. ඒක දින 14න්, 14ට ලබා දෙනවා. දින 28න් නොවෙයි, දින 14කට රුපියල් 200 ගණනේ ලබා දෙනවා. ඒක තමයි ඒ ලැබෙන්නේ.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Minister, can I ask you a question?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

Yes, Hon. Member.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

විවාදයකට යන්න එපා. ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වෙලාවේදී ඔය ගැන කථා කරන්න පුළුවන්. ඔබතුමාට කථා කරන්න කාලය වෙන් වෙලා තිබෙනවා.

මීළඟට, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.04]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා මේ අවස්ථාවේදී සභාවේ නැහැ. හැබැයි, එතුමා අහගෙන සිටිය යුතු දෙයක් තිබෙනවා. මම ඒක පසුව කියන්නම්. මේ ආණ්ඩුව බලයට එන්න කලින් මේ ඉන්න මන්ත්‍රීවරුන් ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ සියලුම සාමාජිකයන් දේශපාලන වේදිකාවල කිව්වා, හොරා කාපු සල්ලි ටික මාසයක් ඇතුළත මේ රටට ගෙනෙනවා, උගන්ඩාවල තිබෙන හොරා කාපු සල්ලි ගෙනෙනවා කියලා. ඒක කියපු මන්ත්‍රීතුමියත් සභාවේ ඉන්නවා. *[බාධා කිරීම්]* ඊළඟට, අපනයනකරුවන් සඟවා තිබෙන ඩොලර් කෝටි ගණනක් තිබෙනවා, ඒ ටික ගෙනෙනවා කිව්වා. එයින් ණය ටික ගෙවනවා කිව්වා, මාසයකින්. ඊට පස්සේ කිව්වා, IMF එක එළවනවා, ඔවුන්ගේ කොන්දේසිවලට යටත් වෙන්නේ නැහැ කියලා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම් කරන්නේ නැහැ, ඒ ණය ගෙවන්නේ නැහැ කිව්වා. "මචං, අපි ඒවා ගෙවන්නේ නැහැ" කියලා කියන්න යනවාය කිව්වා. ඒ වචනවලින්මයි කිව්වේ. මේක මාසයකින් කරනවා කියලා තමයි කිව්වේ. හැබැයි, දැන් අවුරුද්දක් ගතවෙලා තිබෙනවා.

චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා අද කථා කළා. එතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. එතුමා මේ කථාව අහගෙන හිටියා නම් හොඳයි. එතුමා කිව්වා, මේ අය වැය කථාවත් එක්ක අපි ප්‍රතිපත්ති ප්‍රකාශනය පටලවා ගත්තා කියලා. අපි පටලවාගෙන නැහැ. එතුමා කිව්වා, අපි confused කියලා. අපි නොවෙයි, ආණ්ඩුවයි confused. ආණ්ඩුවට ප්‍රතිපත්තියක් නැහැ. එදා වේදිකාවේ කියපු දේවල් සහ අද කියන දේවල් අතර වෙනසක් තිබෙනවා. චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ආණ්ඩුව වෙනුවෙන් කියනවා, මේවා එක්වරම කරන්න බැහැ, අපට මේ අය වැයකින් ඔක්කොම කරන්න බැහැ, අපට අවුරුදු 20ක් ඕනෑය කියලා. අනේ දෙවියනේ! රනිල් වික්‍රමසිංහ මහත්මයා අවුරුදු 20ක් ගැන කථා කරනකොට ඔබතුමන්ලාම තමයි සවුත්තු කරලා දැම්මේ, අවුරුදු 20ක් ඉන්න පුළුවන්ද කියලා. ජනාධිපතිතුමා කියපු කථාව අනුව, එතුමන්ලා බලයට ඇවිල්ලා මාස 6කින් මේ ටික ඔක්කොම විසඳනවා කිව්වා. හැබැයි, දැන් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. පාර වැරදිලාද දන්නේ නැහැ, කොයි පාරේ යනවාද දන්නේ නැහැ, දැන් හොයා ගන්න බැරිව ඉන්නේ. මේ රටේ මිනිස්සු JVP එකට ඡන්දය දුන්නේ ඔබතුමන්ලාගේ ආර්ථික හැකියාව මත නොවෙයි. ඒගොල්ලන් දැනගෙන හිටියා, ඔබතුමන්ලාට ආර්ථිකය මෙහෙයවන්න එතරම් දක්ෂකමක් නැහැ කියලා. ඒක නේ IMF එක පස්සෙන් යන්නේ. *[බාධා කිරීම්]* නැහැ, ඉතින් IMF එක පස්සෙන් නේ යන්නේ. මොකක්ද කරන්නේ? කවුද, ආර්ථිකය මෙහෙයවන්නේ? Papageorgiouද, කවුද, අර IMF එකේ ලොක්කා තමයි මේ ආර්ථිකය මෙහෙයවන්නේ. ඔබතුමන්ලා නොවෙයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එතුමායි, නන්දලාල් වීරසිංහයි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ඇත්ත කථා කරන්නකෝ. ලජ්ජා නැති වැඩේ නේ. මේ, IMF එක ගෙන යන රටක් නේ. ඔබතුමන්ලාට ඡන්දය දුන්නේ, ඔබතුමන්ලාට විනයක් තිබෙන නිසා සදාචාරාත්මක සමාජයක් ඇති කරයි, සමාජ සාධාරණත්වය ඇති කරයි, නීතිය හරියට ක්‍රියාත්මක කරයි, නීතියේ ආධිපත්‍යය රකියි, මේ රටේ දූෂණය නැති කරයි කියන විශ්වාසයෙන්.

අද ඒකත් නැති වෙලා නැද්ද? අද බලන්න. සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා දූෂණය, අරවා මේවා ගැන කථා කරනවා නේ. මම ඉස්සෙල්ලාම කියන්නේ, මෙතැනදී ගරු කථානායකතුමාට වගකීමක් තිබුණාය කියන එකයි. කන්ටේනර් තුන්සිය විසි ගණන ගැන විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා තීරණයක් ගත්තා. ඒ විශේෂ කාරක සභාව තවම පත් කරන්න බැරි ඇයි? ඇයි ඒක පත් කරන්නේ නැත්තේ, මොකක්ද ප්‍රශ්නය, මොකක්ද සඟවන්න බලන්නේ? එතැන ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට, කැබ් රථ එක්දහස් ගණනක් ගේනවා කිව්වා. මොනවාටද ඒ කැබ් රථ? මන්ත්‍රීවරුන්ටත් දෙනවා ලු. ඒ කාලයේ තමුන්නාන්සේලාම වේදිකාවල කිව්වා, මහජනයාට නැති වරප්‍රසාදයක් මන්ත්‍රීවරයෙකුට එපා කියලා. අපි මේ පාර්ලිමේන්තුවේදී කනවා ලු නැති වෙන්න. අද අපි කන්නේ නැහැ. අපි ඒ දවස්වල කෑවේත් නැහැ. අද කන්නේ ඔබතුමන්ලා. ඔබතුමන්ලාට දැන් කැබ් රථ මොනවාටද? ඇයි හදිසිය? ප්‍රශ්නය වන්නේ ඒ ප්‍රසම්පාදන ක්‍රමය කඩ කරලා කටයුතු කරන්නේ ඇයි කියන එකයි. හරි නම් ප්‍රසම්පාදන ක්‍රමය අනුව ටෙන්ඩරයක් ක්‍රියාත්මක කරන්න දින 49ක් තිබෙන්න ඕනෑ. දින 12කින් ඒ ටෙන්ඩරය දුන්නා. එතකොට ඒකේ වංචාවක් නැද්ද? එතැන ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. තමුන්නාන්සේලාට දැන් ඒ ප්‍රශ්නයත් එනවා. දැන් ආර්ථිකය හසුරුවන්නත් බැහැ, විනයකුත් නැහැ, ඔබතුමන්ලාගෙන් වැඩකුත් නැහැ. ඔක්කොම ෆේල්. ඒක තමයි යථාර්ථය.

මම තව එක කාරණයක් කියන්නම්. හර්ෂණ නානායක්කාර ඇමතිතුමනි, මෙහෙම ගල් පැළෙන බොරු කියන්න පුළුවන්ද? හරි, ආණ්ඩුවට ආවාට පස්සේවත් බොරු කියන එක නවත්වන්නකෝ. මෙතැනදී කියනවා, ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගන්නකොට ගෑස් ටැංකි පුපුරනවා ලු, කෑම පෝලිම් තිබුණා ලු. මොන පෝලිම්ද තිබුණේ? ඔබතුමන්ලා භාර ගන්නකොට මේ රටේ විදේශ සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.2යි. රුපියල හොඳටම ශක්තිමත් වෙලා, 2024 නොවැම්බර් මාසය වෙනකොට මේ රට සංවර්ධන මාර්ගයට වැටිලා ඉවරයි. ඒ වාගේ රටක් ඔබතුමන්ලා භාර ගත්තේ. බංකොලොත් වෙච්ච රට ආපහු හරවලා ඔබතුමන්ලාට දුන්නා. නිකම්ම නිකම් පිනට දුන්නා. ඒක තමයි, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වේ. ඔබතුමන්ලා හදපු දෙයක් නැහැ. හැබැයි, මෙහෙම තිබෙන රටක ගරු කථානායකතුමා, හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පස්දෙනෙක් ගිය මාසයේ ද, ගිය සතියේද එංගලන්තයට ගියා. කොහොමද ගියේ? SriLankan Airlines එකෙන්. ඊයේ ජනාධිපතිතුමා අඳෝනාවක් කළා, SriLankan Airlines එකේ පාඩුව විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා, SriLankan Airlines එක ගන්න මිනිහෙක් නැහැ, අපි මොකක්ද කරන්නේ කියලා. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? SriLankan Airlines එකේ economy class එකේ ticket අරගෙන business class එකට upgrade කර ගන්නවා. ඒක මොන ලජ්ජා නැති වැඩක්ද? ඔබතුමන්ලා බස් එකේ යනවා කියපු මිනිස්සු. මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මම SriLankan Airlines එක භාරව ඇමතිවරයා වශයෙන් හිටපු බව. ඒ විෂය භාර ඇමතිවරයා හැටියට මම ඒකේ economy class එකේ ගියේ. කිසිම දවසක මම මේ වාගේ upgrade කර ගත්තේ නැහැ. දැන් තමුන්නාන්සේලා මොකක්ද කියන්නේ? ඒ වාගේ සවුත්තු වැඩ කරනවා. එහෙම කරලා මෙතැන ඇවිල්ලා හරියට බුදු වෙන්න වාගේ කථා කරනවා. බුදු වෙන්න වාගේ කථා කරන්නේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
පයින් යනවා කියලා ආවේ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මේක තමයි යථාර්ථය. මේක තේරුම් ගන්න. මේ රට හැමදාම මුළා කරන්න බැහැ. ඇත්ත තේරුම් ගන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
බහින කලාව!

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ ගරු ජනාධිපතිතුමා මේ සභාවට ඇවිල්ලා 2026 අය වැය ලේඛනය ඉදිරිපත් කළා. එතුමා 2025 වර්ෂයේ සාර්ථක දර්ශක, ඉලක්ක ගැන කථා කළා. ඇත්තටම එතැනදී අපනයන වැඩිවීම, ජංගම ගිණුමේ අතිරික්තයක් තිබීම, අය වැය හිඟය අඩුවීම වාගේම බදු ආදායම වැඩිවීම යන කාරණා ගැන සතුට ප්‍රකාශ කරන්න, ප්‍රධාන විපක්ෂය හැටියට සමගි ජන බලවේගය ලෝභ වෙන්නේ නැහැ. ඒ මූල්‍ය දර්ශක සපුරා ගැනීම පිළිබඳව, 2024දී ලබා දුන්නු තත්ත්වය එහෙම ම පවත්වාගෙන යෑම පිළිබඳව බොහොම නිහතමානීව අපේ ස්තුතිය පළ කරනවා. අපේ සතුට අපි ප්‍රකාශ කරනවා. හැබැයි, මේ ඉලක්කවලට යන්න කවුද ගොදුරක් බවට පත් කළේ කියන ප්‍රශ්නය අපි අහන්න කැමැතියි. සමාජයේ කාටද වැඩියෙන්ම ඒ බර ඔසවන්න සිද්ධ වුණේ, මේ ඉලක්කවලට යද්දී කාටද වැඩියෙන්ම පීඩනය ඇති වුණේ කියන ප්‍රශ්න තිබෙනවා. 2024දී රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ විධියටම මේ ඉලක්ක ටික කිව්වා. මේ ඉලක්ක ටිකම සපුරා ගන්න එතුමාට හැකියාව ලැබුණා. ඒකම තමයි ඔබතුමන්ලා ගෙනියන්නේ. හැබැයි, සමගි ජන බලවේගය එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙනුත් මේ ප්‍රශ්න ටිකම ඇහුවා. අපි එතුමාගෙනුත් ප්‍රශ්න කළා. අද අපි අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගෙනුත් ඒ ප්‍රශ්නමයි අහන්නේ. මේ ඉලක්ක සපුරා ගන්න සමානුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කළාද එහෙම නැත්නම් අසාමාන්‍ය විධියට එක කොටසකට වැඩි බරක් ඇති කළාද කියන ප්‍රශ්නය අපි අහන්න කැමැතියි. අන්න ඒක තමයි වැදගත්ම ප්‍රශ්නය. 2025 අය වැය කථාවේදී ගරු ජනාධිපතිතුමා එතුමාට ලැබුණු ජන වරම ගැන කථා කරනවා. මම ඒක කියන්න ඕනෑ. 2025 අය වැය කථාවේ 4වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

> "කෙසේ වුවත්, ශ්‍රී ලංකාව තුළ පැතිරී ඇති දිළිඳුකම තුරන් කිරීම සඳහා මෙවැනි මුදල් ආධාර පමණක් ලබාදීම් තිරසාර විසඳුමක් නොවේ."

ඒ කියන්නේ අස්වැසුම දීලා මදි.

> විවිධ දුෂ්කරතා සහ අභියෝග හේතුවෙන් ඵලදායී ආර්ථික කටයුතුවල නිරත වීමට නොහැකි පුරවැසියන් රැක බලා ගැනීම මානුෂික රජයක යුතුකමයි."

ඊළඟට එතුමා කියනවා, වැදගත්ම වාක්‍යයක්.

> "සියලුම පුරවැසියන්ට ආර්ථික ක්‍රියාවලියට සහභාගි විය හැකි පරිදි අවස්ථා වැඩිදියුණු කර, එහි ප්‍රතිඵල සමාජයේ සෑම ස්ථරයකටම සාධාරණ ලෙස ලබා ගත හැකි අයුරින් ආර්ථික වර්ධනය සිදුවිය යුතුයි."

මෙහෙම කියන්නේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා, ගිය අය වැයේදී. ඉතාම වැදගත් දෙයක් එතුමා කියනවා. Inclusive growth තිබෙන්න ඕනෑ කියලායි එතුමා කියන්නේ. ඒ inclusive growth ගැන කියලා, හැමෝටම සාධාරණ ලෙස ආදායම බෙදී යන්න ඕනෑ කියලා එතුමා පිළිගන්නවා. හැබැයි, 2025 අය වැයෙන් ඒ වාගේ දෙයක් සිදු වෙලා නැහැ. ඒක අපි තහවුරු කරන්න ඕනෑ. 2026 අය වැයෙන් ඒ විෂමතාව තවදුරටත් වර්ධනය වනවා මිසක් අඩු වෙන්නේ නැහැ කියන එක අපට තහවුරු කරන්න පුළුවන්. ඒ නිසා ඔබතුමන්ලා ඒ දෙකෙන්ම ෆේල්. හර්ෂ ද සිල්වා මැතිතුමා පෙන්වා දුන්නා ඔබතුමන්ලාට ආර්ථික වැඩ පිළිවෙළක් නැහැ කියලා. මේ රටේ ජනතාවට සහනයක් ලබා දීමේදීත් ඔබතුමන්ලා ෆේල් වෙලා තිබෙන බව පැහැදිලියි.

2025, 2026 වර්ෂ සඳහා ඉදිරිපත් කළ අය වැය ඔබගේ චින්තනය, ඔබගේ මූලධර්මය මත පදනම් වූ අය වැය නොවෙයි කියන එකත් පැහැදිලි වෙනවා. මොකද, විටෙක ඔබ දේශපාලන වේදිකාවේදී ආර්ථිකයට අහිතකර වනවා කියපු, ජාතික ආරක්ෂාවට තර්ජනයක් වනවා කියපු, ස්වෛරීත්වයට පාඩුවක් වනවා කියපු ඒ හංවඩු ගහපු ප්‍රතිපත්ති ටික අද ඔබතුමන්ලා ක්‍රියාත්මක කරනවා, තමුන්නාන්සේලාගේම ප්‍රතිපත්ති වාගේ. පුදුමයි! ඇත්තටම අද තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති දිහා බලනකොට මට නම් මතක් වෙන්නේ, පිටිසර ගම්මානයක වියපත් මිත්තනියක් හේන්වලින් එකතු කරන කලවම් පලා මල්ලක් වාගෙයි. කිසිම සංයුතියක් නැති, වැඩ පිළිවෙළක් නැති ප්‍රතිපත්ති ටිකක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. කෙසේ වෙතත්, 2025 සහ 2026 අය වැය දෙකෙන් පෙන්නුම් කරන්නේ එක දෙයයි. ඒ අය වැය දෙකෙන්ම පෙන්නුම් කරන්නේ, 1971 විප්ලවයේදී ජීවිත පරිත්‍යාග කරපු ජේවීපී එකේ සහෝදරයන්, 1988-1989දී දහස් ගණනක් නැති වූ ජේවීපී සහෝදරයන් කරපු විප්ලවය වැරදි බව ඔබතුමන්ලා සනාථ කරනවා. ඒ විතරක් නොවෙයි, 76 වසරක් තුළ හැම ආණ්ඩුවක්ම කරපු ප්‍රගතිශීලී වැඩ කඩාකප්පල් කරන්න ඔබතුමන්ලා කරපු හැම ක්‍රියාවක්ම වැරදි බව මේ අය වැය දෙකෙන්, ඔබතුමන්ලා අනුගමනය මේ වැඩ පිළිවෙළින් සනාථ වනවා. ඒක තමයි මේකෙන් ඇත්තටම සනාථ වෙන්නේ. ඔබතුමන්ලා සම්පූර්ණයෙන්ම fail. අවුරුදු 60ක් තිස්සේ මේ රට පෙනී සිටපු ප්‍රතිපත්ති වැරදියි, වැරදියි කියලා ඒවාට විරුද්ධ වෙමින් ඔබතුමන්ලා කටයුතු කළා. හැබැයි, ඇත්ත වශයෙන්ම අද වනකොට අපේ ප්‍රතිපත්ති හරි කියලා පිළිගන්න තරම් අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට ආත්ම ශක්තියක් තිබීම පිළිබඳව අපේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කරන්න කැමැතියි. අන්තිමට අපේ line එකට එතුමා ඇවිල්ලා තිබෙනවා කියලා පෙනෙනවා. ඉතින්, මේක තමයි යථාර්ථය. එතකොට මේ අයවැයවලින් වෙන මොකක්ද වෙලා තිබෙන්නේ? මෙතැන ඔබතුමන්ලාට කට උත්තර නැහැ. 2025 සමස්ත අය වැයේ ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ බලන්න. කයිය ගහන්න හොඳයි. තමුන්නාන්සේලාට කථා කරන්න පුළුවන් හයිය තිබෙනවා, හැබැයි, කරන්න දන්නේ නැහැ. අද බිම් මට්ටමට ගිහිල්ලා බලන්න. *[බාධා කිරීමක්]* නැහැ, සංඛ්‍යාලේඛනවලින් පෙන්වන්නම්කෝ.

2025 -මේ යන අවුරුද්දේ- සමස්ත අය වැයෙන්, ඔබතුමන්ලා ඉදිරිපත් කළ ගිය අය වැයේ භෞතික ප්‍රගතිය සියයට 33යි; මූල්‍ය ප්‍රගතිය සියයට 21යි. එතකොට බලන්න කථාවට දක්ෂයි, ක්‍රියාවට දුර්වලයි. 2026 අය වැය ගන්න. ඊයේ ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ගන්න. එහි වියදම් යෝජනා 62ක් තිබෙනවා. අය වැය පොතේ අන්තිම පිටුවල ඒවා තිබෙනවා. ඒකෙන් සෘජු සංවර්ධන යෝජනා තිබෙන්නේ 13යි. ඒ යෝජනා 62ටම මුළු රාජ්‍ය ආදායමින් වෙන් කර තිබෙන්නේ සියයට 2යි. එතකොට මේ අයවැයවලින් ලොකු පින්තූරයක් පෙන්නුවාට, ඇත්ත වශයෙන්ම

[ගරු කබීර් හෂීම් මහතා]

මොකුත් සිද්ධ වෙන්නේ නැහැ. ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, ගිය අවුරුද්දේ වෙන් කරපු මුදල් භාවිත කරන්න, පාවිච්චි කරන්න. ඒකෙන් පෙනෙනවා, මේ රටේ මිනිස්සුන්ට දෙන පොරොන්දු මොන වාගේද කියලා. වතුකරයේ ඉන්න ජනතාව හිතාගෙන ඉන්නවා, ඒගොල්ලන්ට ඒ මුදල් ලැබෙයි කියලා. හැබැයි, ඒකට වෙන් කරපු මුදල මදි. හර්ෂ ද සිල්වා මැතිතුමා පෙන්නුවා ඒකට වෙන් කරපු මුදලත් මදි කියලා.

ආණ්ඩුව ගෙන යන මේ ප්‍රතිපත්තිය තුළින් ආදායම් විෂමතාව සහ ධන ව්‍යාප්තිය වැඩි කරනවා මිසක්, පුළුල් කරනවා මිසක් එය සංකෝචනය කරන්න මේ වැඩ පිළිවෙළින් ඔබ ක්‍රියාත්මක නොවන බව සහතික වනවා.

අය වැය ලේඛනයේ 48 වන පිටුවේ, 35 වන ඡේදයේ තිබෙනවා, 2026 වසරේ ආදායම් යෝජනා පිළිබඳව. ඒ ආදායම් යෝජනාවල මොකක්ද තිබෙන්නේ? එම යෝජනාවල තිබෙනවා, එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් ලියාපදිංචි සීමාව අඩු කරන බව. ඒ කියන්නේ, එම බදු දෙකම සඳහා ලියාපදිංචි වීමට කලින් තිබුණු වාර්ෂික පිරිවැටුම් සීමාව -threshold - මිලියන 60ක් තිබුණු ඕනෑම ව්‍යාපාරයක එය මිලියන 36 දක්වා අඩු කරන බව. දැන් ඒකෙන් මොකක්ද වෙන්නේ? ඒකෙන් වෙන්නේ දවසකට රුපියල් ලක්ෂයක පිරිවැටුමක් තිබෙන සෑම ව්‍යාපාරයක්ම VAT ගෙවීමට එකතු වනවා. ඒ කියන්නේ, VAT එක වෙනුවෙන් සියයට 18ක් වැඩිපුර ගෙවන්න ඕනෑ, ඒ පොඩි ව්‍යාපාර. ඒ වාගේම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද වෙනුවෙන් සියයට 2.5ක් ගෙවන්න ඕනෑ. ඒ කියන්නේ, කෙළින්ම සියයට 20.5ක් වැඩි වනවා ඔවුන් ගෙවිය යුතු බදු. ඊළඟට, සෙස් බද්දත් ගෙවන්න වනවා. ඒ ඔක්කෝම එකතු කළාම වෙන්නේ මොකක්ද? භාණ්ඩවල මිල වැඩි වනවා. මේවා කවුද කරන්නේ? සාමාන්‍යයෙන් ගමක, නගරයක තිබෙන සිල්ලර කඩයක් දවසකට රුපියල් 100,000ක බිස්නස් කරන්න පුළුවන්. ඊළඟට, කුළු බඩු, ඒ කියන්නේ, කරුංකා, සාදික්කා, කරාබු නැටි විකුණන, සුළු ආදායමක් ගන්න කඩයක් වෙන්න පුළුවන්, එළවලු කඩයක් වෙන්න පුළුවන්, මස් කඩයක් වෙන්න පුළුවන්, මාළු කඩයක් වෙන්න පුළුවන්, පොඩි පට්ටලයක් වෙන්න පුළුවන්, පොඩි garment factory එකක් වෙන්න පුළුවන් ඒ ඔක්කෝටම සිද්ධ වෙන්නේ මොකක්ද? ඒ බර ඒගොල්ලන්ගේ ඇඟට වැටෙනවා. ඊළඟට, පාරිභෝගිකයා වෙත තමයි ඒ බර පැටවෙන්නේ. මේක කාගේ නියෝගයක්ද? මේක IMF එකේ නියෝගයක්. ඒකයි මම කිව්වේ, මේ නියෝග දෙන්නේ, මේ රට දුවවන්නේ, run කරවන්නේ IMF එක කියලා. මේ ආණ්ඩුව නොවෙයි. කෙළින්ම ඒ නියෝගවලට යටත් වුණු, ඒ එකකටවත් කථා කරන්න හයියක් නැති, කොන්දක් නැති ආණ්ඩුවක්. හැබැයි, මේ බදු වැඩි කරන්න පුළුවන් මහා පරිමාණයේ සමාගම් තිබෙනවා. බලගතු ව්‍යාපාරිකයන්, ඒ වාගේම වෘත්තිකයන් ඉන්නවා. එම වෘත්තිකයන් ඇතුළේ ඉන්නවා වෛද්‍යවරු, නීතිඥවරු, ටියුෂන් ගුරුවරු හා දේශපාලනඥයන්. තමන්ගේ වත්කම් ටික ඉදිරිපත් කළ හොඳ වත්කම් තිබෙන දේශපාලනඥයෝ ඉන්නවා, ශතයක්වත් බදු ගෙවන්නේ නැති. ඔබතුමන්ලාට තිබුණා මේ බදු ඒගොල්ලන්ගෙන් අය කර ගන්න. හැබැයි, මේ බදු ටික අය කරන්න බලන්නේ, බදු දැල ව්‍යාප්ත කරන්න බලන්නේ, සාමාන්‍ය පොඩි මිනිසුන්ට. ඔවුන්ගෙන් කීයක් හෝ ගලවා ගන්නයි බලන්නේ. මේකෙන් ආදායම් විෂමතාව වැඩි වනවා මිසක්, තමුන්නාන්සේලා අර මාෆියාවට තවම අත තබා නැති බවයි පෙනී යන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනාධිපතිතුමා යටතේ තිබෙන මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2025 වසරේ පළමු මාස නවය සඳහා මූල්‍ය වාර්තාව නිකුත් කළා. ඒකේ සසඳනවා 2024 සහ 2025 වර්ෂ. ඒකේ කියන විධියට 2024දී ආදායම් බදුවලින් ලැබුණු ප්‍රමාණය රුපියල් බිලියන 743යි. 2025දී ඒක රුපියල් බිලියන 831කට වර්ධනය වෙලා තිබෙනවා. වර්ධනය සියයට 11යි. හැබැයි, VAT ආදායම 2024දී රුපියල් බිලියන 949යි. 2025දී ඒක වර්ධනය වෙලා තිබෙනවා රුපියල් බිලියන 1,239 දක්වා. වර්ධනය සියයට 31යි. එතකොට ඔබතුමන්ලා මේ පෙන්වපු දර්ශක, ඉලක්ක ඔක්කෝම ළඟා කර ගත්තේ කවුරුන් නිසාද? කවුද ඒ වෙනුවෙන් දුක් වින්දේ? ඔබතුමන්ලා මේ අය කර ගන්න හැම ආදායමක්ම ගන්නේ සාමාන්‍ය මිනිසුන්ගෙන්; සාමාන්‍ය ජනතාව පාරිභෝජනය කරන භාණ්ඩවලින් VAT එක අය කිරීමෙන්. ඔවුන් ගන්නා බෙහෙත්වලට -ඖෂධවලට- පාසල් පොත්වලට, කන බොන දේවල්වලට VAT එක ගහලා තමයි ඔබ මේ සියලු ඉලක්ක ටික පෙන්වන්නේ. 2026 අය වැය ලේඛනයේ 35වන ආදායම් යෝජනාවෙන් බදු දැල ව්‍යාප්ත කරලා, ගමේ කඩේටත් ඔබ අත තබා තිබෙනවා. මේක තමයි ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, SVAT කියලා ක්‍රමයක් තිබුණා. SVAT එක තිබුණේ අපේ රටේ දේශීය නිෂ්පාදකයන්ට. ඒකෙන් ඒගොල්ලන්ට සහනයක් ලැබුණා. මොකද, එය VAT එක refund කරන ක්‍රමයක්. හැබැයි, IMF එකෙන් කිව්වා, ඒක අයින් කරන්න කියලා. ඒක බලපාන්නේ කාටද? බලපාන්නේ මේ රටේ සුළු සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට සහ අපේ අපනයනකරුවන්ට. ඒ අයට මෙය ලොකු බලපෑමක් වනවා. SVAT එක අයින් කිරීම නිසා තේ කර්මාන්තයේ යෙදෙන කුඩා තේ වතු හිමියන්ගේ තේ මිල ඊයේ පෙරේදා රුපියල් 100කින් අඩු වෙලා තිබෙනවා. මෙය දිගටම බලපාන්නේ ග්‍රාමීය ආර්ථිකයට. මේකත් IMF එකේ නියෝගයක්. SVAT එක එකපාර අයින් කරන්න බැහැ කියන්න ඔබතුමන්ලාට කොන්දක් තිබුණේ නැහැ. විකල්ප ක්‍රමයක් හදන කල් මේක අයින් කරන්නේ නැහැ කියන්න ඔබතුමන්ලාට බැරි වුණා. ඒක තමයි ගැටලුව. අපට පෙනෙන හැටියට මේ රජය හිතන්නේ, බදු පමණක් අය කරලා මේ රටේ ආර්ථිකය නංවන්න පුළුවන් කියලායි.

එහෙම හිතනවා නම් ඒක මිථ්‍යාවක්. මොකද, මම හිතනවා යම් ජාතියක් සෞභාග්‍යය අරමුණු කරගෙන ජාතියටම බදු පැනවීමෙන් කරන්නේ බාල්දියකට බැසගත් මිනිසෙක් බාල්දි කොක්කෙන් අල්ලාගෙන බාල්දිය ඔසවන්න උත්සාහ කරනවා වාගේ වැඩක් කියලා. කොටින්ම කියනවා නම්, මේ ආණ්ඩුවේ 159දෙනා බාල්දියක් අස්සට රිංගාගෙන, ඒ බාල්දිය ඇතුළට අපේ රටේ ජනතාවත් දාගෙන බාල්දි කොක්කෙන් ඒ බාල්දිය ඔසවන්න උත්සාහ කරනවා වාගේ දෙයක් කරනවා කියලායි මට පෙනෙන්නේ. එහෙම බාල්දිය ඔසවන්න බැහැ නේ. ඒ නිසා බාල්දිය එකම තැන. හැබැයි ඉලක්ක ටික වැඩි වෙලා තිබෙනවා. ඕක තමයි කථාව. බදුවලින්ම රටක් ඔසවා තබන්න පුළුවන් කියලා හිතනවා නම් ඒක වැරැදියි. ඒකට සංවර්ධන සැලැස්මක් තිබෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා එක කාලයක කිව්වා, බදු ගෙවන්න එපා කියලා. දැන් දිගට හරහට, පාරේ යන පුංචි මිනිහාටත් බද්දක් අය කරලා දුවන්න බලනවා. මේක තමයි යථාර්ථය. ඉතින් මොකක්ද තිබෙන වෙනස? කියමනක් තිබෙනවා නේ, "නිරුවතින් පීනුවේ කවුදැයි අනාවරණය වෙන්නේ වඩදිය බැස ගියාට පසුවයි" කියලා. දැන් අපට ජේනවා නිරුවත, හොඳටම පෙනෙනවා. ඔබගේ ප්‍රතිපත්තිවල නිරුවත පෙනෙනවා. ඔබගේ නිහතමානි බවේ නිරුවත දැන් හොඳින්ම ප්‍රදර්ශනය කරනවා, ඔබතුමන්ලා දැන් ක්‍රියාත්මක කරන මේ වැඩ පිළිවෙළ තුළින්ම.

රජයේ 2025 මූල්‍ය ආර්ථිකයේ දත්ත, දර්ශක හොඳ වුණාට ප්‍රශ්න විශාල ප්‍රමාණයක් අපි ඒ දත්තවලින්ම දකිනවා. 2026 ලේසි

වෙන්නේ නැහැ. ඔබතුමන්ලා මේ දත්ත පෙන්වා මේ ආර්ථිකය ස්ථාවරයි කිව්වාට, අපි ඒක විශ්වාස කරන්නේ නැහැ. 2019 යහ පාලන ආණ්ඩුවේ අපි මේ රට බාර දෙන කොට මේ රටේ දරිද්‍රතාව සියයට 11ක් දක්වා අඩු කරලා තිබුණා. ඒක 2024 වන කොට සියයට 24ට වර්ධනය වුණා. 2022දී සියයට 30කට ගිහින්, ආයේ 2024දී සියයට 24ට ඇවිත්, 2025දී හෙවත් ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඒක සියයට 25ක නතර වෙලා තිබෙනවා. ඔබට ඒක අඩු කරන්න බැරි වෙලා තිබෙනවා, මේ අවුරුද්ද තුළ. ඔබතුමන්ලාගේ ගිය පාර අයවැයෙන් දුප්පත්කමට කථා කරලා තිබුණා නම් එය අඩු වෙලා තිබෙන්න ඕනෑ. එහෙම වුණේ නැහැ. මේ අයවැයවලින් පැහැදිලිව ඒක ආමන්ත්‍රණය කරලා නැහැ.

මූල්‍ය අංශයේ ප්‍රතිව්‍යුහගත කිරීම තුළින්, IMF වැඩ පිළිවෙළ තුළින් විෂමානුපාතික බරක් මේ රටේ පුංචි මිනිසුන්ට පැටවිලා තිබෙනවා. දුප්පත් අයටම තමයි ඒ බර වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා අපේ ජනගහනයෙන් සියයට 25ක් දරිද්‍රතාවෙන් පෙළෙන අය. ඒ කියන්නේ, ලක්ෂ 55ක් දුප්පත්කමින් පෙළෙන අය. ඊයේ ජනාධිපතිතුමා ඒ දුප්පත්කම පිළිබඳව විනාඩි 2ක්වත් කථා කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ බහුමාන දරිද්‍රතාව - multidimensional poverty - සියයට 56යි. ඒ පිළිබඳ අවදානම් තත්ත්වයක් මේ රටේ තිබෙන්නේ. මේ ආර්ථිකය දියුණු වුණා කියලා සංඛ්‍යාලේඛනවලින් මනින්න බැහැ.

1980 දශකයේ බ්‍රසීලය එම කලාපයේ, ලතින් ඇමෙරිකාව තුළ පැවැති දියුණුම රටක් වුණාට, වැඩිම සංවර්ධනය තිබුණු රටක් වුණාට, බ්‍රසීලය තුළ දුප්පත්කම, ආදායම් විෂමතාව ඉතාම වේගයෙන් වර්ධනය වුණු නිසා බ්‍රසීලය කඩා වැටුණා. ඒ නිසා, ආර්ථික ඉලක්කවලින්ම ඔක්කෝම බලා ගන්න බැහැ.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ සහ රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළ අතර තිබෙන වෙනස දිහා බැලුවාම, මට පෙනෙන හැටියට රනිල් වික්‍රමසිංහ මහත්මයා ගියේ එයාගේ වැල් පාලමේ, අනුර කුමාර දිසානායක මහත්මයා යන්නේ IMF වැල් පාලමේ. ඒක තමයි අප දකින වෙනස. එහෙම නැතුව අපට ලොකු වෙනසක් දකින්න නැහැ, මෙතැන.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වර්තමාන තත්ත්වය බලන්න. ලොකුවට කියනවා නේ, ඔක්කෝම වැඩි වුණා කියලා. නමුත් 2025 මාස 9ක් තුළ -සැප්තැම්බර් මාසය වනකල්- නිෂ්පාදිත අපනයනය වැඩි වෙලා තිබෙන්නේ ඩොලර් බිලියන 10.2ක් ලෙසයි. ඒක ඉතාම සුළු ඉලක්කයක්. අපේ නිෂ්පාදිත අපනයනය සහ සේවා අපනයනය එකතු කළාට පසුව ඩොලර් බිලියන 12ක් විතර එනවා. හැබැයි, 2025 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා ආනයන වියදම ඩොලර් බිලියන 15යි. ඔබතුමන්ලා කිව්වා නේ, මේ රටේ දේශීය නිෂ්පාදනය, ජාතික නිෂ්පාදනය වැඩි කරනවා කියලා. හැබැයි, වර්ධනය වෙලා තිබෙන්නේ අපනයනය නොවෙයි, ආනයනයයි. ජනාධිපතිතුමා ඊයේ විනාඩි 5ක් විතර ගත්තා, ඒ ගැන කියන්න. මේ ආනයනය වැඩිවීම තාවකාලිකයි, මේ ආනයනය කර තිබෙන්නේ අමුද්‍රව්‍ය, මේවා අතරමැදි භාණ්ඩ කියලා එතුමා කිව්වා. එහෙම වෙන්න බැහැ නේ. ආනයන වියදම වැඩි වෙලා තිබෙන එක පුදුමයක්. මොකද, මේ රටේ මේ වසර තුළ තෙල් මිල අඩු වෙලා තිබෙනවා. තෙල් මිල අඩු වුණාම අපේ සමස්ත ආනයන බිල අඩු වෙන්න ඕනෑ. ඒත් ඒක වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, මේවා අපනයනය කරන්න එන අමුද්‍රව්‍යත් නොවෙයි. මේ ආනයන අතර අපට ඕනෑ නැති පාරිභෝජන භාණ්ඩ ගොඩක් රට තුළට ඇවිල්ලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, වාහන ආනයනය සඳහා සැප්තැම්බර් මාසය දක්වා ඩොලර් බිලියන 1.8කට LCs විවෘත කර තිබෙනවා. එතකොට ඒකත් ආනයන බිලට එකතු වෙනවා. මොකද, මේ වාහන ටික අපි පාවිච්චි කරලා අපනයනය කරන්නද? කැලි කඩලා යවන්නද? ඒවා අතර ගොඩක්ම තිබෙන්නේ luxury වාහන. මේ වාහන ගෙන්වීම නිසා දැන් මේ රට තුළ වාහන අතිරික්තයක් තිබෙනවා. ඒ නිසා ලබන වසරේ ඔබතුමන්ලාගේ ජාතික ආදායමට එකතු වන බදු ආදායමත් අඩු වෙන්න යනවා. මොකද, ආයෙත් වාහන ගෙන්වලා මෙහේ විකුණන්න බැරි වෙනවා. එතකොට මොකක්ද වෙන්නේ? එතකොට අර ඉලක්ක ටික ඔක්කෝම වෙනස් වෙනවා. එහෙම නම්, අපි මේ තුළ තිරසාර සංවර්ධනයක් දකින්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ජංගම ගිණුමේ අතිරික්තය ඩොලර් බිලියන 1.9යි. ඒක ගැන ලොකුවට කථා කළා. හැබැයි, වෙළෙඳ හිඟය සියයට 23කින් වැඩි වෙලා, ඩොලර් බිලියන 5.7කට. මේ වෙළෙඳ හිඟයේ ලොකු අතිරික්තයක් තිබෙනවා. ඉතින් අපි කොහොමද හිතන්නේ අපේ ඉදිරිය හොඳයි කියලා? අපි කොහොමද හිතන්නේ, තිරසාර ව්‍යුහාත්මක සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා කියලා? අපට එහෙම හිතන්න බැහැ. අපට ඒ වාගේ නිගමනයකට එන්න බැහැ කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට කියන්න පුළුවන් වන්නේ මෙන්න මේ විධියටයි. මේ ආර්ථිකයේ විශාල වර්ධනයක් වෙලා තිබෙනවාය කියන එකට ආණ්ඩුව ගොඩක් දුරට පෙන්වන්න හදන සාධකය මොකක්ද? පෞද්ගලික අංශයට ණය මුදල් ප්‍රසාරණය. බැංකුවල credit growth එක වැඩි වෙලා තිබෙනවා කියන එක තමයි ආණ්ඩුව දිගටම පෙන්වන්නේ. පෞද්ගලික අංශය ලොකු ආයෝජන කරලා, ලොකු ව්‍යාපෘති කරලා, කර්මාන්ත ඇති කරනවා කියන එක ගැන කථා කරන්න මේ ණය මුදල් ප්‍රසාරණයක් ගැන කියනවා. හැබැයි, ඇත්ත තත්ත්වය මොකක්ද? ඒ ඇත්ත තත්ත්වය තුළ අපේ රටේ ජනතාව මේ ණය මුදල් පරිහරණය කර තිබෙන්නේ කොහොමද? 2024-2025 අතර කාලය තුළ අපි මෙය සංසන්දනය කර බැලුවාම පෙනී යනවා, මේ රටේ සාමාන්‍ය මිනිස්සු තමන්ගේ රත්තරන් ආභරණ උකස් කරලා ගත්තු ණය ප්‍රමාණය සියයට 73කින් මේ වසරේ වැඩි වෙලා තිබෙන බව. එතකොට කෙළින්ම ඒ ණය ප්‍රසාරණය වෙලා තිබෙන්නේ මිනිස්සු රත්තරන් භාණ්ඩ වැඩිපුර උකස් කර තිබෙන නිසායි. මිනිස්සු දුප්පත් වීම නිසා තමන්ගේ රත්තරන් බඩු උකසට තබා ණය ගන්නවා. මේක තමයි යථාර්ථය. එහෙම නම්, මේ රටේ නිෂ්පාදනයේ වැඩිවීමක් නොවෙයි වෙලා තිබෙන්නේ.

අනෙක් පැත්තෙන්, 2025 සම්පූර්ණ බැංකු ණය මුදල් ප්‍රසාරණය ගත්තාම, රුපියල් ට්‍රිලියන 1.6යි. හැබැයි ඒකෙන් වාහන ලීසිංවලටම ගිහින් තිබෙනවා, රුපියල් ට්‍රිලියන 1.1ක්. ඒ කියන්නේ සියයට 72ක්ම ගිහිල්ලා තිබෙන්නේ වාහන ලීසිංවලට. මේක නිෂ්පාදන පද්ධතියට, කර්මාන්තවලට, ආයෝජනවලට වූ ණය ප්‍රසාරණයක් නොවෙයි. එතකොට හිතන්න පුළුවන් වන්නේ කොහොමද, මේ කාල පරිච්ඡේදය තුළ අපේ නිෂ්පාදන පද්ධතිය තුළ, කර්මාන්ත තුළ, අපේ කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්තවල සංවර්ධනයක් සිදු වෙලා තිබෙනවා කියලා?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ නිෂ්පාදනය වැඩි නම්, අපනයනය වැඩි නම් විය යුත්තේ කුමක්ද? මේ වසරේදී භාණ්ඩාගාරයට සිද්ධ වුණා, ඩොලර් බිලියන 1.5ක ණය ගෙවන්න. ඩොලර් මිලියන 1,350ක් විදේශ ණය ලෙස ගෙවන්න සිද්ධ වුණා.

මුදල් අමාත්‍යාංශය සතුව තිබුණේ ඩොලර් මිලියන 545ක් විතරයි. ඉතුරු සල්ලි මහ බැංකුවේ අපේ විදේශ සංචිතවලින්

[ගරු කබීර් හෂීම් මහතා]

ගන්න සිද්ධ වුණා. ආණ්ඩුවට මේ තරම් ඩොලර් තිබෙනවා නම් ඇයි මහා භාණ්ඩාගාරයට මේ ටික ගෙවන්න බැරි වුණේ? මහ බැංකුවෙන් සල්ලි ගන්න සිද්ධ වුණා. යථාර්ථය බලනකොට ප්‍රාග්ධන වියදම කපලා, ප්‍රාග්ධන වියදම් නොකර, වාහන ගෙනැල්ලා ඒකෙන් ආදායම උපයලා යම් අතිරික්තයක් පෙන්වනවා. හැබැයි, මේ රටේ රැකියා උත්පාදනය කරන, මිනිස්සු පොහොසත් කරවන, දුප්පත් මිනිස්සුන්ට නිවාස ලබා දීම, වරප්‍රසාද ලබා දීම කියන එකක්වත් කරන්න පුළුවන් තිරසාර සංවර්ධනයක් මේ රට තුළ ඇති කිරීම ගැන මේ අය වැය දෙකෙන්ම ආමන්ත්‍රණය කරලා නැති බව අපට ඉතාම පැහැදිලිව පෙනී යනවා. JVP ආණ්ඩුව, IMF මාර්ග සිතියම ඉස්පිල්ලක්, පාපිල්ලක්වත් වෙනස් කරන්නේ නැතිව ක්‍රියාත්මක කරන ආණ්ඩුවක් කියන එක මේකෙන් ඔප්පු වෙනවා. IMF එකේ රාමුව භාවිත කරන්න අපට හැකිමක් තිබුණා. හැබැයි, ඒ මාර්ග සිතියමේ සමහර කොන්දේසි ඉවත් කරන්න අපි අනිවාර්යයෙන්ම තීරණය කරලා තිබුණා. හැබැයි, මේ ආණ්ඩුව ඒ හැම දෙයක්ම පිළිගෙන ඉවරයි.

මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ ගත්තාම, ඒ තුළින් අසමතුලිත, විෂමානුපාතික විධියට පොදු ජනයාට වැඩි බරක් වැදිලා තිබෙනවා. ඒක වැරදියි. අද ගෝලීය දකුණ - Global South - ගත්තොත්, අපි වාගේ රටවල් ගෙවිය යුතු ජාත්‍යන්තර ණය පිළිබඳව ලොකු සංවාදයක් රටවල් අතර ඇතිවෙලා තිබෙනවා. එක්සත් ජනපදය තුළ ආර්ථික විශේෂඥයන් කථා කරනවා, අපේ ණය ගෙවීම පිළිබඳව. ස්වෛරී බැඳුම්කර ණයවල, වාණිජ ණයවල පොලිය අඩු කරලා ඒ ගෙවීම් අඩු කරන්න, කප්පාදු කරන්න ඕනෑ කියලා ජාත්‍යන්තර තුළ සංවාදයක් ඇති වෙලා තිබෙන වෙලාවක, අනුර කුමාර දිසානායක මහත්මයා මේ ආණ්ඩු බලය ගත්ත ගමන් මොකක්ද කළේ? කිසිම කොන්දේසියක් දමන්නේ නැතිව ඒ හැම ඩොලරයක්ම ගෙවන්න එකඟ වුණා. පුදුමයි ඒ වැඩේ. මම කවදාවත් දැකපු නැති දෙයක් ඊයේ දැක්කා. ඊයේ ජනාධිපතිතුමා මෙතැන කථා කරද්දී කිව්වා, අපට 2024ට වඩා වැඩි විදේශ ණය ප්‍රමාණයක් ගෙවන්න සිද්ධ වුණා, අපි ගෙව්වා කියලා. ජනාධිපතිතුමා එහෙම ප්‍රකාශ කරනකොට මෙතැන හිටපු 159දෙනාම අත්පුඩි ගැහුවා. ණය වැඩියෙන් ගෙවනකොටත් අත්පුඩි ගහනවා. රටක ණය අඩු කරන්න ඕනෑ. හැබැයි, ණය වැඩියෙන් ගෙව්වා කියපු ගමන් 159දෙනාම අත්පුඩි ගැහුවා. මෙතැන ඉන්න 159දෙනාම පාපිසි 159ක් කියලා තමයි මම නම් හිතන්නේ. කියන හැම දෙයකටම ඔළුව හොල්ලනවා, තේරුම් ගන්නේ නැතිව. ඔබ දැන්වත් තේරුම් ගන්න ඔබ යන පාර වැරදියි කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉක්වදෝරයේ ජනාධිපතිවරයා IMF එකත් එක්ක තර්ක කළා, අය කරන ලද ණය ඒ විධියටම ගෙවන්න බැහැ, ඒ ගැන audit කරන්න කියලා. ඊට පස්සේ audit කරලා, ගෙවන්න තිබෙන ණය අඩු කරලා, පොලියත් අඩු කරලා අඩු මුදලක් ගෙවන්න පටන් ගත්තා. හැබැයි, ඔබතුමන්ලාට හයියක් තිබුණේ නැහැ ඒක කථා කරන්න. JVP එකට බලය දුන්නේ, මෙතෙක් කාලයක් IMF එක කියපු එකම කරගෙන යන්න නොවෙයි, ඒක වෙනස් කරන්න. හැබැයි, ඔබතුමන්ලාට ඒක කර ගන්න හයියක් තිබුණේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට වෙලාව මදි. නමුත් මම අන්තිමට කියන්න කැමැතියි මේ කාරණයත්. සෝමවංශ අමරසිංහ මැතිතුමා කියන්නේ ඔබතුමන්ලාගේ JVP එකේ හිටපු නායකයෙක්. එතුමා 2015දී පැවති මාධ්‍ය සාකච්ඡාවකදී JVP එක ගැන කථා කළා. JVP එකේ සාමාජිකයන්ට ගැඹුරු ඉලක්කයක් තිබෙනවා කියලා එතුමා කිව්වා. එතුමා කිව්වා, පොදුජන ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ සාධාරණත්වය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණේ සෑම සාමාජිකයෙක්ම සටන් කළ යුතුයි කියලා. ඒ වාගේම ඔබතුමන්ලාත් බලයට එන්න කලින් කිව්වා, මාක්ස්, ලෙනින්, චේ ගුවේරා සහ ෆිදෙල් කැස්ත්‍රෝ යන පාරේ අපි යන්න ඕනෑ කියලා. හැබැයි, අද ඔබතුමන්ලා ඒ ප්‍රතිපත්ති පාවා දීලා තිබෙනවා.

ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා අද යන්නේ අර IMF වැල් පාලමේ. 2026 අය වැයෙනුත් මේ රටේ ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්නවලට නිසි උත්තර දෙන්න ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා. ඔබතුමන්ලා ඒකෙනුත් ෆේල්.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් වටගල රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.34]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එතුමාගේ කථාව ඇතුළේ මොකක්ද නිරුවත් කථාවක් කිව්වා; කවුද මේ නිරුවත් වෙලා ඉන්නේ කියලා. ජනාධිපතිවරයාගේ ඊයේ අය වැය ලේඛනයෙන් පස්සේ විපක්ෂය විසින් එළියේ දීපු voice-cutsවලින් පෙනෙනවා, කවුද නිරුවත් වෙලා ඉන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ඔබතුමන්ලා යන පාර වැරදියි, ඒක දැන්වත් දැනගන්න" කියලා දැන් කබීර් හාෂිම් මන්ත්‍රීතුමා කිව්වා නේ. එතුමන්ලාට අවුරුදු හැත්තෑ ගාණක් බලය දීලා එතුමන්ලා යන පාර දිහා අපි බලාගෙන හිටියා. අන්තිමට තනි වචනයක් ආවා, "රට බුන්වත්" කියලා. එතකොට, එතුමා හිතාගෙන ඉන්නවා ඇති බුන්වත් පාර තමයි හොඳ පාර කියලා. මාර පාරක් ඒක!

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක තමයි පාර.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඒක තමයි පාර.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එක දෙයක් කියන්නම්. මේ අය වැය ජනතාවාදී අය වැයක් කියන එකට උදාහරණ කීපයක් තිබෙනවා. ජනාධිපතිවරයාම මේ සභාවේ කිව්වා, එක දෙයක් නිසා තමයි අද විපක්ෂයට කට උත්තර නැත්තේ කියලා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා 45 minutes අරගෙන

තවත් විනාඩි 10ක්ද, 15ක්ද අරගෙනත් කථා කළා. එතුමාට පැයක් දුන්නා. ඊට පස්සේ වැඩිම වෙලාවක් කථා කළ කථිකයා තමයි කබීර් හාෂිම් මන්ත්‍රීතුමා. මට කියන්න, මොනවාද මේ අය වැයට එරෙහිව ආපු හරයාත්මක විවේචනය? ජනාධිපතිවරයාගේ අය වැය ඇතුළේ එතුමන්ලාට පළමුවෙන්ම කියන්න සිද්ධ වෙලා තිබෙන වචන කීපයක් තිබෙනවා. "අය වැය හොඳයි, සාධනීය පැති තිබෙනවා, එහෙත්..." කියලා තමයි එතුමන්ලාට කථාව පටන් ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අන්න එතැනට අද ආණ්ඩුව විසින් විපක්ෂය වට්ටලා තිබෙනවා, ගෙනැල්ලා තිබෙනවා. අන්න ඒක දැන ගන්න. මේ අය වැයේ මූලික ලක්ෂණය වුණේ මොකක්ද? මූලික ලක්ෂණය වෙන මොකක්වත් නොවෙයි, කලින් අවුරුදු හැත්තෑ ගාණේදි ඉදිරිපත් කළ අය වැයවලට වඩා වෙනස් අය වැය දෙකක් අපි ඉදිරිපත් කිරීම. පළමුවැනි අය වැයෙන් අපි කිව්වේ මොකක්ද? මේක ජනතාවාදී අය වැයක්. *[බාධා කිරීමක්]* ජනතාවගේ පටිය තද කර ගන්න කියපු කලින් පාලකයෝ වෙනුවට, පාලකයෝ පටිය තද කරගෙන *[බාධා කිරීමක්]* ජනතාවගේ පටිය ලිහලා තිබෙන්නේ. ඒක තමයි වෙනස. අන්න, ඒක තමයි මේ අය වැයේ හරයාත්මක වෙනස. *[බාධා කිරීමක්]* ඒක කියනකොට කෑ ගහනවා. ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමනි, අපේ ජයග්‍රහණයේ මූලික දේ තමයි මහජන මුදල් අවභාවිත නොකර, රාජ්‍ය මූල්‍ය හරියට කළමනාකරණය කරන ආණ්ඩුවක් තිබීම. එතකොට අපේ ආණ්ඩුව රාජ්‍ය මූල්‍ය හරියට පවත්වාගෙන ගිය ආණ්ඩුවක් නිසා තමයි අවුරුද්දක් යනකොට මෙවැනි සාධනීය අය වැයක් අපට ඉදිරිපත් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ. ඉතින්, ඒ මූලික සාධක දෙක සාර්ථක වූ නිසා අද විපක්ෂයට කට උත්තර නැතිවෙලා තිබෙනවා.

දැන් කිව්වා නේ, නීතියේ ආධිපත්‍යය නිකම් පෙන්වාගෙන ගියා කියලා. අපි නීතියේ ආධිපත්‍යය හරියට රැක්කා කියන පැත්තට තමයි උදාහරණ තිබෙන්නේ. අපි නීතියේ ආධිපත්‍යයේ අනෙක් පැත්තට ගියා කියන එකට උදාහරණත් ඔයගොල්ලන්ට නැහැ. අන්න ඒක දැන ගන්න. චාමර සම්පත් මන්ත්‍රීතුමා මේ සභාවේදී අපට අභියෝගයක් කළා. ඒ මොකක්ද? එතුමා කිව්වා, ලසාගේ ඝාතනයේදී දේශපාලනය මැදිහත් වුණා කියලා. එතුමා මේ පාර්ලිමේන්තුවට අභියෝගයක් කළා, පුළුවන් නම් දවස් තුනක් ඇතුළත වෙඩික්කරුවෝ අල්ලන්න කියලා. මහජන ආරක්ෂක ඇමති ඒ අභියෝගය භාර ගත්තා. දවස් දෙකහමාරකින් වෙඩික්කරුවෝ අත්අඩංගුවට ගත්තා. තේරුණා ද? දවස් දෙකහමාරෙන් අත්අඩංගුවට ගත්තා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එයාම කරලා එයාම ඇල්ලුවා.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ආවාට ගියාට වචන පාවිච්චි කරන්න එපා. *[බාධා කිරීම්]* අපට කියන්න, ඒ අභියෝගය තිබ්බෙ දේශපාලනය? නැහැ. *[බාධා කිරීමක්]* වෙඩික්කරුවෙක් ඇවිල්ලා වෙඩි තැබුවා. අපි ඒ වෙඩික්කරු අත්අඩංගුවට අරගෙන තිබෙනවා. බයිසිකල් පැදිකරුවත් අත් අඩංගුවට ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒකයි වෙනස. *[බාධා කිරීමක්]*

ඔයගොල්ලෝ බලාගෙන හිටියා, අනුරාධපුර උදාහරණයෙන් අපට බැටේ දෙන්න. අපි අනුරාධපුර සිද්ධිය හරියටම කළමනාකරණය කරලා තිබෙනවා. අපි පොලීසියේ කටයුතුවලට මැදිහත් වෙන්නේ නැහැ කියන එකට, අපේ එකෙක් වරදක් කළත් අපි ඒකට මැදිහත් වෙන්නේ නැහැ කියන අභීත ආදර්ශය අපි දීලා තිබෙනවා; කට උත්තර නැති වෙන්න දීලා තිබෙනවා. තේරුණාද? ඒ නිසා නීතියේ ආධිපත්‍යය ගැන කථා කරන්න දෙයක් නැහැ. අපි නීතියේ ආධිපත්‍යය හරියටම රකිනවා.

ඒකට හේතුව තමයි අපි ආයතන ස්වාධීන කරලා, ඒ ස්වාධීන කරපු ආයතන ඇතුළේ නීතිය ක්‍රියාත්මක වීම.*[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකයි අපි කියන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඇයි, අර මන්ත්‍රීතුමිය අත්අඩංගුවට ගත්තේ නැත්තේ? *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මම දෙන්නම් උත්තර. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
අහගෙන ඉන්නකෝ, උත්තරේ. *[බාධා කිරීම්]* අහගෙන ඉන්න උත්තරේ. අහගෙන ඉන්න. *[බාධා කිරීමක්]* වාඩි වෙන්නකෝ, ඔබතුමාට උත්තරේ දෙන්න.*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව නිහඬ වෙන්න. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විනයක් තියා ගන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ ආයතනවල කටයුතුවලට මැදිහත් වෙන්නේ නැහැ. ඒ මන්ත්‍රීතුමියගේ නිවස පවා පරීක්ෂා කරලා තිබෙනවා. ඔයගොල්ලන්ගේ කාලයේ නම් මන්ත්‍රීවරුන්ගේ නිවෙස් පරීක්ෂා කරන්න ඉඩ දුන්නේ නැහැ, ගිහිල්ලා බදා ගත්තා. අන්න ඒක තේරුම් ගන්න. හරිද? *[බාධා කිරීම්]* ඔයගොල්ලන්ගේ කාලයේ ගිහිල්ලා, - *[බාධා කිරීම්]* ඔයගොල්ලන්ගේ කාලයේ මේවා කරන්න ඉඩ දුන්නේ නැහැ.*[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
සභාව නිහඬ වෙන්න.*[බාධා කිරීම්]*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ඔබතුමන්ලාගේ හවුල් ආණ්ඩු. ඔබතුමන්ලාගේ හවුල් ආණ්ඩුවල පාලකයෝ එහෙමයි කළේ. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි නොවෙයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හරි, අපි නොවෙයි කිව්වාට ඔබතුමන්ලාගේ කට්ටිය. ඔබතුමන්ලා හවුලේ ආණ්ඩු කරපු කට්ටියගේ නායකයෝ තමයි එහෙම කළේ. *[බාධා කිරීම්]*

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
අපි මහින්ද ගෙනාවේ නැහැ. ඔබතුමන්ලා තමයි ගෙනාවේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාව ඇතුළේ e-visa සිද්ධිය ගැන කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, e-visa සිද්ධිය පිළිබඳව මේ ආණ්ඩුවට විවේචනයක් නැහැ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඒකට හේතුව තමයි මේ වෙනකොට ඒ පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 8ක් විභාගයට ගෙන තිබීම. එළඹෙන 17වැනි දා arguments ගන්නවා. ඊට අමතරව, ඒ ගැන විගණකාධිපති වාර්තාවක් දීලා තිබෙනවා. එම වාර්තාව ඇතුළේ සිද්ධියක් තිබෙනවා. ඒ සිද්ධිය මොකක්ද? එතැන කොන්දේසියක් තිබෙනවා. ඒ කොන්දේසියේ කියන්නේ මොකක්ද? ඒ කොන්දේසියේ කියනවා, "ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින නඩුකරවල තීරණවලට යටත්ව ඉදිරියේදී වඩා සුදුසු e-visa ක්‍රමයක් විනිවිදභාවයකින් යුතුව, සුදුසු ලංසු කැඳවීමක් මඟින් සේවා සපයන්නෙකු තෝරා ගැනීම අපි නිර්දේශ කරමු" කියලා. ගරු මන්ත්‍රීතුමා, දැනටමත් ඒ ගැන නඩු 8ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතිනවා. ඒවා විභාගවීමෙන් අනතුරුව මේ කොන්දේසිය අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒ නිසා මේ ආණ්ඩුවේ ප්‍රශ්නයක් එතැන නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට මේ දායාද ලැබුණේ කිලෝමීටර තුන හතරේ පෝලිම් එක්කයි. මීට අදාළ සියලු මැදිහත්වීම් කරලා, ඒ අදාළ මැදිහත්වීම් ඇතුළේ අද ඒ සියලු ප්‍රශ්න බේරලා තිබෙනවා. අද ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ ඊට අදාළ විවේචනය ගත්තොත්, මේ ආණ්ඩුවට ඒ ගැන විවේචනයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මේ අය වැය ඇතුළේ "රටම එකට" ජාතික මෙහෙයුම වැඩසටහන සඳහා රුපියල් මිලියන 1,500ක් වෙන් කරලා තිබෙනවා. අපි කවුරුත් මේ වැඩසටහන සාර්ථක කර ගන්න මැදිහත් වෙන්න ඕනෑ. මොකද, මේකත් අවුරුදු 70 ගණනක් ඇතුළේ මේ රටේ අයිස්, කුඩු, ගංජා වසංගතයට අදාළව දේශපාලනය මැදිහත් වෙලා, දේශපාලනය විසින් එය පෝෂණය කරලා හදලා වඩලා ගෙනැවිත් දීපු දායාදයක්. ඒකත් අපේ ජනාධිපතිවරයාට තමයි බාර ගන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් දිස්ත්‍රික් සංවිධාන හදලා, ප්‍රාදේශීය සංවිධාන හදලා, ගමේ මහජන ආරක්ෂක කමිටු හදලා ඒ නිශ්චිත සංවිධාන ව්‍යුහය ඇතුළේ අද මේ වැඩසටහනට අපි අත ගහලා තිබෙනවා. මේ ව්‍යසනයට ගොදුරු වුවන් අතර බාල, තරුණ, මහලු භේදයක් නැහැ. ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද කියලා භේදයක් නැහැ. සිංහලද, ද්‍රවිඩද, මුස්ලිම්ද කියලා භේදයක් නැහැ. ඒ නිසා මේ තිබෙන ව්‍යසනය අනෙක් පැත්තට හරවන්න නම් සියලුදෙනාම එකාවන්ව එක කුඩේ යටට එකතු වෙන්න ඕනෑ. කරුණාකරලා ඒ සඳහා අපට සහයෝගය දෙන්න කියලා මේ වෙලාවේ විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් තමයි අද මෙම ජාතික මෙහෙයුම වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ.

ඒක නිසා, සෑම දිස්ත්‍රික්කයටම ගිහිල්ලා දිස්ත්‍රික් සංවිධාන හදලා, මේ රට අගාධයට දමලා තිබෙන මෙන්න මේ ව්‍යසනය වැළැක්වීම සඳහා කටයුතු කිරීමට මහජන ආරක්ෂක අමාත්‍යාංශය ලෙස අපට පුළුවන් වෙලා තිබෙනවා. කරුණාකරලා විපක්ෂය අඩුම තරමින් මේකටවත් අපට සහයෝගය දෙන්න කියලා මේ වෙලාවේ මම ඉල්ලීමක් කරනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මම කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වයක් ගැන කථා කළා. අපට ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වය ගැන කථා කරන්න දෙයක් නැහැ. මේ ආණ්ඩුවේ අපි, ප්‍රජාතන්ත්‍රවාදය ඕනෑතරම් දීලා තිබෙනවා. ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වය ගැන කථා කරනවා නම්, අපේ පක්ෂයේ නායකවරු හිර කරන්න එදා විවිධ විධියේ කොමිෂන් සභා අරගෙන ආපු බව අපි දන්නවා. වර්තමාන ජනාධිපතිවරයා සහ මහජන ආරක්ෂක අමාත්‍යවරයා මේ තත්ත්වයට මුහුණ දුන්නා කියලා අපි දන්නවා. එතුමන්ලා කොමිෂන් සභාවකට අරගෙන ගියා. ඒ කොමිෂන් සභාව මඟින් එතුමන්ලාට දඬුවම් දෙන්න හැදුවා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය මැදිහත් වෙලා තමයි ඒවා ආපස්සට හරවන්න පුළුවන් වුණේ. ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වය කියන්නේ ඒගොල්ලන්ට ඕනෑ විධියට නීතිය නවලා ගෙනාපු දේවල්. අද ලංකාවේ ප්‍රථම වතාවට අපේ ආණ්ඩුව කාලයේ තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පිටින් යන්නේ නැතුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටින් ඉඳගෙන රට පාලනය කරන ජනාධිපතිවරයෙක් බිහි වෙලා ඉන්නේ. මේ රටේ පළමුවැනියාගේ සිට අටවැනියා දක්වා හිටපු ජනාධිපතිවරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා කියලා ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ඇතුළේ ලියලා තිබෙනවා. ඒක නිසා ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වය කියන්නේ ඒගොල්ලන්ට ප්‍රතිබන්ධනයක් - estoppel - වෙන එකක් කියලා අපි කියනවා. ඒ නිසා ඒක අපට අදාළ දෙයක් නොවෙයි, ඒ අයට අදාළ දෙයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැයෙහි තිබෙන සාධනීය තත්ත්වය ගැන අපට අමුතුවෙන් කියන්න දෙයක් නැහැ. මේ රටේ ජනතාවට ඒක හොඳින් දැනෙනවා. ඊයේ මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය කටයුතු කරපු ආකාරය මම දැක්කා. මෙවර අය වැය ගැන නම් විපක්ෂය

එළියට ගිහිල්ලා අර මයික්වලට ඇත්ත, සාධනීය දේ කියයි කියලා මට හිතුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් ඒක එහෙම වුණේ නැහැ. මෙහෙම දෙයක් තිබෙනවා. මේ අය වැය ගැන අපි සාධනීය දේ දකිනවා වාගේම, විපක්ෂයට ඕනෑ නම් මේ අය වැයේ එතුමන්ලාට අහුවෙන නිෂේධනීය කාරණා ඉදිරිපත් කරන්නත් පුළුවන් කියලා මම විශ්වාස කරනවා. ඒකට නේ, විපක්ෂයක් ඉන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි මේ දිහා දෙපයින් හිටගෙන බලන්න ඕනෑ. මොකද, ඔළුවෙන් හිට ගත්තොත් ඒක සම්පූර්ණ විකෘතියක් වාගේ තමයි පෙනෙන්නේ. මේ අය වැය සම්බන්ධයෙන් ඔළුවෙන් හිටගෙන බලපු දේවල් ටිකක් තිබෙනවා. අනෙක් එක, මේ ඉදිරිපත් කරපු අය වැයේම පැටලිලිසහගත සමහර දේවල් තිබෙනවා නම් ජනාධිපතිතුමා එවෙලේම ඒ පැටලිල්ල පවා ලිහලා ගියේ. ඒ නිසා මේ ගැන ආයේ ඇත්තටම කිසිම දෙයක් කථා කරන්න නැහැ.

අතීතයේ මේ සභාවේ අය වැය ලේඛන කියවපු මුදල් ඇමතිලා ඒ අය වැය ලේඛන කියෙව්වේ කොහොමද කියලා අපි දන්නවා නේ. ඇත්තම කියනවා නම් ජනාධිපතිතුමා මේ අය වැය ගැන ආපහු කාටවත් ප්‍රශ්නයක් මතු කරන්න ඉතුරු කළේ නැහැ. ඒ සියල්ල ලිහලා ගියේ. ආණ්ඩු පක්ෂයට තිබුණු ප්‍රශ්නත් ලිහුණා. ඒ වාගේම විපක්ෂයේ ඒවාත් ලිහුණා. නමුත් දැන් කරන්නේ මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සර ගම් සභා තිබ්බ කාලයේ මැම්බර්ලා හිටියා. එහා ගමේත් මැම්බර් කෙනෙක් ඉන්නවා, මෙහා ගමේත් මැම්බර් කෙනෙක් ඉන්නවා. යම් සිද්ධියක් ගැනයි මම මේ කියන්න යන්නේ. උඩහ ගමේ මැම්බර්ට එන්න කියලා පහළ ගමේ මැම්බර් අවුරුද්දට පාටියක් දෙනවා. මේ පාටියට උඩහ ගමේ මැම්බර්ටත් ආරාධනා කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතින් අද වාගේම තමයි ඉස්සරත් ඒවායේ රහමෙර කොහොමත් තිබුණා. එතකොට අර ආගන්තුක යාළු මැම්බර්ට සාමාන්‍ය රහමෙර දෙන්නේ නැහැ. මොනවාද දෙන්නේ? අර කියනවා නේ පළතුරු යුෂවලින් හදන අරක්කු ගැන. ඒ පළතුරු යුෂවලින් හදන අරක්කු තමයි එයාට දෙන්නේ. ඒවා කැළේ පෙරන ගෝඩා එහෙම නොවෙයි. වැඩි හොඳට පළතුරු යුෂවලින් හදන අරක්කු තමයි දෙන්නේ. දීලා ඉවර වෙලා අහනවා, "මැම්බර් මහත්තයා අරක්කු ටික කොහොමද?" කියලා. "අපෝ, අපේ මස්සිනා ගේනවා ටොප් ඒවා. මේ මොකක්ද, මේක පල් රහයි නේ" කියනවා.

ඊට පස්සේ ඊළඟ අවුරුද්දේත් ආරාධනා කරලා, ඊට වඩා හොඳට අරක්කු හදලා දෙනවා. දීලා අහනවා, කොහොමද කියලා. "අයියෝ, අපේ මස්සිනාගේ ඒවා මීට වඩා ටොප්" කියලා බැණ බැණ යනවා. "මොනවාද වගයක් දුන්නා අර යකා" කියලා බැණ බැණ යනවා. ඊට පස්සේ ඊළඟ අවුරුද්දේ අර මැම්බර් මොකද කළේ? යාළුවාට ආරාධනා කරලා, පලතුරුවලින් හදලා දෙන අරක්කු නතර කරලා ඒ යාළුවාගේ මස්සිනාගෙන්ම බඩු ගෙනැල්ලා දුන්නා. දීලා ඇහුවා, කොහොමද කියලා. "අපෝ, මොනවාද මේ, අපේ මස්සිනාගේ ඒවා ටොප් නේ" කියනවා. හැබැයි ඒවා ඒ මස්සිනාගේම බඩු. මේ අය වැයත් ඒ වාගේම තමයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මිදි යුෂ හදලා දුන්නත් මේගොල්ලන්ට මෙලෝ රහක් නැහැ. මිදි යුෂ මට්ටමේ අය වැයක් හදලා දුන්නත් මේගොල්ලන් කියයි, "මෙලෝ රහක් නැහැ" කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කියන්නේ ඔළුවෙන් හිටගෙන නැතිව දෙපයින් හිටගෙන මේ කියන ඇත්ත කාරණා මේ විපක්ෂයට හොයා ගන්න පුළුවන් වෙන්න ඕනෑ කියන එකයි. මොන තත්ත්වයක් යටතේ ද අපි මේ අය වැය හදලා තිබෙන්නේ? මේ රට මොන විධියට තිබුණු රටක් ද? මේ අය වැය එවැනි තත්ත්වයක් තුළ හදපු අය වැයක්. ඇත්තටම සමහර වෙලාවට මේ විපක්ෂය කරන මේ සමහර විවේචන, තව අවුරුදු 5කින් විතර අපේ අවසාන අය වැයේ දී කරන්න ඕනෑ විවේචන.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2025 වසරේ අපේ පළමු අය වැය කියන්නේ ඇත්තටම මාස 8ක අය වැයක්. නමුත් එහි ප්‍රගතිය කථා කරනකොට එක මන්ත්‍රීවරයෙක් කිව්වා, දවස් 365ක කථාවක්. දවස් 365ක් අපේ අය වැයට තිබුණේ කොහේද? ඒකට මාස 8යි තිබුණේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ කාලය තුළ තමයි අපි මේ ප්‍රගතිය ලබාගෙන තිබෙන්නේ. මේ අවුරුද්දේත් තව මාස දෙකක් ඉතිරිව තිබෙනවා. මේ මාස දෙක ඇතුළතත් මේ වැඩ කෙරෙනවා. කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති හැටියට මම දන්නවා, පසුගිය අය වැයේ ප්‍රගතිය අපි සියයට 80 පන්නන බව. සමහර විට එය සියයට 70 වාගේ තැනකට එන්න පුළුවන්. හැබැයි, අපි සියයට 80 පන්නන්න වැඩ කරනවා. හැම දිස්ත්‍රික්කයකම එහෙමයි. දැන් කවුරුත් මේ පිළිබඳව දන්නවා. මේවා නොදන්නා දේවල්ද? මේ පාර්ලිමේන්තුවේ ඔය විවේචන ඉදිරිපත් කරපු මන්ත්‍රීවරුන් දන්නේ නැද්ද, අවුරුද්දක ප්‍රගතිය එන්නේ කොහොමද කියලා? දන්නවා. මීට කලින් කවදාවත් අය වැයක ප්‍රගතිය ගිහිල්ලා තිබෙනවාද සියයට 60ට, සියයට 70ට? නැහැ. බොහෝ වෙලාවට සියයට 50න් ප්‍රගතිය නතර වෙනවා. හැබැයි දැන් අපි 2025 අවුරුද්දේ ප්‍රගතිය සියයට 60 ඉක්මවා තිබෙනවා. ඉතින් මේ අය මොකක්ද මේ කරන්නේ? මේ කරන්නේ බොරුවක්. මේ තරම් විශ්ලේෂණාත්මකව දකින්නේ නැති, රූපවාහිනියෙන් මේ විවාද බලාගෙන ඉන්න ගමක කෙනෙක් නම් හිතනවා මේ ආණ්ඩුව අසාර්ථකයි කියලා. මේ ඇති කරන්න උත්සාහ කරන්නේ ඒ මතය තමයි. එහෙම නැතිව බැලුවොත්, ඇත්තටම අපේ රට ඉස්සරහට ගෙන යන පසුගිය අය වැයට ලබා දෙන තවත් ජීවයක් තමයි, 2026 අවුරුද්දේ අය වැය කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අයවැයේ විශේෂ දෙයක් තිබෙනවා. පසුගිය කාල වකවානුවල පැවති පාලන කාල තුළ අපි රස්තියාදු ගහපු මිනිස්සු වුණා. රස්තියාදු ගහනවා කිව්වාට, මම පෞද්ගලිකව රස්තියාදු ගැහුවා නොවෙයි. අපේ ජීවිත, මේ රටේ මිනිස්සුන්ගේ ජීවිත වැඩි කාලයක් ගත වුණේ රස්තියාදුවෙන්. ආයතනයකට ගිහිල්ලා වැඩක් කර ගන්න බැහැ. ඒවායේ කිසි විනයක් නැහැ, පාලනයක් නැහැ. හැබැයි ඒ ආයතනවල පාලනයයි, විනයයි දැන් අපි හදලා තිබෙන්නේ. තවදුරටත් ඒ විනය සහ පාලනය හදන්න පුළුවන් ආකාරයට රාජ්‍ය අංශය කාර්යක්ෂම කිරීමක් මේ අය වැය ඇතුළේත් තිබෙනවා. ඒ නිසා තමයි අතීතයේදී දීලා තිබුණේ නැති, හංගලා තිබුණු, ඒ මිනිස්සුන්ට ලැබිය යුතු දේ පවා ලබා දීමට අවශ්‍ය දේවල් ටික අපි මෙවර දෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි උපතින්ම දේශපාලනය කරන්න ආපු, ප්‍රතිරූප හදාගෙන ආපු මිනිස්සු නොවෙයිනේ. ඒ නිසා අපට ඕනෑ තරම් එවැනි අත්දැකීම් තිබෙනවා. සමහර වෙලාවට පෞද්ගලික ජීවිතයේ වැඩ කර ගන්න රාජ්‍ය ආයතනවලට ගිහිල්ලා ලැබුණු අත්දැකීම් අපටත් තිබෙනවා. එක මේසයක් උඩ තිබෙන ෆයිල් එක අල්ලපු මේසෙට යන්න පමණයි තිබෙන්නේ. හැබැයි, ඒ ෆයිල් එක අල්ලපු මේසෙට යනතෙක් අපි දැස් දල්වා බලාගෙන ඉඳලා තිබෙනවා.

අපි දන්නවා, ඒ ෆයිල් එකේ වැඩ ඉවරයි, හැබැයි ඊළඟ මේසෙට ඒ ෆයිල් එක යන්නේ නැහැ කියලා. අපි බයයි ගිහිල්ලා ඒ නිලධාරියාට කියන්න, ඔය ෆයිල් එක එහා මේසෙට යවන්න කියලා. මොකද, එහෙම කිව්වොත් ඒ වැඩේ තව පැය දෙක තුනක් පරක්කු කරයි. එහෙම රාජ්‍ය සේවයක් තිබුණේ. හැබැයි අපට අද ආඩම්බරයෙන් කියන්න පුළුවන් ඒවා පවා දැන් වෙනස් වෙලා තිබෙනවා කියලා. ෆයිල් එක මේසය උඩ තියාගෙන හිටපු තත්ත්වය අපි දැන් වෙනස් කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් තමයි රාජ්‍ය සේවකයාට ලැබිය යුතු දේ දෙන්නේ. රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය වීම තුළ තිබෙන්නේ ඒක. අපි රාජ්‍ය සේවයට 75,000ක් බඳවා ගන්නේ ඒකට. මේවා කවුරුවත් දැක්කාද? මේවා ගැන කවුරුවත් කිව්වාද? විපක්ෂයේ කවුද මේවා සාධනීය දේවල්

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

හැටියට දැක්කේ? අන්න ඒ විධියට අපි මේ පාලනය විධිමත් කරලායි තිබෙන්නේ. මේ පාලනය විධිමත් කරමින් මිනිස්සුන්ගේ ජීවිත රස්තියාදු නොකර, මිනිස්සුන්ගේ ජීවිත ගොඩ නැංවීම සඳහා හදපු අය වැයක් තමයි මේ. ඒ ගමන යන්න මේ අය වැය අපට උදවු කරලා තිබෙනවා.

ඒ වාගේම ස්ථිර නොවූ සේවකයන් ස්ථිර කිරීම පිළිබඳවත්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ගිණුම්වලට ලබා දුන් පොලී සඳහා රජයේ දායක මුදල් ගෙවීම පිළිබඳවත් මේ අය වැයෙන් යෝජනා වෙලා තිබෙනවා. මේ රට බංකොලොත්වීමට ඒ මිනිස්සු පළි නැහැ. ඒ මිනිස්සු අහිංසකයි. ඒ නිසා ඒවා දිහාත් අපි බලා තිබෙනවා.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව කියන්නේ, කියන දේ කරගෙන යන ආණ්ඩුවක් විතරක් නොවෙයි. අසාධාරණයට ලක් වූ හැම මිනිහෙක් වෙනුවෙන්ම අපි වගකියනවා. අපි හොයලා බලලා තමයි වගකියන්නේ. නැතිව, ඔවුන් අපට කියලා නොවෙයි. අසාධාරණයක් වෙලා තිබෙන නිසා ඒ මිනිස්සුන්ට සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. ඒවා පවා මේ අය වැය තුළ තිබෙනවා. එහෙම නම්, කිසිවෙකුට මේ අය වැයෙන් අසාධාරණයක් වෙන්නේ නැහැ. මොකද, අපි හැදුවේ නිකම්ම නිකම් ආණ්ඩුවක් නොවෙයි. අද මෙතැන උපුටා දැක්වූවා, සෝමවංශ අමරසිංහ සහෝදරයා ගැන. ඔව්, ඇත්ත. අපි හැමෝගේම වුවමනාව වන්නේ සාධාරණ සමාජයක් ගොඩනැඟීමයි. ඒ වෙනුවෙන් තමයි අපි කටයුතු කරන්නේ. ඒක අපි පැහැර හරින්නේ නැහැ. එක එක්කෙනා අපට උගන්වන්න එනවා, අරයා මෙහෙම කිව්වා, මෙයා මෙහෙම කිව්වා, දැන් ඔයගොල්ලන් යන්නේ වෙන පාරක කියලා. නැහැ, අපි යන්නේ හරි පාරේ. මේ රටේ මිනිස්සු වෙනුවෙන් මේ රට වෙනස් කරලා මිසක් අපි අතහරින්නේ නැහැයි කියමින්, ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

2026 වසරට අදාළව ඉදිරිපත් කරපු අය වැය සම්බන්ධයෙන් මූලික අදහස් පක්ෂ, විපක්ෂ අනුව ඉදිරිපත් වන මොහොතේ මගේ අදහස් දැක්වීම මෙසේ ආරම්භ කරනවා. මට කලින් අදහස් දක්වපු විපක්ෂයේ මන්ත්‍රීවරුන් වරින් වර විවිධ කරුණු ඉදිරිපත් කළා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු ඒ දවස්වල කිව්වා, "මේ පිරිස් තේ කඩයක්වත් කරලා නැහැ, බලය දෙන්න එපා" කියලා. ඒ වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු අද කිව්වා, "අපි දන්න ඉතිහාසයේ පළමුවෙනි වතාවට භාණ්ඩාගාරය උතුරලා ගිහින්, වැඩිපුර සල්ලි ට්‍රිලියනයක් තිබෙනවා" කියලා. අද විවාදය ආරම්භ කරමින් තමයි සභාවේ මන්ත්‍රීතුමෙක් ඒ විධියට පැහැදිලි කළේ. මේ කථා එකිනෙකට පරස්පරයි. ඒ වාගේම මට කලින් අදහස් දක්වපු විපක්ෂයේ තවත් මන්ත්‍රීතුමෙක් මාක්ස්, එංගල්ස්, ලෙනින් වැනි දාර්ශනිකයන් පිළිබඳව යම් අදහසක් ඉදිරිපත් කළා. මට හරියටම මතක නැහැ ඒ ඉදිරිපත් කරපු අදහස මොකක්ද කියලා. හැබැයි අපි කියවා තිබෙන මාක්ස්, ලෙනින් දර්ශන ඇතුළේ අපි මෙන්න මෙහෙම අදහසක් හදාරා තිබෙනවා.

"මහ පැරණි ගස් කපා හෙළීමේදී විසි වන සෑම අතිරේක අතු කැබැල්ලක් ගැන බොලරේසුවෝගේ පටන් මාර්තෝ දක්වාම ධනපති සමාජයේ සුරතල් බල්ලන් කෙඳිරි ගෑවේය, බිරුවේය. නිර්ධන පන්ති ඇතා දැක බිරීමට නොවේ නම් ඒ සුරතල් බල්ලන් සිටින්නේ කුමටද, ඔවුන් බිරුවා වේ, අපි අපේ ගමන යන්නෙමු."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා අදාළ අය අදාළ විධියට ඒවා ස්ථානගත කරගනීවි. අපි ඒ පිළිබඳව වැඩිය කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අපේ රටට අවශ්‍ය වනවා, සැලසුම්සහගත උපාය මාර්ගික ආර්ථික වැඩ පිළිවෙළක්.

එවැනි පැහැදිලි සැලැස්මක් නැති නිසා තමයි එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා පොහොට්ටුව ඇතුළු මේ පක්ෂ 1947 ඉඳලා 2024 දක්වා අපේ රට පාලනය කළත්, අවසානයේ මේ රට බංකොලොත් වුණේ. එච්චරයි අපට ඉතුරු වුණේ. අපේ රටේ මිනිසුන්ට පෝලිම් ගාණේ ඉන්න සිද්ධ වුණා. ඒ වාගේම පෝලිම්වල මිය යන්න සිද්ධ වුණා. ඒක තමයි ඒ ආණ්ඩු පාලනවල ශේෂ පත්‍රය. ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අභිලාෂය වන්නේ නැවත මේ රට ඒ පත් වුණු තත්ත්වයට පත් වෙන්න ඉඩ නොදී ආර්ථික, දේශපාලන, සමාජයීය සහ සංස්කෘතික වශයෙන් ස්ථාවරත්වයකට පත් කර ගැනීමයි. අන්න ඒ ඉලක්කය මුල් කරගෙන තමයි අපි 2025දී අපේ මුල්ම අය වැය යෝජනාව ඉදිරිපත් කළේ. ඉන් අනතුරුව තමයි 2026 වර්ෂය වෙනුවෙන් මේ අය වැය යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. 2026 වර්ෂය වෙනුවෙන් මූලික වශයෙන්ම, තිරසර සහ සෑමට ප්‍රතිලාභ හිමිවන ආර්ථික වර්ධනයක්, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක්, ණය තිරසරභාවය සහතික කිරීමක්, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීමක්, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීමක් සහ ඩිජිටල්කරණය වැනි මූලික කාරණා පදනම් කරගෙන තමයි අපේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අන්න ඒ වැඩ පිළිවෙළට යද්දී රාජ්‍ය සේවය ශක්තිමත් කරන දිශාව ඉතාම වැදගත් කියලා අපි විශ්වාස කරනවා. ඊයේ ඉදිරිපත් වෙච්ච මේ අය වැයේදී අපේ රටේ රාජ්‍ය සේවය සහ රාජ්‍ය සේවකයන් ශක්තිමත් කරන දිශාවට, ඒ යාන්ත්‍රණය ශක්තිමත් කරන දිශාවට ඉතා පැහැදිලි කරුණු කාරණා ප්‍රමාණයක් ඉදිරිපත් වුණා. ඒ ඉදිරිපත් කරපු වියදම් යෝජනා ඇතුළේ රජයේ ආයතනවලට හා පළාත් පාලන ආයතනවලට අවශ්‍ය වාහන හා යන්ත්‍ර සූත්‍ර ලබා දීමට රුපියල් මිලියන 12,500ක්, රාජ්‍ය ආයතනවල ඩිජිටල් ප්‍රවේශය ඉහළ නැංවීමට රුපියල් මිලියන 1,000ක්, රාජ්‍ය ආයතන 10ක හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් වසර දෙකක් තුළ නිරවුල් කිරීමට රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට යෝජනා කර තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය සේවකයන්ට බැංකු මඟින් ලබා දෙනු ලබන දේපළ ණය යෝජනා ක්‍රමය නැවත ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 500ක් වෙන් කිරීමට ද යෝජනා කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දේපළ ණය යෝජනා ක්‍රමය ඉතිහාසයේ තිබුණත්, පසුගිය කාල වකවානු තුළ පැවති ආණ්ඩු ඒක නවත්වලා තිබුණේ. ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවැනි අයවැයෙන් මේ රටේ රාජ්‍ය සේවකයාට අහිමි කර තිබුණු දේපළ ණය ලබා දීමේ ක්‍රමය යළි සක්‍රිය කිරීමට අවශ්‍ය මුදල් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම ගරු දුෂ්කර දීමනාව සහ විදුහල්පති දීමනාව වැඩි කිරීමටත් රුපියල් මිලියන 1,000ක් වෙන් කර තිබෙනවා.

එමෙන්ම, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල සිටින ගේට්ටුකරුවන්ගේ දීමනාව වැඩි කිරීමටත් මේ අය වැය තුළින් යෝජනා කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා

සභාපතිතුමියනි, 2013 වර්ෂයේ සිට ඒ සේවකයන්ට ගෙව්වේ මාසිකව රුපියල් 7,500යි. වත්මන් ආණ්ඩුව එම මුදල සියයට සියයකින් වැඩි කරලා, ඉතා විශාල කාර්යයක් කරන ඒ දුම්රිය ගේට්ටුකරුවන්ගේ මාසික දීමනාව රුපියල් 15,000ක් දක්වා වැඩි කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

ඒ වාගේම, වතු කම්කරු වැටුප් වැඩි කරන්න රුපියල් මිලියන 5,000ක මුදලක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. ඒ ආදී වශයෙන් අපේ රටේ රාජ්‍ය සේවය මෙන්ම අනෙකුත් සේවාද ශක්තිමත් කරන දිශාවට අවශ්‍ය කරන වැඩ කටයුතු මේ අය වැය තුළින් සිදු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මට විශේෂ දවසක්. මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය නියෝජනය කරපු අපි මේ කාරණය කියන්න ඕනෑ. අපේ රටේ රාජ්‍ය සේවකයාට තිබුණු පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම ලැබීමේ අයිතිය 2016.01.01 දින සිට රාජ්‍ය සේවයට පැමිණි සියලුදෙනාටම නොලැබෙන ලෙස එදා පැවැති රජය කටයුතු කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයායි, විශ්‍රාම වැටුපයි කියන්නේ හරියට නයාට අඳුකොළ වාගේ දෙයක්. 2002 වර්ෂයේදී අගමැති වුණු රනිල් වික්‍රමසිංහ මහත්මයා, 2003 ජනවාරි 01වැනි දා සිට රාජ්‍ය සේවයට එන අයගේ විශ්‍රාම වැටුප මේ විධියටම අහෝසි කළා. එම නිසා අපට ඒ වෙනුවෙන් අධිකරණයට යන්න වුණා. අවසානයේදී අපි අධිකරණයට ගිහිල්ලා තමයි 2007 වර්ෂයේදී මේ රටේ රාජ්‍ය සේවකයාට යළි විශ්‍රාම වැටුප දිනා දෙන්න පුළුවන්කම ලැබුණේ. නැවත වතාවක් යහ පාලනය නමින් බලයට ඇවිල්ලා, ඒ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාම 2016.01.01 දින සිට රාජ්‍ය සේවයට එන ඒ රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වැටුප අත්හිටුවන්න කටයුතු කළා. "රජය විසින් ඉදිරියේදී ගන්නා ප්‍රතිපත්තිමය තීරණය මත විශ්‍රාම වැටුප මොකක්ද කියලා තීරණය කරනවා" කියන වාක්‍යය ඇතුළත් කරලා තමයි පත්වීම් ලිපි දුන්නේ. ඒ අය අපේ රටේ රාජ්‍ය සේවකයා අන්න එවැනි අස්ථාවරත්වයකට ඇද දැම්මා. 2016 වර්ෂයේ සිට බඳවා ගත්ත සෑම රාජ්‍ය සේවකයෙකුටම විශ්‍රාම වැටුප් හිමි පත්වීමක් කියන විශ්වාසයේ සහතිකය නිර්මාණය කරන ඒ සහතිකය ලබා දුන්නේ ගරු ජනාධිපතිතුමා ඊයේ ඉදිරිපත් කරපු අය වැයෙන් කියන කාරණාව ඉතා පැහැදිලිව මම කියනවා. එම නිසා මේ රටේ රාජ්‍ය සේවකයාට ඒ අහිමි කර තිබුණු පූර්ණ විශ්‍රාම වැටුප් හිමිකම සහතික කරපු ආණ්ඩුව බවට ජාතික ජන බලවේගයේ මාලිමාව ආණ්ඩුව ඉතිහාසගත වෙනවාය කියන කාරණය මේ පාර්ලිමේන්තුවේදී අද අපි අවධාරණය කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතා පැහැදිලිව මම කිව යුතුයි, මේ රටේ විශ්‍රාමිකයින් සම්බන්ධයෙනුත් ගැටලු ප්‍රමාණයක් තිබෙන බව. 2016-2019 කාලයේ විශ්‍රාම ගිය විශ්‍රාමිකයින්ට කවුද ගැටලුව ඇති කළේ? එදා යහ පාලන ආණ්ඩුව ඔවුන්ට දෙන්න තිබුණු විශ්‍රාම වැටුප දුන්නේ නැහැ. ඒක 2020දී දෙනවා කියලා පොරොන්දු වෙලා අවසානයේ බලයට ආපු ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවත් ඒක මඟ හැරියා. ඒ නිසා තමයි ජාතික ජන බලවේගය ආණ්ඩුවේ අපි 2016-2019 කාලයේ විශ්‍රාම ගිය අයට ලැබෙන්න තිබුණු විශ්‍රාම වැටුප අදියර තුනකින් ලබා දෙන්න අවශ්‍ය පියවර අරගෙන ඒ කටයුතු ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

ඒ වාගේම අපි දන්නවා, 1997 ඉඳලා 2021 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය ගුරු-විදුහල්පතිවරුන්ට විශ්‍රාම වැටුප් සම්බන්ධව ගැටලුවක් තිබෙන බව. ඒ ගැටලුව විසඳිය යුතුයි කියන අවබෝධයක රජය ඉන්නවා. මේ වනවිට ඒකට අවශ්‍ය පියවර ගන්න ක්‍රමානුකූලව කටයුතු කරමින් ඉන්නවා. ඒ නිසා තමයි සමස්ත රාජ්‍ය සේවයේම වැටුප් සහ විශ්‍රාම වැටුප් පිළිබඳව කටයුතු කරන්න ඉදිරියේදී කොමිසමක් පත් කරන්න රජයේ අවධානය යොමු කරලා, ඊයේ අය වැය කථාවේදීත් ඒ පිළිබඳව ඉතා පැහැදිලිව අවධාරණය කළේ.

විශේෂයෙන්ම රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම සඳහාත් 2026 අවුරුද්ද වෙනුවෙන් රුපියල් කෝටි 11,000ක් -රුපියල් බිලියන 110ක්- වෙන් කරන්න මෙවර අය වැය තුළින් කටයුතු කර තිබෙන බව අපි දන්නවා. මේ අවුරුදු තුනට රුපියල් කෝටි 33,000ක් වෙන් කරමින් අපේ රටේ සමස්ත රාජ්‍ය සේවකයින්ගේ වැටුප් සියයට 66කිනුත්, වැටුප් වර්ධක සියයට 80කිනුත් වැඩි කරන්න අවශ්‍ය පියවර ගත් ආණ්ඩුවක් විධියට තමයි අද අපි 2026ට අදාළ අය වැය ගෙනැවිත් තිබෙන්නේ කියන කාරණාවත් මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ රාජ්‍ය සේවකයින්ට තිබුණු විවිධ අයිතිවාසිකම් කප්පාදු වුණු ඉතිහාසයක් තමයි අපි පසුගිය කාලයේ දැක්කේ. හැබැයි, අපි එහෙම නැහැ. රාජ්‍ය සේවකයින්ට ලබා දුන් රුපියල් 10,000ක උත්සව අත්තිකාරම් මුදල රුපියල් 15,000ක් කරමින් එය රුපියල් 5,000කින් වැඩි කරන්න මෙවර අය වැය තුළින් කටයුතු කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

අපි දන්නවා, රාජ්‍ය සේවකයෝ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට, වෙසක් උත්සවයට, නත්තල් උත්සවයට වාගේම රාමසාන්, හජ්ජි වැනි උත්සවවලට උත්සව අත්තිකාරම් මුදල් ඉල්ලන බව. ඒ උත්සව අත්තිකාරම් මුදල රාජ්‍ය සේවකයින්ට ඉතාම වැදගත් වෙනවා. මෙවර අය වැය තුළින් අපි එම අත්තිකාරම් මුදල වැඩි කර තිබෙනවා.

ඊළඟට, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල ගේට්ටුකරුවන්ගේ මාසික දීමනාව වැඩි කිරීමටත් මෙවර අය වැය තුළින් පියවර ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, රාජ්‍ය සේවයේ තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන සිටින සේවකයින්ට විධිමත් පරිදි ස්ථිර පත්වීම් ලබා දෙන්නත් යෝජනා කර තිබෙනවා. මේ ආදී වශයෙන් අපේ රටේ රාජ්‍ය සේවකයින්ගේ වෘත්තීයභාවයට, වැටුපට, අනාගතයට බලපාන ප්‍රගතිශීලී තීන්දු තීරණ විශාල ප්‍රමාණයක් 2026 අය වැයට යෝජනා කරන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. මේ වනකොටත් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව ඇතුළේ පාර්ලිමේන්තු අනුකමිටුවක් තුළ මේ රටේ රාජ්‍ය සේවකයින්ගේ වැටුප්, ඒ වාගේම වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා සහ තව තවත් සාධනීය වෙනස්කම් කරන්න ආණ්ඩුවක් විධියට අපි අවධානය යොමු කරලා තිබෙනවාය කියන කාරණාවත් මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.08]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026 අය වැය ලේඛනය සම්බන්ධයෙන් පළමු දවසේම අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකනවා.

අද උදේ 6.30ට නෙත් එෆ්එම් ප්‍රවෘත්තිවල "රතු කට්ට" විශේෂාංගය යටතේ මට ඇහුණු දෙයක් තිබෙනවා. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් පැහැදිලි කිරීමක් කරමින් කිව්වා, "මේ අය වැය ලේඛනය හරියට පල්ලියේ පියතුමා පන්සලේ බණ කියනවා වාගේ" කියලා. මම පැයක් තිස්සේ එතුමාගේ කථාව අහගෙන හිටියා. එතුමා අන්තිම මිනිත්තුවේදීත් කිව්වේ ඔය කථාවම තමයි. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා අහගෙන ඉන්නකොට මට හිතෙන්නේ, ඒ උපමාව තමන් තමන්ටම කියා ගත් එකක් වාගෙයි. එහෙම තමයි මට දැනෙන්නේ. අනෙක් පැත්තෙන් ගරු විපක්ෂ නායකතුමා කියනවා, මේක සහන නොලැබුණු අය වැයක් කියලා. ඒ වාගේම තව අදහසක් එනවා, ජාතික ජන බලවේගය විධියට අපි බහුජන ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතික්ෂේප කරමින් ව්‍යවස්ථාපිත ඒකාධිපතිත්වයක් නිර්මාණය කරන්න හදනවා කියලා. අපට ලොකු ඉතිහාසයකට යන්න ඕනෑ නැහැ. ව්‍යවස්ථාපිත ආඥාදායකත්වයේ ප්‍රතිමූර්තිය අපි පසුගිය අවුරුදු 5 තුළ දැක්කා. ටික කාලයකට රිමාන්ඩ් එකට ගිහිල්ලා ආපු හිටපු ජනාධිපතිවරයාගෙන් තමයි අපි ඒක දැක්කේ. මේ වාගේ තත්ත්වයක් තමයි අපි දැක්කේ.

අනෙක් පැත්තෙන් අපි දන්නවා, මනුෂ්‍යත්වයට ආමන්ත්‍රණය කරපු, ආර්ථික විද්‍යාත්මක ප්‍රවේශයක් එක්ක එන අය වැය ලේඛනයක් තමයි ඊයේ ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ කියලා. මම මෙහෙම කියන්නේ ඇයි? මේ අය වැය ලේඛනය හරහා අපි යන ගමන ඉතා පැහැදිලියි. මේ සමාජය තුළ ආන්තිකරණයට ලක් වෙච්ච කණ්ඩායම් ඉන් අත්මුදා ගැනීමටත්, අවාසිදායක තත්ත්වයන්ගෙන් පෙළෙන කණ්ඩායම් ඉන් අත්මුදා ගැනීමටත් හැකි වන, කොටින්ම කිව්වොත් ඔක්කොම එකට යන ගමනක් තුළ ආර්ථික සංවර්ධනය අත්පත් කර දීමේ ව්‍යායාමයක ලේඛනයක් තමයි ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ. සමාජ සාධාරණත්වය ඉල්ලා සිටින ජනතාවට තමයි ගරු ජනාධිපතිතුමා ආමන්ත්‍රණය කළේ. සමාජ සාධාරණත්වය ඉල්ලා සිටින ප්‍රබලම කණ්ඩායමක් තමයි ආබාධ සහිත කණ්ඩායම. මේ ප්‍රමාණය දහසය ලක්ෂයකට අධිකයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ කණ්ඩායම තුළ විවිධ ආබාධ තත්ත්වයන් නියෝජනය කරන කණ්ඩායම් ඉන්නවා. මේ සෑම පාර්ශ්වයකම තිබෙන ප්‍රධාන ගැටලු ආමන්ත්‍රණය කරපු අය වැය ලේඛනයකට තමයි අපි ඊයේ සවන් දුන්නේ.

අපි ආබාධ සහිත පුද්ගලයන් සඳහා පළමුවෙන්ම රුපියල් 10,000ක දීමනාවක් දුන්නා. ඒක ඉදිරි අවුරුද්ද පුරාත් අඛණ්ඩව ගෙන යාමට රුපියල් මිලියන 19,000ක් වෙන් කර තිබෙනවා. විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මේ තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ ආබාධ සහිත ප්‍රජාවගේ ජීවන අවශ්‍යතා ඉෂ්ට කරන්නයි. ඔවුන්ට ලොකුම ගැටලුවක් තිබෙනවා. ආබාධ සහිත ප්‍රජාව දහසය ලක්ෂයක් ඉන්නවා කියලා අපි කිව්වාට ඔවුන්ව අපට මහ මාර්ගයේ දකින්න ලැබෙන්නේ නැහැ; ප්‍රවාහන පද්ධතිය තුළ දකින්න ලැබෙන්නේ නැහැ. ඒ ඇයි? ප්‍රධාන කාරණයක් තිබෙනවා. අපට බැරි වෙලා තිබෙනවා, අවුරුදු 76ක් තිස්සේ මේ ආබාධ සහිත ප්‍රජාවට ප්‍රවේශ පහසුකම් ලබා දෙන්න. අපි ආබාධිත ව්‍යාපාරය විධියට දිගින් දිගටම කියපු දෙයක් තමයි, ප්‍රවේශ පහසුකම් නිර්මාණය කිරීම සඳහා රජය තීරණාත්මකව මැදිහත් විය යුතුයි, ඒක රජයක වගකීමක්, බැඳීමක්, ඒක අත්හැර යන්න බැහැ කියන එක. අන්න ඒකට විසඳුමක් දෙනවා මේ අය වැයෙන්. මේ ප්‍රවේශ පහසුකම් නිර්මාණය කිරීම සඳහා රුපියල් මිලියන 1,000ක මුදලක් මෙවර අය වැය ලේඛනයෙන් වෙන් කරනවා. අපට යන්න පුළුවන් පොදු වැසිකිළියක්, අපට යන්න පුළුවන් රෝහලක්, අපට යන්න පුළුවන් ප්‍රවාහන පද්ධතියක් ඇති වෙලා නැහැ. දුම්රිය පොළකට - railway station එකකට- බස් නැවතුම්පොළකට, පොලීසියකට, උසාවියකට - මේ කිසිම තැනකට- පඩි පෙළවල් නිසා අපට යා ගන්න බැහැ. රෝද පුටුවෙන් යන කෙනා අසරණයි, පඩි පෙළක් ඉදිරියේ. ආබාධ සහිත ප්‍රජාව මෙන්න මේ අසරණභාවයෙන් මුදා ගන්න තමයි මේ ප්‍රවේශ පහසුකම් නිර්මාණය කිරීම සඳහා මුදල් වෙන් කරලා තිබෙන්නේ. මේක තමයි අපි ආබාධ සහිත පුද්ගලයන් විධියට කියපු දේ. මෙන්න මේ කාරණයට වෙනම budget line එකක් වෙන් කරන්න ඕනෑ. පොදු ධාරාව තුළ මේක කෙරෙන්නේ නැහැ. මේකට ආමන්ත්‍රණයක් වෙන්නේ නැහැ. මෙන්න මේ ප්‍රශ්නය විසඳන්න ගරු ජනාධිපතිතුමා ආමන්ත්‍රණය කරලා තිබෙනවා. ආබාධ සහිත ජනතාවගේ ප්‍රවේශ පහසුකම් නිර්මාණය කිරීම සඳහා වෙනම ප්‍රතිපාදනයක් වෙන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමිය මේ ගැන දන්නවා. වර්තමානයේ තිබෙන සහ ඉදිරියට ප්‍රසාරණය වෙන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි බුද්ධි වර්ධන ඌනතා සහිත දූවා දරුවන්ගේ ප්‍රශ්නය. මේ දූවා දරුවන්ද මනුෂ්‍ය පවුලේම සාමාජික කණ්ඩායමක්. ඔවුන්ව ආරක්ෂා කිරීම, ඔවුන්ව රැක බලා ගැනීම රජයක වගකීමක්; සමාජයක වගකීමක්. මේ වගකීම ඉෂ්ට කිරීම සඳහා ජාතික ජන බලවේගය ආණ්ඩුව ගිය අවුරුද්දෙත් මැදිහත් වීමක් කළා. අපි ගෙවන මේ 2025 වසරේදීත් මැදිහත් වීමක් කළා. ඒ තමයි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම. මේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන එන අවුරුද්දේත් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 547ක මුදල් ප්‍රමාණයක් වෙන් කරනවා. ඇයි ඒ? මේ දූවා දරුවන්ට සුරක්ෂිත ජීවිතයක් අත්පත් කර දිය යුතුයි. අනෙක් පැත්තෙන්, මේ දූවා දරුවන් උපත ලබන පවුලේ මව් දෙමවුපියන්ට සහනයක් දිය යුතුයි. ඔවුන් මේ ආර්ථිකයට සක්‍රියව දායක කර ගන්න නම් මේ දූවා දරුවන්ට රැකවරණය දිය යුතුයි.

අනෙක් කාරණය තමයි, අධ්‍යාපනය. ආබාධ සහිත පුද්ගලයන් අධ්‍යාපන ධාරාවෙන් අයින් කරන්න බැහැ. හැබැයි, ඔවුන්ට තමන් අත්විඳින ආර්ථිකමය දුෂ්කරතා නිසා, මේ අධ්‍යාපන ධාරාව තුළ පහසුකම් අඩුකම නිසා ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නයට විසඳුම් ගෙනෙන්න ගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. පාසල්වල ඉගෙනුම ලබන ආබාධ සහිත දූවා දරුවන්ට මාසයකට රුපියල් 5,000ක දීමනාවක් දෙනවා, ඒ දරුවන් අධ්‍යාපන ධාරාව ඔස්සේ සමාජයේ ඉහළට ගෙනෙන්න. එහෙම ඉහළට ගෙනෙන දරුවන් උසස් අධ්‍යාපනයේදී අත්හරින්න සූදානමක් නැහැ. අපි විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන ආබාධ සහිත දරුවන්ට මහපොළ ශිෂ්‍යාධාරවලට අමතරව තවත් රුපියල් 5,000ක දීමනාවක් දෙනවා, ඔවුන්ගේ අධ්‍යයන පහසුව සඳහා. මෙන්න මෙහෙම තමයි අපි අධ්‍යාපන ධාරාව ඔස්සේ ඵලදායී පුරවැසියෙකු බිහි කරන්න උත්සාහවත් වෙන්නේ.

ඒ වාගේම මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අපි විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කර තිබෙන බව. ඒ ප්‍රතිපත්තිය තුළ ආබාධ සහිත දූවා දරුවන්ට ස්වකීය අභිලාෂය අනුව තමන්ගේ කුසලතාව ඔප්නංවන විෂය ධාරාවට ඇතුළත් වෙමින් ඉගෙනුම ලැබීමේ හැකියාව, අවස්ථාව ලබා දෙනවා. අනෙක් පැත්තෙන් මේකම තමයි, ආබාධ සහිත සමාජය තුළ අපි විශ්වාස කරන අන්තර්කරණය කියලා ආමන්ත්‍රණය කරන පදය. මේ පදයෙන් අදහස් කරන්නේ

මොකක්ද? පොදු ධාරාව තුළ අවශ්‍ය පහසුකම් නිර්මාණය කරමින්, අවශ්‍ය පහසුකම් ලබා දෙමින් ආබාධ සහිත දරුවන්ට; ආබාධ සහිත තැනැත්තන්ට අන්තර්කරණීය සමාජයක් තුළ නිර්බාධිත සමාජ ජීවිතයක් උරුම කරදීමේ අවස්ථාව තමයි මේ අය වැය ලේඛනය හරහා ගෙනෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මට තව විනාඩි දෙකක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

அதேமாதிரி, இதில் இன்னமும் ஒரேயொரு விஷயம் இருக்கின்றது. இந்த விஷயத்தை நான் சொல்வதால் என்னுடைய வாக்காளர்கள் மத்தியில் நான் விமர்சனங்களுக்கு உள்ளாவேன். அதேநேரத்தில், மக்கள் சரியான பாதையில் தங்களைக் கொண்டு செல்ல வேண்டும், அவர்களுக்கு என்னென்ன தேவையோ அவற்றைப் பெற்றுக்கொள்ள வேண்டுமென்பதற்காகத்தான் எனக்கு வாக்களித்துள்ளார்களே தவிர, தேன் மாதிரி பொய்களைச் சொல்லி மக்களைக் கவர்ந்திழுத்து அவர்களது வாக்குகளைப் பெற்று இங்கே வந்து நான் உட்காருவதற்கல்ல. நீங்கள் 5,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு வழங்கியிருக்கின்றீர்கள், attendance incentive மூலமாக 200 ரூபாய் ஒரு நாளைக்குத் தொழிலாளர்களுக்கு வழங்குவதற்கு. அது உங்களுக்கும் பெருந்தோட்ட நிறுவனங்களுக்குமிடையிலுள்ள ஒரு பொறிமுறை. அது இறுதிக் கட்டத்திற்கு வரும்பொழுது கட்டாயம் பாராளுமன்றத்துக்கு அதைச் சமர்ப்பிப்பீர்கள் என்று நான் எதிர்பார்க்கின்றேன்.

அதேநேரத்தில், இதுவரைக்கும் மலையகத்தில் இருக்கின்ற ஒரு பெரிய பிரச்சினை என்ன? எங்களுக்கு வளங்கள் பற்றாக்குறையாக உள்ளது. அங்கு போதுமானளவு 864 பாடசாலைகள் இருக்கின்றன. அவற்றில் எத்தனை பாடசாலைகள் சரியான அபிவிருத்தியோடு, போதிய உட்கட்டமைப்பு வசதிகளோடு இருக்கின்றன? அதேமாதிரி, நுவரெலியா மாவட்டத்தில் மட்டும் ஆறு பிரதான வைத்தியசாலைகள் இருக்கின்றன. ஆனால், எத்தனை வைத்தியசாலைகளில் மக்களால் போய் உட்கார்ந்திருக்க முடிகிறது, காத்திருக்க முடிகிறது? அதற்குரிய வளங்கள் எங்கே இருக்கின்றது? அதேமாதிரி, நுவரெலியா மாவட்டத்தில் மட்டும் நான் நினைக்கின்றேன், கிட்டத்தட்ட 200 கிலோமீற்றர் வீதிகள் இருக்கின்றன; அது தோட்டப்புற வீதிகளாக இருக்கட்டும், இல்லாவிட்டால் பெரிய வீதிகளாக இருக்கட்டும், அவற்றில் எத்தனை வீதிகள் நல்ல நிலையில் இருக்கின்றன?

நீங்கள் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்துக்கு 5,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு வழங்கியிருக்கின்றீர்கள், தப்பில்லை. இது அடுத்த வருடத்துக்கான ஒதுக்கீடு, சரி. ஆனால், அதற்கடுத்த வருடம்? அதற்கடுத்த வருடம்? எனவே, இதை ஒரு சட்டமாகக் கொண்டுவந்து அரசாங்கம் மூலமாகத் தொழிலாளர்களுக்கு நீங்கள் வருடாவருடம் 200 ரூபாய் கொடுங்கள்! யாரும் தப்பென்று சொல்ல மாட்டார்கள். ஒருவேளை வரவிருக்கும் மாகாண சபைத் தேர்தலுக்காக நீங்கள் 200 ரூபாய் சம்பள உயர்வைக் கொடுத்திருக்க முடியும். அதேநேரம், பாராளுமன்ற உறுப்பினர் ஒருவர் ஒரு விஷயத்தைச் சொல்லிருந்தார், "அரசாங்கம் வரலாற்றில் முதன்முறையாக இந்தச் சம்பள உயர்வை வழங்கியுள்ளது" என்று. அது தவறான கருத்து. அதை நான் இங்கே திருத்தியாக வேண்டும். ரணில் விக்கிரமசிங்க அவர்களின் தலைமையில் நல்லாட்சி அரசாங்கத்தின் ஆட்சிக்காலத்தின்பொழுது, தமிழர் முற்போக்குக் கூட்டணியின் தலைவர் கௌரவ மனோ கணேசன் அவர்கள், முன்னாள் அமைச்சர் திகாம்பரம் அவர்கள் Cabinetஇல் இருந்தபொழுது, நான் நினைக்கின்றேன் இதேமாதிரித்தான் கிட்டத்தட்ட மூன்று - நான்கு மாதங்களுக்கு 100 ரூபாய் வழங்கியிருந்தார்கள். அதேபொறிமுறையில்தான் இந்த 200 ரூபாய் வழங்கப்படுகின்றது. அது தவறு கிடையாது. அதேநேரத்தில், இதை நீங்கள் எப்படி sustain பண்ணப்போகின்றீர்கள்? ஏனென்றால், இது ஒரு தனியார்துறை.

அதேநேரத்தில் 5,000 மில்லியன் நிதி ஒதுக்கீடு இருந்தால், கட்டாயம் மலையகம் பார்க்காத ஒரு மாற்றத்தைக் கொண்டுவர முடியும். அங்குள்ள பாடசாலைகள் முதல் அனைத்து அத்தியாவசியமான சேவைகளுக்கான உட்கட்டமைப்பு வசதிகளையும் உருவாக்க முடியும். அபிவிருத்திகளைக் கொண்டுவர முடியும்; வேலைவாய்ப்புக்களை உருவாக்க முடியும். நாங்கள் ஆட்சியில் இருக்கும்பொழுது, எங்களிடம் நிதி ஒதுக்கீடு கிடையாது. ஆனால், இன்றைக்கு நீங்கள் 159 பேர் இருக்கின்றீர்கள். மாண்புமிகு சனாதிபதி அவர்கள் இருக்கின்றார். நான் ஒரு விடயத்தை வெளிப்படையாகச் சொல்லுகிறேன்; அரசியல்வாதியாக இல்லாமல், இந்த நாட்டிலே வாழும் ஓர் இளைஞனாகச் சொல்கின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் நாட்டைப் பாரம் எடுத்தது ஓர் அரசியல் புரட்சி! அவர் என்ன செய்திருக்க வேண்டும்? முதல் நூறு நாட்களில், தேவையான மாற்றங்கள் அனைத்தையும் கொண்டுவந்திருக்க வேண்டும். ஏனென்றால், அன்று யாரும் கேள்வி கேட்டிருக்க மாட்டார்கள்; யாருக்கும் பதில் சொல்லியிருக்கவும் முடியும். இன்றைக்கு ஒரு வருடம் கடந்திருக்கிறது. நாடளாவிய ரீதியில் என்பதை விடுத்து, மலையகத்தில் எத்தனை வீடுகள் கட்டப்பட்டிருக்கின்றன? அதைவிட, நுவரெலியா மாவட்டத்துக்கென ஒதுக்கப்பட்ட வீடுகள் இன்றைக்கு மாயமாக பதுளை மாவட்டத்துக்கு மாற்றப்பட்டிருக்கிறது. அதுபற்றி கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்க வேண்டும் என்று இருந்தேன்; கௌரவ அமைச்சர் அவர்கள் இங்கு இல்லை. கட்டாயம் இதற்கு அவர் பதில் அளிக்க வேண்டுமென எதிர்பார்க்கின்றேன்.

இறுதியாக, நான் ஒரேயொரு விஷயத்தை இங்கே சொல்ல விரும்புகின்றேன். "தோட்டத் தொழிலாளர்களுக்கு நாட் சம்பளமாக எங்கள் தானைத் தலைவர் மாண்புமிகு சனாதிபதி அவர்கள் 1,750 ரூபாயை வழங்கியிருக்கிறார்" என்று இங்கே வந்து ஆர்ப்பரிக்கின்ற சில உறுப்பினர்களுக்கும் அவர்களுக்கு உடந்தையாக tableஇல் தட்டிக்கொண்டு இருக்கின்ற சில விஷயம் தெரியாத உறுப்பினர்களுக்கும் நான் சொல்ல விரும்புவது ஒரேயொரு விஷயம்தான். தயவுசெய்து இதை மனதில் வைத்துக் கொள்ளுங்கள்! நீங்கள் வழங்கியிருக்கின்ற 1,750 ரூபாய், சனாதிபதி அவர்களின் வாக்குறுதிப்படியான தொகை கிடையாது! சனாதிபதி அவர்கள் கொடுத்த வாக்குறுதி 2,138 ரூபாய் வழங்கப்படும் என்பதே. ஆனால், அதைப் பற்றி நான் இப்போது கேட்க மாட்டேன். ஏனென்றால் எனக்குப் புரிகிறது, நீங்களே கஷ்டப்பட்டுத்தான் சம்பளத்தை அதிகரித்து இருக்கின்றீர்கள் என்பது. ஆனால், இந்தச் சபைக்கும் தெரியட்டும், மக்களுக்கும் தெரியட்டும், இன்றைக்கு இந்த அரசாங்கம் ஜீவன் தொண்டமான் சொன்ன 1,700 ரூபாய் சம்பளத்தைத்தான் வழங்கியிருக்கின்றது என்பது. அதேநேரத்தில், நான் 1,700 ரூபாய் சம்பளம் வழங்க வேண்டும் என்று கேட்டபோது, "1,700 ரூபாய் சம்பளம் வழங்குவதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது, இது போதாத ஒரு தொகை" என்று சொல்லி, சம்பள நிர்ணய சபையில் வந்து வாக்களிக்காமல் நிராகரித்த, வெளிநடப்புச் செய்த ஆளுந்தரப்பின் சில உறுப்பினர்கள் இன்றைக்குச் சொல்கின்றார்கள், 1,750 ரூபாய்தான் தங்களால் வழங்கக்கூடிய பொருத்தமான சம்பளம் என்று. ஆகவே, எங்களுடைய கோரிக்கையை ஏற்று, நீங்கள் சனவரி மாதத்தில் இருந்து 1,750 ரூபாய் சம்பளத்தை வழங்கினால் என்னுடைய மனமார்ந்த நன்றியை அரசாங்கத்துக்கும், மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கும் தெரிவித்துக்கொள்வேன்.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Yes, Hon. Minister?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නය පිළිබඳව යම් සැකයක ඉන්නවා කියා මට හිතෙන නිසා තමයි මම මේ කථාව කියන්නේ. විශේෂයෙන්ම වතු

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කම්කරුවන්ගේ වැටුප පිළිබඳව අපි අඛණ්ඩව රජයක් ලෙස මැදිහත් වුණා. ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා හොඳටම දන්නවා, වතු කම්කරුවන්ගේ පඩි වැඩි කරන්නේ සාමූහික ගිවිසුමෙන් බව. හැබැයි, සාමූහික ගිවිසුමෙන් පඩි වැඩි කරන කල් අපි බලාගෙන හිටියොත් තව අවුරුදු එකහමාරක් ඉන්න වෙනවා නේ. ඔබතුමා දන්නවා, ගිවිසුම අනුව තව කාලය තිබෙනවා කියලා. ඔබතුමා අහපු වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීමේ ප්‍රශ්නය පිළිබඳව අපි ආණ්ඩුවක් වියියට අවධානය යොමු කර තිබෙනවා. පසුගිය අය වැයේදීත් ගරු ජනාධිපතිතුමා පොරොන්දු වුණා, ඒ වැටුප් වැඩි කිරීම ලබා දීම සඳහා ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගන්නවා කියලා. ඒ අනුව තමයි වතු හාම්පුතුන් සහ හාම්පුතුන්ගේ සම්මේලන කියන ඒ සියලුදෙනා එක්ක සාකච්ඡා කරලා මූලික වැටුපට - basic salary එකට - රුපියල් 200ක් එකතු කරන්න ඒ අය එකඟ වුණේ. ඒක පැමිණීමේ දීමනාවක් ලෙස ලබා දීමට යම් එකඟතාවක් ඒගොල්ලන් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුවෙනුත් රුපියල් 200ක් දෙනවා. එය ගෙවන්නේ කොහොමද, reimburse කර ගන්නේ කොහොමද කියලා අපි ඒ අයට කියලා තිබෙනවා. එම නිසා සැක හැර ගන්න තමයි ඔබතුමාට මම මේ කාරණය කියන්නේ. ආණ්ඩුව මේ ගත්ත තීරණය ජනවාරි 01වන දා වනකොට ක්‍රියාත්මක කරනවා. මොකද, දෙසැම්බර් 05වන දා නේ මේ අය වැය සම්මත කරන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ මුදලුත් වෙන් කරලා ලබන අවුරුද්දේ ජනවාරි මස සිට තමයි අපට මෙය ක්‍රියාත්මක කරන්න වෙන්නේ. ඒ අනුව, ඔබතුමා සැක හැර දැනගන්න, රුපියල් 200ක් basic salary එකට එකතු වනවා, රුපියල් 200ක් පැමිණීමේ දීමනාව - incentive එක - ලෙස ඒ අයට ලැබෙනවා කියන එක. ඒ අනුව දින 25ක් වැඩ කළොත් රුපියල් 10,000ක් ඒ අයට ලැබෙනවා. එය ලැබෙන බව අපි සහතික කරලා කියනවා.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කෙටියෙන් කියලා අවසන් කරන්න.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் ஒரேயொரு விடயத்தைத் தெளிவுபடுத்தியேயாக வேண்டும். கூட்டு ஒப்பந்தத்தின் மூலமாகத்தான் சம்பளம் அதிகரிக்கப்படுவதாகச் சொன்னீர்கள்; அது தவறான விடயம். ஏனென்றால், கூட்டு ஒப்பந்தம் இரத்துச் செய்யப்பட்டு கிட்டத்தட்ட 5 வருடங்களுக்கும் மேலாகின்றது. முன்னரும் கூட்டு ஒப்பந்தம் மூலமாகச் செய்யப்படவில்லை; சம்பள நிர்ணய சபையினூடாகத்தான் செய்தோம். அதேநேரத்தில், நான் மறுபடியும் சொல்கின்றேன், நீங்கள் இதனைக் கட்டாயம் பெற்றுக் கொடுப்பீர்கள் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. அதேநேரத்தில் உங்களுக்கு பெருந்தோட்ட நிறுவனங்கள்மூலமாக ஏதாவது அழுத்தங்களோ அல்லது அவர்கள் வழமையாகவே செய்கின்ற கபடத்தனத்தையோ செய்தால், அதற்கு எங்களுடைய முழுமையான ஆதரவு இருக்கின்றது என்றுதான் நான் சொல்ல வருகின்றேன். ஆனால், அதற்காக நான் இராஜினாமா செய்ய வேண்டுமென்று சொல்வது மிகத் தவறான விடயம்.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, කෙටියෙන් පිළිතුර ලබා දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තත්පර 30කින් මම අවසන් කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි ප්‍රශ්නය. සාමූහික ගිවිසුම පිළිබඳව සාකච්ඡා නොකර අවුරුදු පහක් වෘත්තීය සමිති එක පැත්තක හිටියා; හාම්පුතුන් එක පැත්තක හිටියා. දෙපැත්තට වෙලා ඇද ඇද හිටියා. ඒක තමයි සිද්ධ වුණේ. ඒගොල්ලන් සාමූහික ගිවිසුම අත්සන් කරන්න ආවේ නැහැ, පඩි ප්‍රශ්නය නිසාම. හැබැයි, සාමූහික ගිවිසුමක් නැතුව දිගින් දිගට ගියාට පසුව අවසානයේ පඩිපාලක සභාවට ඇවිල්ලා තමයි එකඟ වුණේ. හැබැයි, එකඟ වුණේ රුපියල් 1,350කට. අපි ඔබතුමාට කියනවා, රුපියල් 200ක් නිශ්චිතව basic salary එකට එකතු වන බව. ඒ වාගේම ඉතුරු රුපියල් 200 ආණ්ඩුවෙන් දෙනවා. දින 25ක් වැඩ කළොත් රුපියල් 10,000ක් අනිවාර්යයෙන්ම වතු කම්කරුවන්ගේ මාසික වැටුපට එකතු වනවා කියන එක අපි සහතික කරලා කියනවා. ඒක නිශ්චිතව ලැබෙනවා. නොලැබුණොත් එය ලබා ගැනීමේ සටනට ඔබතුමාටත් ආරාධනා කරනවා.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ அமைச்சர் அவர்களே, 25 நாள் வேலைக்கு வந்தால் 10,000 ரூபாய் சம்பளம் கொடுக்கப்படுமென்று சொல்கின்றீர்கள். 25 நாட்கள் பெருந்தோட்ட நிறுவனங்கள் வேலை கொடுத்தால் மக்கள் கட்டாயம் வேலைக்கு வருவார்கள். கவலைப்பட வேண்டாம். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.09]

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு வணக்கம்!

இன்று பெருந்தோட்டத் தொழிலாளர்களுடைய சம்பள உயர்வு குறித்து அதிகமாகப் பேசப்படுவதால், ஒரு விடயத்தைக் கூற வேண்டுமென நினைக்கின்றேன். போராட்டங்கள் இன்றி தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வு வழங்கப்பட்ட முதலாவது வரவு செலவுத்திட்டம் இது என்று சொல்லலாம். இதற்கு முன்னரான காலப் பகுதியில், வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்படுவதற்கு ஒரு மாதத்துக்கு முன்னர், தோட்டத் தொழிலாளர்களைத் தூண்டுவித்து போராட்டங்களைச் செய்வித்து, அவர்களுடைய சம்பளத்தை அதிகரித்துத் தருவதாகச் சொல்லி, வரவு செலவுத்திட்டத்தில் தோட்டத் தொழிலாளர்களுடைய சம்பளம் எப்படியெல்லாம் வரும் என்பதைக் குறிப்பிட்டு, பிறகு வரவு செலவுத்திட்டத்தில் சம்பளம் உயர்த்தப்படவில்லை என்று கூறப்பட்ட காலம் தாண்டி, இம்முறை எந்தவிதமான போராட்டத்தையும் எம்மக்கள் செய்யாமல், அவர்கள் குறித்து அரசாங்கம் தானாகவே எண்ணியதன் விளைவாக, அவர்களுக்கு வரவின் அடிப்படையில் 200 ரூபாய் ஊக்குவிப்புத் தொகையை அரசாங்கமும் கம்பனிகள் 200 ரூபாயையும் வழங்குவதாக உறுதியளிக்கப்பட்டு இருக்கின்றது. இதற்குக் காரணம், 2025ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்கள் 1,750 ரூபாய் சம்பள உயர்வை பேச்சுவார்த்தை மூலம் பெற்றுக்கொடுக்க முயற்சிப்பதாகக் கூறியிருந்தமைதான்.

அதன் அடிப்படையில், கடந்த 9 மாதங்களாகத் தொடர்ச்சியாகப் பேச்சுவார்த்தை நடத்தப்பட்டது. அதன் விளைவாகத்தான் இன்று கம்பனிகள் அவர்களின் நாட்சம்பளத்தை 200 ரூபாயால் அதிகரித்துக் கொடுப்பதற்கு முன்வந்து இருக்கின்றன. கடந்த காலத்தில் வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்படுவதற்கு ஒரு மாதத்துக்கு முன்னரே போராட்டத்தை ஆரம்பித்து, வரவு செலவுத்திட்டம் முடிந்தவுடன் போராட்டத்தை நிறுத்திக்கொள்வார்கள். அந்தக் கலாசாரம் இல்லாமல் போய், இன்று வரவு செலவுத்திட்டத்தில் தோட்டத் தொழிலாளர்களின் நாட்சம்பளம் உயர்த்தப்பட்டு இருக்கிறது. நாங்கள் மலையக மக்களுக்குச் சொன்னதுபோல, 1,750 ரூபாய் நாட்சம்பளம் கட்டாயமாக வழங்கப்படும். அதில் எவ்விதமான சந்தேகமும் கொள்ளத் தேவையில்லை.

இது எதிர்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களின் வரவு செலவுத்திட்டம் அல்ல. மாறாக, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் வரவு செலவுத் திட்டமாகும். இன்று எனக்கு முன்னர் உரையாற்றிய பாராளுமன்ற உறுப்பினர் கூறினார், மலையகப் பகுதிகளில் பாதைகள் நிர்மாணிக்கப்படவில்லை என்று. இன்று மலையகப் பகுதிகளில் carpet வீதிகள் அமைக்கப்படுகின்றன. பதுளை மாவட்டத்துக்கு வந்து பாருங்கள்! நாளைய தினம் 400 மில்லியன் ரூபாய் செலவில் தம்பேதென்ன - ஹப்புத்தளை பாதை carpet இடப்பட இருக்கின்றது. பண்டாரவளை - பூனாகலைப் பாதை carpet இடப்படுகின்றது. கடந்த காலங்களில் புறக்கணிக்கப்பட்ட பாதைகள் இன்று carpet இடப்படுகின்றன. அந்த உறுப்பினர் மேலும் சொன்னார், எங்களுடைய மக்களுக்கான வீட்டுத்திட்டத்துக்கென ஒரு செங்கல்லை ஏனும் வைக்கவில்லையாம் என்று. ஐயா! நேற்று முன்தினம் நான் பூனாகலைக்குச் சென்று இவர்கள் கட்டிக்கொடுத்த வீடுகளைப் பார்த்தேன். அந்த வீடுகளுக்கு நிலத்துக்குச் சீமெந்து போடுவதற்குக்கூட பணம் ஒதுக்கப்படவில்லை. தரமற்ற வீடுகளைக் கட்டிக்கொடுத்து இருக்கிறார்கள். அந்தச் சுமையையும் நாங்கள் சுமக்கவேண்டி இருக்கின்றது. கபரகலையில் எங்களுடைய தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் கட்டிக்கொடுக்கப்படுகின்ற வீடுகளைப் பார்த்துவிட்டு, நாங்கள் ஒரு செங்கல்லையேனும் வைக்கவில்லையா அல்லது தரமான 50 வீடுகளைக் கட்டியிருக்கிறோமா என்பதைச் சொல்லுங்கள்! மக்களுடைய வரிப் பணம் சரியான முறையில் அவர்களுக்காகப் பயன்படுத்தப்படுகின்ற காலம்தான் இது! எனவே, மலையக மக்கள் பயப்படத் தேவையில்லை. அவர்களுடைய வேதனைகளை அறிந்த, நல்ல தலைவர்களை அவர்கள் இச்சபைக்கு அனுப்பி இருக்கிறார்கள். தேசிய மக்கள் சக்தி அரசாங்கமானது, மக்களின் நலன்கருதி வேலை செய்கின்ற ஓர் அரசாங்கமாகும். இந்த வரவு செலவுத்திட்டமும் அவர்களுக்கு நன்மை பயக்கும் விதத்திலே அமைக்கப்பட்டு இருக்கிறது எனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி! வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.13]

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ අපේ අතිගරු ජනාධිපතිතුමා විසින් මේ රටේ 80වෙනි අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවා. ඒ අය වැය ඉදිරිපත් කිරීමත් සමඟ විපක්ෂය බරපතළ අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. දැන් විපක්ෂය අපේ අය වැයට විරුද්ධව ගොඩ නඟන්න තර්ක සොයනවා. අද උදේ ඉඳන් කථා කළ විපක්ෂයේ එක කථිකයෙක්වත් කිසිදු අවස්ථාවකදී සාර්ථක වුණේ නැහැ, දක්ෂ ලෙස අපේ අය වැයට විරුද්ධව කිසිදු තර්කයක් ගොඩ නඟන්න හෝ විතර්කයක් ඉදිරිපත් කරන්න. 2022දී බංකොලොත් කළ රට, අපි 2024දී බාරගෙන වසරක් තුළ මෙවැනි විශිෂ්ට අය වැයක් ඉදිරිපත් කළේ කොහොමද කියලා ඔවුන් වික්ෂිප්තව බලාගෙන ඉන්නවා.

අපි කියන්න කැමැතියි, ආණ්ඩුවක් හැටියට අපට හොඳ මූල්‍ය විනයක්, හොඳ මූල්‍ය දර්ශනයක් තිබෙන බව. අපට දක්ෂ රාජ්‍ය නිලධාරීන් පිරිසක් සිටිනවා. අපි ඔවුන් සමඟ එකතුවෙලා තමයි මෙවර විශිෂ්ට අය වැයක් ඉදිරිපත් කර තිබෙන්නේ. මම කියන්න කැමැතියි, 79වෙනි අය වැයට වඩා 80වෙනි අය වැය විශිෂ්ට බව. ඒ වාගේම, 2027ට ඉදිරිපත් කරන මේ රටේ 81වෙනි අය වැය, මේ ඉදිරිපත් කළ 80වෙනි අය වැය අබිබවා යන විධියට, මීට වඩා විශිෂ්ට අය වැයක් ලෙස අපි විසින්ම ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආණ්ඩුව ගන්න අවස්ථාව වනකොට විවිධ ආර්ථික ඔස්තාර්ලා, ආර්ථිකය පිළිබඳ විශේෂඥයන් මැතිවරණ වේදිකාවල කිව්වා, 2019දී තිබුණු මට්ටමට මේ රට එන්න නම් තව අවුරුදු 10ක් යනවා, අවුරුදු 15ක් යනවා කියලා. තවත් සමහරු කිව්වා, සංවර්ධිත රටක් බවට පත් වෙන්න 2048 වෙනකම් බලාගෙන ඉන්න කියලා. නමුත් අපි ආණ්ඩුව අරගෙන වසරක් සම්පූර්ණ වෙන මේ දෙසැම්බර් මාසය

[ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය]

වනවිට අපට හැකියාව ලැබිලා තිබෙනවා, 2019දී තිබුණු ආර්ථික තත්ත්වයට මේ රට ගෙනැවිත් අපේ මහජනතාවට ශක්තිමත් ආර්ථිකයකින් යුතු රටක් දායාද කිරීමට.

ඊයේ අය වැයෙන් පසුව අපේ විපක්ෂ නායකතුමා කියලා තිබුණු කථාව මම අහලා බැලුවා. එතුමා කියලා තිබෙනවා මේ අය වැය මහ පොළොවේ පය ගහලා හදපු අය වැයක් නොවෙයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ රටේ මහජනතාව දන්නවා, මේ මහ පොළොවේ පය ගහලා ඉන්නේ සහ නැත්තේ ජනාධිපති අනුර කුමාර දිසානායක ප්‍රමුඛ මේ ආණ්ඩු පක්ෂයද, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා ප්‍රමුඛ විපක්ෂයද, කවුද කින්ද මන්ද කියලා. මහජනතාවට බාරයි මේ අය වැය මහ පොළොවේ පය ගහලාද, නැතිවද හැදුවේ කියලා තීරණය කරන්න. ඒ කරුණු සනාථ කරන්නත් එක්ක මම උදාහරණ කිහිපයක් කියන්නම්. අපේ ගරු අම්බිකා සාමුවෙල් මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මෙවර අයවැයෙන් රටට ඩොලර් උපයන වතු කම්කරුවාගේ ඉඳන් රාජ්‍ය සේවකයා දක්වාත්, ඒ වාගේම, මේ රටේ ඉන්න කාන්තාවන් වෙනුවෙන්, ළමා පරපුර වෙනුවෙන්, විශ්‍රාමික ශ්‍රමිකයන් වෙනුවෙන්, ආබාධිත ශ්‍රම බලකාය වෙනුවෙන්, ආබාධිත තැනැත්තන් වෙනුවෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ සියලු ක්ෂේත්‍ර ආවරණය කරලා තිබෙන්නේ.

මහ පොළොවේ පය ගහලාද මේක හැදුවේ කියන එක සනාථ කරන්න අපට තව හොඳ උදාහරණයක් තිබෙනවා. මේ අය වැයේ කථා කරලා තිබෙනවා වීදි සුනඛයෝ ගැන පවා. ඒ වාගේම අලි ඇතුන් ඇතුළු සොබා දහම ගැන කථා කරලා තිබෙනවා. ඒ නිසා මේක හොඳට මහ පොළොවට දැනෙන අය වැයක් බව අපට තේරුම් ගන්න පුළුවන්. මේක මිනිස්සු ගැන වාගේම සතුන් ගැනත් කථා කරලා තිබෙන අය වැයක්. මීට පෙර කවදාද මෙවැනි අය වැයක් මේ රටට ඉදිරිපත් වෙලා තිබෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දුම්රිය හරස් මාර්ගවල ගේට්ටුකරුවන්ට 2013 ඉඳන් රුපියල් 7,500ක දීමනාවක් ලැබුණේ. ඒ මිනිස්සු එතැන කරන්නේ රක්ෂාවක් නොවෙයි සමාජ සේවයක්. දවසේ ඒ අදාළ පැය ගාණම වැඩ කළත් රුපියල් 7,500යි හම්බ වෙන්නේ. සමහර දවස්වලට පාන්දර 4.30 ඉඳන් රාත්‍රී 10.30, 11.00, 12.00 වෙනකම් දුම්රිය පැමිණෙනවා. මෙවර අය වැයෙන් ඔවුන්ගේ ඒ දීමනාව රුපියල් 15,000 දක්වා වැඩි කර ගැනීමට අපට හැකියාව ලැබිලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருணி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අමතරව තව විනාඩියක කාලයක් ඉල්ලා සිටිනවා. විපක්ෂයේ අය අපේ වටිනා කාලය නාස්ති කළා. ඉතා වැදගත් කාරණාවක් තමයි, මේ අය වැය විවාදයේදී මම අද ඉදිරිපත් කරන්නේ. එම නිසා අමතර විනාඩියක කාලයක් මම ඉල්ලා සිටිනවා.

ඊයේ ප්‍රකාශ කර තිබුණා, රටේ දරිද්‍රතාව එන්න එන්න වැඩි වෙලා තිබෙනවා, දිළිඳුකම එන්න එන්න වැඩි වෙලා තිබෙනවා කියලා. අපි 2024දී ආණ්ඩුව භාර ගන්නකොට දරිද්‍රතාව සියයට 24.5යි. ඒක 2025දී සියයට 22.7කට අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම විරැකියාව 2024දී සියයට 4.4යි. 2025 මේ වනකොට එය සියයට 3.8 දක්වා අඩු වෙලා තිබෙනවා. අපි එතැනින් නතර වෙන්නේ නැහැ, ඒ සංඛ්‍යා දත්තවලින් නතර වෙන්නේ නැහැ.

අපට මෙවර අය වැයෙන් ප්‍රජා ශක්ති, දිළිඳුකම තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය හරහා රුපියල් මිලියන 25,000ක් වෙන් වෙලා තිබෙනවා. ගමේ බිමේ, නගරයේ සංවර්ධනයට වෙන් වන විමධ්‍යගත මන්ත්‍රී අරමුදල්වලට අමතරව, ප්‍රාදේශීය සභාවට, නගර සභාවට වෙන් වන මුදල්වලට අමතරව, තමන්ගේ ගම සංවර්ධනය කර ගන්න සෑම දිස්ත්‍රික්කයටම රුපියල් මිලියන 1,000 බැගින් වෙන් වෙලා තිබෙනවා. අපි ගමේ ඉන්න දිළිඳු ජනතාවගේ ග්‍රාමීය ආර්ථිකය, යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා වූ විශිෂ්ට වැඩ පිළිවෙළක් මේ දවස්වල මෙහෙයවමින් යනවා. ප්‍රජා ශක්ති ජාතික වැඩසටහනට අදාළ කමිටු සභාපතිවරුන්ට දැන් පත්වීම් ලබා දෙමින් මූලික කටයුතු ටික අපි පටන් අරගෙන තිබෙන්නේ. මුදල් ටික ගමට ගියාට පස්සේ ජනවාරි සිට අපට ඒ කටයුත්ත පටන් ගන්න පුළුවන්.

විශේෂයෙන්ම ළමයින් වෙනුවෙන්, අධ්‍යාපනය වෙනුවෙන් මේ අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. 2026 වර්ෂයේදී ජනතාවගේ නිවාස අවශ්‍යතා වෙනුවෙන් නිවාස 27,000ක් ඉදිකිරීමට නියමිතව තිබෙනවා. ඒ වාගේම, ළමා නිවාසවල ඉඳලා වයස අවුරුදු 18 සම්පූර්ණ වුණාට පස්සේ එළියට එන දරුවන්ට නිවසක් සාදා ගැනීමට හෝ ඉඩමක් මිලදී ගැනීමට රුපියල් මිලියන 2ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමට මුදල් වෙන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනය වෙනුවෙන් මෙවර රුපියල් බිලියන 704ක් වෙන් වෙලා තිබෙනවා. මම එක කාරණයක් කියන්නම්. ඊට බාධා නොකරන ලෙස ඉල්ලා සිටිනවා. 2025 අය වැයෙන් වෙන් වෙලා තිබෙන මුදලින් රුපියල් 10,000ක් දක්වා මහපොළ ශිෂ්‍යාධාර මුදල ඉහළ නංවා තිබෙනවා. මා ළඟ තිබෙනවා ඒ දත්ත සහ තොරතුරු. 2006දී මහපොළ ශිෂ්‍යාධාර දීමනාව ලෙස ලබා දුන්නේ රුපියල් 2,500යි. ඒ රුපියල් 2,500ක මුදල රුපියල් 5,000 දක්වා වැඩි වෙන්න අවුරුදු 9ක් ගතවෙලා තිබෙනවා. 2015දී තමයි ඒක රුපියල් 5,000 බවට පත් වුණේ. ඉන්පසුව 2019 ආණ්ඩුවෙන් -ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවෙන්- විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මැතිවරණ පොරොන්දුවක් ලබා දුන්නා, මහපොළ දීමනාව රුපියල් 7,500ක් බවට පත් කරනවා කියලා. ඒ, 2019දී. හැබැයි, ඒ පොරොන්දුව ඉෂ්ට කළේ නැහැ. ඉන්පසුව 2020දී බන්දුල ගුණවර්ධන හිටපු උසස් අධ්‍යාපන ඇමතිතුමාත් කියලා තිබෙනවා, ඉන්පසු අවුරුද්දේ සිට 10,000ක් ලබා දෙනවා කියලා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019දී මහපොළ ශිෂ්‍යාධාරය සඳහා වෙන් කරනවා කියපු රුපියල් 7,500 අපි ආණ්ඩු බලය අරගෙන අවුරුද්දක් ඇතුළත වෙන් කර තිබෙනවා. ඒ වාගේම, 2020දී රුපියල් 10,000 දක්වා වැඩි කර වැඩි කරනවාය කියපු මහපොළ ශිෂ්‍යාධාරය අපි ආණ්ඩු බලය අරගෙන දෙවෙනි අය වැයේදී වැඩි කර තිබෙනවා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ ආණ්ඩුව ගැන, මේ අය වැය ගැන විපක්ෂයට නිසි තර්කයක් ගොඩ නඟා ගන්න බැරි වුණු වෙලාවේ වැරදිලාද දන්නේ නැහැ, එතුමන්ලාගෙන් මේ අය වැය ගැන ගුණ වැයීම් පවා සිද්ධ වුණා. හිටපු ඇමතිතුමෙක් උදේ කිව්වා, "ට්‍රිලියනයක අතිරික්තයකින් භාණ්ඩාගාරය පිරී ඉතිරිලා ගිහිල්ලා තිබෙනවා, නමුත් අපට භයයි, මේක කොහොම කළමනාකරණය කර ගනියිද කියලා" යනුවෙන්. මම විපක්ෂයට කියන්න කැමැතියි, අපි ආදායම් උත්පාදනය කර ගන්නත් දන්නවා, කළමනාකරණය කර ගන්නත් දන්නවා, කිසිදු සතයකට හානියක් වෙන්න දෙන්නේත් නැහැ කියන කාරණය. අපි ජනතාවට පොරොන්දු වුණු ආකාරයටම ඒ වගකීම ඉෂ්ට

කරනවා. මහජන මුදල් සතයක් නැර මහ ජනතාවගේම ප්‍රයෝජනය වෙනුවෙන් උපරිම විධියට යොදවලා, අපි මේ රට දියුණු රටක් බවට පත් කරනවා කියා විශ්වාසයෙන් යුතුව මම ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.22]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අය වැය පිළිබඳව අද මා කරුණු ඉදිරිපත් කරන්නේ ඉතාම ආඩම්බරයෙන්, සතුටින්. ඒකට හේතු වන එක කාරණාවක් තමයි, අපේ රටේ ජනතාව 2024 සැප්තැම්බර් 21වැනි දා ඉතිහාසගත වන, ඉතිහාසයේ රන් අකුරින් ලියැවෙන තීන්දුවක් ගැනීම. ඒ වාගේම, ඒ ලැබූ ජයග්‍රහණය 2024 නොවැම්බර්වලදී තවත් තීව්‍ර කරලා ජනතාව අපට ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ඒ ඓතිහාසික ජයග්‍රහණය හරියටම තේරුම් ගෙන ඉතිහාසගත වන අයවැයක් තමයි වසරකට පසුව මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඉතිහාසයේ පළමුවැනි වරට අප මේ ඉදිරිපත් කරන්නේ, මහජන මුදල් අවභාවිත නොකළ, අනිසි වරප්‍රසාද භුක්ති නොවිඳපු කාල සීමාවකට පසුව ඉදිරිපත් කරන අය වැයක්; අලුත් දේශපාලන සංස්කෘතියක් ඇතුළේ ඉදිරිපත් කරන අය වැයක්. ඒ නිසාම අප මේ අය වැය ඉතාම සතුටින් තමයි ඉදිරිපත් කරන්නේ.

අපේ රටේ ඉතිහාසයේ අය වැය ගැන ලියැවී තිබුණේ, මහජන නියෝජිතයා ගැන සඳහන් වෙලා තිබුණේ වෙනත් ආකාරයකට. අද දවස වන විට විපක්ෂය පැත්තේ සමහර මන්ත්‍රීවරුන්ට එක පැත්තකින්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු තවත් පැත්තකින් කලබල වෙලා සිටිනවා. මේ සියල්ල තුළ පෙනෙන්නේ ජාතික ජන බලවේගයේ ජයග්‍රහණයයි කියන එක අපි පැහැදිලි ලෙසම සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගයේ අපට අදහසක් තිබෙනවා. ඇත්තටම අප කල්පනා කරන්නේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යටතේ සර්ව සම්පූර්ණ රටක් ගොඩ නගන්නයි; මිනිසුන්ට සතුටින් ජීවත් වෙන්න පුළුවන් සමාජයක් ගොඩ නගන්නයි. අපි මේ ඉදිරිපත් කර තිබෙන්නේ අපේ ආණ්ඩුව ගමන් කරන දෙවැනි වසරට අදාළ අය වැයයි. හැබැයි, වසරක් ඇතුළත හෝ දෙවන වසර ඇතුළත ජාතික ජන බලවේගය විධියට අප බලාපොරොත්තු වන සර්ව සම්පූර්ණ රට ගොඩනගන්න බැහැ. ඇයි? ඒකට ප්‍රධාන හේතුව මොකක්ද? වසර 76ක් තිස්සේ මේගොල්ලන් මේ රට කෑවා. කෑවා විතරක් නොවෙයි, උළා කෑවා. එදා රට කොතැනද තිබුණේ? මේ රටේ මිනිස් සමාජය කෲරත්වයේ සිට අතිකෲරත්වය දක්වා ගමන් කරමින් තිබුණේ. නරුමවාදයේ සිට අතිනරුමවාදය දක්වා ගමන් කරමින් තිබුණේ. මිලේච්ඡත්වයේ සිට අතිමිලේච්ඡත්වය දක්වා ගමන් කරමින් තිබුණේ. එදා මේ රටේ සියලු පද්ධති වට්ටලා තිබුණේ. ආර්ථිකය බංකොලොත් කරලා තිබුණේ. මේ රට අමු සොහොනක් බවට පත් කරලා තිබුණේ. එහෙව් රටයි අපි භාර ගත්තේ. අප රට භාරගත් පසු ඉදිරිපත් කළ දෙවැනි අය වැයයි, මේ. ජයග්‍රාහී වසරකින් පසුව අප ඉදිරිපත් කරන අය වැයයි, මේ.

2025 පෙබරවාරි මාසයේදී අපේ මුදල් ඇමතිතුමා -අපේ රටේ අතිගරු ජනාධිපතිතුමා- වන අනුර කුමාර දිසානායක මැතිතුමා 2025 වසරට අදාළ අය වැය ඉදිරිපත් කළා. ඒක, එම අය වැය ලේඛනයේ සියලු මූල්‍ය ප්‍රභවයන් සාර්ථක කර ගත් අය වැයක්. ඒකත් අභිභවා ගිය අය වැයක් බවට මේ අය වැය පත් කර තිබෙනවා. එම අය වැයෙහි සියලු සංඛ්‍යාලේඛන හා දත්ත අභිභවා ගිහින් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, වර්තමාන රජය ගෙන යන වැඩ පිළිවෙළ ජාත්‍යන්තරය හමුවේ, විවිධ ශ්‍රේණිගත කිරීම් අතරේ, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ, ලෝක බැංකුව තුළ ප්‍රශංසාවට ලක් වෙලා තිබෙනවා. අද විපක්ෂයේ අයගේ ඇස්වලට කටුවලින් අනිනවා වාගේ, පොල් පරාලවලින් අනිනවා වාගේ මේ අය වැය දැනෙන්නේ ඒ නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයට උත්තර කිහිපයක් දෙන්න මට ඕනෑකමක් තිබෙනවා. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයේ අය විශේෂයෙන්ම දක්ෂයි අපේ රටේ මිනිසුන්ට භූතයන් පෙන්වන්න සහ අනාවැකි කියන්න. මොකද, මිනිසුන් කැමැතියි භූතයන්ට සහ අනාවැකිවලට. විපක්ෂය ඉතිහාසයේදී කළේත් අප පිළිබඳවත් අනාවැකි කීම සහ භූතයන් පෙන්වපු එක. අද කරන්නේත් ඒකමයි. විපක්ෂය මේ අය වැය සම්බන්ධවත් භූතයෝ මවා පෙන්වනවා සහ අනාවැකි කියනවා. මේක තමයි කරන්නේ. කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වේ ඒ අනාවැකි. ජාතික ජන බලවේගය ලස්සන ගමනක් ආරම්භ කර තිබෙනවා. මේ රටේ ඉස්සරහට අරගෙන යන්න ඉලක්ක සහගතව, පැහැදිලිව ඉලක්කම් එක්ක, පුරෝකථනත් එක්ක අය වැයක් ඉදිරිපත් කරන කොට ඒගොල්ලෝ අනාවැකි කියනවා; රටේ ජනතාවට භූතයන් පෙන්වනවා.

භූතයන්ට කැමැතියි තමයි. හැබැයි, ඒගොල්ලෝ කැමැති භූතයෝ ටිකක් ඉන්නවා, රටේ. ඒගොල්ලන්ගේ මනදොළ සතුටු කරන්න තමයි මේගොල්ලෝ මේ භූතයෝ පෙන්වමින් ඉන්නේ. මේ අය වැය විවාදය ඇතුළේ ඒකට උත්තර දෙන්න කාලය මදි. එතුමා හිටියා නම් බොහොම හොඳයි. ඒගොල්ලෝ අනාගතය පිළිබඳව රටේ ජනතාවට පෙන්වන්න ලක ලැහැස්ති වෙන භූතයෝ සහ අනාවැකි බොරු කරලා පෙන්වන්න අපට පුළුවන්කම තිබෙනවා. නමුත් ඒකට කාලය නොවෙයි මේ. ඒකට වෙලාව මදි. අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විශේෂයෙන්ම, අපේ රටේ ග්‍රාමීය දුප්පත්කම නැති කරන්න ඉලක්ක කරගත්, අපේ රටේ ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැඟීම ඉලක්ක කරගත්, ඒ වාගේම සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් අපේ රටේ මිනිසුන්ට උරුම කර දෙන්න ඉලක්ක කරගත්, පාරිසරික වශයෙන් තිරසර සංවර්ධනයක් සහිත රටක් ගොඩ නැඟීම අරමුණු කරගත්, ආරක්ෂිත, කාර්යක්ෂම, පරිසර හිතකාමී තිරසර ප්‍රවාහන සේවයක් ඉලක්ක කරගත්, මේ රටේ අපි ලබන ආර්ථික ප්‍රතිලාභයක් ඇත්නම් ඒ සියල්ල මුළු රටම ආවරණය වන පරිදි අපේ රටේ සකලවිධ ජනතාවගේ ජීවිතවලට, අපේ රටේ පහළම කොටසට ගලාගෙන යන හොඳ සැලැස්මක් එක්ක ඉදිරිපත් කරපු අය වැයක්. ඒ නිසා අපි බොහොම සතුටින් ඉන්නේ මේ අය වැය ක්‍රියාත්මක කරන්න.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ලසිත් භාෂණ ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.29]

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් අය වැය කථාවකින් සිදු වෙන්නේ, එම වර්ෂයට අදාළව රට ගමන් කරන්න බලාපොරොත්තු වෙන මාර්ගය පෙන්වීමයි. රටක ආර්ථිකය, සමාජය සහ සංස්කෘතිය ඉදිරියට ගෙන යන්න යෝජනා කරන දැක්ම තමයි අය වැය කථාවේදී ඉදිරිපත් කරන්නේ.

අපට ඊයේ අහන්න ලැබුණු අය වැය කථාව විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු බොහොම අමාරුවෙන් තමයි අහගෙන හිටියේ. මොකද, ඒ තරමටම ඒ අය වැය වදින්නම දුන්නා. ඒ වාගේම කාලය වැඩියි කියලා පිරිසක් ඉක්මනින් යන්න හැදුවා. ඒ වාගේම පිරිසක් ගියා. කලින් තිබුණු අය වැය තුළින් කථා කරලා තිබෙන්නේ මොනවාද කියලා බලන්න. අල, ලූනු, පරිප්පු මිල අඩු කරන එක නොවෙයි අය වැය කථාවක් කියන්නේ. නමුත් එහෙම තමයි කලින් අය වැය ගෙනාවේ. අපේ ආණ්ඩුවේ පළමුවැනි අය වැය ගෙනැල්ලා ඊට මාස අටකට පස්සේ තමයි අපට මේ දෙවැනි අය වැය ගෙනෙන්න සිද්ධ වෙන්නේ. අය වැය කථාව තුළින් ඉතාම හරවත් විධියට, 2026 වසරේ අපේ රට ගමන් කරන්න බලාපොරොත්තු වෙන ආර්ථික දර්ශනය මොකක්ද කියලා ඉදිරිපත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ අය වැය ගෙනෙන්න සිද්ධ වෙන්නේ, අපේ පළමුවැනි අය වැය ගෙනැල්ලා මාස අටකට පස්සේ. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා, වැඩ කරලා මදි, වැඩ කරලා නැහැ කියලා.මන්ත්‍රීවරයෙක් කිව්වා, භාණ්ඩාගාරයේ මුදල් zero කියලා. ඒ වාගේම කියනවා, වැඩ වෙලාම නැලු. ඇත්තටම ඒ කියපු සමහර කාරණා බොරු. සමහර ඒවාට විශේෂ හේතු කාරණා තිබෙනවා. ඒ විශේෂිත හේතු කාරණා අතරේ රාජ්‍ය සේවයේ කඩා වැටීමත් තිබෙනවා. රාජ්‍ය සේවයේ වෙච්ච ඒ කඩා වැටීමට මේ අය වැයෙන් ඉතාම සාධනීය විසඳුම් යෝජනා කරලාත් තිබෙනවා. අපි දන්නවා, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට 2025 වසර සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 8,000කට වැඩි මුදලක් වෙන් කර තිබුණු බව. හැබැයි, අපට තිබුණු ගැටලුව මොකක්ද? අපට විශාල ගැටලුවක් තිබුණා. ඒ මුදල ක්‍රියාත්මක කිරීමේදී අපේ පළාත් පාලන ආයතන තුළ, පළාත් සභාව තුළ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ අදාළ තාක්ෂණ නිලධාරින් හෝ හරි හමන් නිලධාරින් හිටියේ නැහැ. අපට සිද්ධ වුණා, ඒවා එකින් එකට අධීක්ෂණය කරන්න. සමහර විට ඒවා බලපෑම් සහගතව අධීක්ෂණය කරන්න වුණා. සමහර විට කන්නලව් කරලා ඒ වැඩ කර ගන්න සිද්ධ වුණා. ඒ නිසා අපි මේ අය වැයෙන් රාජ්‍ය සේවයට බඳවා ගන්න යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම අතහැර දැමූ පැරණි ගොඩනැඟිලි කාර්යක්ෂමව යොදවා ගැනීමටත් යෝජනා කර තිබෙනවා. බාගෙට හදපු ගොඩනැඟිලි නැවත හැදීමට මුදල් යොදවන්න යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය සේවයට අවශ්‍ය වාහන පහසුකම් සපයන්න යෝජනා කරලා තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඉන්නේ තාක්ෂණ නිලධාරින් - TOsලා - 5දෙනායි. දිස්ත්‍රික්කයටම තිබෙන්නේ වාහනයයි. ඉතින් කොහොමද වාරි කර්මාන්තය නඟා සිටුවන්නේ? එම නිසා වාහන ගෙනෙන්න යෝජනා කරලා තිබෙනවා. ඊට අමතරව ඩිජිටල්කරණයට අදාළ වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යන්න යෝජනා කරලා තිබෙනවා. ඒක තවත් ශක්තිමත් කරන්න යෝජනා කරලා තිබෙනවා. මේ ආණ්ඩුව තමයි ලංකා ඉතිහාසයේ පළමුවැනි ආණ්ඩුව, ඩිජිටල් අමාත්‍යාංශයක් හදන. ඒ අමාත්‍යාංශය මඟින් 2026 වසරට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කර තිබෙනවා.

ඒ වාගේම තමයි නිලධාරින්ගේ ගැටලුව. එක මන්ත්‍රී කෙනෙක් කිව්වා, ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ ඉන්න නිලධාරින් හින්දාත් ඔබතුමන්ලා අපහසුතාවට පත් වෙන්න පුළුවන් කියලා. අපි දන්නවා ඒක. නිලධාරින් ලොකු පිරිසක් ඉන්නවා, අති උනන්දුවෙන් මේ වැඩකටයුතු කරන. තව පිරිසක් ඉන්නවා, වැඩ බැරි. ඒ දවස්වල සංස්කෘතියක් තිබුණා, "ෂෝට්" ගහගෙන කකුල් දෙක උඩ දාගෙන පත්වීම් දුන්න. අන්න, එහෙම පිරිසක් ඉන්නවා. තව පිරිසකුත් ඉන්නවා කකුලෙන් අදින්න උත්සාහ කරන. අපි ඒ ඔක්කෝම හඳුනාගෙන තිබෙන්නේ. ඒ අය හඳුනාගෙන තිබෙනවා. අදාළ තැන්වලදී ඒ අයටත් ක්‍රියාමාර්ග ගන්නවා.

විශේෂයෙන්ම තරුණයෝ ගැන කථා කළා. ඒ ගැන කියලා කිඹුල් කඳුළු හෙළුවාද කියලාත් හිතෙනවා. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් කිව්වා, V4R App එක ගැන. මම හිතන හැටියට එතුමා ඒ documents බලන්නේ නැතිව ඇති. මේ වසරේත් ඒකට අදාළ මුදල් වෙන් කරලා තිබෙනවා. ලබන වසරටත් ඒකට අදාළ යම් මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට නියමිතව තිබෙනවා. ඒ වාගේම ව්‍යවසායකත්වය, වෘත්තීය පුහුණු අධ්‍යාපනය දෙගුණ කරන්න යෝජනා කරලා තිබෙනවා. මේවා සියල්ල කරන්නේ තරුණයෝ වෙනුවෙන් තමයි.

ඊළඟට, කෘෂි ව්‍යවසායකයන් වෙනුවෙන් රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබුණත්, මේ වසරේ -2025 වසරේ- ඒක සිද්ධ වෙන්නේ නැහැ කියලා කිව්වා. ඒක බොරු. ඒ රුපියල් මිලියන 500න් සියයට 100ක් ණය පහසුකම ලබා දෙන්න අපට හැකියාව තිබෙනවා. අපි ඒක ලබා දෙනවා.

ඒ වාගේම, දුප්පත්කම සම්බන්ධයෙන් කබීර් හෂීම් මන්ත්‍රීතුමා එක බොරුවක් කිව්වා. එතුමා කිව්වා, 2025 වසරේ දුප්පත්කම වැඩි වෙලා කියලා. ඒක බොරු නේ. 2024ට වඩා දුප්පත්කම අඩුයි. මොකක්ද ඒ දත්ත ගත්ත ලේඛනය? World Bank එකේ දත්ත අනුව ඒක අඩු වෙමින් පවතින්නේ; අඩු වෙලා තිබෙන්නේ.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
World Bank එක කිව්වාට වැඩක් නැහැ, දත්ත ඕනෑ.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
මම දන්නේ නැහැ, මොන දත්ත පද්ධතියක් බලාගෙන කථා කළාද කියලා. 2025ට අදාළ දත්ත පද්ධතියක් තිබෙනවා නම් ඒක මොකක්ද කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ලසිත් භාෂණ ගමගේ මහතා**
(மாண்புமிகு லசித் பாஷண கமகே)
(The Hon. Lasith Bhashana Gamage)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය බලාපොරොත්තු වෙනවා අපේ ආර්ථික මොඩලය මොකක්ද කියලා හොයන්න. අපේ පළමුවැනි අය වැයේදීත් ඒ ගැන සාකච්ඡාවක් කළා. මම හිතන හැටියට ඒ ගැන දිගටම කථා කළොත් අවුරුදු ගණනාවක් යනතුරුම ඔබතුමන්ලාට ඒ ආර්ථික මොඩලය ගැන හොය හොයා ඉන්න වෙනවා. මොකද, ඊළඟට ඔබතුමන්ලාට කථා කරන්න දෙයක් නැති වෙන්න ම ඊළඟ අය වැය ලබා දෙනවා. *[බාධා කිරීමක්]* ඒක වෙන්න ඇති.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් තව එක කාරණයක් කියන්න ඕනෑ. පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් උදා කර දෙන්න යන ගමනේදී මේ රටේ කුටුම්බ ශක්තිමත් කරලා, කුටුම්බ ඔස්සේ ගම ශක්තිමත් කරලා, ගම් ඔස්සේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඔස්සේ දිස්ත්‍රික්ක ශක්තිමත් කරලා, ශක්තිමත් ජාතියක්, ශක්තිමත් ශ්‍රී ලංකාවක් ගොඩ නඟන්න බලාපොරොත්තු වෙනවා. අන්න ඒ ශක්තිමත් ශ්‍රී ලංකාව ගොඩ නඟන්න බලාපොරොත්තු වුණත් අපි දන්නවා, ඒක තනියෙන් කරන්න බැහැ කියලා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඒක තමයි කිව්වේ. මේ කටයුත්ත තනියෙන් කරන්න බැහැ. ඒක ඇමති මණ්ඩලයට තනියෙන් කරන්න බැහැ. ඒක මන්ත්‍රීවරුන්ට තනියෙන් කරන්න බැහැ. ඒක කරන්න ප්‍රජා සහභාගිත්වය ඕනෑ. ප්‍රජා සහභාගිත්වය, රාජ්‍ය යන්ත්‍රණය, දේශපාලන නායකත්වය කියන මේ සියල්ලේ එකතුවක් තුළින් විතරයි, මේ සියල්ල සංහිඳියාවෙන් අත්වැල් බැඳ ගත්තොත් විතරයි මේකෙන් ගොඩ යන්න පුළුවන්. අපි ඒක අනිවාර්යයෙන්ම කරනවා. අපි ඒක පැහැදිලි කරමින් ඉන්නවා. අපි ඒක තවත් පැහැදිලි කරනවා. අපි අනිවාර්යයෙන්ම ඒක ජය ගන්නවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[5.38 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

Hon. Presiding Member, to preface my arguments on the Second Reading of the Appropriation Bill, I would like to quote from a publication by the ODI, a think-tank, where among the contributors are, former Governor of the Central Bank, Dr.Indrajit Coomaraswamy, Dr. Nandalal Weerasinghe, the current Governor and also prominent economist Prof. Shanta Devarajan. This book titled "Sri Lanka: from debt default to transformative growth" states, I quote:

> "These improvements in the economy can be traced to a combination of decisive stabilisation measures, the IMF programme and interim Indian aid…"

Together with that, they further say, I quote:

> "The country's 17th IMF programme has brought in the toughest policy conditionalities and austerity measures so far in Sri Lanka. It focuses on revenue-based fiscal consolidation and seeks to significantly raise tax revenue and increase utility prices; control inflation by raising interest rates, eliminating monetary financing and ensuring an independent central bank; rebuild foreign exchange reserves through a flexible exchange rate and other measures; safeguard financial stability by ensuring adequately capitalised banks and a new banking act; and reduce corruption risks through better fiscal transparency and public financial management."

This was also stated in the IMF Report in 2023. So, all these had taken place before this Government took over; the most difficult job had been completed by the previous administration. This book also states, I quote:

> "…Sri Lanka sought bridging finance and aid from India to finance essential imports of food, fuel and medicines. In the first six months of 2022, Indian aid worth $3.8 billion flowed to Sri Lanka, through credit lines and deferred loans and grants. This meant this was India's largest bilateral aid programme to any country in recent times."

So, if not for that, we would have been in dire straits. But, all these things happened before this Government took over. And, now, the Government is continuing to abide by the rules set by the IMF, very obediently following their dictates.

Sir, earlier, I have talked about cost-reflective pricing formulas. The CEB started increasing electricity rates to go along with the cost incurred. Originally, in 2022, as the Hon. Kabir Hashim mentioned, their loss was Rs. 298 billion. However, in 2024, there was a profit of Rs. 1,044 million. So, from a loss of Rs. 298 billion, a profit of Rs. 1 billion had been declared in 2024. With that, what did the President promise to the consumers? During the election he said, "We will reduce the electricity rates by 30 per cent." Did it happen? No, because the IMF will not allow you to do that. Much worse than that, the IMF insisted that you must add on the legacy debt. So, whatever debt that had accumulated has been added onto the consumer and the consumer is paying for all that! So, what the President promised, he never did. Of course, a very flourish speech was made yesterday, but promises were not kept. So, that is one issue.

Speaking about the CEB, I would like to move on to another important factor. Now, in the public domain, there is a discussion regarding an issue relating to the grand theft of our nation's power. It is arguably the most brazen, calculated and unconscionable raid on the public purse in the history of this Republic. What we are witnessing, Sir, is not a mere accounting anomaly. I am talking about the grand theft, an orchestrated plunder of the Ceylon Electricity Board executed over decades by a cabal of 15 individuals led by one U. D. Jayawardena, who weaponized insider access and fiduciary trust to siphon billions from the State. This is not conjecture, Sir; on those findings, discussions are going on in this Parliament now and this is in the public domain.

Now, Sir, let me talk about the anatomy of this theft. In 1980, the CEB founded the Lanka Transformers Limited to serve public interest. It was a State-owned entity with 70 per cent of its shares held by the CEB. Over time, foreign shareholders wanted to exist from the company. Then, what happened? Instead of the CEB reclaiming its rightful stake, the Board, chaired by Mr. Nalinda Illangakoon, declined to purchase the shares, citing cash flow constraints. It was worth a mere Rs. 500 million. The CEB said, "We cannot pay this money. We have cash flow constraints." Then, what happened? Then came the betrayal. Mr. Illangakoon, wearing two hats as the Chairman of both the CEB and the LTL, facilitated the transfer of those shares to a private trust - LTG ESOT - controlled by the very insiders who orchestrated the scheme. That trust, now renamed "Peradev (Pvt.) Limited", is 82 per cent owned by that robber gang of 15 engineers. They, now, beneficially own almost 30 per

[ගරු නිතිඥ රවුෆ් හකීම් මහතා]

cent of LTL Holdings without investing a single rupee! How is this happening? This is a very serious matter, Sir. The value of this almost 30 per cent stake is estimated to be between Rs. 34.4 billion and Rs. 64.5 billion, as per independent valuation done by the NDB Investment Bank and the CT CLSA Capital (Pvt.) Limited. Sir, I **table*** a few documents related to this issue.

Sir, since 2018, this gang has pocketed almost Rs. 5 billion in dividends. All of this was enabled by leveraging the sovereign strength of the CEB without public consent, transparency and without a shred of accountability. What did they do? They did not even commit themselves to the audit done by the Auditor-General; they filed action after action in courts. And, it is a shame that the Member in the Cabinet who filed action against that withdrew the action! He withdrew the action after filing it in Supreme Court. So, that also happened. Why did he withdraw the action? They call it a management buyout, but it is a betrayal of the people.

We must demand a full forensic audit of the LTL Holdings and its share transfers, make an immediate referral of this case to the Commission to Investigate Allegations of Bribery or Corruption and bring in a legislative reform to prevent any future abuse of State-owned enterprises and employee trusts. So, this is not just about recovering stolen billions, but about restoring public trust; it is about sending a message that no one, however powerful he is, can loot the State and walk away unscathed. Therefore, this is a very important exposure.

Sir, in the past, we boldly challenged the e-visa scandal taken place during the last regime. We went to the Supreme Court and today, the Controller General of Immigration and Emigration has been punished and is in jail for contempt of court, for not obeying the court order, and the case had been taken up recently. An Hon. Member of the Government pointed it out as if it is their achievement. But, it is us, Members of the Opposition, who went to court and challenged it and finally, got the tender, which was awarded without any transparency and which was to rob the country, cancelled. Almost one-third of the entire IMF bailout would have been earned by them, if we allowed the contract to stand. Therefore, we went to court and challenged it. Of course, the arguments are pending in that case.

Then, Sir, I would like to refer to some of the Proposals in this Budget. Particularly, there was a lady Member of the Government who spoke about the new Community Development Councils to be established in every Grama Niladhari Division to identify the real development needs and opportunities of the people. Now, steps are being taken to plan regional development programmes of the Government according to the development needs identified by those councils. How are these councils created? Now, in some areas, those councils have already been started to be created; Government Members are forming those councils. In order to implement the Integrated Rural Development Programme Island-wide under the National Campaign for Eradicating Poverty, the President said that he is allocating Rs. 20,750 million in addition to the existing provision of Rs. 4,250 million, which is almost Rs. 25,000 million in total, for the Praja Shakthi Programme. So, all of these are included. And, these councils are now being formed and the Government Members are appointing their defeated local authority candidates as chairmen of those councils. How can this happen? Where is transparency? You all are using your own defeated candidates to chair those councils. That is happening in Akkaraipattu and Addalaichenai. So, that is this the way in which it is being done. If State funds are to be spent, there must be a proper legal mechanism created through an independent selection. But, that does not happen at the rural level. You all are again going to let your own defeated candidates, who are doing political work having lost at the Local Authority Elections, control development work, sidelining all the elected local authorities from being involved in development of the area. So, that is another issue I would like to highlight.

Having said that, Sir, I would now like to deal with some of the other issues they spoke about. For 2026, there is an allocation of Rs. 150 million made for an indoor Sports Stadium in Kalmunai. That same Rs. 150 million was allocated from the Budget of last year, but not a single cent has been spent. That is what the Hon. Kabir Hashim pointed out. So, last year, Rs. 150 million was allocated, but not a single cent has been spent and again, Rs. 150 million has been allocated for 2026. Actually, out of the entire money that had been allocated last year, there has been only a 30 per cent physical progress and not even a 20 per cent financial progress. That is what has happened; that is what the assessment states.

Of course, we must thank the President for having allocated Rs. 300 million for the half-finished auditorium in Nintavur; we appreciate that. That was something for which we spent another Rs. 400 million and at that time, since the Government changed, we could not complete it. Now, this Government has come forward to complete it. So, we congratulate and thank the President for that. But, we do not know whether the same thing that happened in Kalmunai would happen again in Nintavur with this Rs. 300 million. So, please see to it that, at least, the implementation part is properly supervised and carried out to complete the work. Otherwise, all these monies allocated would be meaningless.

In the meantime, also see that there is some transparency in having the rural development work implemented. This morning, the Minister of Health and Mass Media said that all of us, the Opposition Members, should participate, contribute and assist the Government in doing the district development programmes. But, in the meantime, they are keeping out the local authorities from any development work done.

Meanwhile, there is an Adjournment Motion to be moved by the Hon. Kabir Hashim today, where this same issue and the use of Governors to stultify the actions of

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

the local authorities will be taken up. So, all of these must change, if proper development in the country is to happen and an authoritarian tendency is not to develop.

With those comments, Sir, I conclude. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.51]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ඉඳලා 2026 අවුරුද්දට අදාළ අය වැය පිළිබඳව වාද විවාද ගොඩක් කළා. මේ විපක්ෂය දිගින් දිගටම මේ විධියට මේ විවාදයට සම්බන්ධ වෙනකොට මට හිතෙනවා, අවුරුදු ගණනාවක් තිස්සේ මේ රට පාලනය කළේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුද කියලා. අද විපක්ෂයෙන් කථා කරපු, ඒ බහුතර පිරිසක් නියෝජනය කරපු ආණ්ඩු අවුරුදු 40කට ආසන්න කාලයක් මේ රට පාලනය කළා. අවුරුදු 40ක කාලයක් මේ රට පාලනය කරපු පාලකයෝ හැටියට හිටපු අය, අපි මාස හතක අටක වාගේ කාලයකට ඉදිරිපත් කරලා වැඩ කරගෙන යන අය වැයක් පිළිබඳව මහා ලොකු බිල්ලෙක් මවලා පෙන්වනවා. අපට රට හදන්න බැරි වුණා ලු, සංවර්ධනය කරන්න බැරි වුණා ලු. මේ වාගේ විවිධ දේවල් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව අවුරුදු 5කින් අපට ඔය කාරණය කිව්වා නම් අපි පිළිගන්නවා. අපි අවුරුදු 5කට අදාළ වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒකට ගැළපෙන විධියේ මධ්‍ය කාලීන වැඩ පිළිවෙළක් එක්කයි රට මෙහෙයවන්නේ.

මට මේ දේවල් කියන්න සිදුවන එක ගැනත් කනගාටුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමන්ලා එක වෙලාවකට කියනවා, IMF එක හොඳයි, ඒක මත තමයි රනිල් වික්‍රමසිංහ මේ රට මෙතැනට ගෙනාවේ කියලා. තව වෙලාවකට කියනවා, මේ ආණ්ඩුව IMF එක කියන විධියට යන එක මාර "අප්සෙට්" කියලා. පිස්සු හැදිලා වාගේ විවිධ දේවල් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට හේතුව මෙයයි. වත්මන් ආණ්ඩුව මේ මාස 11ක, 12ක කාල සීමාව තුළ ගත් ක්‍රියාමාර්ග තුළ විපක්ෂයේ ඉන්න මේ මන්ත්‍රීවරුන් මෙවර පාර්ලිමේන්තුවට ආවත්, ලබන සැරේ පාර්ලිමේන්තුවට තබා පළාත් සභාවකටවත් එන්න බැරි තැනකට පත් වනවා, මේ ආණ්ඩුව අවුරුදු 5ක් මේ රට පාලනය කරලා ඉවර වෙනකොට. ඒක ඔවුන්ට දැනෙනවා, ඒ පිළිබඳව ඔවුන් සංවේදී වෙනවා, කම්පනයට පත් වෙනවා. එහෙම කම්පනයට පත් වෙලායි මේ අය එකින් එක, එකින් එක මෙවැනි කරුණු කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා එක්තරා රූපවාහිනී චැනල් එකක් එක්ක ගිහිල්ලා, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ආසන්නයේ ඉදිකර තිබෙන ශීතාගාරය පිළිබඳව මහා කථාවක් කළා, "මෙච්චර ගාණක් වියදම් කරලා මේක හදලා තිබෙනවා, නමුත් තවම පටන් ගත්තේ නැහැ" කියලා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

මම නොවෙයි.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

නැහැ, නැහැ, ඔබතුමා නොවෙයි. සමාවෙන්න. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

දැන් මම කියනවා ඒක කොහොමද තිබෙන්නේ කියලා. ඒක පටන් ගත්තේ යහ පාලන ආණ්ඩුව පැවති කාලයේ. ඒ කියන්නේ 2019 වසරේ. 2019දී පටන් අරගෙන 2024 වෙනකම් මේක හැදුවා. නමුත් ඒ ඉදිකිරීම් කටයුතු අවසන් කරලා තිබුණේ නැහැ. හැබැයි ඉන්දියාව කිව්වා, මේක විවෘත කරන්න ඕනෑ කියලා. මොකද, ඉන්දියානු ආධාරයක් යටතේයි මෙය ඉදිකරන්න පටන් ගත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු හයක් තිස්සේම මේ ශීතාගාරය ඉදිකර ගන්න, මෙහි වැඩ අවසන් කර ගන්න බැරි වෙලා දැන් අපට කියනවා, මේ ශීතාගාරයේ කටයුතු පටන් අරගෙන නැහැ කියලා. ඒක අද උදේත් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ කොම්පැනියක් තමයි මෙහි ඉදිකිරීම් කටයුතු කරන්නේ. ලංකාවේ CECB එක තමයි මෙහි අධීක්ෂණ කටයුතු කළේ. හැබැයි අධීක්ෂණ කටයුතු කරපු CECB එක කිව්වා, මේ ඉදිකිරීම්වල නිසි ප්‍රමිතියක් නැහැ, ක්‍රමවත් නැහැ, ඒ නිසා මේක මේ විධියට කරගෙන යන්න බැහැ කියලා. නමුත් ඉන්දියානු සමාගම කිව්වා, මේක CECB එකේ කොන්දේසිවලට අනුව කරන්න බැහැ කියලා. ඒ නිසා මේ කටයුතු අවසන් කරන්න බැරි වුණා. හැබැයි, වත්මන් ආණ්ඩුව බලයට පත් වෙලා මේ ආයතන දෙක එකතු කරලා මේ ගැන සාකච්ඡා කරලා, එහි වැඩ අවසන් කරන්නට සැලසුම් කළා. ඒ අනුව මේ සැරේ සල්ලි ටිකක් දාලා මේ කටයුතු පටන් ගෙන ඉදිරියේදී අපි මෙහි වැඩ අවසන් කරනවා. මේ වාගේ ලංකාව පුරාම අවසන් කර ගන්න බැරි වෙච්ච ව්‍යාපෘති තිබෙනවා. ගරු ජනාධිපතිතුමා ඊයේ කිව්වා, සංවර්ධනය, සංවර්ධනය කියලා භාගෙට ඉදි කරලා, මෙතෙක් කාලයක් වැඩ අවසන් කරන්නේ නැතුව, පාවිච්චි කරන්න විධියක් නැතුව තිබෙන එවැනි ගොඩනැඟිලි දෙදහස් ගණනක් විතර තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එකක් කියන්නම්. අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙනවා, 2001දී මෙතුමන්ලාගේ ආණ්ඩුවෙන් පටන් ගත් සංවර්ධන ව්‍යාපෘතියක්. 2001දී පටන් ගත්තා, "රජ ඇළ" කියලා ව්‍යාපෘතියක්. පසුගිය අවුරුදු ගණනාවක් තිස්සේ මේ අයගේ ආණ්ඩු මාරුවෙන් මාරුවට තිබිලාත්, ඒ වාගේම රුපියල් කෝටි ගාණක් වියදම් කරලාත්, 2001දී පටන් ගත් ඒ ව්‍යාපෘතියේ වැඩ අවසන් කරලා නැහැ. හැබැයි, අපි මොකද කළේ? එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කරන්න අපි රුපියල් මිලියන 600ක් ගිය අවුරුද්දේ වෙන් කරලා දැන් එහි වැඩ පටන් ගෙන තිබෙනවා. අපි මේ අවුරුද්දේ එහි වැඩ අවසන් කරනවා. එහෙම තමයි අපි සංවර්ධන කටයුතු කරන්නේ. අවුරුදු 30ක විතර කාලයක් තිස්සේ එක දිගට සල්ලි වියදම් කර කර, සල්ලි වෙන් කර කර බොරුවට සංවර්ධනය පෙන්නුවා.

අපි ආණ්ඩුව භාර ගන්නකොට රට තිබුණේ කොහොමද? මෙතුමන්ලා කියනවා, අපි ආණ්ඩුව භාර ගන්නකොට රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා ආර්ථිකයේ සංවර්ධනය ඉහළට ගෙනැල්ලා තමයි රට භාර දුන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපොස සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල ආවාම එක ඉස්කෝලයකින් කියනවා, අපේ ඉස්කෝලයේ ප්‍රතිඵල සියයට 100යි කියලා. තව ඉස්කෝලවලින් කියනවා, ඔවුන්ගේ ප්‍රතිඵල සියයට 50යි, සියයට 60යි, සියයට 90යි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහගේ ආර්ථික සංවර්ධනය කියන්නේ මොකක්ද? රටේ පුළුල් ආර්ථිකය ඉතා කුඩා ආර්ථිකයක් බවට පත් කරලා, එක එක කෑලි වහපු එක.

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේදී ඉදිකිරීම් කර්මාන්තය වැහුවා. ආනයනය ඇතුළු මේ ඔක්කෝම නවත්තලා, එක කැල්ලක් අරගෙන සියලු දේවල් ඒකට දාලා ආර්ථිකයේ සංවර්ධනය එතුමා පෙන්නුවා. එහෙම තමයි එතුමා ආර්ථිකයේ සංවර්ධනය පෙන්නුවේ.

හැබැයි, අපි මොකක්ද කළේ? අපේ ගරු ජනාධිපතිවරයා ආණ්ඩුව අරගෙන සමස්ත ක්‍රියාවලියම නැවත ආරම්භ කරලා මේ වසර තුළ පුළුල් ආර්ථිකයක් එක්ක තමයි ආර්ථික සංවර්ධනය පෙන්වන්නේ. අපටත් පුළුවන්, එක ළමයෙක් විභාගයට ඉදිරිපත් කරලා ඒ ළමයා pass වුණාම ප්‍රතිඵලය සියයට 100යි කියන්න. හැබැයි, ළමයි 500ක් විභාගයකට ඉදිරිපත් වෙච්ච ඉස්කෝලයක ළමයි 450ක් "A" සහ "B" සාමර්ථ අරගෙන හොඳට විභාගය පාස් වෙලා තිටියාට, එතැන සංවර්ධනය සියයට 90යි. දැන් මෙතුමන්ලා ඉදිරිපත් කරන්නේ රනිල් වික්‍රමසිංහ හදපු ආර්ථිකය ගැන කරුණු නේ. ඒ ආර්ථිකය ඒගොල්ලන් තමයි හැදුවේ. ඒකෙන් සියයට 75ක් විතර වැහුවා, සියයට 25යි ක්‍රියාත්මක වුණේ. ඒ සියයට 25ක කොටයෙන් තමයි සංවර්ධනය පෙන්නුවේ. හැබැයි අපි නැවත සියයට 100ක් පටන් ගත්තා, ඒ සංවර්ධන වැඩ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ඒවා ගැන කියන්න ඕනෑ කාරණා ගොඩක් තිබුණා. Brand new වාහනයක් දුන්නාම අපට ඒ වාහනය පාරේ පදවන්න බැහැ වාගේ කථාවක් තමයි මේ අය අපට කියන්නේ. Brand new වාහනයක් දුන්නාට, රියදුරාට driving බැහැ වාගේ කථාවක් තමයි මේ කියන්නේ. අපි දන්නවා, රියදුරෙකුට brand new වාහනයක් දුන්නාම ඔහුට කරන්න තිබෙන්නේ ඒකට තෙල් ටිකක් ගහලා පැදගෙන යන්න විතරයි කියලා. හැබැයි, මේ කියන අවුරුදු 76ක් තිස්සේ හදපු ආර්ථිකය අපට භාර දෙනකොට කොහොමද තිබුණේ? හරියට පාරේ ගිය වාහනයක් condemn වෙන්න හප්පලා, කුඩු පට්ටම් කරලා, අඩු-බඩු මොකුත් නැතුව දුන්නාම, අපට පළමුවැනි අවුරුද්දේ විතරක් නොවෙයි, අවුරුදු දෙකක් යනකම් මේ වාහනය දුවන්න වෙන්නේ අන්න අර කැලි බැලි ටික සවි කරලායි. මේ දවස්වල අපි ඒ කැලි බැලි ටික හොයනවා.

මේ වන විට සාමාන්‍ය පාරවල් 3,000ක් විතර භාගෙට හදලා ඒවායේ වැඩ නතර කරලා තිබෙනවා. ඒවායේ වැඩ අවුරුදු 5ක් තිස්සේ ක්‍රියාත්මක වුණේ නැහැ. අධිවේගී මාර්ගයක් හදන්න පටන් ගන්නවා, ඒකේ භාගයක් හදනවා. ඒකේ අගත් නැහැ, මුලත් නැහැ, අතරමග. ඔක්කෝම ණය නතර වෙනවා. ඒ විතරක් නොවෙයි. සියලු ආර්ථික ක්‍රියාකාරකම් නතර කරලා දීපු ආර්ථික ක්‍රියාවලියක් නැවත ආරම්භ කරනවා කියන එක ලෙහෙසි නැහැ. ඒක මේ විපක්ෂය දන්නවා. විපක්ෂය ඒක දැනගත්තාට විපක්ෂය කල්පනා කරනවා, මහජනතාව ළඟට යන්න පාර විවෘත කර ගන්න නම් මොකක්ද කරන්න තිබෙන්නේ, ඇති වෙන්න ජනතාවට බොරු කියන්න ඕනෑය කියලා. ඊට පස්සේ රූපවාහිනී චැනල්වලින් මේ බොරුව සමාජගත කරනවා.

විපක්ෂය පැත්තේ සිහින ජනාධිපතිවරු තුන්දෙනෙක් ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ සිහින ජනාධිපතිවරු තුන්දෙනාගෙන් එක්කෙනෙක් සිහින ජනාධිපතිවරයා බවට පත්වීම වෙනුවෙන් බොරුව සමාජගත කිරීම උපරිමයෙන් කරනවා. අනෙක් දෙදෙනා ඒ මාධ්‍යයට තමන්ගේ මතත් ඉදිරිපත් කරලා අවසානයේ තුන්දෙනාම එකම කාර්යය කරනවා. මේ වත්මන් ආණ්ඩුවේ ඇත්ත ක්‍රියාකාරිත්වය, ඇත්ත සංවර්ධනය ජනතාව අතරට ගෙනියනකොට ඒකට භීතියට පත් වෙච්ච, කලබලයට පත් වෙච්ච මේ විපක්ෂයට අපි කියනවා, කලබල වෙන්න එපා, ජාතික ජන බලවේග වත්මන් ආණ්ඩුව අනිවාර්යයෙන්ම -නියත වශයෙන්ම- මේ භාර ගත් කාර්යභාරය අවසන් කරන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාව ලස්සන රටක සුන්දර ජීවිතයක් ගත කරන්න පුළුවන් තැනකට ගෙනැල්ලා කියන එක. එසේ කියමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.00 වූයෙන්, කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.***

***එතැන් සිට විවාදය 2025 නොවැම්බර් 10වන සඳුදා පවත්වනු ලැබේ.***

*அப்போது பி.ப. 6.00 மணியாகிவிடவே, அலுவல்கள் இடைநிறுத்தப்பட்டு விவாதம் ஒத்திவைக்கப்பட்டது.*

*விவாதம், 2025 நவம்பர் 10, திங்கட்கிழமை மீளத் தொடங்கும்.*

*It being 6.00 p.m., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Monday, 10th November, 2025.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු කබීර් හෂීම් මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ සංවර්ධන ව්‍යාපෘති අත්හිටුවීම
## மாவனல்லை பிரதேச சபையால் அங்கீகரிக்கப்பட்ட அபிவிருத்தித் திட்டங்கள் இடைநிறுத்தம்
## SUSPENSION OF DEVELOPMENT PROJECTS APPROVED BY MAWANELLA PRADESHIYA SABHA

[අ.භා. 6.00]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් පිළිතුරු ලබා ගැනීම සඳහා.

"2025.07.15 දින මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ග්‍රාමීය මාර්ග 47ක් හා වෙනත් සංවර්ධන ව්‍යාපෘති කිපයක් ඉදිකිරීම සඳහා රුපියල් 19,000,000ක් වෙන්කොට ක්‍රියාත්මක කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී. නමුත් 2025.09.11 දින සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් විසින් සබරගමුව ගරු ආණ්ඩුකාරතුමියගේ නියෝගයක් පරිදි එම යෝජනා ක්‍රියාත්මක කිරීම නතර කරන ලදී.

ප්‍රාදේශීය සභාවෙන් උපයන ලද බදු ආදායම් සහ වෙනත් මුදල් ජනතා සේවයට යොමු කිරීම ප්‍රාදේශීය සභාවේ වගකීමක් වේ. නමුත් ආණ්ඩුකාරතුමියගේ මෙම අත්තනෝමතික ක්‍රියාවලිය හරහා මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ජනතා පරමාධිපතිත්වය හැල්ලුවකට ලක් වී ඇති අතර, තව පැත්තකින් මාවනැල්ල මහජනතාවගේ මූලික අයිතිවාසිකම් ද උල්ලංඝනය වී ඇත.

මාවනැල්ල ප්‍රාදේශීය සභාව සම්මත කරන ලද ඉහත යෝජනා ක්‍රියාත්මක නොකිරීමෙන් බදු ගෙවන ජනතාවට අසාධාරණයක් සිදු වී ඇති අතර, ගරු ආණ්ඩුකාරතුමිය විසින් රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ද උල්ලංඝනය කර පළාත් පාලන නීතියටද පටහැනිව ක්‍රියා කර ඇත.

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ මහ සභාව 2025.08.12වන දින තීරණ අංක 34 යටතේ සෞඛ්‍ය කම්කරුවන් 10දෙනෙකු බඳවා ගැනීමට අනුමතකොට ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉල්ලීම් කර ඇත. ප්‍රාදේශීය සභාව සතු මූල්‍ය හැකියාවන් පිළිබඳ වාර්තාවක් ද 2025.09.10වන දින ගරු ආණ්ඩුකාරතුමිය වෙත යොමු කොට ඇත. මාස 02ක කාලයක් ගත වුවද, ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය නොදීමේ හේතුව මත දෛනිකව එකතු වන කසළ මෙට්‍රික් ටොන් 10ක් කළමනාකරණය කිරීමට මින් බාධා එල්ල වී ඇත.

මෙම බාධා කඩිනමින් ඉවත් කිරීමට සහ මෙම යෝජනාවන් ප්‍රාදේශීය සභාව හරහා ක්‍රියාත්මක කිරීමට කිසියම් වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රාදේශීය සභාව යම් පක්ෂයක ප්‍රාදේශීය සභාවක් හැටියට නඩත්තු නොකර ආණ්ඩු පක්ෂය, විපක්ෂය හැටියට එකතු වෙලා ප්‍රතිපාදන වෙන් කරනකොට, බදුවලින් ලැබුණු ඒ ආදායම්වලින් ලබා ගත් ඒ මුදල් ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය වෙනුවෙන් අපි ප්‍රථමයෙන්ම ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට බෙදා දුන්නා. එහෙමත් කරලා හරියට තෝරා බේරා ගෙන පොදු වැඩවලටත් ඒ මුදල් වෙන් කරනවා. නමුත්, ඒ සිද්ධිය අවුස්සන තව කෙනෙක් මන්ත්‍රීවරයෙක් හරහා දමන පෙත්සමකින් ඒ කටයුතු නතර කිරීම මම හිතන හැටියට ප්‍රාදේශීය සභාවේ නීතිරීතිවලට පටහැනිව කටයුතු කිරීමක්. ඒ එකතු වන බදු මුදල් භාවිත කරන්න ඒ ප්‍රදේශයේ ජනතාවට අයිතියක් තිබෙනවා. ඒ මුදල් ඔක්කෝම ග්‍රාමීය ප්‍රදේශවල සංවර්ධනය සඳහා අවශ්‍ය වන පන්සල්, පල්ලි, මාර්ග, ළිං සංවර්ධනය ආදී පොදු වැඩ සඳහා භාවිත කරන්න පුළුවන්. ඒ නිසා මේ මුදල් අනුමත කරන එක නතර කිරීම නීත්‍යානුකූලව වරදක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කුණු කසළ ඉවත් කිරීම ගැනත් මම කිව යුතුයි. ගරු ජනාධිපතිතුමාත් ඊයේ මේ ගැන කථා කළා. ඒක අත්‍යවශ්‍ය දෙයක්. ඒ සඳහා අවශ්‍ය කම්කරුවන් ටික බඳවා ගන්න ඕනෑ. රාජ්‍ය සේවකයන් 65,000ක්, 75,000ක් බඳවා ගන්නවා කිව්වා. මාවනැල්ල ප්‍රාදේශීය සභාවට බඳවා ගන්න කම්කරුවන්ට ගෙවන්න අපට පුළුවන් කියලා තිබියදීත් ඒ කටයුත්තත් දැන් ඇද ඇද ඉන්නවා. ඒක ඕනෑකමින් කරන වැඩක් ද කියන ප්‍රශ්නය මතු වෙනවා. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට ක්‍රියා කරන්න බැහැ. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ සඳහා සුදුසු තීරණයක් අරගෙන දෙන්න කියලා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

යෝජනාව ස්ථිර කිරීම, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.05]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව මම ස්ථිර කරනවා. මේක ඉතා වැදගත් යෝජනාවක්. මොකද, ප්‍රාදේශීය සභාවේ අරමුදල්වලින් ඒ ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය කරන යෝජනාවක් සභාව ඒකමතිකව සම්මත කළාම, ඒ වැඩ පිළිවෙළට බාධා කිරීම පළාත් පාලන කොමසාරිස් හරහා, එහෙම නැත්නම් ආණ්ඩුකාරවරයා හරහා කරනවා නම් ඒක ඉතා වැරදියි. ඒ වාගේම ඒක ඒ පළාත් පාලන ආයතනයට සහ ඒ ප්‍රදේශයේ ජනතාවට කරන විශාල හානියක්. මොකද, ඒවා ජනතාවගේ නියෝජිතයෝ තමයි ඒ යෝජනා ඒකමතිකව සම්මත කරලා තිබෙන්නේ. මෙතැන ආණ්ඩු පක්ෂය, විපක්ෂය කියලා භේදයකුත් නැහැ. ඒ නිසා මේ ගැන අපට එක්තරා විධියක සැකයක් ඇති වෙනවා.

පළාත් පාලන මැතිවරණයෙන් පසුව ප්‍රාදේශීය සභාවල බලය පිහිටුවන විට ආණ්ඩුවෙන් කිව්වා, මේ ආණ්ඩුවට බලය යන්නේ නැති ඒවාට අපි සල්ලි දෙන්නේ නැහැ කියලා. මේ සල්ලි දෙන්නේ නැති එක නොවෙයි දැන් තිබෙන ප්‍රශ්නය. ඒ ප්‍රාදේශීය සභාවේ තිබෙන සල්ලි ටික මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා අනුව වියදම් කරන්නත් බාධා කරනවා නම්, ඒක ඒ ප්‍රදේශයේ ජනතාවට කරන ලොකු හානියක්. ඒ නිසා ගරු ඇමතිතුමා මේ ගැන වහාම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපි දැක්කා, පළාත් පාලන ආයතනවල බලය පිහිටුවනකොටත්, සභාපතිවරු පත් කරනකොටත් පළාත් පාලන කොමසාරිස්තුමන්ලාගේ අභිමතය පරිදි වැඩ කරනවා. ඒක අපි දැක්කා, මුල ඉඳලාම. නමුත් එහෙම අභිමතයක් නැහැ. ඒ අභිමතය තිබෙන්නේ ඒ ප්‍රදේශයේ ජනතාවට. මේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට මේ ආණ්ඩුව පළාත් පාලන මැතිවරණයේ ඉඳන්ම යම් යම් බාධා කරනවා අපි දැක්කා. මෙවැනි තත්ත්වයක් අපි ඉතිහාසයේ දැකලා නැහැ. වරදක් තිබෙනවා නම්, පළාත් පාලන ආයතනයේ දූෂණයක් තිබෙනවා නම් ආණ්ඩුකාරවරයා මේ විධියට මැදිහත් වෙලා ඒවා හෙව්වාට කමක් නැහැ. නමුත්, ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන සංවර්ධන යෝජනා නවත්වන්න පළාත් පාලන කොමසාරිස්වරයාට හෝ කොමසාරිස්වරියට හෝ ආණ්ඩුකාරවරයාට බලයක් තිබෙනවාද කියන එක අපි දැනගන්න කැමතියි. ඒ නිසා විශේෂයෙන්ම ඇමතිවරයා මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගන්න. අපට බලය තිබෙන පළාත් සභා, ප්‍රාදේශීය සභා, නගර සභා ගණනාවක් තිබෙනවා. ඒවාට මේ විධියට දිගින් දිගටම හිරිහැර කරන්න, බාධා කරන්න සූදානම් වුණොත් අපි නීතිය හමුවට යනවා. අපි ඒ විධියට නීතිය හමුවට ගියොත් මේ නිලධාරින්ට, පළාත් පාලන කොමසාරිස්වරුන්ට තමයි අන්තිමට ඒ වැරැද්ද පැටවෙන්නේ. ඒ නිසා අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ජනතාව පත් කරගත්ත ආයතනවල වැඩකටයුතු ක්‍රියාත්මක කරන්න ඒ ප්‍රදේශයේ ජනතා නියෝජිතයන්ට අවශ්‍ය විධියට ඉඩකඩ සලසා දෙන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.07]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෑගල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් ගෙනාපු සභාව

[ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා]

කල් තැබීමේ යෝජනාව පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න ලැබීම සතුටක්. මොකද, මේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවේ සඳහන් වෙනවා, සබරගමුව පළාතේ ආණ්ඩුකාරතුමිය කාරණා දෙකකට බාධා කළා කියලා. එකක් තමයි, මාවනැල්ල ප්‍රාදේශීය සභාව 2025.07.15වන දින ගෙනාපු සංවර්ධන යෝජනා 41ක් නැවැත්වූවාය කියන එක. අපි අහලා බැලුවා, එදා ඒ සභාවේ කථා වුණේ මොනවාද කියලා. එදා ඒ සභාවේ හිටපු සභාපතිවරයෙක් කියනවා, "ගරු සභාපතිතුමනි, මේ යෝජනා 41 තුළ තිබෙනවා, සභාවට අයිති නැති යෝජනා ගණනාවක්. ඒ නිසා මේ පිළිබඳව වහාම සැලකිලිමත් වෙන්න" කියලා. ඒ සභාවේ විපක්ෂ නායක සිසිර හේරත් මැතිතුමා කියනවා, "ඒ යෝජනා 41හි ගැටලුසහගත තැන් ගොඩක් තිබෙනවා. ඒ නිසා අපි මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා" කියලා. එහෙම තමයි එදා සභාවේදී කථා වෙලා තිබෙන්නේ. සභාපතිවරයා විසින් මේ යෝජනා ටික සම්මත කරගෙන යැව්වාට පසු, මේ යෝජනාවලට අදාළව පෙත්සමක් යවනවා. ඒ පෙත්සම්කරු කියනවා, මෙන්න මෙහෙම කථාවක්. "එම ව්‍යාපෘතියේ 11වන ව්‍යාපෘතිය වන හෙම්මාතගම වසමේ හෙම්මැල්ල, හපුකුඹුර හරහා ඉන්ධන පිරවුම්හල දක්වා කොටස යම් නඩු කටයුත්තක් සිදු වන ස්ථානයකි. මෙම මාර්ගය කෘෂි මාර්ගයක් වන අතර, එහි වගකීම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයත්ව තිබේ. එම මාර්ග භාවිත කරන්නේ නිවාස තුනක් පමණි."

ඒ අනුව අදාළ නැති විෂයයකට තමයි මේ අනුමැතිය ඉල්ලා තිබෙන්නේ. මෙහෙම කාරණා ගොඩක් තිබෙනවා. පළාත් පාලන කොමසාරිස්වරයා කියන්නේ මොකක්ද? පළාත් පාලන කොමසාරිස්වරයා කියනවා, "මේ පිළිබඳව සොයා බැලුවාට පසු සභාවට අදාළ නැති දේවල් තිබෙනවා" කියලා. අපි එතුමාගේ වාර්තාව ගෙන්වා ගත්තා. එහි තිබෙනවා, "මෙම ව්‍යාපෘති නාමාවලිය පරීක්ෂා කිරීමේදී සභාවේ විෂය පථයට ගැනෙන හා විෂයයට නොගැළපෙන ව්‍යාපෘති බැලූ බැල්මටම හඳුනා ගත හැකි නිසා මේ පිළිබඳ කටයුතු නවත්වනවා" කියලා.

එතකොට දැන් කබීර් හාෂීම් මන්ත්‍රීතුමා මොකක්ද මේ කියන්නේ? එතුමා ආණ්ඩුකාරතුමියට චෝදනා 6ක් එල්ල කරනවා. අත්තනෝමතිකව වැඩ කළා, ජනතා පරමාධිපත්‍ය හැල්ලු කළා, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළා, මූල්‍ය ප්‍රතිපත්ති උල්ලංඝනය කළා වැනි චෝදනා ටිකක් එතුමියට එල්ල කරනවා. කබීර් හාෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මාවනැල්ල ප්‍රාදේශීය සභා මැතිවරණය වෙලාවේ ජනතාව ඡන්දය දුන්නේ මාලිමාවට කියන එක. මාලිමාව තමයි මාවනැල්ල ප්‍රාදේශීය සභාව දිනුවේ. මහජන පරමාධිපත්‍යයට පටහැනිව තමුන්නාන්සේ එකතු කර ගත්ත මන්ත්‍රීවරුන්ගෙන් තමයි මේ සභාව පත් කර ගත්තේ. මේ සභාව දැන් ගෙනියන්න බැහැ. කෑගල්ල දිස්ත්‍රික්කයේ කසළ කළමනාකරණය සම්බන්ධයෙන් වසර 20කට වැඩි කාලයක් වැඩිම ගැටලු තිබෙන සභාව තමයි ඔබතුමා නියෝජනය කරන්නේ. ඒ සම්බන්ධයෙන් ජනතාව අද ප්‍රශ්න කරනකොට ඔබතුමා ආණ්ඩුකාරතුමියට චෝදනා කරනවා.

මම කියන්න කැමතියි පළාත් සභාව ගැනත්. වසර ගණනාවක් තිස්සේ හිටපු මහ ඇමතිවරු, ආණ්ඩුකාරවරු නටපු සෙල්ලම් අපි දැක්කා. මේ සිද්ධියේදී වර්තමාන ආණ්ඩුකාරතුමිය ඉතාම බුද්ධිමත්ව කටයුතු කර තිබෙනවා. කොමසාරිස්තුමාගේ වාර්තාවක් ලබාගෙන ඒකට අනුව තමයි එතුමිය මේ කටයුතු කරලා තිබෙන්නේ. කබීර් හෂීම් මන්ත්‍රීතුමාගේ බංකොලොත් දේශපාලනය වහගන්න මෙවැනි අඳ බාල දේශපාලන වැඩ කරන්න එපා කියලා ඉල්ලමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඉතාම කෙටියෙන් කියන්න.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමා කිව්ව කාරණා ගැන කනගාටු වෙනවා. ගරු සමන්ත රණසිංහ මන්ත්‍රීතුමනි, මේක මගේ පෞද්ගලික අවශ්‍යතාවකට මම දාපු ප්‍රශ්නයක් නොවෙයි. මේක දේශපාලන ප්‍රශ්නයකුත් නොවෙයි. මැතිවරණය කවුද දිනුවේ කියලා ඔබතුමා ඔය ආකාරයට කථා කරන එක මේකට අදාළ නැහැ. මේවා මහජන මුදල්. මේවා හරියට පාවිච්චි කරන්න ඕනෑ. මේ ප්‍රාදේශීය සභාවට බලයක් තිබෙනවා. පරීක්ෂණයක් තියලා වාර්තාවක් දෙන්න කියා තිබුණා නම්, ඒ වාර්තාව අරගෙන ඒකේ වැරදි තිබෙනවා නම් පෙන්වන්න ඕනෑ. එහෙම නැතිව, "බැලූ බැල්මට මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා" කියන්න බැහැ. මේකට අදාළ නීතියක් තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට එතුමා උත්තර දීපු ආකාරයම වැරදියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[පි.ව. 6.12]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ கபீர் ஹஷீம் அவர்கள் சபரகமுவ மாகாண ஆளுநர் தொடர்பாகக் கொண்டுவந்திருக்கின்ற ஒத்திவைப்புப் பிரேரணையை உண்மையாக நான் ஆமோதிக்கிறேன். இதேமாதிரி, வடக்கு மாகாணத்திலும் அங்குள்ள ஆளுநருடைய சேட்டைகள் நடந்திருக்கின்றன; அதைச் சொல்வதற்குத் இந்தச் சந்தர்ப்பத்தைப் பயன்படுத்துகின்றேன். தயவுசெய்து அதற்காக என்னை மன்னித்துக் கொள்ளுங்கள்!

திரு. வேதநாயகன் என்றொருவர் வடக்கு மாகாண ஆளுநராக இருக்கின்றார். இவர் 2020 - 2022ஆம் ஆண்டு காலப்பகுதிகளில் யாழ். மாவட்ட GA ஆக இருந்தவர். வடக்கு மாகாணத்தில் நானூறு இலட்சம் ரூபாய் காசு மோசடி இடம்பெற்றிருக்கிறது என நான் எனது முன்னைய உரையிலே தெளிவாகச் சொல்லியிருக்கின்றேன். அதாவது, Commercial Bankஇல் கள்ளமாக ஒரு accountஐத் திறந்து காசு வைப்பில் இடப்பட்டிருக்கின்றது என்று தெளிவாகக் கூறி, அதன் reportஐக்கூட எங்களுடைய DCCஇனுடைய Chairman சந்திரசேகர் அவர்களுடைய கையில் கொடுத்திருக்கின்றேன். இந்தக் குற்றச்செயலில் சம்பந்தப்பட்டவர்களைக் காப்பாற்றுவது யாரென்று சொன்னால், வடக்கு மாகாணத்திலே இருக்கின்ற ஆளுநர் வேதநாயகன் அவர்கள்! இவர் வைத்தியர் கேதீஸ்வரன் மற்றும் வைத்தியர் சத்தியமூர்த்தி உட்படச் சம்பந்தப்பட்டவர்களையெல்லாம்

தன்னுடைய roomக்குக் கூப்பிட்டுக் கதைத்து, இந்த வைத்தியசாலை பற்றிய ஊழலை வெளிக்கொணராமல் வைத்திருக்கின்றார்.

2021ஆம் ஆண்டு இவர் GAஆக இருக்கும்போதுதான் இது நடந்திருக்கின்றது. இப்போது இவர் ஆளுநராக இருக்கின்றார். இந்த ஊழல் பருத்தித்துறை ஆதார வைத்தியசாலையில் நடந்தது. இது பற்றிய reportஐ உங்களிடம் தந்திருக்கின்றேன். கௌரவ அமைச்சர் சந்திரசேகர் அவர்களே! இதுபற்றி உங்களுடைய மனதைத் தொட்டுக் கேளுங்கள்! நீங்கள் உண்மையாகவே வடக்கு மாகாணத்திற்கு நியாயமான ஓர் அமைச்சராக இருக்க விரும்பினால் தயவுசெய்து நீங்கள் இந்த விடயத்தை விசாரணைக்கு எடுங்கள்! அதைவிடுத்து, நீங்களும் சத்தியமூர்த்தியோடும் கேதீஸ்வரனோடும் ஆளுநருடனும் சேர்ந்து கதைத்துக்கொண்டு ஏமாற்றப் போகின்றீர்கள் என்றால், உங்களுடைய பாராளுமன்றக் காலம் வெகுகுறைவானதாகத்தான் இருக்கும் என்பதை விளங்கிக் கொள்ளுங்கள்!

இந்த ஆளுநர் என்று சொல்லப்படுகின்ற

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

GAஆக இருக்கின்ற

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

என்றும், அவர் இருந்தால் தன்னால் வடக்கு மாகாணத்தைக் கொண்டுசெல்ல முடியாது என்றும் கடிதம் எழுதியிருக்கிறார். கடந்த யூன் மாதம் அந்தக் கடிதம் பிரதீபனுக்கு அனுப்பப்பட்டிருக்கின்றது. அதன் பிரதியையும் உங்களுக்கு வழங்கியிருக்கின்றேன்.

வடக்கு மாகாணத்தில் இப்போது 3 பேர்தான் DCC meetingஇல் மேலேயுள்ள Chairகளில் இருக்கிறார்கள். நாங்கள் சின்னப்பெடியள்தானே, கீழே இருக்கின்றோம்.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

என்பதற்குரிய ஆதாரத்தை உங்களிடம் சமர்ப்பித்திருக்கின்றேன். இவர் GAஆக இருக்கும்போதுதான் பருத்தித்துறை ஆதார வைத்தியசாலையில் இந்த 400 இலட்சம் நிதி மோசடி நடைபெற்றது. இப்போது அவர் Governorஆக இருந்துகொண்டு, GAஆக இருக்கின்ற

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

- அவர் இருந்தால் தனக்குக் கள்ள வேலை செய்ய ஏலாது என்று - கடிதம் அனுப்பியிருக்கின்றார். அந்த ஆதாரத்தையும் உங்களுக்கு நான் தந்திருக்கின்றேன். இவர்கள் இருவருக்கும் மேலே நீங்கள் இருக்கின்றீர்கள். இந்த மூன்று கள்வரும் மேலே DCC meetingஇல் Chair இல் இருக்கின்றபோது, நாங்கள் வந்து என்னத்தைக் கதைக்க இயலும் என்று சொல்லுங்கள்? *[இடையீடு]* நீங்கள் கதையுங்கள், பிரச்சினை இல்லை. ஆனால், DCC meeting ஊடாக என்னத்தை எங்களால் செய்ய முடியும் என்பதைத்தான் நான் கேட்கின்றேன். "வடக்கு மாகாணத்தில் ஊழலை ஒழிப்போம். வடக்கு மாகாணத்தில் ஊழல் இல்லை" என்று சொல்கின்ற மூன்று பேருமே கள்வர்கள்! ஏனென்றால், கள்வர்களுடன் சேர்ந்து -

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමනි, ඔබතුමාගේ අදහස ඉතා කෙටියෙන් ඉදිරිපත් කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවට වග කියන්න බැරි නිලධාරින්ට අපහාසාත්මකව කථා කරන එක හොඳ නැහැ. මම කියන්නේ මේකයි. ගරු මන්ත්‍රීතුමාට එවැනි තොරතුරක් තිබෙනවා නම් ඒක පොලීසියට දන්වන්න. නැත්නම්, CID එකට ගිහිල්ලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. එපමණක් නොවෙයි, මාවත් දැන් හොරුන්ගේ ගොඩට නේ දාලා තිබෙන්නේ. ඒ නිසා ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමාට මම කියන්නේ මෙච්චරයි. ඕනෑම විවේචනයක් අපට ගේන්න. ඒක වෙනම එකක්. මේ සභාවට ඒ නිලධාරියාට, වෛද්‍යනායකයන්ට එන්න බැහැ නේ. ප්‍රදීපන්ට එන්නත් බැහැ නේ. ඔබතුමාට මේ සභාවේ කථා කරන්න නිදහස තිබෙනවා කියලා එක දිගටම අපහාස කරමින් කථා කරන්න එපා. ඒක

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හරි නැහැ. ඔබතුමා පිට රට ගිහිල්ලා මොකක්ද වුණේ කියලා දන්නවා නේ. வெளிநாட்டில் உங்களுக்கு என்ன நடந்தது என்று தெரியும்தானே! அதனால், இந்த இடத்திலே இல்லாத அதிகாரிகள்மீது பொய்யான குற்றச்சாட்டுக்களை முன்வைக்காதீர்கள், please! அவர்களால் இங்கே உங்களுக்குப் பதில் சொல்ல முடியாது. அவ்வாறு பதில் சொல்ல முடியாததால் நீங்கள் இல்லாதவற்றைச் சொல்லிக் கொண்டு போகாதீர்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ පිළිබඳව සැලකිලිමත් වෙන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, நான் தமிழில் சொல்கிறேன். அந்த இரண்டு கள்வரையும் இவர் காப்பாற்றுகிறார் என்றால், இவர்தான் மிகப் பெரிய கள்வராக இருக்க வேண்டும். ஆதாரபூர்வமாக reportஐக் கொடுத்த பிறகுகூட இவர் 'අපහාස කරනවා' என்று அரைகுறைச் சிங்களத்தில் கதைக்கிறார். நான் ஆதாரபூவமாக இந்தப் பாராளுமன்றத்தில் reportஐக் கொடுத்திருக்கிறேன். இரண்டு மிகப் பெரிய கள்வரையும்

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

காப்பாற்றுகின்ற இவர் எப்படிப்பட்ட கள்வனாக இருக்க வேண்டும்! நீங்கள் 159 பேரும் இவரைக் காப்பாற்றினீர்கள் என்றால், மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் வடக்கு மாகாணத்தில் எவ்வளவுக்கு மரியாதையை இழப்பார்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය නාස්ති කළා. මට තව පොඩි වේලාවක් දෙන්න, මම කථාව අවසන් කරන්නම්.

ஆகவே, நாங்கள் கேட்பது, ஆளுநர் வேதநாயகன் கள்வன் என்று report கொடுத்திருக்கிறேன்; GA பிரதீபன் கள்வன் என்று சகல inquiry reportsஉம் இருக்கிறது; இந்த இரண்டு பேர்களிடமும் காசை வாங்குவது எங்களுடைய கௌரவ அமைச்சர் சந்திரசேகர் அவர்கள். இந்த மூன்று கள்வரும் DCC meetingஇல் மேல் மட்டத்தில் இருந்துகொண்டிருந்தால் எப்படி வடக்கு மாகாணம் முன்னேறும்? ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා, இந்த வாய்ப்பைத் தந்ததற்கு உங்களுக்கு நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.17]

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මැතිතුමා ඉදිරිපත් කරපු සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා. එතුමා ආණ්ඩුකාරතුමියට චෝදනා නඟනවා, ග්‍රාමීය මාර්ග 47ක් සහ වෙනත් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් අත්හිටුවීම සම්බන්ධයෙන්. මෙහි තිබෙන එක චෝදනාවක් තමයි, මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ජනතා පරමාධිපත්‍යය හෑල්ලුවට ලක් කළාය කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මාවනැල්ල ජනතාවගේ ජනතා පරමාධිපත්‍යය හෑල්ලුවට ලක් කළේ කබීර් හෂීම් මැතිතුමන්ලායි. මොකද, මාවනැල්ල ආසනය ජනාධිපතිවරණයේදීත්, පාර්ලිමේන්තු මහ මැතිවරණයේදීත් ජාතික ජන බලවේගය ජයග්‍රහණය කළා. ඒ විතරක් නොවෙයි, ප්‍රාදේශීය සභා මැතිවරණයේදීත් ජාතික ජන බලවේගය තමයි එය ජයග්‍රහණය කළේ. කොට්ඨාස 24න්, කොට්ඨාස 19ක් ජාතික ජන බලවේගය ජය ගත්තා. නමුත්, එතැන විපක්ෂයේ සියලු මන්ත්‍රීවරු ජාතික ජන බලවේගය සමඟ වැඩ කරන්න එකඟ වෙලා සිටියදී, මෙතුමාගේ බලපෑමට තමයි ඒ ජනතාවගේ ජනතා පරමාධිපත්‍යය, ඒ ජනතා වරම යටපත් කරලා බලහත්කාරයෙන් ඒ සභාව ඔය කියන විධියේ පාලනයකට අරගෙන ගියේ. එතැන මැර පාලනයක්, වංචාසහගත පාලනයක් උදා කරන්න මෙතුමා තමයි මූලික වුණේ. ඒ නිසා අද මොකක්ද වෙලා තිබෙන්නේ? මෙතුමාගේ උපදෙස් අනුව කටයුතු කරන්න ගිහිල්ලා ඒ මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු ඒ පාලනය දැන් අපහසුතාවට පත් කර තිබෙනවා. ඒ නිසා මම ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ඒ පාලනය ඒගොල්ලන්ට කරගෙන යන්න ඉඩ දෙන්න කියලායි. ඔබතුමා එතැනට මැදිහත් වෙලා ඒ ජනතාවගේ අයිතිය, ජන වරම විකෘති කළා වාගේ ඉදිරියේදීත් එතැන පාලන කටයුතු කරගෙන යන්න බැරි විධියට අතපෙවීම් කරන්න එපා. ඒගොල්ලන්ට නිදහසේ එතැන පාලන කටයුතු කරගෙන යන්න ඉඩ දෙන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

මෙතැනදී ආණ්ඩුකාරතුමිය කිසිදු වරදක් කර නැහැ. මේ සම්බන්ධයෙන් විමර්ශනය කරන්න එතුමිය කමිටුවක් පත් කර තිබෙනවා. ඒ විමර්ශන වාර්තාව එනතුරු ඒ කටයුතු අත්හිටුවීමක් විතරයි කරලා තිබෙන්නේ. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, එම නිසා මේ පාර්ලිමේන්තුවට විකෘති තොරතුරු දෙන්න එපා, වැරදි ආකාරයට, නොමඟ යවන විධියේ තොරතුරු දෙන්න එපා කියලා මා ඉල්ලා සිටිනවා.

ඊළඟට කබීර් හෂීම් මන්ත්‍රීතුමා කියනවා, මාවනැල්ල ජනතාවට සේවය කරන එක නවත්වන්න දෙන්න එපා ලු. ඔබතුමාගේ බලපෑම යටතේ, ඔබතුමාගේ බල කිරීම් යටතේ මේ සිදු වෙන්නේ මොකක්ද? ඔබතුමාට ඡන්දය දීපු සමහර ඡන්ද දායකයන්ට පෞද්ගලිකව සලකන ක්‍රියාමාර්ගවලට යෑම තමයි මේ සිදු වෙන්නේ. ඔබතුමන්ලා අනුමත කර ගන්න උත්සාහ කරමින් තිබෙන ඒ සමහර යෝජනා පෞද්ලික යෝජනා. ඒවා පොදුවේ මාවනැල්ල ප්‍රදේශයට බලපාන යෝජනා නොවෙයි. ඒ නිසා තමයි ඒ විමර්ශන කමිටුව අදාළ විමර්ශනය කරන තුරු ඒවා තාවකාලිකව අත්හිටුවා තිබෙන්නේ. ඒ නිසා මේ විධියට පාර්ලිමේන්තුව නොමඟ යවන්න එපා කියන ඉල්ලීම මම ගරු කබීර් හෂීම් මැතිතුමාගෙන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු කබීර් හෂීම් මැතිතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමා මෙතෙක් කල් ඇමති ධුර කීයක් දැරුවාද, ඔබතුමා මන්ත්‍රී ධුරය දරමින් කොච්චර නම් කාලයක් මාවනැල්ල ආසනය නියෝජනය කළාද කියලා. හැබැයි, ඔබතුමාට නොහැකි වුණා මාවනැල්ල නගරයට සංවර්ධනය කැඳවන්න. අපට ප්‍රාදේශීය සභාවේ බලය නැතත්, ජනාධිපතිවරණයේදී ජනතාව අපට දීපු ජන වරම, පාර්ලිමේන්තු මැතිවරණයේදී අපට දීපු ජන වරම, ප්‍රාදේශීය සභා මැතිවරණයේදී අපට දීපු ජන වරම අපි රකිනවා. ඒ අනුව අපි මාවනැල්ලේ ජනතාවට අවශ්‍ය සංවර්ධනය කැඳවාගෙන ඇවිත් තිබෙනවා.

පසුගිය කාලයේ මාවනැල්ල බස් ස්ටෑන්ඩ් එක හදන්න ඔබතුමාට බැරි වුණා, ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපි ඒ බස් ස්ටෑන්ඩ් එක හදන්න වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා, එහි පුළුල් කිරීම් කරලා තිබෙනවා. මේ වනකොට එම පුළුල් කිරීම්වලින් සියයට 80ක විතර කටයුතු අපි අවසන් කරමින් තිබෙනවා. පසුගිය දවසක මමත් එහි ගිහිල්ලා බැලුවා. මාවනැල්ල නගරය සහිත මාවනැල්ල ආසනය කියන්නේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ වැඩිම ජනගහනයක් සිටින, මුස්ලිම් සහ සිංහල ජනතාව ඉතාම සමඟියෙන් ජීවත් වන ප්‍රදේශයක්. ඒ වාගේම වැඩිම ඡන්ද දායකයන් පිරිසක් සිටින ප්‍රදේශයක්. මාවනැල්ල රෝහල කියන්නේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට වැඩිම සේවාවක් සපයන රෝහලක්. එම රෝහලට අඩුපාඩුවක්ව තිබුණු on-call වෛද්‍යවරුන්ට රැඳී සිටීමට අවශ්‍ය කාමර සහිත පස් මහල් ගොඩනැඟිල්ල වෙනුවෙන් රුපියල් මිලියන 142ක් වෙන් කරලා අපි එම ගොඩනැඟිල්ලට මුල්ගල තැබුවා. ඒ වාගේම, මාවනැල්ල ඩිපෝව කියන්නේ, මහනුවර-කොළඹ මාර්ගයේ පිහිටා තිබෙන ඩිපෝවක්. එම ඩිපෝව සංවර්ධනය කරන්න අවශ්‍ය කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. මාවනැල්ල නගර සංවර්ධන කටයුතු කරන්න, මාවනැල්ලේ ඓතිහාසික ගඩොල් පාලම සංරක්ෂණය කරන්න අවශ්‍ය කටයුතු අද අපි ආරම්භ කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මාවනැල්ල නගරයේ අපජලය බැහැර කිරීම සඳහා මෙතෙක් කල් ක්‍රමයක් තිබුණේ නැහැ. අපි දැන් ඒ සඳහාත් මැදිහත් වෙලා ඉන්නවා. ඒ වාගේම, මාවනැල්ල සංචාරක කලාපයක් හැටියට සංවර්ධනය කරන්න අවශ්‍ය සියලු වැඩ කටයුතු අපි එකින් එක ක්‍රියාත්මක කරමින් ඉන්නවා. එම නිසා ගරු කබීර් හෂීම් මැතිතුමනි, ඔය ආකාරයට පාර්ලිමේන්තුව නොමඟ යවන්න උත්සාහ කරන්න එපා. ඔබතුමාගේ චෝදනාවල තිබෙනවා, ගරු ආණ්ඩුකාරතුමිය බදු ගෙවන ජනතාවට අසාධාරණයක් කරලා තිබෙනවා, රජයේ මූල්‍ය ප්‍රතිපත්ති උල්ලංඝනය කරලා තිබෙනවා, පළාත් පාලන නීතියට පටහැනිව කටයුතු කරලා තිබෙනවා කියලා. එහෙම නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි, විමර්ශනයකින් තොරව ඒ යෝජනා ක්‍රියාත්මක වුණා නම් සිදු වෙන්න තිබුණු දේවල් තමයි ඔබතුමා සඳහන් කරලා තිබෙන්නේ. එහෙම වුණා නම් තමයි, බදු ගෙවන ජනතාවට අසාධාරණයක් වෙන්නේ. එහෙම වුණා නම් තමයි රජයේ මූල්‍ය ප්‍රතිපත්ති උල්ලංඝනය වෙන්නේ. එහෙම වුණා නම් තමයි පළාත් පාලන නීතියට එය පටහැනි වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
ගරු ආණ්ඩුකාරතුමිය ඉතාම නිවැරදි ලෙස ඒ සඳහා අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඒ නිසා, එම පියවර අනුව යමින් අදාළ විමර්ශනයට අනුව කටයුතු කරන්න කියන ඉල්ලීමයි අප කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.24]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්තීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමාගේ මේ යෝජනාවේ අභිරහසක් තිබුණා. දැන් නම් ඒ අභිරහස සම්පූර්ණයෙන්ම ඉවත් වෙලා තිබෙන්නේ. මොකද, ඒ යෝජනාවේ ඉතා පැහැදිලිව සඳහන් වන පරිදි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් විසින් යම්කිසි ව්‍යාපෘතියකට ඔවුන්ගේ මුදල් වැය කිරීම සඳහා ගෙනෙන ලද යෝජනාව ආණ්ඩුකාරතුමිය විසින් නවතා තිබීම පිටුපස තිබුණු අභිරහස දැන් අපට තේරෙනවා. මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ බලය මේ රජයට ලබා ගන්න බැරි වීමේ තරහට දේශපාලන පළිගැනීමක් සිදු කළාය කියන එක ආණ්ඩුවේ මන්ත්‍රීවරු ඉතා පැහැදිලිව පිළිගෙන තිබෙනවා.

ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2026 අය වැය කථාවේ 40වැනි පිටුවෙන් මම උපුටා දැක්වීමක් කරන්නම්. එහි මෙසේ සඳහන් වෙනවා:

"**30.2 පළාත් පාලන ආයතනවල වියදම් පියවීම (ප්‍රාදේශීය සංවර්ධනය)**

පළාත් පාලන ආයතන ස්වාධීන බලතල සහිත ආයතනයක් වූ නමුත් වැටුප් ගෙවීමට පවා මහා භාණ්ඩාගාරයෙන් යැපෙන තත්ත්වයට පත් කර තිබෙනවා.

මහා භාණ්ඩාගාරයෙන් වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී, ඇස්තමේන්තුවෙන් සියයට 20 හා සියයට 40 යන ප්‍රතිශතයන් අඩු කර ප්‍රතිපාදන ලබාදීමේ පවතින ක්‍රමය වෙනුවට නව ක්‍රමයක් හඳුන්වා දීමට යෝජනා කරනවා."

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, අපි කල්පනා කළා ජනාධිපතිතුමා ඉදිරිපත් කරන්න යන නව ක්‍රමය මොකක්ද කියලා. දැන් අපට තේරෙනවා නේ ඒ නව ක්‍රමය මොකක්ද කියලා. නව ක්‍රමය තමයි, ආණ්ඩු පක්ෂයට පළාත් පාලන ආයතනවල බලය තිබෙනවා නම්, ඔවුන්ගේ මූල්‍ය ප්‍රතිපාදන ඔවුන් කැමැති විධියට වියදම් කරන්න අවස්ථාව ලබා දෙන එක. එහෙම නැත්නම් ආණ්ඩුකාරවරයාගේ බලතල පාවිච්චි කරලා ඒවා නවත්වනවා; ඒවාට බාධා කරනවා. ඒක තමයි නව ක්‍රමය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුකාරතුමියට බලතල නැහැ. හරි නම් බලතල තිබෙන්නේ ජනතාව විසින් පත් කළ යුතු පළාත් සභා මහ ඇමතිට සහ ඒ අමාත්‍ය මණ්ඩලයට. දැන් ඒකත් නැති කරලා. මේක සම්පූර්ණයෙන් ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව ජනාධිපතිතුමා මෙහෙම කියනවා:

"ඒ අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් මෑතකදී සිදු කරන ලද අධ්‍යයනය පදනම් කරගෙන, පළාත් පාලන ආයතනවල ආදායම් සහ සත්‍ය වියදම් සැලකිල්ලට ගනිමින් එක් එක් පළාත් පාලන ආයතනය සඳහා රජයේ දායකත්වය ලබා දෙන විධිමත් ක්‍රමවේදයක් ආරම්භ කිරීමට යෝජනා කරනවා. "

විධිමත් නොවෙයි. මේක අවිධිමත්, ප්‍රජාතන්ත්‍ර විරෝධී, තමන්ට හිතුමනාපයේ වැඩ කළ හැකි, ආණ්ඩුකාරතුමා හෝ තුමිය හරහා රජයේ පක්ෂවලට පක්ෂපාතිව මුදල් වැය කිරීම සඳහා යොදා ගන්නා ලද ක්‍රමයක්. යම්කිසි ක්‍රමයක් තිබේ නම් එය සියලු පළාත් පාලන ආයතනවලට සමසේ බලපෑ යුතුයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම කරන්නේ නැතිව දිගින් දිගටම කිසිම දේශපාලන ප්‍රශ්නයක් මතු නොකරන ලද, මේ යෝජනාවේ පිටුපස තිබෙන අභිරහස් දේශපාලන පළිගැනීමේ ක්‍රියාවලිය දැන් පැහැදිලිවම මුළු ජනතාවම දැනගත්තා කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.28]

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවට අදාළව මම මේ විධියට කරුණු පැහැදිලි කරන්න කැමැතියි.

මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජූලි 15වැනි දින පවත්වන ලද මහා සභාවේදී සංවර්ධන යෝජනා 41ක් සහ පෞද්ගලික සභික යෝජනා ගණනාවක්ද ඇතුළුව සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට අය වැය ප්‍රතිපාදන රුපියල් මිලියන 19ක් වෙන් කිරීමට තීරණය කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කළේ ඒකමතිකව තීරණය කළා කියලායි. නමුත් හේරත් මන්ත්‍රීතුමාගේ සඳහන අනුව මේක ඒකමතික තීරණයක් නොවන බව පෙනෙනවා. කොහොම වුණත්, මෙම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳව පැන නැඟී ඇති ගැටලු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමියට කරන ලද පැමිණිල්ලක් පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා සබරගමුව පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර තිබෙනවා.

මෙම ව්‍යාපෘති යෝජනා පිළිබඳව ඉදිරිපත් වූ පැමිණිල්ල අනුව ප්‍රාදේශීය සභාවේ විෂය පථයට අදාළ නොවන ව්‍යාපෘති මෙන්ම, වෙනත් බලාධිකාරී යටතට ගැනෙන මාර්ග පිළිබඳව ද නිරීක්ෂණය වූ බැවින් සබරගමුව පළාත් පාලන කොමසාරිස් විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 196 වගන්තිය අනුව කොමසාරිස්වරයාට පැවරී ඇති අධීක්ෂණ බලතල ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කර තීරණ දැනුම් දෙන තෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා, ඒ පිළිබඳව මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා දැනුවත් කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 196 (1)හි සඳහන් පරිදි බලය ලබා දී පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු පත් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඉදිරිපත් වූ පැමිණිල්ල විභාග කිරීම සඳහා තාවකාලිකව තමයි ඒ ක්‍රියාවලිය අත්හිටුවා තිබෙන්නේ. ඒ පරීක්ෂණය කිරීම සඳහා මේ වන විට නිලධාරීන් දෙදෙනෙකුත් පත් කර තිබෙනවා. එම පරීක්ෂණ වාර්තාව පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය ද සමඟ ගරු ආණ්ඩුකාරතුමිය වෙත ලබා දීමට නියමිතව ඇත. මාවනැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විවිධ ස්ථානවල පිහිටි මෙම ව්‍යාපෘති නිරීක්ෂණය කර වාර්තා කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වූ බැවින් 2025.11.21වන දින වාර්තාව ගරු ආණ්ඩුකාරතුමිය වෙත ලබා දීමට නියමිතව තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයටම සමහර පාරවල් සම්බන්ධ අධිකරණමය ක්‍රියාමාර්ග තිබෙනවා. ඒක නිසා ඒ සියල්ල විමර්ශනය කරලා වාර්තාවක් දීමට යම් කාලයක් ගත වුණා. නමුත් ඒ වාර්තාව මෙම මස 21වන දින ආණ්ඩුකාරතුමිය වෙත ලබා දීමට කටයුතු කරනවා.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 196 වගන්තිය අනුව පළාත් පාලන කොමසාරිස්වරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීම රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමක් හෝ පළාත් පාලන නීතියට පටහැනිවීමක් නොවන අතර, සභා බල ප්‍රදේශයේ බදු ගෙවන ජනතාවගේ බදු මුදල් ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් නියමානුකූලව යෙදවීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීමක් වන බැව් වැඩිදුරටත් පෙන්වා දෙන්න කැමැතියි.

මේ පනතින් බලතල දී තිබෙන්නේ මේ ආයතනවල කටයුතු විධිමත්ව, නිසි පරිදි සිදු වෙනවාද කියන එක අධීක්ෂණය කරන්නයි. ඒ ක්‍රියාවලිය තමයි මේ විධියට සිදු කරලා තිබෙන්නේ.

මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ කසළ කළමනාකරණය සඳහා සේවකයන් 10දෙනෙක් සේවා ගිවිසුම් මත යොදා ගැනීමට 2025 අගෝස්තු 12වැනි දිනැතිව මහ සභා අනුමැතිය ලබා ගෙන, පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් වූ එම යෝජනාව, යෝජනාව ඉදිරිපත් කිරීමේදී තිබූ අඩු පාඩු ප්‍රාදේශීය සභාව මඟින් සම්පූර්ණ කරවා ගැනීමෙන් අනතුරුව නිර්දේශ කර අනුමැතිය සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් මඟින් ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා.

ඒ කියන්නේ, ලේඛනයේ අඩු පාඩු තිබුණා. ඒ නිසා ඒ යෝජනාවේ අඩු පාඩු සකස් කරලා එවන්න කියලා ආපහු එවලා තිබුණා. ඒ අනුව සකස් කරපු යෝජනාව ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලද වහාම මාවනැල්ල ප්‍රාදේශීය සභාව දැනුවත් කිරීමට කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. සමහර ආයතන සේවකයන් බඳවා ගෙන තිබෙනවා. සෞඛ්‍ය කම්කරුවන් හැටියට තමයි ඒ අයව බඳවා ගෙන තිබෙන්නේ. නමුත් සෞඛ්‍ය කම්කරු සේවයේ නොවෙයි ඔවුන් යොදවලා තිබෙන්නේ. කාර්යාල රාජකාරි, රියදුරු වාගේ අවිධිමත් විධියට ඒ යෙදවීම් කරලා තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කිරීම ආණ්ඩුකාරතුමියගේ වගකීමක් හැටියට තිබෙනවා. ඒ අනුව තමයි මේ ක්‍රියාවලිය සිද්ධ වන්නේ. ඒක නිසා ඉතාම ඉක්මනින් මේ ප්‍රශ්න නිරාකරණය කරලා දීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට මේ සභාවේ නොමැති හෝ පිළිතුරු දිය නොහැකි නිලධාරීන් සම්බන්ධයෙන් යම් චෝදනාවක් තිබෙනවා නම් ඒ පිළිබඳව විධිමත්ව කරුණු දැක්වීම තමයි වඩාත් සුදුසු වන්නේ. ඒ අයට නිකම්ම චෝදනා කිරීම සාධාරණ නැහැ කියලා මම හිතනවා.

ඒ වාගේම අවසානයට කථා කරපු ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට ගරු ජනාධිපතිතුමා විසින් මේ ආයතනවලට අවශ්‍ය ප්‍රතිපාදන පහසුකම් ලබා දීමේ ක්‍රමයක් සකස් කරනවා කියලා සඳහන් කරලා තිබුණා. භේදයකින් තොරව සියලු ආයතනවලට අවශ්‍ය ඒ පහසුකම් ලබා දීම තමයි රජයේ ඉලක්කය. ඔබතුමා දන්නවා, අපි මේ වනවිටත් යන්ත්‍රෝපකරණ රාශියක් ඇණවුම් කරලා තිබෙනවා කියලා. ඒ යන්ත්‍රෝපකරණ බෙදා දීමේදී වුණත්, ආණ්ඩු පක්ෂයේ බලය සහිත ආයතනයක්ද, නැත්නම් විපක්ෂයේ බලය සහිත ආයතනයක්ද කියන කාරණය අපි සැලකිල්ලට ගන්නේ නැහැ. ජනතාවගේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් තමයි අපි ඒ යන්ත්‍රෝපකරණ ලබා දෙන්නේ. ඒ වාගේම ගෙන්වන කැබ් රථවලිනුත් ඒ පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට කැබ් රථයක් ලබා දීම සඳහා අපි කටයුතු කරනවා. ඒවා ලබා දෙන්නේ මන්ත්‍රීවරුන්ට පමණයි නොවෙයි. රජය සියලු ආයතනවලට සමානව කටයුතු කරන බව සඳහන් කරනවා. යම් ගැටලුවක් තිබෙනවා නම්, ඒ ගැටලුව නිරාකරණය කරලා වඩාත් හොඳින් ජනතාවට සේවය කිරීම සඳහා අවස්ථාව ලබා දීමට අපි කටයුතු කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු ඇමතිතුමනි, ඒ උත්තරය ඉතාම පැහැදිලියි. ඒකට ඔබතුමාට ස්තුති කරනවා මේ වෙලාවේ. පක්ෂ, පාට භේදයෙන් තොරව හරියාකාරව ඒ පියවර ගන්නවා කිව්වාට මගේ ස්තුතිය පළකරනවා.

*එකල්හි වේලාව අ.භා. 6.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.35ට, 2025 ඔක්තෝබර් 23වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 10වන සඳුදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது நேரம் பி.ப. 6.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.35க்கு, பாராளுமன்றம் அதனது 2025 ஒக்ரோபர் 23ஆந் தேதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 10, திங்கட்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.35 p.m. until 9.30 a.m. on Monday, 10th November, 2025, pursuant to the Resolution of 23rd October, 2025.*

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
# வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
# WRITTEN ANSWERS TO QUESTIONS

## කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණය: නඩත්තු කටයුතු
## களுத்துறை மாவட்ட விளையாட்டுக் கட்டிடத்தொகுதி: பராமரிப்பு நடவடிக்கைகள்
## KALUTARA DISTRICT SPORTS COMPLEX: MAINTENANCE

1462/2025

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) බණ්ඩාරගම පිහිටි, කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ (පෙර රාජා සමරනායක ස්ටේඩියම්) නඩත්තුව සහ ප්‍රතිසංස්කරණය සඳහා සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රීඩා සංකීර්ණයේ සිදු කළ යුතු නඩත්තු කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල කොපමණද;

(iv) එම ක්‍රීඩා සංකීර්ණයේ නඩත්තු කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් 2025 වර්ෂය තුළ වැය කර ඇති මුදල කොපමණද;

(v) එම ක්‍රීඩාංගණයේ ඇති මීටර් 400 ධාවන පථයේ, මීටර් 100ක පමණ කොටසක සහ ක්‍රීඩාංගණය මධ්‍යයේ ස්ථාන ගණනාවක තණකොළ මැරී ගොස් බොරලු පස් පැදී ඇති බව දන්නේද;

(vi) එසේ නම්, එය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(vii) ක්‍රීඩාංගණය තුළ වැසි ජලය එකතුවීම වැළැක්වීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரிடம் கேட்ட வினா:

(அ) (i) பண்டாரகமவில் அமைந்துள்ள களுத்துறை மாவட்ட விளையாட்டுக் கட்டிடத் தொகுதியின் (முன்பு ராஜா சமரநாயக்க விளையாட்டரங்கு) பராமரிப்பு மற்றும் புனரமைப்பு நடவடிக்கைகளுக்காகத் திட்டமொன்று வகுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்விளையாட்டுக் கட்டிடத் தொகுதியில் மேற்கொள்ளப்பட வேண்டிய பராமரிப்பு மற்றும் புனரமைப்பு நடவடிக்கைகள் யாவையென்பதையும்;

(iii) அதற்கென மதிப்பீடு செய்யப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iv) மேற்படி விளையாட்டுக் கட்டிடத் தொகுதியின் பராமரிப்பு மற்றும் புனரமைப்பு நடவடிக்கைகளுக்காக 2025ஆம் ஆண்டில் செலவு செய்யப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(v) மேற்படி மைதானத்தில் உள்ள 400 மீற்றர் ஓடுபாதையில் சுமார் 100 மீற்றர் நீளமான பகுதியில் மற்றும் மைதானத்தின் மத்தியின் பல பகுதிகளில் புற்கள் காய்ந்து கிரவல் மண் வெளிப்பட்டுள்ளதை அறிவாரா என்பதையும்;

(vi) அவ்வாறாயின், அதனை மீளமைப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

(vii) மைதானத்தினுள் மழை நீர் தேங்கி நிற்பதைத் தவிர்ப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) whether there is a plan for the maintenance and renovation of the Kalutara District Sports Complex (formerly known as Raja Samaranayake Stadium) located in Bandaragama;

(ii) if so, the maintenance and renovation work to be carried out at the said sports complex;

(iii) the estimated cost thereof;

(iv) the amount of money that has been spent on the maintenance and renovation of the said sports complex during the year 2025;

(v) whether he is aware that the grass of the turf has died resulting in the exposure of the underlying gravel on a section of about 100 metres along the 400-metre track of the stadium and in several places in the middle of the stadium;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(vi) if so, the steps that will be taken to resolve this issue; and

(vii) the steps that will be taken to prevent rainwater from accumulating in the stadium?

(b) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

(අ) (i) කළුතර දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණයේ නඩත්තු සඳහා සැලැස්මක් සකස් කර ඇත.

(ii) **ඇමුණුම*** මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) රුපියල් මිලියන 39.80 (වැට් සහිතව රුපියල් 40,614,586.92)

(iv) මේ වන තෙක් ගෙවීමක් සිදු කර නොමැත.

(v) ඔව්.

(vi) ඉදිරියේදී නඩත්තු කොන්ත්‍රාත්කරු විසින් පිළිසකර කිරීම සිදු කරනු ලැබේ.

(vii) නඩත්තු කොන්ත්‍රාත්කරු විසින් පිළිසකර කිරීම සිදු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

(அ) (i) களுத்துறை மாவட்ட விளையாட்டுக் கட்டடத் தொகுதியின் பராமரிப்பு நடவடிக்கைகளுக்காகத் திட்டமொன்று வகுக்கப்பட்டுள்ளது.

(ii) இணைப்பு 01* மூலம் சமர்ப்பிக்கப்பட்டுள்ளது.

(iii) 39.80 மில்லியன் ரூபாய் ('வற்' அடங்கலாக ரூபாய் 40,614,586.92)

(iv) இது வரையில் எதுவித கொடுப்பனவும் செய்யப்படவில்லை.

(v) ஆம்.

(vi) எதிர்வரும் காலங்களில் பராமரிப்பு ஒப்பந்ததாரரினால் பழுதுபார்த்தல் செய்யப்படும்.

(vii) பராமரிப்பு ஒப்பந்ததாரரினால் பழுதுபார்த்தல் செய்யப்படும்.

(ஆ) கேள்வி எழாது.

(a) (i) A plan has been prepared for the maintenance of the Kalutara District Sports Complex.

(ii) Outlined in Annex*.

(iii) Rs. 39.80 million (Rs. 40,614,586.92 with VAT).

(iv) No payment has been made yet.

(v) Yes.

(vi) The repairs will be carried out by the maintenance contractor in the future.

(vii) The repairs will be carried out by the maintenance contractor.

(b) Does not arise.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.